177 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 177 - இல. 10
**Volume 177 - No. 10**

2008 ඔක්තෝබර් 09 වන බ්‍රහස්පතින්දා
2008 ஒக்ரோபர் 09, வியாழக்கிழமை
**Thursday, 09th October, 2008**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
**OFFICIAL REPORT**

(අශෝධිත පිටපත/பிழை திருத்தப்படாதது/**Uncorrected**)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:
  මහජන ආරක්ෂක ප්‍රකාශනය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

විසර්ජන පනත් කෙටුම්පත, 2009:
  පළමු වන වර කියවන ලදී

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත් කෙටුම්පත:
  පළමු වන වර කියවන ලදී

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත:
  පළමු වන වර කියවන ලදී

පරිපූරක මුදල:
  විභාග සඳහා ප්‍රතිපාදන

කල් තැබීමේ යෝජනාව:
  රටේ ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුවේ කාර්ය භාරය

---

# பிரதான உள்ளடக்கம்

சனாதிபதியிடமிருந்து வந்த செய்தி:
  பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்:

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2009:
  முதன்முறை மதிப்பிடப்பட்டது

பிரதேசிய சங்வர்த்தனை வங்கிச் சட்டமூலம்:
  முதன்முறை மதிப்பிடப்பட்டது

இலங்கை வீடமைப்பு அபிவிருத்தி நிதிக் கூட்டுத்தாபன வங்கி (திருத்தம்) சட்டமுலம்:
  முதன்முறை மதிப்பிடப்பட்டது

குறைநிரப்புத் தொகை:
  பரீட்சைகளுக்கான நிதி ஏற்பாடு

ஒத்திவைப்புப் பிரேரணை :
  நாட்டின் பொருளாதாரம் பாதுகாக்கப்படுவதில் மத்திய வங்கியின் பாத்திரம்

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
  Public Security Proclamation

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2009:
  Read the First time

PRADESHIYA SANWARDANA BANK BILL:
  Read the First time

HOUSING DEVELOPMENT FINANCE CORPORATION BANK OF SRI LANKA (AMENDMENT) BILL:
  Read the First time

SUPPLEMENTARY SUPPLY:
  Provision for Examinations

ADJOURNMENT MOTION:
  Role of the Central Bank in Protecting the Economy of the Country

2 — PL 003304 — 1600 — (2008/10)

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**2008 ඔක්තෝබර් 09 වන බ්‍රහස්පතින්දා**
2008 ஒக்ரோபர் 09, வியாழக்கிழமை
*Thursday, 09th October, 2008*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு டபிள்யு. ஜே. எம். லொக்குபண்டார] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a. m.* MR. SPEAKER [ THE HON. W. J. M. LOKUBANDARA] *in the Chair.*

# ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

"**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
President of Sri Lanka

අංකය : පීජේඑල්/308

2008 ඔක්තෝබර් මස 06 වන දින,
කොළඹ දීය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මවිසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ : මහින්ද රාජපක්ෂ
ජනාධිපති"

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - சிறுவர் அபிவிருத்தி, பெண்கள் வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Child Development and Women's Empowerment)
ගරු කථානායකතුමනි, මොනරාගල, මාරාව, මො/තෙනගල්ලන්ද මහා විද්‍යාලයේ කේ. එම්. ධර්මතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ෆීලික්ස් පෙරේරා මහතා - පැමිණ නැත.
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.
ගරු මහින්ද රත්නතිලක මහතා - පැමිණ නැත.
ගරු රවි කරුණානායක මහතා - පැමිණ නැත.
ගරු කබීර් හෂීම් මහතා - පැමිණ නැත.

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
ගරු කථානායකතුමනි, පොල්ගොල්ල "ග්‍රීන් වීව් ගාඩ්න්" හි පදිංචි ගාමිණී විජේකෝන් මහතාගෙන් ලැබුනු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

1. ගා/උඩුගම, කැටගොඩ, ගහ එගොඩ පදිංචි කේ. වී. සුමනසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම ; සහ
1. බද්දේගම, සුමග පාර, ගල්පොත්තවත්ත පදිංචි කාරියවසම් පතිරගේ සෝමදාස මහතාගෙන් ලැබුනු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4 - 0146/08 - (1), ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipunaarachchi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நகர அபிவிருத்தி, புனித பகுதிகள் அபிவிருத்தி அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena– Minister of Urban Development and Sacred Area Development and Chief Government Whip)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මන්ත්‍රීතුමා ඊයේ ප්‍රශ්නයක් පිළිබඳ කරුණක් අපට ඉදිරිපත් කළා. ඒ ගැන මා සම්පූර්ණයෙන් විමසා බැලුවා. ඒ පිළිබඳව සොයා බැලීමේදී පෙනී ගිය කාරණය මේකයි. ඒ ගරු මන්ත්‍රීතුමා තමන්ගේ ප්‍රශ්නය සංශෝධනය කිරීමට ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉදිරිපත් කර තිබෙන්නේ, අප න්‍යාය පුස්තකයේ ඇතුළත් කරන ලද ඒ ප්‍රශ්නයම තමන්ගේ අතින් වෙනස් කරලායි. න්‍යාය පුස්තකයට යමක් ඇතුළත් වුණාට පසුව ඒක පාර්ලිමේන්තුවේ දෙයක් බවට පත් වෙනවා. ඊට පසුව ඒක වෙනස් කරන්න බැහැ. එහෙම වෙනස් කළ නිසායි ඒ වැරැද්ද වෙලා තිබෙන්නේ. ඒ නිසා මා දැන් කාර්ය මණ්ඩලයට නියම කර තිබෙනවා, මීට පසුව ඒ විධියට භාර ගන්න එපා; සම්පූර්ණයෙන්ම වෙනම ප්‍රශ්නයක් විධියට ඉල්ලන්න ඕනෑය කියලා. අතපසු වීමක් වෙලා තිබෙනවා ; වැරැද්දක් වෙලා තිබෙනවා. ඒ වැරැද්ද වෙලා තිබෙන්නේ ඒ විධියටයි. මා ඒ ගැන සොයා බැලුවා. නිලධාරී මණ්ඩලයට දෝෂාරෝපනය කරන්නත් බැහැ. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව දන්නවා. එතුමා ඒ කාර්යය ඒ විදියට කර තිබෙනවා. මා පැහැදිලිව නියම කළා, මීට පසුව සංශෝධනයක් අවශ්‍ය නම්, කලින් ඉදිරිපත් කළ ප්‍රශ්නය අහෝසි හැටියට සලකා මන්ත්‍රීතුමන්ලාට ඒක වෙනමම ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කරන්න කියලා.

## ලූනම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය : අඳ ගොවීන් සහ කුඹුරු
### லுனம கமநலசேவை நிலைய அதிகாரப் பிரதேசம் : குத்தகை விவசாயிகள் மற்றும் வயல்கள்
### LUNAMA AGRARAIN SERVICE CENTRE AREA : TENANT FARMERS AND PADDY LANDS

0464/'08

8. **ගරු විජිත රණවීර මහතා**
( மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,—(1) :

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලූනම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටිනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அபிவிருத்தி, கமநலச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) 2007.12.31 ஆம் திகதியன்று உள்ளவாறு அம்பாந்தோட்டை மாவட்டத்தில் லுனம கமநல சேவை நிலைய அதிகார பிரதேசத்தில் உள்ள வயல்களின் அளவு எத்தனை ஏக்கர்,

(ii) அவற்றிற்கிடையில் பெரிய நீர்ப்பாசனம், சிறிய நீர்ப்பாசனம், மானாவரி என்ற வகையில் பாசனம் பெறும் நிலத்தின் அளவு வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) 2007.12.31 ஆம் திகதியன்று உள்ளவாறு சம்பந்தப்பட்ட அதிகார பிரதேசத்தில் கமத்தொழில் செய்கின்ற குத்தகை விவசாயிகளின் எண்ணிக்கை, பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவு யாது,

(ii) காணி உரிமையுடைய விவசாயிகளின் எண்ணிக் கையும் பயிர் செய்யப் படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு,

(iii) அது தவிர வேறு விவசாயிகள் இருப்பின் அவ்விவசாயிகளின் எண்ணிக் கையும் பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) (i) 2000 ஆம் ஆண்டில் கமநல அபிவிருத்திச் சட்டம் நடைமுறைப் படுத்தப்பட்டதன் பின்னர் 2007.12.31 வரையிலான காலப்பகுதியில் குத்தகை விவசாயி இறந்து போனதன் காரணமாக காணி உரிமை யாளருக்கும் பின்னுரிமையாளருக்கும் இடையில் தோன்றியுள்ள பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(ii) கமநல சேவை உதவி ஆணையாளருக்கு சம்பந்தப் பட்ட அதிகார பிரதேசத்திலிருந்து அறிவிக்கப் பட்டுள்ள குத்தகை விவசாயிகளின் பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(iii) குத்தகை விவசாய உரிமை பெற்ற பின்னுரிமை யாளர்களின் எண்ணிக்கை எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agricultural Development and Agrarian Services ,- (1)

(*a*) Will he inform this House—

(i) the number of acres of paddy lands in the Lunama Agrarian Service Centre area in the Hambantota District as at 31.12.2007; and

(ii) separately, the extent of land identified as falling into the categories of major irrigated, minor irrigated and rain fed, out of the number of acres of paddy lands mentioned in the answer for (a) (i) above?

(*b*) Will he submit to this House—

(i) the number of tenant farmers engaged in paddy farming in the relevant area as at 31.12.2007 and the number of acres of paddy lands cultivated by them;

(ii) the number of farmers who have their own paddy lands and the number of acres of paddy lands cultivated by them; and

(iii) if there are any other types of farmers other than the two types of farmers mentioned above, their number and the number of acres of paddy lands cultivated by them?

(*c*) Will he state—

(i) the number of disputes that have arisen between the land owner and the successor owing to the death of the tenant farmer during the period up to 31.12.2007, since implementation of the Agrarian Development Act in the year 2000;

(ii) the number of disputes of tenant farmers that have been reported to the Assistant Commissioner of Agrarian Services from the relevant area; and

(iii) the number of successors who have been accorded the rights of tenant farmers?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2007.12.31දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලූනම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය - 12.065කි.

(ii)

| | | |
|---|---|---|
| මහ වාරි මාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය | - | 10.968 |
| සුළු වාරි මාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය | - | නැත |
| වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය | - | 1.097 |

(ආ)

| | | | |
|---|---|---|---|
| (i) | කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන් සංඛ්‍යාව | - | 1.472 |
| | වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය | - | 3.947 |
| (ii) | ඉඩම් හිමි ගොවීන් සංඛ්‍යාව | - | 933 |
| | වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය | - | 2.786 |
| (iii) | වෙනත් ගොවීන් සංඛ්‍යාව | - | 1.842 |
| | වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය | - | 5.332 |

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මිය යෑම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතරු ගැටලු සංඛ්‍යාව - 02කි.

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත වාර්තා වී ඇති අඳ ගොවි ගැටලු සංඛ්‍යාව - 28කි.

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් නැත.

(ඈ) අදාළ නොවේ.

ඊයේ අසන ලද ප්‍රශ්නවල සම්ප්‍රදායෙන්මයි අහන්නේ. මෙහි විස්තර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් ගැන දැන ගන්න නේද?

**ගරු විජිත රණවීර මහතා**
( மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
ඔව්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නයේ අසන ලද සියලුම කොටස්වලට උත්තර දී තිබෙනවා.

එම ප්‍රශ්නයේ (ඇ) (iii) කොටසට උත්තරය, අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් නැත. කියන එකයි.

ඒ කියන්නේ අර නීතිය තවම ක්‍රියාත්මක වෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
කලින් තිබුණු අඳ ගොවි අයිතිවාසිකම් අනුව දුවට හෝ පුතාට හෝ එහි අයිතිය පත් වෙන්නේ නැති තත්ත්වයක් නේද තිබෙන්නේ ගරු ඇමතිතුමනි? එම නිසා, සංශෝධන පනත් කෙටුම්පත ගෙන ඒම ඉක්මන් කිරීම බොහොම වැදගත්, මොකද, ඒ දෙය දැන් සිද්ධ වෙමින් පවතිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඊයේ මා මේ පිළිබඳව දැනුම් දී තිබෙනවා. සංශෝධන පනත් කෙටුම්පත ඉක්මන් කිරීම හෝ අතුරු -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මේ කොටසට අතුරු නියෝගයක් නිකුත් -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙමයි. මොකද, අඳ ගොවියෙක් මිය ගියාම කුඹුරු පනතට අනුව තිබුණේ අනුප්‍රාප්තිකයාට හිමිකම යන්නට ඕනෑය කියලායි. දැන් ඒක අත් හිටුවා තිබෙනවා, පරීක්ෂණයකට ලක් කරන්න. දැන් ඒ කාල සීමාව පැනලා. ගරු කථානායකතුමනි, මේ රටේ අඳ ගොවීන්ට සහ අනුප්‍රාප්තික දරුවන්ට ඒක විශාල හානියක්. ඒකට අප අවධානය යොමු කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු ඇමතිතුමනි, මා මේ කාරණය ඔබතුමාගෙන් දැන ගන්නට කැමතියි. ඒ නියෝගය යැවීමට පෙර දෙමව්පියෝ මිය ගිය අය ඉන්නවා. ඒ ගොල්ලන්ට ඉඩමේ අයිතිය ඇවිත් නැහැ. එතකොට දැන් ඒ කාල පරිච්ඡේදයක් ගිහින් තිබෙනවා නේ. ඒ කාල පරිච්ඡේදය තුළ අඳ ගොවි අයිතිය අහිමි වුණු දරුවන් ගැනත් නැවත සමාලෝචනය කර, ඒ අයත් ඇතුළත් කර ගැනීමේ හැකියාවක් ඇතිවද එම නියෝගය යන්නේ කියා මා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අපේ සංශෝධන පනත් කෙටුම්පත එන කොට ඒක කරමු. බොහොම සුළු ප්‍රමාණය කටයි තමයි තීන්දු දී තිබෙන්නේ. තීන්දු දී නැති නුත්දහස් ගණනයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

එම නිසා දැනට තීන්දු දීම අත් හිටුවනවා නම් තමයි වඩාත් යෝග්‍ය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්.

## අඟුණකොළපැලැස්ස ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය : අඳගොවීන් සහ කුඹුරු

**அங்குனுகொலபெலஸ்ஸ கமநலசேவை நிலைய அதிகாரப் பிரதேசம் : குத்தகை விவசாயிகள் மற்றும் வயல்கள்**

ANGUNAKOLAPALESSA AGRARIAN SERVICE CENTRE AREA : TENANT FARMERS AND PADDY LANDS

0465/'08

9. **ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,— (1)

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණුකොළපැලැස්ස ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටිනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) 2007.12.31 ஆம் திகதியன்று உள்ளவாறு அம்பாந்தோட்டை மாவட்டத்தில் அங்குனுகொல பெலஸ்ஸ கமநல சேவை நிலைய அதிகார பிரதேசத்தில் உள்ள வயல்களின் அளவு எத்தனை ஏக்கர்,

(ii) அவற்றிற்கிடையில் பெரிய நீர்ப்பாசனம், சிறிய நீர்ப்பாசனம், மானாவரி என்ற வகையில் பாசனம் பெறும் நிலத்தின் அளவு வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) 2007.12.31 ஆம் திகதியன்று உள்ளவாறு சம்பந்தப்பட்ட அதிகார பிரதேசத்தில் கமத்தொழில் செய்கின்ற குத்தகை விவசாயிகளின் எண்ணிக்கை, பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவு யாது,

(ii) காணி உரிமையுடைய விவசாயிகளின் எண்ணிக் கையும் பயிர் செய்யப் படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு,

(iii) அது தவிர வேறு விவசாயிகள் இருப்பின் அவ்விவசாயிகளின் எண்ணிக்கையும் பயிர் செய்யப் படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) (i) 2000 ஆம் ஆண்டில் கமநல அபிவிருத்திச் சட்டம் நடைமுறைப் படுத்தப்பட்டதன் பின்னர் 2007.12.31 வரையிலான காலப்பகுதியில் குத்தகை விவசாயி இறந்து போனதன் காரணமாக காணி உரிமை யாளருக்கும் பின்னுரிமையாளருக்கும் இடையில் தோன்றியுள்ள பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(ii) கமநல சேவை உதவி ஆணையாளருக்கு சம்பந்தப் பட்ட அதிகார பிரதேசத்திலிருந்து அறிவிக்கப் பட்டுள்ள குத்தகை விவசாயிகளின் பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(iii) குத்தகை விவசாய உரிமை பெற்ற பின்னுரிமையாளர் களின் எண்ணிக்கை எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agricultural Development and Agrarian Services ,—;

(*a*) Will he inform this House—

(i) of the number of acres of paddy lands in the Angunakolapelessa Agrarian Service Centre area in the Hambantota District as at 31.12.2007; and

(ii) separately, the extent of land identified as falling into the categories of major irrigated, minor irrigated and rain fed, out of the number of acres of paddy lands mentioned in the answer for (a) (i) above?

(*b*) Will he submit to this House—

(i) the number of tenant farmers engaged in paddy farming in the relevant area as at 31.12.2007 and the number of acres of paddy lands cultivated by them;

(ii) the number of farmers who have their own paddy lands and the number of acres of paddy lands cultivated by them; and

(iii) if there are any other types of farmers other than the two types of farmers mentioned above, their number and the number of acres of paddy lands cultivated by them?

(*c*) Will he state—

(i) the number of disputes that have arisen between the land owner and the successor owing to the death of the tenant farmer during the period up to 31.12.2007, since implementation of the Agrarian Development Act in the year 2000;

(ii) the number of disputes of tenant farmers that have been reported to the Assistant Commissioner of Agrarian Services from the relevant area; and

(iii) the number of successors who have been accorded the rights of tenant farmers?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2007.12.31 දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය - 10,253කි.

(ii) මහාවාරිමාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය - 9,094
සුළු වාරිමාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය - 1,159
වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය - නැත.

(ආ) (i) කුඹුරු ගොවිතැන් කරන අඳගොවීන් සංඛ්‍යාව - 706
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - 1,187

(ii) ඉඩම් හිමි ගොවීන් සංඛ්‍යාව - 407
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - 904

(iii) වෙනත් ගොවීන් සංඛ්‍යාව - 3,144
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - 8,162

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර ගැටලු පැන නැගී නැත.

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත වාර්තා වී ඇති අඳ ගොවි ගැටලු සංඛ්‍යාව - 01 කි.

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් නැත.

(ඈ) අදාළ නොවේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. මහින්ද චින්තනය යටතේ තේ පර්යේෂණ ආයතනයෙන් බෙදා හරින ලද පොහොර අවශ්‍ය සංයුතියෙන් නැහැ කියා දැන් වාර්තා වෙලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමිය ඊයේ මේ ගැන අපිත් එක්ක සාකච්ඡා කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
කොහේද ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු රේණුකා හේරත් මන්ත්‍රීතුමිය මේ කාරණය ගැන ඊයේ සාකච්ඡා කළා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
කොහේදිද ඇමතිතුමා ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සභා ගර්භයෙන් පිට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඒක නේ වැඩේ. අපි ඒක දන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔය ගොල්ලන් එක්ක කථා නොකර අපිත් එක්ක කථා කරනවා. ඔය ගොල්ලන් එක්ක හැම දෙයම කථා කරන්නේ නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
දිනේෂ් ඇමතිතුමායි, ගරු රේණුකා හේරත් මන්ත්‍රීතුමියයි එළියේ කරන ලද කථා බහ අපි දන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තව මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් සිටියා. අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා සිටියා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

මම ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවන්නේ මේ තේ වගාකරුවන්ට - තේ ගොවීන්ට - ලබා දී තිබෙන පොහොර අවශ්‍ය සංයුතියෙන් නැහැ කියලා අද පර්යේෂණවලින් ඔප්පු වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන් කොපමණ පොහොර යෙදුවත් අවශ්‍ය වර්ධනයක් තේ ගසට ලැබිලත් නැහැ. මේ පොහොරම තමයි සමහර අය කෘෂිකාර්මික ගොවි පොළවලටත් වී වගා කරන ඉඩම්වලටත් යොදවන්නේ. දැන් මතුවෙලා තිබෙන ප්‍රශ්නය තමයි ආනයනය කරනු ලබන මේ පොහොරවල අවශ්‍ය සංයුතිය නොමැති වීම. ඒ නිසා ගරු ඇමතිතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවන්න මා කැමැතියි. මේ පොහොර බොහෝ විට ආනයනය කරනු ලබන්නේ, ලංකා පොහොර සංස්ථාවයි, කලම්බු කොමර්ෂල් පොහොර සමාගමයි කියන සමාගම් දෙකෙනුයි. ඒ ගෙන ඒමේදී ලබා දෙන ටෙන්ඩර් ලබා දෙන්නේ කවර ටෙන්ඩර්කරුවන්ටද, ඔවුන් විසින් ආනයනය කරන ලද පොහොර මේ සංයුතියෙන් බැහැර වෙලා තිබුණා නම් ඒ පිළිබඳව ගනු ලබන තීන්දු තීරණ මොනවාද කියලා මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමාට අතිරේක ප්‍රශ්නයක් අහන්න අයිතිය තිබෙනවා. මෙය මුල් ප්‍රශ්නයට සම්පූර්ණයෙන් වෙනස් අතිරේක ප්‍රශ්නයක්. ඒක නිසා ඒ ප්‍රශ්නය වෙනම ඉදිරිපත් කරන්න. එතකොට ඒකට වෙනම පිළිතුරු සපයන්න පුළුවන්. එතෙක් තමුන්නාන්සේ කියපු කරුණු ඇමතිතුමාට දැනුම් දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ඒක මම පිළිගන්නවා.

## උඩයාල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය : අඳ ගොවීන් සහ කුඹුරු

**உடயால கமநலசேவை நிலைய அதிகாரப் பிரதேசம் : குத்தகை விவசாயிகள் மற்றும் வயல்கள்**

UDAYALA AGRARAIN SERVICE CENTRE AREA : TENANT FARMERS AND PADDY LANDS

0466/'08

10. **ගරු විජිත රණවීර මහතා**
( மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය ,—(1):

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ උඩයාල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටිනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அபிவிருத்தி, கமநல சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) 2007.12.31 ஆம் திகதியன்று உள்ளவாறு அம்பாந்தோட்டை மாவட்டத்தில் உடயால கமநல சேவை நிலைய அதிகார பிரதேசத்தில் உள்ள வயல்களின் அளவு எத்தனை ஏக்கர்,

(ii) அவற்றிற்கிடையில் பெரிய நீர்ப்பாசனம், சிறிய நீர்ப்பாசனம், மானாவரி என்ற வகையில் பாசனம் பெறும் நிலத்தின் அளவு வெவ்வேறாக எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) 2007.12.31 ஆம் திகதியன்று உள்ளவாறு சம்பந்தப் பட்ட அதிகார பிரதேசத்தில் கமத்தொழில் செய்கின்ற குத்தகை விவசாயிகளின் எண்ணிக்கை, பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவு யாது,

(ii) காணி உரிமையுடைய விவசாயிகளின் எண்ணிக் கையும் பயிர் செய்யப் படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு,

(iii) அது தவிர வேறு விவசாயிகள் இருப்பின் அவ்விவசாயிகளின் எண்ணிக்கையும் பயிர் செய்யப்படுகின்ற வயல்களின் ஏக்கர் அளவும் எவ்வளவு

என்பதை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) (i) 2000 ஆம் ஆண்டில் கமநல அபிவிருத்திச் சட்டம் நடைமுறைப் படுத்தப்பட்டதன் பின்னர் 2007.12.31 வரையிலான காலப்பகுதியில் குத்தகை விவசாயி இறந்து போனதன் காரணமாக காணி உரிமை யாளருக்கும் பின்னுரிமையாளருக்கும் இடையில் தோன்றியுள்ள பிணக்குகளின் எண்ணிக்கை எவ்வளவு,

(ii) கமநல சேவை உதவி ஆணையாளருக்கு சம்பந்தப்பட்ட அதிகார பிரதேசத்திலிருந்து அறிவிக்கப்பட்டுள்ள குத்தகை விவசாயிகளின் பிணக்கு களின் எண்ணிக்கை எவ்வளவு,

(iii) குத்தகை விவசாய உரிமை பெற்ற பின்னுரிமை யாளர்களின் எண்ணிக்கை எவ்வளவு

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agricultural Development and Agrarian Services :

(*a*) Will he inform this House—

(i) of the number of acres of paddy lands in the Udayala Agrarian Service Centre area in the Hambantota District as at 31.12.2007; and

(ii) separately, the extent of land identified as falling into the categories of major irrigated, minor irrigated and rain fed, out of the number of acres of paddy lands mentioned in the answer for (a) (i) above?

(*b*) Will he submit to this House—

(i) the number of tenant farmers engaged in paddy farming in the relevant area as at 31.12.2007 and the number of acres of paddy lands cultivated by them;

(ii) the number of farmers who have their own paddy lands and the number of acres of paddy lands cultivated by them; and

(iii) if there are any other types of farmers other than the two types of farmers mentioned above, their number and the number of acres of paddy lands cultivated by them?

(*c*) Will he state—

(i) the number of disputes that have arisen between the land owner and the successor owing to the death of the tenant farmer during the period up to 31.12.2007, since implementation of the Agrarian Development Act in the year 2000;

(ii) the number of disputes of tenant farmers that have been reported to the Assistant Commissioner of Agrarian Services from the relevant area; and

(iii) the number of successors who have been accorded the rights of tenant farmers?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2007.12.31දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ උඩයාල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය - 4.011කි.

(ii)

| | | |
|---|---|---|
| මහ වාරි මාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය | - | 3.309 |
| සුළු වාරි මාර්ග වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය | - | 656 |
| වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් අක්කර ප්‍රමාණය | - | 46 |

(ආ)

| | | | |
|---|---|---|---|
| (i) | කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන් සංඛ්‍යාව | - | 1.180 |
| | වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය | - | 1.966 |
| (ii) | ඉඩම් හිමි ගොවීන් සංඛ්‍යාව | - | 1.215 |
| | වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය | - | 2.045 |
| (iii) | වෙනත් ගොවීන් සංඛ්‍යාව | - | නැත |
| | වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය | - | නැත |

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මිය යෑම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතරු ගැටලු පැන නැඟී නැත.

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත වාර්තා වී ඇති අඳ ගොවි ගැටලු සංඛ්‍යාව - 01කි.

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් නැත.

(ඈ) අදාළ නොවේ.

## තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ව්‍යාජ බලපත්‍රය

**தவலம பிரதேச செயலாளர் காரியாலயம் : போலி உரிமம்**

THAWALAMA DIVISIONAL SECRETARIAT : FORGED LICENCE

0633/'08

15. **ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය ,— (1) :

(අ) (i) ගාල්ල, තවලම, හල්විටිගල ජනපදය අංක 130 E. S. 1 දරන තාවකාලික බලපත්‍රය ජේ. ඩබ්ලිව්. ජයසේකර යන අයට 1980.10.14 වැනි දින ලබා දී ඇති බවත්;

(ii) හතර මායිම් ලෙස උතුරට රත්නායකගේ ඉඩමත්, දකුණට ඩබ්ලිව්. ජී. පියදාස යන අයගේ ඉඩමත්, නැගෙනහිරට පාළුගල පාර සහ බටහිරට ප්‍රධාන පාර ඇති බවත්;

(iii) මේ අතර හල්විටිගල සුධර්මාරාමයට යාබද ඉඩමක් සඳහා හතර මායිම් වෙනස්කර, මුද්‍රාවක් නොමැතිව කෙටි අත්සන් යෙදූ බලපත්‍රයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ලබාදී ඇති බවත්,

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධව පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංක ඉකො/ගා/තව/130 දරන පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත්කර ඇති අතර මෙතෙක් තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඒ සම්බන්ධව චක්‍රලේඛ ප්‍රකාර ව කටයුතුකර නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) පාර්ලිමේන්තු උපදේශක කාරක සභා යෝජනා අංක 1706 ට අදාළ රාපරි/විම/දප/17/86/07 වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට අනුව සමහර තීරණ නිවැරදි වුවද, ව්‍යාජ ලෙස වෙනස් කරන ලද බලපත්‍රය පදනම් කරගෙන අධිකරණයට වැරදි වාර්තාවක් ඉදිරිපත් කිරීම හා එම ලේඛනවලට අදාළ පිටපත් ගොනුවේ නොමැති වීමත් සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු තිලකරත්න විතානාච්චි මහතා]

பொது நிர்வாக, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) காலி, தவலம, ஹல்விட்டிகம குடியேற்றத்தைச் சேர்ந்த 130 E.S. 1 ஆம் இலக்க தற்காலிக உரிமம் திரு. கே. டபிள்யூ. ஜயசேகர என்பவருக்கு 1980.10.14 ஆம் திகதி வழங்கப்பட்டுள்ளதென்பதையும்,

(ii) நான்கு எல்லைகளாக வடக்கே ரத்னாயக்கவின் காணியும், தெற்கே டபிள்யூ. ஜீ. பியதாஸவின் காணியும் கிழக்கே பாலுகல வீதியும் மேற்கே பிரதான வீதியுமாக அமைந்துள்ளதென்பதையும்,

(iii) இதற்கிடையில் ஹல்விட்டிகல சுதர்மாராமயவை அடுத்த காணியின் நான்கு எல்லைகளை மாற்றி இலட்சினையொன்று இல்லாத சுறுக்கக் கையொப்ப மிடப்பட்ட உரிமமொன்று பிரதேச செயலாளர் காரியாலயத்தினால் வழங்கப்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) இது தொடர்பாக மாகாண காணி ஆணையாளரின் ඉකො/ ගා/තව/ 1 3 0ஆம் இலக்க விசாரணை அறிக்கை சமர்ப்பிக்கப்பட்டுள்ளதோடு இதுவரை தவலம பிரதேச செயலாளர் காரியாலயத்தினால் இது தொடர்பாக சுற்றறிக்கையின்படி நடவடிக்கை எடுக்கப்படவில்லை என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) பாராளுமன்ற ஆலோசனைக் குழுவின் 1706 ஆம் இலக்கப் பிரேரணைக்கான රාපරි/විම/දප/17/86/07 ஆம் இலக்க அறிக்கையில் குறிப்பிடப்பட்டுள்ள அவதானிப் புக்களின் பிரகாரம் சில தீர்மானங்கள் சரியாயிருப்பினும் போலியான முறையில் மாற்றம் செய்யப்பட்ட உரிமத்தை அடிப்படையாகக் கொண்டு நீதிமன்றத்துக்கு பிழையானதொரு அறிக்கையைச் சமர்ப்பித்தல் மற்றும் இந்த ஆவணங்களின் பிரதிகள் கோவையில் காணப்படாமை தொடர்பாக சம்பந்தப்பட்ட உத்தி யோகத்தர்களுக்கு எதிராக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(*a*) Is he aware that—

(i) the temporary licence, bearing number 130E.S.1. in the Halwitigala Colony in Thawalama, Galle has been given to Mr. J.W. Jayasekara on 14.10.1980;

(ii) the four boundaries relevant to the aforesaid land are Ratnayake's land to the North, W.G. Piyadasa's land to the South, Palugala road to the East and the main road to the West; and

(iii) meanwhile, an initialed licence without the rubber stamp placed on it has been issued by the Divisional Secretariat in respect of a land adjacent to Sudharmaramaya in Halwitigala having altered it's four boundaries?

(*b*) Will he admit the fact that though an investigation report of the Provincial Commissioner of Lands bearing number LC/G/TW/130 has been presented in this regard, so far Thawalama Divisional Secretariat has not acted in terms of the Circular?

(*c*) Will he state as to what steps have been taken against the relevant officers who are responsible for submitting a wrong report based on the forged licence, to the court and for the non availability of copies of the relevant documents in the file, though certain decisions, according to observations of the report No. රාපරි/විම/දප/17/86/07 in relation to Parliamentary Consultative Committee resolution No.1706, are correct?

(*d*) If not, why?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) නැත.
තව/හල්විටිගල ජනපදය / 130 බලපත්‍රයේ
උතුරට - පාර
දකුණට - පන්සල් ඉඩම
නැගෙනහිරට - ගෙබිම 78
බටහිරට - මහ පාර

යනුවෙන් දක්වා ඇත. පෙර පැවති උතුර, දකුණ, නැගෙනහිර යන මායිම් තනි ඉරකින් කපා ඉහතින් සඳහන් කර ඇති මායිම් සඳහන් කර කෙටි අත්සනක් යොදා ඇත.

(iii) නැත.

(ආ) නැත.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ ඉකො/ගා/තව/130 දරන පරීක්ෂණ වාර්තාවක් තවලම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් වී නොමැත.

(ඇ) මෙකී ඉඩම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාව පිළිබඳව අදාළ ඉඩම් නිලධාරිවරයාගෙන් නිදහසට කරුණු විමසා ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. මේ ප්‍රශ්නයේ (අ) (ii) කොටසට එතුමා, නැත කියලා උත්තර දීලා තිබෙනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මා එය පැහැදිලි කරන්නම්. එහි හල්විටිගල ජනපදය අංක 130 බලපත්‍රයෙන් මායිම් තිබෙන්නේ උතුරට පාර, දකුණට පන්සල් ඉඩම, නැගෙනහිරට ගෙබිම 78, බටහිරට මහ පාර.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)

ගරු කථානායකතුමනි, ඒ වෙනත් ස්ථානයක තිබුණු බලපත්‍රයකට තමයි මේ ස්ථානයේ මායිම් වෙනස් කරලා, මේක සකස් කර තිබෙන්නේ. ඒකේදී පැහැදිලිවම පළාත් ඉඩම්

කොමසාරිස්තුමා විසින් ඉකෝ/ගා/තව/130 දරන පරීක්ෂණ වාර්තාව ප්‍රාදේශීය ලේකම්ට ඉදිරිපත් කර තිබෙනවා. ජනපද නිලධාරි ග්‍රාම නිලධාරි මහතා ඇතුළු අය ස්ථාන පරීක්ෂාවකින් පසුව පැහැදිලිව හඳුනා ගෙන තිබෙනවා, මෙම බලපත්‍රය පැහැදිලිවම හතර මායිම් වෙනස් කරලා, වෙනත් ස්ථානයකට මෙය ආදේශ කර තිබෙන බව.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු මන්ත්‍රීතුමනි, මෙය මහේස්ත්‍රාත් අධිකරණයටත්, දිසා අධිකරණයටත් යොමු වුණු ප්‍රශ්නයක්. ඔබතුමා ඔය කියන අඩු පාඩුව අපේ විමර්ශන කණ්ඩායමත් පිළිගෙන තිබෙනවා. ඒ අනුව ඉඩම් නිලධාරිවරයාගෙන් නිදහසට කරුණු විමසා තිබෙනවා. ඒ අනුව ඉදිරි කටයුතු කරනවා.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, මේ පිළිතුර වැරදියි. පළාත් ඉඩම් කොමසාරිස් පිළිතුරක් දීලා නැහැයි කියලා කියනවා. පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංක ඉකො/ගා/තව/130 දරන පරීක්ෂණ වාර්තාවක් තවලම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර නැහැ කියා කියනවා. ජනපද නිලධාරි, ග්‍රාම නිලධාරි මහත්මයා ඇතුළු පිරිස පරීක්ෂණයක් කරලා ස්ථාන පරීක්ෂාවකින් පැහැදිලිව හඳුනා ගෙන තිබෙනවා, හතර මායිම් වෙනස් කරලා මෙම බලපත්‍රය වෙනත් ස්ථානයට ආදේශ කර තිබෙනවාය කියා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු මන්ත්‍රීතුමනි, මෙය මහේස්ත්‍රාත් අධිකරණයටත්, දිසා අධිකරණයටත් යොමු වෙච්ච ප්‍රශ්නයක්. ඔබතුමා කියන ඔය අඩු පාඩුව අපේ විමර්ශන කණ්ඩායමක් පිළිගෙන තිබෙනවා. ඒ අනුව ඉඩම් නිලධාරිවරයාගෙන් නිදහසට කරුණු විමසා තිබෙනවා. ඒ අනුව ඉදිරි කටයුතු කරනවා.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, මේ පිළිතුර වැරැදියි. පළාත් ඉඩම් කොමසාරිස් පිළිතුරක් දීලා නැහැ කියා කියනවා. පළාත් ඉඩම් කොමසාරිස්තුමා ඒ නිශ්චිත ස්ථානය පරීක්ෂාවෙන් පස්සේ මෙය ව්‍යාජයෙන් සකස් කරන ලද බලපත්‍රයක්ය කියා ප්‍රාදේශීය ලේකම්වරයාට පැහැදිලිව වාර්තාවක් දී තිබෙනවා. එම නිසා මේ පිළිතුර පිළිගන්න බැහැ ගරු ඇමතිතුමනි, මේ වාර්තාවේ කොටසකම තිබෙන්නේ සත්‍ය තොරතුරු නොවෙයි. මෙහි සම්පූර්ණ තොරතුරු මා විස්තර සහිතව දන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට ඒවා ඉදිරිපත් කරන්න පුළුවන්ද ?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මෙය තමයි අපේ පිළිතුර. ඔබතුමාගේ විශේෂ විස්තරයක් තිබෙනවා නම් - [බාධා කිරීමක්]

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
ගරු කථානායකතුමනි, මේ පිළිතුර පිළිගන්න බැහැ. මෙය සම්පූර්ණයෙන්ම වැරැදි සහගත පිළිතුරක්.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමා යම් පැහැදිලි කිරීමක් කරනවා නම්, මෙය වැරැදි සහගතයි කියා සටහන් කරනවා නම් මේ පිළිතුරේ දෝෂ සහිතභාවයක් තිබෙනවාද කියා අප පරීක්ෂා කර බලනවා.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
නැවත පරීක්ෂා කර බලා කොපමණ කාලයක් ඇතුළත අපට පිළිතුරු දෙනවාද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මාස තුනක් ඇතුළත.

**ගරු තිලකරත්න විතානාච්චි මහතා**
(மாண்புமிகு திலகரத்ன வித்தானாச்சி)
(The Hon. Thilakaratne Withanachchi)
නිවැරැදි පිළිතුරක් අපට අවශ්‍යයි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් කරුණු විමර්ශනය කරලා මේ පිළිතුර දෝෂ සහිත නම් ඒ පිළිබඳව ඊළඟ උපදේශක කාරක සභාවේදී අප ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්නම්.

## සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යතුමා: විදේශ සංචාර

**சுகாதார நலத்துறை, போசணை அமைச்சர் : வெளிநாட்டுப் பயணங்கள்**

MINISTER OF HEALTHCARE AND NUTRITION : OVERSEAS TRIPS

0061/'08

4. **ගරු රංජිත් අලුවිහාරේ මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - மாண்புமிகு ரவி கருணாநாயக்க - சார்பாக)
(The Hon. Ranjith Aluvihare on behlf of The Hon. Ravi Karunanayake)
සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,— (1):

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළ සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යතුමා විසින් කරන ලද විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද; සහ

(iii) ප්‍රවේශ පත්‍ර සඳහා වියදම් සහ හෝටල් ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඉහත සඳහන් එක් එක් සංචාරයේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරවලදී කැටුව යන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් සඳහා දැරීමට සිදු වූ වියදම් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් විදේශ සංචාරය සඳහා හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

[ගරු රංජිත් අලුවිහාරේ මහතා]

(ඈ) (i) මේ සඳහා අයවැයෙන් වෙන් කරන ලද දීමනාව කොපමණද; සහ

(ii) එවැනි සංචාර සඳහා සපයනු ලැබූ පරිපූරක වැය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார நலத்துறை, போசணை அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) கடந்த மூன்று வருடங்களில் சுகாதார நலத்துறை, போசணை அமைச்சரால் மேற்கொள்ளப்பட்ட வெளிநாட்டுப் பயணங்களின் எண்ணிக்கையையும்,

(ii) விஜயம் செய்த நாடுகளையும், மற்றும்

(iii) பயணச் சீட்டுக்கள் மற்றும் ஹோட்டல் கட்டணங்கள் என்பவற்றின் செலவுகளுடன் ஒவ்வொரு பயணத்திற்குமான மொத்தச்செலவை வெவ்வேறாகவும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) உடன்சென்ற நபர்களின் எண்ணிக்கையையும்,

(ii) அவர்களின் பெயர்கள் மற்றும் அவர்களுக்கென ஏற்பட்ட செலவுகள் என்பவற்றை வெவ்வேறாகவும்; அத்துடன்,

(iii) ஒவ்வொரு வெளிநாட்டுப் பயணத்திற்குமான பிரதான காரணத்தையும்

அவர் தெரிவிப்பாரா?

(இ) (i) அப் பயணங்களுக்கான ஒதுக்கீடு செய்யப்பட்ட தொகை, மற்றும்

(ii) அப் பயணங்களுக்கென வழங்கப்பட்ட குறைநிரப்புச் செலவினம் என்பவற்றையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Healthcare and Nutrition, :

(a) Will he inform this House—

(i) the number of overseas trips that the Minister of Healthcare and Nutrition had undertaken for the last three years;

(ii) the countries visited; and

(iii) the total cost of each trip along with the tickets and hotel charges separately?

(*b*) Will he state—

(i) the number of persons accompanied;

(ii) their names and the cost incurred on them separately; and

(iii) the main reason for each overseas trip?

(*c*) Will he also state—

(i) the budgeted allowance; and

(ii) the supplementary expenditure provided for such trips?

(*d*) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - சுகாதார நலத்துறை, போசணை அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Healthcare and Nutrition and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) (i) පසුගිය වසර 03 තුළ කරල ලද විදේශ සංචාර

2005 03
2006 07
2007 08

(ii) සංචාරය කරන ලද රටවල්,

2005 ස්විට්සර්ලන්තය, ජපානය, ජර්මනිය

2006 ඉන්දියාව, බංගලිදේශය, ඇමෙරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය සහ කැනඩාව

2007 ඉන්දියාව, භූතානය, ස්විට්සර්ලන්තය, පකිස්තානය, ඕස්ට්‍රේලියාව සහ නේපාලය.

(iii) ඔව්.

2005 වර්ෂයේ කරන ලද විද්ශ සංචාර 03 - ස්විට්සර්ලන්ත ජිනීවා නුවර පැවති 58 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය සෞඛ්‍ය ඇමාත්‍යවරුන්ගේ රැස්වීම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්ෂික සැසි වාරය සඳහා පමණක් රජය මගින් වියදම් දරා ඇත.

රජයෙන් දැරූ වියදම් - ගුවන් ගමන් බලපත්‍රය - රු. 262,089/, හෝටල් ගාස්තු - රු. 368,164/-

ඉතිරි සංචාර 02 සඳහා එම රැස්වීම් සඳහා ආරාධනය කරනු ලැබූ අන්තර් ජාතික සංවිධාන මගින් ගුවන් ගමන් පත් හා හෝටල් සඳහා වියදම් දරා ඇත.

2006 වර්ෂයේ කරන ලද විදේශ සංචාර 07 - ස්විසර්ලන්ත ජිනීවා නුවර පැවති 59 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්ෂික සැසි වාරය සඳහා පමණක් රජය මගින් වියදම් කරා ඇත.

රජයෙන් දැරූ වියදම් - ගුවන් ගමන් බලපත්‍රය - රු. 332,900/-, හෝටල් ගාස්තු රු. 382,284/-.

ඉතිරි සංචාර 06 සඳහා එම රැස්වීම් සඳහා ආරාධනය කරනු ලැබූ අන්තර්ජාතික සංවිධාන මගින් ගුවන් ගමන් පත් හා හෝටල් සඳහා වියදම් දරා ඇත.

2007 වර්ෂයේ කරන ලද විදේශ සංචාර 08 - ස්විට්සර්ලන්තයජිනිවා නුවර පැවති 60 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීම, ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්ෂික සැසි වාරය සඳහා පමණක් මගින් වියදම් දරා ඇත.

රජයෙන් දැරූ වියදම - ගුවන් ගමන් බලපත්‍රය - රු. 315,000/, හෝටල් ගාස්තු රු. 297,980/-

ඉතිරි සංචාර 07 සඳහා එම රැස්වීම් සඳහා ආරාධනය කරනු ලැබූ අන්තර්ජාතික සංවිධාන මගින් ගුවන් ගමන් පත් හා හෝටල් සඳහා වියදම් දරා ඇත.

(ආ) (i) ඇමුණුම බලන්න.

(ii) ඇමුණුම බලන්න.

(iii) ඇමුණුම බලන්න.

(ඇ) (i) ගරු ඇමතිතුමා සඳහා අය වැයෙන් වෙන් කරන ලද දීමනාව-

2005 රුපියල් 1,600,000/-
2006 රුපියල් 500,000/-
2007 රුපියල් 600,000/-

සංචාරවලදී කැටුව යන නිලධාරීන් සඳහා අය වැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන -

2005 රු. 3,500,000/- 2005 වර්ෂයේ විදේශ සංචාර 03 සඳහාම නිලධාරීන් සඳහා රජයෙන් වැය කර ඇති මුදල රු.668,855/-

2006 රු. 5,500,000/- 2006 වර්ෂයේ විදේශ සංචාර 07 සඳහාම නිලධාරීන් සඳහා රජයෙන් වැය කර ඇති මුදල රු.836,252.50.

2007 රු. 7,638,000/- 2007 වර්ෂයේ විදේශ සංචාර 08 සඳහාම නිලධාරීන් සඳහා රජයෙන් වැය කර ඇති මුදල රු.910,171.03

(ii) මෙම සංචාර සඳහා 2007 වර්ෂයේ පමණක් පරිපූරක ඇස්තමේන්තු මගින් රු.300,000/-ක මුදලක් අනුමත කර ඇත. 2006 වසර සඳහා FR66 රෙගුලාසි මගින් රු.1,222,805/-ක මුදලක් අමාත්‍යාංශ අභ්‍යන්තර මාරු කිරීමක් සිදු කර ඇත.

(ඈ) පැන නොනඟී.

ඇමුණුම

**Foreign visits of the Hon. Minister in 2005**

| *No.* | *Name* | *Reason* | *Country* | *Expenses* | | |
|---|---|---|---|---|---|---|
| | | | | *Incidental Expenses* | *Air Fare* | *Living Expenses* |
| 01. | 1. Dr. Y. D. N. Jayathilaka Add/Secretary (MS) | Commonwealth Ministers Meeting & 58th World Health Assembly | Geneva, Switzerland 15th –25th May 2005 | Rs. 17,710.00 | WHO | Rs. 245,415.00 |
| | 2. Dr. H. S. B. Tennakoon DDG (P)U | | | Rs. 17,710.00 | WHO | Rs. 245,415.00 |
| 02. | 1. Dr. H. A. P. Kahandaliyanage | 7th International Congress On AIDS in Asia Pacific | Japan 29th June-4th July 2005 | Rs. 12,738.00 | Rs. 13,42,71.00 | Govt. of Japan |
| 03. | 1. Dr. H. A P. Kahandaliyanage<br>2. Dr. P. Senadheera | Symposium "Wazfluthite" | Germany 18th-21st August 2005 | Rs. 7798.00<br>Rs. 7798.00 | Govt. of Germany | Govt. of Germany |

**Foreign visits of the Hon. Minister in 2006**

| *No.* | *Name* | *Reason* | *Country* | *Expenses* | | |
|---|---|---|---|---|---|---|
| | | | | *Incidental Expenses* | *Air Fare* | *Living Expenses* |
| 01. | 1. Dr. Y. D. N. Jayathilaka | 59th World Health Assembly | Geneva, Switzerland 21th –27th May 2006 | | | |
| | 2. Dr. H. A. P. Kahandaliyanage DGHS | Commonwealth Health Ministers Meeting (Only Hon. Minister Attended) | | Rs. 13,062.50<br>Rs. 18,289.25 | Rs. 185,400.00<br>165,840.00 | Rs.115,208.50<br>Rs.161.310.75 |
| | 3. Dr. N. Edirisinghe Director/STD/AIDS | | | Rs. 18,287.50 | | Rs.. 161,303.50 |
| | 4. Dr. P. Palihawadana Deputy Epidenmiologist | | | | | |
| | 5. Dr. P. Abeykoon/WHO | | | WHO | WHO | WHO |
| 02. | 1. Dr. Y. D. N. Jayathilaka | United Nations General | USA | Rs. 10.467.00 | Rs. 1,10,800.00 | Rs. 61,549.00 |
| | 2. Mr. Dalas alahapperuma/MP | Assembly Meeting on HIV/AIDS | 31st May-2nd June 2006 | WHO | WHO | WHO |
| | 3. Dr. N. Edirisinghe Director/STD/AIDS | | | WHO | WHO | WHO |
| | 4. Ms. Savithri Wijesekara Executive Officer, Women's Development Centre | | | WHO | WHO | WHO |
| 03. | 2. Dr. Nihal Abeysinghe | Regional Conference of Ministers of Health Agriculture/Livestock on Avian Influenza | India 27th-30th July 2006 | | WHO | WHO |

| No. | Name | Reason | Country | Expenses | | |
|---|---|---|---|---|---|---|
| | | | | Incidental Expenses | Air Fare | Living Expenses |
| 04. | 1. Dr. Nimal Edirisinghe National AIDS Control | 16th International Conference on AIDS (Participants 1,2,3) | Toronto Canada 13th-18th August 2006 | WHO | WHO | WHO |
| | 2. Dr. Sujatha Samarakoon Consultant, Veneriologist | 24th Meeting of Ministers of Health of the Member States Of WHO South-East | Dhaka, Bangladesh 21st-21st August 2006 | WHO | WHO | WHO |
| | 3. Dr. H. A. P. Kahandaliyanage DGHS | Asia Region (participants 1,4,5) | | WHO | WHO | WHO |
| | 4. Dr. S. M. Samarage, Acting DDG (Planning) | 59th Session of the WHO Regional Committee for South East Asia. (participants 1,4,5) | | WHO | WHO | WHO |
| 05. | 1. Dr. H. A. P. Kahandaliyanage DGHS | 59th Session of the WHO Regional Committee of South-East Asia. | Bangladesh 22nd-25th August 2006 | Rs. 18,605.00 | WHO | Rs. 52,706.00 |
| | 2. Dr. S. M. Samarage Actg. DDG (P) | | | Rs. 18,605.00 | WHO | Rs. 52,706.00 |

**Foreign visits of the Hon. Minister in 2007**

| No. | Name | Reason | Country | Expenses | | |
|---|---|---|---|---|---|---|
| | | | | Incidental Expenses | Air Fare | Living Expenses |
| 01. | 1. Dr. Palitha Abeykoon | 120th Session of the Executive Board | Switzerland 22nd-25th January 2007 | WHO | WHO | WHO |
| 02. | 1. Mr. R. Pushpa Kumara Minister of Health/UVA | PGA's Parliamentary Seminar Series on HIV/AIDS | Pakistan 9th-11th April 2007 | Rs. 15,302.00 | UNAIDS | UNAIDS |
| | 2. Mr. Gamini Thilakasiri Minister of Housing/Western | | | Rs. 15,302.00 | UNAIDS | UNAIDS |
| 03. | 1. Dr. Y. D. N. Jayathilaka<br>2. Dr. Sujatha Samarakoon | Commonwealth Health Ministers Meeting & 60th World Health Assembly | Geneva 10th-23rd May 2007 | Rs. 19,755.00 | Rs. 176,385.00<br>Rs. 96,200.00 | Rs. 348,417.00<br>Rs. 165,883.00 |
| 04. | Dr. Ajith Mendis | Fourth International AIDS Society Conference 73rd Ministers Meeting | Australia 22nd-25th July | Rs. 19,988.00 | Govt. of Australia | Govt. of Australia |
| 05. | 1. Dr. H. A. P. Kahandaliyanage<br>2. Dr. S. M. Samarage<br>Palithe Abeykoon | 25th Meeting of Health Ministers of WHO South-East Asia Region & 60th of The WHO Regional Committee | Bhutan 31st August-3rd Sep. 2007 | Rs. 8598.00<br>Rs. 20,063.00<br>Rs. 19,892.00 | WHO<br>WHO<br>WHO | WHO<br>WHO<br>WHO |
| 06. | 1. Dr. Wimal Jayantha DDG (Medical Services) | 9th Meeting of the Commission on Social Determinants of Health | China 24th-26th October 2007 | Rs. 13,012.00 | WHO | WHO |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2 - 0067/'08-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3 - 0073/'08-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5 - 0324/'08-(1), ගරු රංජිත් අලුවිහාරේ මහතා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කෝට්ටේගොඩ තැපැල් හල : ඉඩම
**கோட்டேகொட தபால்நிலையக் : காணி**
KOTTEGODA POST OFFICE : LAND

0325/'08

6. **ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,— (1) :

(අ) (i) මාතර, කෝට්ටේගොඩ තැපැල්හල පිහිටි ඉඩමෙන් කොටසක් කිසියම් ආයතනයකට හෝ පෞද්ගලික අයෙකුට පවරාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර අයෙකුට හෝ කවර ආයතනයකටද;

(iii) ඒ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඉඩම ධීවර පුස්තකාලයක් ඉදිකිරීම සඳහා වෙන්කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி, காணி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) மாத்தறை, கோட்டேகொட தபால் நிலையம் அமைந்துள்ள காணியின் ஒரு பகுதி நிறுவனமொன்றுக்கோ தனியார் ஒருவருக்கோ கையளிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா,

(ii) அவ்வாறாயின், அது எந்த நபருக்கு அல்லது எந்நிறுவனத்துக்கு,

(iii) எந்தக் காரணத்துக்காக

இக்காளன்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இக்காணி மீனவர் நூல் நிலையமொன்றுக்காக ஒதுக்கப்பட்டிருந்ததென்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Land Development,—(1) :

(*a*) Will he inform this House—

(i) whether arrangements have been made to transfer a portion of the land on which the Matara, Kottegoda Post Office is located, to some institution or a private individual;

(ii) if so, the name of the person or the institution; and

(iii) the reason for doing so?

(*b*) Will he admit the fact that the aforesaid land had been reserved for the construction of a fisheries library?

(*c*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) නැත. (තැපැල් දෙපාර්තමේන්තුවට පමණක් භාර දී ඇත.)
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.

(ආ) මෙම ඉඩම ධීවර පුස්තකාලයක් ඉදි කිරීම සඳහා වෙන් කර නැත.

(ඇ) මෙම ඉඩම අත් කර ගෙන ඇත්තේ කෝට්ටේගොඩ තැපැල් කාර්යාලය ඉදි කිරීම සඳහාය. මෙම ඉඩමේ විශාලත්වය හෙක්ටයාර් 0.131ක් වන අතර තැපැල් කාර්යාලය හැර වෙනත් ගොඩනැඟිලි ඉදි කිරීමට ප්‍රමාණවත් නැත.

## එච්. එම්. ගුණරත්න මහතා: හිඟ වැටුප්
**திரு. எச. எம். குணரத்ன : நிலுவைச் சம்பளம்**
MR. H. M. GUNARATHNA : SALARY ARREARS

0328/'08

7. **ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය —(1) :

(අ) (i) බඩල්කුඹුර, 11 වැනි සැතපුම, අංක 265 ලිපිනයෙහි එච්.එම්.ගුණරත්න මහතා 2002 පළාත් පාලන මැතිවරණයෙන් බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ සභාපතිධුරයට පත්වූ බවත්;

[ගරු රංජිත් අලුවිහාරේ මහතා]

(ii) 2002.04.15 වැනි දින සිට 2006.04.15 වැනි දින දක්වා එම ප්‍රාදේශීය සභාවේ කටයුතු කළ බවත්;

(iii) එම කාලය තුළ ගුරු සේවයේ නිවාඩු අනුමත කරගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බඩල්කුඹුර මො/නිශ්ශංක ජාතික පාසලේ ගුරුවරයෙකු ලෙස සේවය කරමින් සිටි මොහුට 2006.04.15 වැනි දින සිට මේ දක්වා මාසික වැටුප් හා උසස්වීම් ලබා නොදෙන්නේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ගුරු සේවයේ නිවාඩු අනුමත කර ගැනීම සඳහා විධිමත් පරිදි කටයුතු කර ඇති මෙම ගුරුවරයාට හිඟ වැටුප් හා උසස්වීම් ලබා දීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) படல்கும்புற, 11 ஆம் கட்டை, இலக்கம் 265 முகவரியில் வதியும் திரு. எச். எம். குணரத்ன 2002 இல் நடைபெற்ற உள்ளூராட்சி மன்றத் தேர்தலில் படல்கும்புற பிரதேச சபையின் தலைவர் பதவிக்கு தெரிவு செய்யப்பட்டாரென்பதையும்,

(ii) 2002.04.15 ஆம் திகதியில் இருந்து 2006.04.15 ஆம் திகதி வரை மேற்படி பிரதேச சபையில் பணியாற்றினாரென்ப தையும்,

(iii) அக்காலப்பகுதியில் ஆசிரியர் சேவையின் லீவுக்காக அனுமதி பெற்றிருந்தாரென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) படல்கும்புற மொ/நிஸ்ஸங்க தேசிய பாடசாலையில் ஆசிரியராக சேவையாற்றிக் கொண்டிருந்த இவருக்கு 2006.04.15 ஆம் திகதியில் இருந்து இற்றைவரை மாதச் சம்பளமும் பதவியுயர்வும் வழங்கப்படாமைக்கான காரணம் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) ஆசிரியர் சேவையில் லீவுக்கான அனுமதி பெற்றுக் கொள்ள முறையாக நடவடிக்கை மேற்கொண்டுள்ள இந்த ஆசிரியருக்கு நிலுவைச் சம்பளத்தையும் பதவியுயர் வையும் வழங்க அவர் நடவடிக்கை எடுப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education, :

(*a*) Is he aware that—

(i) Mr. H.M. Gunarathna of No.265, 11th mile post, Badalkumbura, was elected to the post of Chairman of the Badalkumbura Pradeshiya Sabha at the Local Government Election held in the year 2002;

(ii) he performed his duties as the Chairman of that Pradeshiya Sabha from 15.04.2002 up to 15.04.2006; and

(iii) he got his leave in the teaching service approved for the aforesaid period?

(*b*) Will he inform this House as to why monthly salaries and promotions have not been granted to Mr. Guna rathne, who has been serving as a Teacher at Mo / Nishshanka National School in Badalkumbura, from 15/04/2006 up to now?

(*c*) Will he take necessary action to grant arrears and pro motions to this teacher who has taken action to get his leave approved in the Teachers' Service in the proper manner?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්

(ආ) 2006/04/15 වැනි දින සිට මෙම ගුරු මහතාට මාසික වැටුප් ගෙවා ඇති බව මොනරාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දන්වා එවා ඇත. එනමුත් ගුරු සේවයේ උසස්වීම් ලබා දීමට අදාළව සේවා කාලය පදනම් කර ගෙන උපයා ගත යුතු ලකුණු ප්‍රමාණය ලබා ගෙන ඇතත්, ඒ මහතාගේ සක්‍රිය සේවා කාලය ඔහු විසින් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හේතුවෙන් අඩු වී ඇත. එබැවින් උසස්වීම් ලබා දීමට නොහැකි වී ඇත.

(ඇ) ගුරු සේවයේ උසස්වීම් ලබා දීමේදී එම උසස්වීම් සඳහා සලකා බැලෙන සේවා කාලයේ ඇති සියලුම වැටුප් රහිත නිවාඩු එම නිලධාරියාගේ සේවා කාලයෙන් අඩු කර සක්‍රිය සේවා කාලය ගණනය කළ යුතු අතර, ඒ අනුව කටයුතු කළ විට උසස්වීම් සඳහා සුදුසුකම් ලබා ගත යුතු සේවා කාලය සම්පූර්ණ කර නැත.

(ඈ) අදාළ නොවේ.

## නන්දන බාලසූරිය මහතා : මුදල් වංචාව
### திரு. நந்தன பாலசூரிய : நிதி மோசடி
### MR. NANDANA BALASOORIYA : FINANCIAL FRAUD

0511/'08

11. **ගරු රංජිත් අලුවිහාරේ මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - சார்பாக)
(The Hon. Ranjith Aluvihare on behalf of The Hon. Gamini Jayawickrama Perera)

ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය — (1) :

(අ) දැනට, උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන නන්දන බාලසූරිය මහතා එම තනතුරට පත්වීමට පෙර උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ උඩුබද්දාව සමෘද්ධි බැංකු කලාපයේ කළමනාකරුවෙකු වශයෙන් සේවය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඔහු උඩුබද්දාව සමෘද්ධි බැංකු කලාපයේ කළමනාකරුවෙකු වශයෙන් සේවය කරමින් සිටියදී රුපියල් ලක්ෂ පහක (රු. 500,000.00) මුදල් වංචාවකට හසුව වැඩ තහනමට ලක්ව සිටි බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම වංචා සම්බන්ධයෙන් සමෘද්ධි අධිකාරිය මගින් මොහුට විරුද්ධව ආරම්භ කර ඇති පරීක්ෂණයේ වත්මන් තත්ත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙහි පැමිණිලි පාර්ශ්වය වන සමෘද්ධි අධිකාරිය වෙනුවෙන් පෙනී සිටින විමර්ශන නිලධාරි සරත් විජේවර්ධන මහතා හා අභ්‍යන්තර විගණන නිලධාරි අනුරවංශ මහතාගෙන් විනය පරීක්ෂක නිලධාරි වන පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම්වරයාට මෙම පැමිණිල්ල කඩිනමින් විභාග කිරීම සඳහා නිසි සහයෝගයක් නොලැබෙන බව හා එම නිලධාරීන් විත්තිකාර පාර්ශ්වයට වාසි වන ලෙස කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඉ) ඉහත පරීක්ෂණය අපක්ෂපාතී ලෙස කඩිනමින් නිම කිරීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඊ) අදාළ පරීක්ෂණයෙන් හෙළිවූ කරුණු එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

தேசத்தைக் கட்டியெழுப்புதல், தோட்ட உட்கட்டமைப்பு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) தற்போது உடுபத்தாவ பிரதேச சபையில் தலைவராக பணியாற்றும் திரு. நந்தன பாலசூரிய அப்பதவியில் நியமனம் பெறுவதற்கு முன்னர் உடுபத்தாவ பிரதேச செயலாளர் பிரிவில் உடுபத்தாவ சமுர்த்தி வங்கி வலயத்தில் முகாமையாளராகப் பணியாற்றியுள்ளா ரென்பதை அவர் அறிவாரா?

(ஆ) இவர் உடுபத்தாவ சமுர்த்தி வங்கி வலயத்தில் முகாமையாளராக பணியாற்றிய காலத்தில் ஐந்து இலட்சம் ரூபாய் (5,00,000 ரூபா) மோசடி செய்தமை காரணமாக தொழிலிருந்து இடைநிறுத்தப்பட்டிருந்தார் என்பதை அவர் அறிவாரா?

(இ) மேற்படி மோசடி சம்பந்தமாக சமுர்த்தி அதிகாரசபை இவருக்கெதிராக ஆரம்பித்த விசாரணையின் தற்போதைய முன்னேற்றம் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இம் முறைப்பாட்டாளராகிய சமுர்த்தி அதிகாரசபையின் சார்பில் பணியாற்று கின்ற விசாரணை உத்தியோகத்தர் திரு. சரத் விஜேவர்தன, உள்ளக கணக்காய்வு உத்தியோகத்தர் திரு. அநுரவங்ச, ஒழுக்காற்று விசாரணை உத்தியோகத்தர் திரு. பொல்பித்திகம ஆகியோர், மேற்படி விசாரணையை துரிதமாக மேற்கொள்வதற்காக பிரதேச செயலாளருக்கு போதிய ஒத்துழைப்பினைப் பெற்றுத்தராமை, மற்றும் பிரதிவாதி களுக்கு அனுகூலம் கிடைக்கக் கூடிய வகையில் செயலாற்றுகின்றமை பற்றி அவர் அறிவாரா?

(உ) மேற்படி விசாரணையை பக்கச்சார்பற்ற முறையில் துரிதமாக மேற்கொள்ள அவர் நடவடிக்கை மேற்கொள்வாரா?

(ஊ) மேற்படி விசாரணையின்போது வெளிப்படுத்தப்பட்ட தரவுகளை அவர் இச்சபைகக்கு அறிவிப்பாரா?

(எ) இன்றேல், ஏன்?



asked the Minister of Nation Building and Estate Infrastructure Development :

(*a*) Is he aware that Mr. Nandana Balasooriya, who is now serving as the Chairman of the Udubaddawa Pradeshiya Sabha had served as a Manager of the Udubaddawa Samurdhi Bank Zone in Udubaddawa Divisional Secretariat Division before he was appointed to the post held by him at present?

(*b*) Will he admit that he had been interdicted from service as he was involved in a financial fraud of five lakhs (Rs.500,000/=) when he was serving as a Manager of the Udubaddawa Samurdhi Bank Zone?

(*c*) Will he inform this House of the current situation of the investigation that has been initiated against him by the Samurdhi Authority, with regard to the above mentioned frauds?

(*d*) Is he aware that Polpithigama Divisional Secretary, the Disciplinary Inquiry Officer, does not get the required cooperation from the Investigation Officer Mr. Sarath Wijewardhana and the Internal Audit Officer Mr. Anurawansha who appear on behalf of the Samurdhi Authority, which is the party that has made the complaint, for looking into this complaint expeditiously and the above mentioned officers act in a manner that is favorable to the party which has been accused of committing the above mentioned fraud?

(*e*) Will he take necessary action to conclude the aforesaid investigation impartially and expeditiously?

(*f*) Will he submit to this House the facts disclosed at the aforesaid inquiry?

(*g*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** සභා මේසය මත තබන ලද පිළිතුර** *:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) ඔව්.

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන බී. එම්. ටී. නන්දන බාලසූරිය මහතා 1999.08.02 වෙනි දින සිට කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි කළමනාකරු තනතුරට පත්ව සේවය කර ඇත.

(ආ) උඩුබද්දාව සමෘද්ධි බැංකු කලාපයේ කළමනාකරුවකු ලෙස රාජකාරි කටයුතු කරමින් සිටියදී රුපියල් ලක් පහක (රු.500,000.00) ඍජු මුදල් වංචාවකට මෙම නිලධාරියා චෝදනා ලබා නැතත්, තමන්ගේ අධීක්ෂණය යටතේ සිටි සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් ගනුදෙනුකරුවන්ගෙන් එකතු කරන ලද රුපියල් හාරලක්ෂ අසූහත්දහසක (රු. 487,000.00) මුදලක් බැංකු සංගමයට භාර නොදීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයට ලක් නොකිරීම් හා චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව රුපයිල් විසිපන්දහසක (රු. 25,000) සබඳ ණය නිකුත් කිරීම සම්බන්ධයෙන් රාජකාරි පැහැර හැරීම් හා චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිය කටයුතු කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා ඇත. ඒ අනුව ඔහුගේ වැඩ තහනම් කර ඇත.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(ඇ) ඔව්.

මෙම නිලධාරියාට විරුද්ධව විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කර පවත්වා ගෙන යන අතරතුරදී නන්දන බාලසූරිය මහතා 2008.03.28 වෙනි දින හදිසියේම මිය ගිය බැවින් විනය පරීක්ෂණ කටයුතු අත් හිටුවීමට ඒක පුද්ගල විනිශ්චය සභාව තීරණය කර ඇත.

(ඈ) විමර්ශන නිලධාරි හා අභ්‍යන්තර විගණන නිලධාරි වෘත්තිකාර පාර්ශ්වය වෙනුවෙන් වාසි දායක වන අයුරින් කටයුතු කිරීම් පිළිබඳව කරුණු හෙළිදරව් වී නැත.

විමර්ශන නිලධාරි සරත් විජේවර්ධන මහතා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් විශ්‍රාම ලබා ඇති හෙයින් එම පරීක්ෂණයේ පැමිණිල්ල මෙහෙයවීම සඳහා වෙනත් නිලධාරියෙක් පත් කර ඇත. විනය පරීක්ෂණ නිලධාරියා ලෙස කටයුතු කරනු ලැබූ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම්වරයාට ද ඔහුගේ රාජකාරි බහුලත්වය හේතු කොට ගෙන එකී විනය පරීක්ෂණ තව දුරටත් ඉදිරියට ගෙන යාමට නොහැකි බව දැන්වීමත් සමඟම වෙනත් නිලධාරියෙක් ඒ සඳහා පත් කළ අතරතුරදී උඩුබද්දාව සමෘද්ධි බැංකු සංගමයේ කළමනාකරු හදිසියේ මිය යාම නිසා ඔහුට විරුද්ධව මෙම විනය පරීක්ෂණය පවත්වා ගෙන යාමේ හැකියාවක් නොපවතී. ඔහු මිය ගිය බව සනාථ කරන ලිපි තුනක් ඇමුණුම් අංක 01, 02 හා 03 වශයෙන් මෙම පිළිතුරු ලිපියට අමුණා ඇති අතර, මුද්‍රිත ශෝක ප්‍රකාශයේ ඡායා පිටපතක් ද අමුණා ඇත.

(ඉ) විනය පරීක්ෂණ කටයුතු අපක්ෂපාතීව පවත්වා ගෙන ගිය අතර, සමෘද්ධි කළමනාකරු මිය යාම නිසා විනය පරීක්ෂණය ඉදිරියටත් පවත්වා ගෙන යාමේ හැකියාවක් නොපවතී.

(ඊ) පරීක්ෂණය මේ වන තුරු අවසන් කර නැති අතර, කළමණාකරුට විරුද්ධව පරීක්ෂණ අත් හිටුවා ඇත. නමුත් මෙම පරීක්ෂණයට අදාළ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 20 දෙනා අතුරින් දෙ දෙනෙක් හැර සෙස්සෝ ඔවුන් ලබා ගත් මුදල් පියවා ඇති අතර, ඒ. රංජීව සම්පත්ගෙන් රු. 80,300.00ක් ද, ඒ. ජී. ප්‍රමිලා ගුණතිලකගෙන් රු. 84,900.00ක් ද අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ගෙන යමින් පවතී.

(උ) අදාළ නොවේ.

ඇමුණුම් - 01

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
උඩුබද්දාව,
2008.04.11 දින

එස්. මඩවල ගමගේ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති විමර්ශන),
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
බත්තරමුල්ල.

විධිමත් විනය පරීක්ෂණය - බී. එම්. ටී. නන්දන බාලසූරිය මයා
සමෘද්ධි කළමනාකරු - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩුබද්දාව

උක්ත කරුණට අදාළව ඔබේ අංක : ස/අධි/2/විම/04/10/11 හා 2008.03.31 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව සමෘද්ධි කළමනාකරු බී. එම්. ටී. නන්දන බාලසූරිය මයා 2008.03.27 වන දින හදිසියේ අභාවප්‍රාප්ත වී ඇත. ඔහුට විරුද්ධව විනය පරීක්ෂණ කටයුතු පැවැත්වීම අනවශ්‍ය බව දන්වමි. එහෙත් එම චෝදනාවට අදාලව වෙනත් සමෘද්ධි නිලධාරීන් ඇත්නම් ඔවුන් සම්බන්ධයෙන් තව දුරටත් පරීක්ෂණ කටයුතු කරගෙන යන ලෙස දන්වමි.

අත්සන් කළේ :

ප්‍රාදේශීය ලේකම්, උඩුබද්දාව,
ඩබ්ලිව්. එම්. සී. කේ. විජේකුරුප්පු
සහකාර ප්‍රාදේශීය ලෙකම්
ප්‍රාදේශීය ලේකම් වෙනුවට
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය
උඩුබද්දාව.

පිටපත් : 01. දිස්ත්‍රික් ලේකම්, කුරුණෑගල - දැ: ගැ: පි :
02. එච්. එම්. ආරියවංශ මයා - දැ: ගැ: පි :
03. වජිර කුඹුරුගමුව මහතා - දැ: ගැ: පි :
04. අයි. එස්. එස්. ගුණතිලක මිය - දැ: ගැ: පි :
05. අධ්‍යක්ෂ (ආයතන) - දැ: ගැ: පි :
06. අධ්‍යක්ෂ (මුදල්) - දැ: ගැ: පි :

ඇමුණුම - 02

එච්. ඒ. ආරියවංශ,
2102,
ආටිගල මාවත,
කොළමුන්න,
පිළියන්දල.
2008.05.14

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
4 වන මහල,
සෙත්සිරි පාය,
බත්තරමුල්ල.

විධිමත් විනය පරීක්ෂණය - බී. එම්. ටී. නන්දන බාලසූරිය මහතා
සමෘද්ධි කළමනාකරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩුබද්දාව
ඔබේ අංකය : ස/අධි/2/විම/04/10/II

ඉහත විනය පරීක්ෂණය හා සම්බන්ධවයි.

වූදිත බී. එම්. ටී. නන්දන බාලසූරිය මහතා 2008.03.28 දින හදිසියේ අභාවප්‍රාප්ත වී ඇති බව උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් තහවුරු කර ගතිමි. ඒ අනුව වූදිත මිය ගොස් ඇති නිසා ඔහුට විරුද්ධව මෙම විනය පරීක්ෂණය පවත්වාගෙන යාමේ හැකියාවක් නොමැති බව මින් දන්වමි.

අත්සන් කළේ :

එච්. ඒ. ආරියවංශ,
ඒක පුද්ගල විනිශ්චය සභාව,
ශ්‍රී ලංකා පරිපාලන ශ්‍රේණිය 1

පිටපත් : 01. ප්‍රාදේශීය ලේකම් උඩුබද්දාව - දැ: ගැ: පි :
02. අයි. එස්. එස්. ගුණතිලක මිය, "සරුවන්" හල්පාය, මැටිකුඹුර, පැමිණිල්ල මෙහෙයවීම - දැ: ගැ: පි :

ඇමුණුම - 03

ඩබ්. රංජනී වීරකෝන්,
ගුරු නිවාසය
කුලි/මධ්‍ය විද්‍යාලය
කුලියාපිටිය.
2008.05.21

සමෘද්ධි අධ්‍යක්ෂක ජනරාල්තුමා,
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
4 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ගරු අධ්‍යක්ෂ ජනරාල්තුමනි.

සමෘද්ධි කළමණාකරු බී. එම්. ටී. නන්දන බාලසූරිය මහතා

උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, උඩුබද්දාව සමෘද්ධි බැංකු සංගමයේ කළමණාකරු ලෙස සේවය කරමින් සිටි බී. එම්. ටී. නන්දන බාලසූරිය මහතා මාගේ නීත්‍යානුකූල ස්වාමි පුරුෂයා වේ. ඔහු සම්බන්ධයෙන් ඔබතුමාගේ අංක ස/අධි/2/විම/4/10/II හා 2004.06.24 දින දරණ චෝදනා පත්‍රය නිකුත් කර තිබුණ බවත්, ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කළ බවත් මම දනිමි. එම පරීක්ෂණයේ පළමු සැසිය 2005.09.29 දින ආරම්භ කර 2006.06.19 දින වන විට සැසි හතරක් පවත්වා තිබුණි. එහෙත් සාක්ෂි කරුවෙකුගේ සාක්ෂි විමසා තිබුණේ 2006.01.27 පැවති දෙවෙනි සැසි වාරයේ දී පමණි. අනෙක් සැසි වාර තුනම යම් යම් හේතූන් මත පරීක්ෂණය කල් දමා තිබුණු බව පැහැදිලිය. මේ අනුව මගේ ස්වාමි පුරුෂයා සම්බන්ධයෙන් පවත්වන ලද ඉහත පරීක්ෂණය ආරම්භක අවස්ථාවේ පවතින බව ප්‍රකාශ කරමි.

මාගේ ස්වාමිපුරුෂයා 2008.03.27 දින කොළඹ ආසිරි රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියයන ලදි. ඔහුගේ මරණ සහතිකයේ පිටපතක් මෙයට යා කර ඇත. ඔහු මියයාමත් සමඟ අවුරුදු 13ක් වන දියණිය සහ වයස අවුරුදු 10 ක පුතා සමඟ මම මහත් අසරණ භාවයට පත්ව සිටිමි. අපටම කියා නිවසක් ද නොමැති අප දැනට ජීවත් වනුයේ ගුරු නිවාසයේය. මේ කරුණු අනුව මගේ ස්වාමි පුරුෂයා මිය යන විටත් රැකියාවේ සිටියා සේ සලකා ඔහු වෙනුවෙන් හිමි සියළු වැටුප් හා දීමනා ආදිය මා වෙත ලබා දීමට කටයුතු කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. මේ පිළිබඳව ඔබතුමාගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

මෙයට,
විශ්වාසී

අත්සන් කළේ
ඩබ්. රංජනී වීරකෝන්

පිටපත්
1. දිස්ත්‍රික් ලේකම්තුමිය, කුරුණෑගල - දැ.ගැ.පි.
2. සහකාර සමෘද්ධි කොමසාරිස් - දැ.ගැ.පි.
3. ප්‍රාදේශීය ලේකම් උඩුබද්දාව - දැ.ගැ.පි.




**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12-0512/'08(01), ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා මහතා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සහල් ආනයනය : විස්තර
### அரிசி இறக்குமதி : விபரம்
RICE IMPORTS : DETAILS

0513/'08

13. **ගරු රංජිත් අලුවිහාරේ මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - சார்பாக)
(The Hon. Ranjith Aluvihare) on behalf of The Hon. Gamini Jayawickrama Perera)

වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ) 2007 වර්ෂයේ විදේශ රටවලින් සහල් ආනයනය කිරීමට පියවර ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස සහල් ආනයනය කළ රටවල්, ආනයනය කළ සහල් ප්‍රමාණය, සහල් කිලෝ 01 ක් මිලදී ගත් මිල, සහල් ගෙන්වූ දේශීය නියෝජිතයින්ගේ නම් හා දේශීය වෙළෙඳපොළෙහි මෙම සහල් කිලෝ 01ක් අලෙවි වන මිල කවරේද;

(ii) 2007 වර්ෂයේ ලංකාවේ රජයේ ගබඩාවල තිබූ සහල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම සහල් ප්‍රමාණය දේශීය වෙළෙඳ පොළෙහි අලෙවි කිරීමට ලබා දුන් ආයතන, එම ආයතන වලට සහල් කිලෝ 01ක් ලබා දුන් මිල හා දේශීය වෙළෙඳ පොළෙහි එම සහල් අලෙවි කළ මිල වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தகம், சந்தைப்படுத்தல் அபிவிருத்தி, கூட்டுறவுத்துறை, நுகர்வோர் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா :

(அ) 2007 ஆம் ஆண்டு வெளிநாடுகளிலிருந்து அரிசி இறக்குமதி செய்வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதை அறிவாரா?

(ஆ) (i) இவ்வாறு அரிசி இறக்குமதி செய்த நாடுகள், இறக்குமதி செய்த அரிசியின் அளவு, ஒருகிலோ அரிசி கொள்வனவு செய்யப்பட்ட விலை, அரிசி இறக்குமதி செய்த உள்நாட்டு முகவர்களின் பெயர்கள் மற்றும் உள்நாட்டுச் சந்தையில் இவ்வரிசி ஒரு கிலோ விற்பனையாகும் விலை என்ன என்பன யாவை,

(ii) 2007 ஆம் ஆண்டு இலங்கையில் அரச களஞ்சியங்களில் இருந்த அரிசியின் அளவு எவ்வளவு

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இந்த அரிசியினை உள்நாட்டுச் சந்தையில் விற்பனை செய்வதற்காக வழங்கப்பட்ட நிறுவனங்கள், இந்நிறுவனங்களுக்கு ஒரு கிலோ அரிசி பெற்றுக் கொடுக்கப்பட்ட விலை மற்றும் உள்நாட்டுச் சந்தையில் இவ்வரிசி விற்பனை செய்யப்பட்ட விலை தனித்தனியாக யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Marketing Development, Co-operatives and Consumer Services,- :

(*a*) Is he aware that steps were taken in the year 2007 to import rice from foreign countries?

(*b*) Will he inform this House—

(i) the names of the countries from which rice was imported as mentioned in (a) above, the amount of rice that was imported, the purchasing price of one kilo of rice, the names of the local agents who imported rice and the selling price of one kilo of rice in the local market; and

(ii) the amount of rice that was there in the stores of the Government of Sri Lanka in the year 2007?

(c) Will he state separately, the names of the institutions to which the said amount of rice was provided to be sold in the local market, the price at

[ගරු රංජිත් අලුවිහාරේ මහතා]

which one kilo of rice was provided to the aforesaid institutions and the selling price of the aforesaid rice in the local market?

(*d*) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunaardena)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර *** සභාගත** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) ඔව්.

(ආ) (i) ඇමුණුම අංක 01 හි දක්වා ඇත.

(ii) 2007 වර්ෂයේ රජයේ ගබඩාවල සහල් කිලෝ ග්‍රෑම් 9,104,122ක් තිබුණි.

(ඇ) එම සහල් සමෘද්ධි ලාභීන් වෙත රු. 30/- කට නිකුත් කිරීම සඳහා විවිධ සේවා සමුපකාර සමිති වෙත රු. 28/-කට ලබා දෙන ලදි.

(ඈ) අදාළ නොවේ.

ප්‍රශ්න අංක 12-0512/'08(01), ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා මහතා.

ඇමුණුම් අංක 01

සහල් ආනයනය 2007
Rice Imports 2007

| | *සහල් ආනයනය කළ රටවල්*<br>*Name of The Country* | *ආනයනය කළ සහල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම්*<br>*Quantity Kg* | *සහල් කිලෝ 1ක් මිල දී ගත් මිල රුපියල්*<br>*Purchasing Price of 1Kg of Rice (Rs.)* | *සහල් ගෙන්වූ දේශීය නියෝජිතයන්*<br>*Name of The Local Agents* | *දේශීය වෙළෙඳ පළෙහි මෙම සහල් කිලෝ 1ක් අලෙවි වන මිල*<br>*Selling Price* |
|---|---|---|---|---|---|
| 1 | India | 4,000 | 99.95 | Omega Traders | Therw was no Maxium |
| 2 | Italy | 322 | 151.06 | Stassen Exports Ltd | Retail for rice fixed in |
| 3 | India | 25,000 | 58.25 | United Stores | year 2007 |
| 4 | India | 25,000 | 58.3 | United Stores | |
| 5 | Pakistan | 99,040 | 74.16 | United Stores | |
| 6 | India | 110,000 | 16.9 | A A Enterprises | |
| 7 | India | 275,000 | 48.89 | A J S | |
| 8 | India | 475,000 | 48.89 | A S P Sivanpillai | |
| 9 | Pakistan | 4,125 | 39.45 | A S P Sivanpillai | |
| 10 | India | 123,000 | 48.68 | A W M Nazeem | |
| 11 | India | 226,650 | 49.94 | Agrolanka Commodities | |
| 12 | India | 250,000 | 49.39 | Akurana Stores | |
| 13 | India | 1,125,000 | 48.49 | Amari Wills Lanka (Pvt) Ltd. | |
| 14 | Pakistan | 150,000 | 39.48 | Amari Wills Lanka (Pvt) Ltd | |
| 15 | India | 175,400 | 48.8 | Anbu Brothers | |
| 16 | Pakistan | 520,000 | 40.14 | Anthon Trading Co | |
| 17 | India | 1,896,950 | 48.65 | Anthon Trading Co | |
| 18 | India | 525,000 | 48.08 | Arvind Trading Company | |
| 19 | Pakistan | 112,000 | 77.05 | Arvind Trading Company | |
| 20 | India | 1,414,000 | 48.87 | Astra Trading & Company | |
| 21 | Pakistan | 75,000 | 39.99 | Bakers Point | |
| 22 | India | 25,000 | 38.76 | Bala Brothers | |
| 23 | Pakistan | 98,000 | 75.87 | C W E | |
| 24 | Pakistan | 40,980 | 90.76 | Cargills Ceylon Ltd | |
| 25 | India | 425,000 | 48.84 | Ceylon Food City | |
| 26 | India | 125,000 | 48.83 | Chandana Stores | |
| 27 | India | 475,000 | 49.26 | Chandara Stores | |
| 28 | Pakistan | 700,000 | 39.65 | Chandara Stores | |
| 29 | India | 500,000 | 52.49 | City Centre | |
| 30 | India | 500 | 46.66 | David Gram Stores | |
| 31 | Pakistan | 400,000 | 38.77 | Devi Trading Co | |
| 32 | India | 823,000 | 46.5 | Devi Trading Co | |
| 33 | Pakistan | 428,275 | 61.54 | Dharan Impex | |
| 34 | India | 147,000 | 48.91 | Earn Import | |
| 35 | Pakistan | 150,000 | 39.87 | Earn Import | |
| 36 | Australia | 19,172 | 304.64 | East West Foods Pvt Ltd | |
| 37 | Pakistan | 766,400 | 81.84 | East West Foods Pvt Ltd | |
| 38 | Thailand | 180,444 | 67.25 | East West Foods Pvt Ltd | |
| 39 | Singapore | 19,295 | 138.87 | East West Foods Pvt Ltd | |
| 40 | Singapore | 23,520 | 67.35 | East West Marketing Pvt Ltd | |
| 41 | Pakistan | 822,280 | 71.38 | East West Marketing Pvt Ltd | |
| 42 | Singapore | 37,717 | 111.63 | Edinborough Products | |
| 43 | Thailand | 85,830 | 70.74 | Edinborough Products | |
| 44 | Pakistan | 312,000 | 66.21 | Edinborough Products | |
| 45 | India | 1,500,000 | 32.25 | Eswara Bagawaan & Company | |
| 46 | Pakistan | 993,000 | 39.78 | Expolanka Commodities Pvt Ltd | |
| 47 | India | 497,890 | 48.71 | F S Traders | |
| 48 | Pakistan | 125,000 | 39.82 | F S Traders | |
| 49 | India | 25,000 | 50.2 | G G D M Sampath Sudharshana | |
| 50 | India | 200,000 | 48.36 | Gaurav Imports Pvt Ltd | |
| 51 | Japan | 735,000 | 33.76 | Global Engineering Technologies | |
| 52 | India | 2,149,450 | 48.21 | Global Enterprises | |
| 53 | Pakistan | 2,000,000 | 38.1 | Global Enterprises | |

| සහල් ආනයනය කළ රටවල් Name of The Country | ආනයනය කළ සහල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් Quantity Kg | සහල් කිලෝ 1ක් මිල දී ගත් මිල රුපියල් Purchasing Price of 1Kg of Rice (Rs.) | සහල් ගෙන්වූ දේශීය නියෝජිතයන් Name of The Local Agents | දේශීය වෙළෙඳ පළෙහි මෙම සහල් කිලෝ 1ක් අලෙවි වන මිල Selling Price |
|---|---|---|---|---|
| 54 Pakistan | 1,454,840 | 74.27 | Gnanam Imports Pvt Ltd | |
| 55 Thailand | 137,500 | 70.42 | Gnanam Imports Pvt Ltd | |
| 56 India | 3,275,000 | 46.62 | Gnanam Imports Pvt Ltd | |
| 57 Pakistan | 3,100 | 39.45 | Gold Star Enterprises | |
| 58 Thailand | 21,500 | 71.09 | Great Wall Tradings Pvt Ltd | |
| 59 Pakistan | 150,000 | 28.17 | Green Lanka Marketing | |
| 60 Pakistan | 1,008 | 117.42 | H E Marketing | |
| 61 India | 1,000 | 252.6 | Hotel Services Ceylon Ltd | |
| 62 Pakistan | 440,040 | 85.55 | Jeear | |
| 63 India | 50,000 | 48.84 | K K Krishanpillai & Co | |
| 64 India | 150,000 | 48.86 | Krishnakumar & Co | |
| 65 India | 677,000 | 39.20 | Lanka Sugar Trading Pvt Ltd | |
| 66 China | 1,000 | 87.59 | Ministry of Fisheries & Aquatic Resources | |
| 67 Japan | 2,439,999 | 33.71 | Ministry of Nation Building & Development | |
| 68 Thailand | 1,986,700 | 43.47 | Ministry of Nation Building & Development | |
| 69 Pakistan | 74,000 | 41.06 | MK Global Trading Co | |
| 70 India | 225,900 | 49.09 | Modern Chemicals | |
| 71 India | 25,000 | 48.83 | Mohamed Ali & Co pm | |
| 72 Pakistan | 22,520 | 75.59 | Mohamed Ali & Co pm | |
| 73 Pakistan | 1,021,750 | 40.8 | NB Foods Pvt Ltd | |
| 74 India | 2,452,000 | 48.27 | N B Foods Pvt Ltd | |
| 75 India | 79,200 | 58.66 | Omega Traders | |
| 76 India | 1,246,800 | 49.27 | P M Mohamedali & Co | |
| 77 Pakistan | 776.605 | 68.1 | P M Mohamedali & Co | |
| 78 India | 125,000 | 45.75 | Palligoda Trading Co | |
| 79 Pakistan | 250,000 | 39.45 | Palligoda Trading Co | |
| 80 Pakistan | 625,000 | 39.78 | Pearl Lanka Trades | |
| 81 India | 1,661,600 | 51.87 | Pearl Lanka Trades | |
| 82 Singapore | 625,000 | 47.62 | Pearl Lanka Trades | |
| 83 Pakistan | 25,000 | 75.95 | Premier Commodities | |
| 84 Pakistan | 499,950 | 62.64 | Quality Spices Co | |
| 85 India | 849,750 | 48.47 | R G Brothers | |
| 86 Pakistan | 418,400 | 67.91 | R T S Foods | |
| 87 India | 1,312,030 | 52.1 | R T S Foods | |
| 88 India | 48,500 | 48.83 | Rabiha Traders | |
| 89 Pakistan | 52,000 | 39.76 | Rupar Trading Co | |
| 90 Pakistan | 250,000 | 39.95 | S R Agency | |
| 91 India | 575,400 | 56.76 | S R Agency | |
| 92 Singapore | 750,000 | 45.36 | Senva Trading (Pvt) Ltd | |
| 93 Pakistan | 2,225,000 | 38.9 | Senva Trading (Pvt) Ltd | |
| 94 Pakistan | 24,000 | 74.39 | Serendib Imports & Exports | |
| 95 India | 75,000 | 48.83 | Shree Ram Impex | |
| 96 India | 222,000 | 49.31 | Siseva Pvt Ltd | |
| 97 Pakistan | 44,000 | 93.85 | S K S Accessories Pvt Ltd | |
| 98 Pakistan | 192,000 | 65.43 | Skyline Concepts | |
| 99 India | 22,250 | 56.32 | Sri ABI Impex | |
| 100 Pakistan | 1,603,975 | 48.26 | Sri Karthik Merchant | |
| 101 India | 2,068,350 | 48.36 | Sri Karthik Merchant | |
| 102 India | 5,370,000 | 46.56 | Sri Lanka Co-operatve Marketing Fedaration Ltd | |
| 103 Singapore | 500,000 | 46.49 | Sri Lanka Co-operation Societies Fedaration Ltd | |
| 104 Pakistan | 273,960 | 83.34 | Sri Lanka Co-operation Societies Fedaration Ltd | |
| 105 India | 250,000 | 45.75 | Sri Lanka Consumer Co-op Societies Fedaration Ltd | |
| 106 Pakistan | 48,000 | 85.65 | Sri Lanka Consumer Co-op Societiesfed Ltd | |
| 107 Singapore | 1,825,000 | 46.3 | Sri Lanka Consumer Co-op Societiesfed Ltd | |
| 108 India | 2,926,875 | 48.55 | Sri Thiruppathy Pvt Ltd | |
| 109 U. Arb. E | 81,640 | 99.23 | Sri Lankan Catering (Pvt) Ltd | |
| 110 Thailand | 39,250 | 62.22 | Sri Lankan Catering (Pvt) Ltd | |
| 111 Singapore | 525 | 45.5 | Stassen Exports Ltd | |
| 112 Pakistan | 93,000 | 69.95 | Stassen Exports Ltd | |
| 113 Pakistan | 99,610 | 58.31 | Sukiran Import Pvt Ltd | |
| 114 India | 50,200 | 48.64 | Sukiran Import Pvt Ltd | |
| 115 India | 125,000 | 48.93 | Sundar Traders (Pvt) Ltd | |
| 116 Pakistan | 1,426,485 | 46.15 | Sunil Traders | |

| | සහල් ආනයනය කළ රටවල් Name of The Country | ආනයනය කළ සහල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් Quantity Kg | සහල් කිලෝ 1ක් මිල දී ගත් මිල රුපියල් Purchasing Price of 1Kg of Rice (Rs.) | සහල් ගෙන්වූ දේශීය නියෝජිතයන් Name of The Local Agents | දේශීය වෙළෙඳ පළෙහි මෙම සහල් කිලෝ 1ක් අලෙවි වන මිල Selling Price |
|---|---|---|---|---|---|
| 117 | India | 7,043,710 | 45.07 | Sunil Traders | |
| 118 | Pakistan | 120,000 | 75.61 | Sunrise Food Products | |
| 119 | India | 532,024 | 51.03 | Suriyan | |
| 120 | India | 47,000 | 50.59 | Tastyy Pvt Ltd | |
| 121 | Pakistan | 1,154,270 | 58.63 | Tastyy Pvt Ltd | |
| 122 | U. King | 5,000 | 116.54 | Tess (Pvt) Ltd | |
| 123 | Pakistan | 173,080 | 69.05 | The Golden Key Trading Co Ltd (Celinco Center) | |
| 124 | China | 33,051 | 15.54 | Tian Yefa Traders Pvt Ltd | |
| 125 | Pakistan | 676,697 | 71.42 | United Stores | |
| 126 | India | 484,489 | 60.09 | United Stores | |
| 127 | Pakistan | 25,020 | 53.34 | United Traders | |
| 128 | Canada | 11,131 | 71.78 | V R M Brothers | |
| 129 | India | 100,000 | 48.83 | Vindana Impex | |
| 130 | India | 100.000 | 49.56 | Vishnu Imports | |
| 131 | India | 125,000 | 48.58 | Weligama Stores | |
| 132 | India | 225,000 | 47.96 | Wickramaratnes | |
| 133 | India | 4,576,750 | 48.2 | Wickramaratnes (Pvt) Ltd | |
| 134 | India | 400,000 | 49.1 | Wilson Stores | |
| 135 | Pakistan | 725,000 | 39.54 | Wilson Trading Company | |
| 136 | India | 125,000 | 48.83 | Wilson Trading Company | |
| 137 | India | 550,000 | 46.94 | Woodlands Company | |
| 138 | India | 525,000 | 47.3 | Y S Foods | |
| 139 | Pakistan | 2,000 | 38.7 | Y S Foods | |
| 140 | Vietnam | 5 | 68.6 | D & L Trading Pvt Ltd | |
| 141 | India | 6,430 | 29.83 | Daffodils Impex | |
| 142 | China | 10,555 | 51.33 | Great Wall Tradings Pvt Ltd | |
| 143 | India | 2,400 | 47.14 | Heylands Impex | |
| 144 | Japan | 137 | 191.28 | J E S Lanka Pvt Ltd | |
| 145 | India | 1,500 | 39.86 | Jayamini Enterprises | |
| 146 | S. Korea | 219 | 52.3 | Kolon Engineering & Construction Co Ltd | |
| 147 | India | 400 | 17.33 | Liyanage Distributors | |
| 148 | Pakistan | 1,250,000 | 38.72 | M. D. K. Food Products (Pvt) Ltd | |
| 149 | India | 15,080 | 40.24 | S S Import | |
| 150 | Japan | 1,814 | 42.63 | Sakura Resturant (Pvt) Ltd | |
| 151 | India | 40,934 | 49.68 | Sri Abi Impex | |
| 152 | India | 2,100000 | 46.49 | Sri Lanka Consumer Co-op Societies Fed Ltd | |
| 153 | Japan | 90 | 42.2 | Sumitomo Corporation | |
| 154 | Pakistan | 640 | 45.46 | Trade Base Lanka Pvt Ltd | |
| 155 | India | 7,650 | 49.13 | United Ventures | |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14 - 0536/08 - (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නොපැමිණීමේ අවසරය : ගරු සරත් රණවක මහතා

**வராதிருக்க அனுமதி : மாண்புமிகு சரத் ரணவக்க**

LEAVE OF ABSENCE : HON. SARATH RANAWAKA

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඊ) ව්‍යවස්ථාව යටතේ, කළුතර මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සරත් රණවක මහතාට 2008 ඔක්තෝබර් මස 09 වැනි දින සිට මාස තුනක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතු යැයි මම යෝජනා කරමි."

ගරු සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(மாண்புமிகு சரத்சந்திர ராஜகருணா)
(The Hon. Sarathchandra Rajakaruna)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

## විසර්ජන පනත් කෙටුම්පත, 2009
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2009
### APPROPRIATION BILL, 2009

"2009 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහාද; ඒ සේවා කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහාද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින්හෝ ආන්ඩුවේ හෝ ආන්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2008 නොවැම්බර් 6 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் உள்ளக நிருவாக அமைச்சரும் பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு, சட்டமும் ஒழுங்கும் பற்றிய பிரதி அமைச்சருமானவரின் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2008 நவம்பர் 06, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Internal Administration and Deputy Minister of Defence, Public Security, Law and Order*

*To be read a Second time upon Thursday, 6th November, 2008 and to be printed.*

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත් කෙටුම්පත
### பிரதேசிய சங்வர்த்தனை வங்கிச் சட்டமூலம்
### PRADESHIYA SANWARDANA BANK BILL

"1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද සංවර්ධන බැංකුවල වත්කම්, වගකීම්, ගිවිසුම්, සේවා නියුක්තිකයන් යනාදිය අන්තර්ග්‍රහනය කිරීමට සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා ද ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2008 ඔක්තෝබර් 21 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் உள்ளக நிருவாக அமைச்சரும் பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு, சட்டமும் ஒழுங்கும் பற்றிய பிரதி அமைச்சருமானவரின் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2008 ஒக்ரோபர் 21, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Internal Administration and Deputy Minister of Defence, Public Security, Law and Order*

*To be read a Second time upon Tuesday, 21st October, 2008 and to be printed.*

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත
### இலங்கை வீடமைப்பு அபிவிருத்தி நிதிக் கூட்டுத்தாபன வங்கி (திருத்தம்) சட்டமூலம்
### HOUSING DEVELOPMENT FINANCE CORPORATION BANK OF SRI LANKA (AMENDMENT) BILL

"1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2008 ඔක්තෝබර් 21 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் உள்ளக நிருவாக அமைச்சரும் பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு, சட்டமும் ஒழுங்கும் பற்றிய பிரதி அமைச்சருமானவரின் சார்பில் மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2008 ஒக்ரேபார் 21, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Prime Minister, Minister of Internal Administration and Deputy Minister of Defence, Public Security, Law and Order*

*To be read a Second time upon Tuesday, 21 October, 2008 and to be printed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද ප්‍රධාන කටයුතුවලට තිබෙන්නේ න්‍යාය පත්‍රයේ අංක 1 විෂයය සම්මත කිරීමයි. පරිපූරක මුදල් වැය ශීර්ෂය. අධ්‍යාපන අමාත්‍යාංශය. අ. භා. 3.30 සිට 4.30 දක්වා කල් තැබීමේ යෝජනාව.

## පරිපූරක මුදල : විභාග සඳහා ප්‍රතිපාදන
### குறைநிரப்புத்தொகை : பரீட்சைகளுக்கான நிதி ஏற்பாடு
### SUPPLEMENTARY SUPPLY : PROVISION FOR EXAMINATIONS

[පූ. භා. 9.47]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - சுகாதார நலத்துறை, போசணை அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Healthcare and Nutrition and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හාරසිය හතලිස් එක් මිලියන අටසිය දහසකට (රු. 441,800,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | |
|---|---|
| ශීර්ෂය 212 | - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන 2 | - සංවර්ධන ක්‍රියාකාරකම් |
| | පුනරාවර්තන වියදම් රු. 441,800,000 |
| | ප්‍රාග්ධන වියදම් රු. — |
| | එකතුව රු. 441,800,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳ පසුබිම් වාර්තාව හා ඒ විස්තර අධ්‍යාපන සේවා අමාත්‍ය ගරු නිර්මල කොතලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කරනවා ඇති.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නිර්මල කොතලාවල ඇමතිතුමා.

[පූ.භා. 9.48]

**ගරු නිර්මල කොතලාවල මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - கல்விச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Education Services)

ගරු කථානායකතුමනි, මා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව කරුණු පැහැදිලි කරන අතරම, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට මෙම අදාළ විස්තරයත් ඉදිරිපත් කරනවා.

ජාතික අවශ්‍යතාවන්වලට ගැළපෙන, විශ්වාසය සහ වලංගුතාව ආරක්ෂා වන පරිදි සකස් කරනු ලබන ඇගැයීම් උපකරණ හා ක්‍රම ශිල්ප මඟින් අධ්‍යාපනය හා සාධනය හා සහතිකකරණය පිළිබඳ ක්‍රියාකාරකම් විශිෂ්ටත්වය කරා මෙහෙය වීම අරමුණු කර ගනිමින් විභාග දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතිනවා වසරක් පාසා 5 වසර ශිෂ්‍යත්ව විභාගය, අපොස සාමාන්‍ය පෙළ, ඒ වාගේම අපොස උසස් පෙළ වැනි පාසල් විභාග මෙන්ම අනිකුත් ආයතනවලට අදාළ විෂයයන් සඳහා වන විභාග ඇතුළුව 260කට අධික ප්‍රමාණයක් විභාග පවත්වා ඒ විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේ වගකීම විභාග දෙපාර්තමේන්තුව සතුව පවතිනවා. ඒ වාගේම මේ විභාග සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සංඛ්‍යාව වසරින් වසර වැඩි වන අතර විභාග සංවිධාන කටයුතු සහ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා දැරීමට සිදු වන වියදමද වසරින් වසර වැඩි වන ප්‍රවණතාවක් පවතිනවා. ගරු කථානායකතුමනි, ඊට අමතරව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේද එකඟතාව ඇතිව උත්තර පත්‍ර ඇගැයීමේ කටයුතුවල නියැළෙන සම්පත් දායකයන්, ඒ වාගේම අනිකුත් සියලුම සේවා දායකයන්ට ගාස්තු ගෙවීම් 2008 වසරේදී සියයට 50කින් වැඩි කළා. පවතින තත්ත්වය මත 2007 සහ 2008 වසරවලදී ප්‍රවාහන සහ අනිකුත් වියදම් වැඩි වුණා. ඒ අනුව විභාග දෙපාර්තමේන්තුව විසින් 2007 වසරේදී පවත්වන ලද විභාගවල වියදම් දැරීම සඳහා ලැබුණු ප්‍රතිපාදන හා අත් මුදල් ප්‍රමාණවත් නොවුණු නිසා 2007 වසරේ අපොස උසස් පෙළ උත්තර පත්‍ර ඇගැයීම වෙනුවෙන් රුපියල් මිලියන 148ක්ද, ශ්‍රී ලංකා පරිපාලන සේවා හා ග්‍රාම සේවා, කළමනාකරණ සේවා, ලේඛන සහකාර වැනි ලේඛනගත නොවූ විභාග පැවැත්වීම සඳහාත්, ඒවායේ ඇගැයීම් කටයුතු වෙනුවෙනුත් රුපියල් මිලියන 188ක්ද, 2007 වසරේ අපොස සාමාන්‍ය පෙළ විභාග ඇගැයීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 256ක්ද මේ වසරේදී ගෙවීමට සිදු වුණා ගරු කථානායකතුමනි. ඒ අනුව 2008 වසරේදී අනුමත වූ මුළු ප්‍රතිපාදන වන රුපියල් මිලියන 692න් 2007 වර්ෂයේ විභාග සඳහා රුපියල් මිලියන 592ක් ගෙවූ පසු 2008 වසරේ විභාග කටයුතු සඳහා ඉතුරුව ඇත්තේ රුපියල් මිලියන 100ක් වැනි ප්‍රමාණයකි. මේ වර්ෂයේ අගෝස්තු මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ ඒ වාගේම පැවැත්වූ අපොස උසස් පෙළ විභාගය, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පරිපාලන සහ ඇගැයීම් ගාස්තු ගෙවීමටත්, දෙසැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත අපොස සාමාන්‍ය පෙළ සහ තොරතුරු තාක්ෂණ විභාගයේ පරිපාලන ගාස්තු ගෙවීමටත් රුපියල් මිලියන 588ක ප්‍රතිපාදන අවශ්‍ය වෙනවා. ගරු කථානායකතුමනි, විභාග වැය විෂයය යටතේ ඉතුරුව ඇති ප්‍රතිපාදනවලින්, වෙනත් වැය විෂයයන් යටතේ ඉතුරුව ඇති ප්‍රතිපාදනවලින් ආවරණය කර ගත හැක්කේ රුපියල් මිලියන 146ක් පමණයි. ඒ අනුව රුපියල් මිලියන 442ක ප්‍රතිපාදන ඌනතාවක් පවතිනවා. ප්‍රතිපාදන නොමැතිව විභාග පැවැත්වීමට නොහැකියි. ඒ වාගේම විභාග දෙපාර්තමේන්තුවේ අනෙකුත් පරිපාලන කටයුතු සහ ජාතික මට්ටමේ විභාග පැවැත්වීම විභාග දෙපාර්තමේන්තුව අඛණ්ඩව කළ යුතු බැවින් රුපියල් මිලියන 442ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර, ඒ සඳහා මෙම ගරු සභාවේ අනුමැතිය අපේක්ෂා කරනවා.

විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ වගේම විශේෂයෙන්ම ඉන්දියාවේ වෙසෙන සරණාගතයන් සඳහාත් විභාග පවත්වනවා මේ සියලු කාරණා සඳහා වැය වන අතිවිශාල මුදල් ප්‍රමාණය, ඒ වගේම වැය බර ඒ අදාළ වියදම් ඉක්මවා යන බැවින් මා මෙම පරිපූරක ඇස්තමේන්තුව මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මට ලබා දී තිබෙන කාලයෙන් විනාඩි 10ක් මගේ ගරු ඇමතිතුමාට ලබා දෙන්නය කියා ඉල්ලා සිටින අතර මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

[පූ.භා. 9.54]

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා අද මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුවට අවශ්‍ය මුදල් වෙන් කරන්නයි. විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබූ අපොස උසස් පෙළ විභාගයේ උත්තර පත්‍ර ඇගැයීම අද අර්බුදයකට; ප්‍රශ්නයකට ලක් වෙලා තිබෙන වෙලාවේ තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ. මේ අවුරුද්දේ අපොස උසස් පෙළ විභාගයේ උත්තර පත්‍ර අගයලා ලකුණු දෙන්න මේ ආණ්ඩුවට තවම බැරි වෙලා තිබෙනවා. මේක රජයේ අසාර්ථකභාවයේ, රජයේ බැරිකමේ හේතුවක් ලෙස මා දක්වනවා. අධිකරණයටත් මේ උත්තර පත්‍ර ඇගැයීම සම්බන්ධව ප්‍රශ්නය පැන නැඟුණා. මේ උත්තර පත්‍ර ඇගැයීම සම්බන්ධව විරුද්ධ වුණාය කියලා අද එක ගුරුවරයකු රිමාන්ඩ් කරලා, වැඩ තහනමටත් ලක් වෙලා ඉන්නවා. කොහොම නමුත් රජයට තවම මේ උත්තර පත්‍ර ඇගැයීම ඉවර කරන්න බැරි වෙලා තිබෙනවා. පහු ගිය 06 වැනි දා -ජාත්‍යන්තර ගුරු දිනය දවසේ- විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින් ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට කියලා තිබෙනවා, උත්තර පත්‍ර ඇගැයීම ඉවරයි, තව උත්තර පත්‍ර අගයන්න තිබෙන්නේ ගණිතය විෂයයෙන් සියයට 60කුත්, විද්‍යා විෂයයෙන් සියයට 60කුත් විතරයි කියා.

ගරු කථානායකතුමනි, ඔබතුමා අධ්‍යාපන ඇමතිවරයකු විධියට හිටපු නිසා මා කියන්න කැමැතියි මේ විභාග දෙපාර්තමේන්තුව -අධ්‍යාපන අමාත්‍යාංශය- අධිකරණයටත් ගිහිල්ලා බොරු කරලා තිබෙනවාය කියා. දැනටත් විභාග දෙපාර්තමේන්තුව ගණකාධිකරණය විෂයය, ව්‍යාපාර අධ්‍යයනය, භූගෝල විද්‍යාව, ඉතිහාසය කියන විෂයයන් සියල්ලේ ප්‍රශ්න පත්‍ර

අගයනවා. රජය අපොහොසත් වෙලා තිබෙනවා මේක අවසන් කරන්න. අද රජය අධිකරණයටත් බොරු කරලා තිබෙනවා. අපි රජයට කියනවා, මේ ප්‍රශ්නය ඉවර කරන්නය කියා. ඇයි මේ ප්‍රශ්නය ඉවර කරන්නේ නැත්තේ?

ඒ විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් ප්‍රශ්න පත්‍ර අගයන කොට ඒ ප්‍රශ්න පත්‍ර බලන ගුරුවරුන්ට ඒ ප්‍රශ්න පත්‍රය හදපු මහාචාර්යතුමා උපදෙස් මාලාවක් දෙනවා. නමුත් මෙවර විභාගයේ ප්‍රශ්න පත්‍ර ඇගැයීමේදී රජයට පුළුවන්කමක් ලැබුණේ නැහැ -විභාග දෙපාර්තමේන්තුවට, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පුළුවන්කමක් ලැබුණේ නැහැ- ඒ ප්‍රශ්න පත්‍ර අගයන ගුරුවරුන්ට ඒ ප්‍රශ්න පත්‍ර සැකසූ අදාළ මහාචාර්යවරුන්ගේ උපදෙස් ලබා දෙන්න. එහෙම උපදෙස් දෙන්නේ ප්‍රශ්න පත්‍ර බලන සියලුම ගුරුවරුන් එක ආකාරයකට මේ ළමයින්ට ලකුණු දෙන්න ඕනෑ නිසායි. නමුත් මෙවර ඒක කරලා නැහැ. එම නිසා ළමයින්ට අසාධාරණයක් වෙනවා. ප්‍රශ්න පත්‍ර අගයන මැදකදී පහු ගිය දා රාජකීය විද්‍යාලයට ගිහිල්ලා එක මහාචාර්යවරයකු විතරක් මේ ගුරුවරුන්ගෙන් කොටසකට විතරක් අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. මේ නිසා මේ ළමයින් බොහොම මහන්සියෙන් තමන්ගේ දුප්පත් දෙමවුපියන් වියදම් කරන මුදලින් උසස් පෙළ කඩ ඉම පහු කරලා විශ්වවිද්‍යාලයට යන්න බලාපොරොත්තු වන වෙලාවේ ළමයින්ට අසාධාරණයක් වනවා. ඔබතුමා හිටපු අධ්‍යාපන ඇමතිවරයකු විධියට දන්නවා, ප්‍රශ්න පත්‍ර ඇගැයීමේදී - මම ආපසු කියන්නේ- ඒවා හදපු මහාචාර්යවරු ඒ ප්‍රශ්න පත්‍ර බලන ගුරුවරුන්ට අවශ්‍ය උපදෙස් දෙන බව. මෙවර එහෙම දෙයක් වෙලා නැහැ. මේකෙන් ළමයින්ට අසාධාරණයක් වෙනවා, ඇමතිතුමනි. මා කියනවා කරුණාකර මේවා හදන්නය කියලා. විභාග දෙපාර්තමේන්තුවට දෙන මුදල් පිළිබඳව -අධ්‍යාපන අමාත්‍යාංශයට දෙන මුදල් පිළිබඳව- අපට ප්‍රශ්නයක් නැහැ. අපි උදවු කරනවා. නමුත් ඒ මුදල් හරියාකාරව යෙදෙන්න ඕනෑ. තවම ලංකාවේ අධ්‍යාපනයට වෙන් කර තිබෙන්නේ ජාතික ආදායමෙන් සියයට 2.6යි. තව මුදල් වෙන් කරන්න කියලායි අපි කියන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමා අධ්‍යාපන ඇමති වශයෙන් සිටියදී -1992 දී- මේ රටේ ජාතික ආදායමෙන් සියයට 3.8ක් තමුන්නාන්සේ අධ්‍යාපනය සඳහා වෙන් කර තිබෙනවා. නමුත් දැන් වෙන් කරන්නේ සියයට 2.6යි. මේ කලාපයේ තිබෙන නේපාලයටත්, භූතානයටත් වඩා අඩුවෙන් තමයි, ජාතික ආදායමෙන් අපි අධ්‍යාපනයට වෙන් කරන්නේ. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අධ්‍යාපනය සඳහා තව සල්ලි වෙන් කරන්න. ගරු කථානායකතුමනි, මේ සල්ලි වෙන් කරලා කරුණාකර අධ්‍යාපනය දියුණු කරන්න.

අද අධ්‍යාපනයේ අර්බුද රැසක් තිබෙනවා. අද ගුරුවරුන් තමන්ගේ වැටුප් විෂමතාව වෙනුවෙන් සටන් කරනවා. මේ වැටුප් විෂමතාව වෙනස් කරනවාය කියලා රජය පුවත් පත් නිවේදනයක් පළ කර තිබෙනවා. රජය නොවෙයි, උසාවිය දුන්නු තීන්දුවකට අනුවයි එහෙම කරලා තිබෙන්නේ.

2008 සැප්තැම්බර් මාසයේ 12 වන දා "දිවයින" පත්‍රයේ 11 වන පිටුවේ මෙහෙම තිබෙනවා:

> "ගුරු වැටුප් විෂමතා ඉවතට
> කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිලාභ රැසක්"

ගරු කථානායකතුමනි, මේ පුවත් පත් දැන්වීමේම අසත්‍ය ප්‍රකාශයක් පළ වී තිබෙනවා. මේකේ මෙහෙම සඳහන් වෙනවා:

> "මේ අනුව සෑම ගුරුවරයෙකුට ම මසකට රුපියල් 1005/- සිට රුපියල් 2685/- දක්වා වැටුප් වැඩිවීමක් සිදුවේ."

මේ දැන්වීමේම තිබෙනවා, 2 - II ගුරුවරයකුට මාසයකට වැඩි වන්නේ රුපියල් 345යි; 2 - I ගුරුවරයකුට මාසයකට වැඩි වන්නේ රුපියල් 505යි කියලා. සමහර විට I ශ්‍රේණියේ ගුරුවරයකුට නම් ඔය කියන ගණන හම්බ වෙනවා ඇති. රජය මේකෙන්ම ගුරුවරු රවටා තිබෙනවා. වැඩි වන්නේ රුපියල් 345යි. මේ දැන්වීමේම තිබෙනවා, මසකට රුපියල් 1,005 සිට රුපියල් 2,685 දක්වා වැඩි වනවාය කියලා. මේ ආකාරයට ගුරුවරුන් රවටලා, ගුරුවරුන්ගේ ධෛර්ය අඩු කරලා, ගුරුවරුන්ගේ ගරුත්වය නැති කරලා රජය මෙහෙම කටයුතු කරන්නේ ඇයි කියලා අපි අහනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. ගුරු වැටුප් වැඩි කරන්න ඕනෑය කියන මේ රජයම පත් කරපු වැටුප් කොමිසම 2007.05.22 වන දා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ අතුරු වැටුප් යෝජනාවේ සඳහන් වෙනවා, ගුරු සේවයේ 3 - II පන්තියේ ගුරුවරයකුට රුපියල් 1,950ක් වැඩි කරන්න ඕනෑය කියලා. ඒත් වැඩි කරන්නේ රුපියල් 345යි. ඒකත් දෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දීපු නිසයි. තමන්ගේ වැටුප් විෂමතාවන් වෙනුවෙන් සටන් කරද්දී උසාවියට ගෙන ගිහින් නොයෙක් නොයෙක් ප්‍රශ්න කරද්දී මනස නිරවුල්ව තියා ගෙන, මනස ඒකාග්‍රතාවක තියා ගෙන, මනස පිරිසිදුව තියා ගෙන මේ ගුරුවරු කොහොමද උත්තර පත්‍ර ඇගැයීම් කටයුතු කරන්නේ? කරුණාකර දුන් පොරොන්දු ඉෂ්ට කරන්නය කියා අප රජයට කියනවා. ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න. ඒකට අවශ්‍ය විසඳුම් දෙන්නය කියා අප රජයෙන් ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ ගරු සභාවේ නැති වුණත් ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමා ඉන්නවා. ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමනි, අප කරුණාවෙන් ඉල්ලන්නේ මේ ප්‍රශ්නය විසඳා අවසාන කරන්නය කියලායි. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සමහර ළමයින් විදේශීය අධ්‍යාපනය ලබන්න යන්න ඕනෑ. සමහර ළමයින් මෙරට අධ්‍යාපනය ලබන්න ඕනෑ. දැන් මාස ගණනක් ප්‍රමාද වෙලායි තිබෙන්නේ. මේ ගුරුවරු අවුරුදු එකොළහක් සටන් කරනවා. ජනාධිපතිතුමාත් එක්ක තුන් සැරයක් සාකච්ඡා කර තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක කිහිප සැරයක් සාකච්ඡා කර තිබෙනවා. ඔවුන්ගේ ඉල්ලීම් ඉෂ්ට කරන බවට පොරොන්දු වෙලා තිබෙනවා. ඒ පොරොන්දු ඉෂ්ට නොවුණු නිසායි ගුරුවරු මේ ක්‍රියා මාර්ගය ගත්තේ. ගුරු සේවය පිහිටුවද්දී මෙහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. එදා ගුරු සේවය පිහිටුවන්නට මූලික අඩිතාලම දැම්මේ අගමැති විධියට රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. එදා එතුමා ගුරු සේවය පිහිටුවන්නට මුල් වුණා මට මතකයි. ඊට පසුව ගරු කථානායකතුමනි තමුන්නාන්සේත් සිටි කැබිනට් මණ්ඩලයට 1991.04.21 වන දා ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා විසින් ගුරු සේවය පිහිටුවන්න අවශ්‍ය කටයුතු කරන්න කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි තමුන්නාන්සේ මේ රටේ අධ්‍යාපන ඇමති විධියට 1993.10.06 වන දා මේක අපේ ප්‍රතිපත්තිය බව සඳහන් කරමින් පාර්ලිමේන්තුවට මේ කාරණාව ඉදිරිපත් කළා. ඒක ක්‍රියාත්මක කරන්න යන කොට අපේ ආණ්ඩුව නැති වුණා. 1994 ඔක්තෝබර් මාසයේ 6 වන දා -ජාතික ගුරු දිනය දවසේ- පොදු ජන එක්සත් පෙරමුණ ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා දේශපාලන වාසියක් ගැනීම සඳහා ගුරුවරුන්ගේ වැටුප් පරිමාණ තුනක් ගැසට් එකේ දැම්මා. ඒ වෙච්ච අවුල තවම විසඳා ගන්න බැරි වුණා. 1994 සිට දිගින් දිගටම මේක විසඳන්න රජය අපොහොසත් වෙලා තිබෙනවා. මේ සම්බන්ධව වග කීමෙන් කටයුතු කරන්නය කියා අප රජයට කියනවා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. පාසල් පෙළ පොත් පාසල් ළමයින්ට හරියට වෙලාවට ලබා දෙන්න. පාසල් පෙළ පොත් ටික පාසල් ළමයින්ට වෙලාවට ලබා දෙන්නට බැරි ආණ්ඩුවක් මේ තිබෙන්නේ. රජයේ පාසල් පෙළ පොත් ටික 2008 අවුරුද්දේ ජූනි මාසයේත් සමහර අය දුන්නා. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. ඉංග්‍රීසි මාධ්‍ය පෙළ පොත් සියල්ල දුන්නේ ජූලි මාසයෙන් පස්සේ. මේ පෙළ පොත් මුද්‍රණය කරන්න සමාගම් දෙකක් තෝරා ගෙන තිබෙනවා. මේ පෙළ පොත් මුද්‍රණය කරන්න දීමේදී තිබෙන එක කොන්දේසියක් තමයි ප්‍රමාද වුණොත් සියයට 150ක දඩ මුදලක් ගහන එක. සාමාන්‍යයෙන් මේ සමාගම් තෝරද්දී තාක්ෂණික කමිටුව අදාළ මුද්‍රණාලවලට ගිහිල්ලා, ඒ මුද්‍රණාලවල මේ පොත් අච්චු ගහන්න පුළුවන් ධාරිතාව තිබෙනවාද, මුද්‍රණාල සතුව ඒ සම්පත් තිබෙනවාද කියා බලනවා. ඒ කිසි දෙයක් බැලුවේ නැහැ. ඒ විතරක් නොවෙයි. පෙළ පොත් මුද්‍රණය පරක්කු වුණොත් පෙළ පොත් 50,000 දක්වා දවසකට රුපියල් 5,000ක දඩයක් ගහනවා. පෙළ පොත් 1,00,000

[ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

දක්වා රුපියල් 10,000ක දඩයක් ගහනවා. මොනවාද මේ සම්බන්ධයෙන් කර තිබෙන්නේ? අධ්‍යාපන ඇමතිතුමා මේ විධියේ කැබිනට් මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා.

"අමාත්‍ය මණ්ඩල සංදේශය 2008 වර්ෂය සඳහා මුද්‍රණය කරන ලද පෙළ පොත්වලට මුදල් ලබා දීම"

ගරු කථානායකතුමනි, මේ සන්දේශයේ තිබෙන්නේ මොකක්ද? වෙලාවට පෙළ පොත් දෙන්න බැරි වුණු මුද්‍රණාලකරුවන්ට දඩ ගහනවා වෙනුවට ඒ මුද්‍රණාලකරුවන්ට ගහන දඩය ඉවත් කරන්න තමයි අධ්‍යාපන ඇමතිතුමා අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අමාත්‍ය මණ්ඩල සන්දේශයේ තව ලස්සන එකක් තිබෙනවා.

"...අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් විසින් අවස්ථා කීපයකදී පොත් භාර දීමට දින ලබා දී ඇත. මෙසේ ලබා දී තිබූ දින අතරින් අවසාන දිනය වූයේ 2008.04.28 වන දිනය."

ඒ කියන්නේ 2008 ජනවාරි මාසයේ දෙන්න ඕනෑ පොත් ටික, අප්‍රේල් මාසයේ 28 වන දා වන තුරු ලබා දෙන්න පුළුවන් කියා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාම ඒ මුද්‍රණාලකරුවන්ට කියනවා කොච්චර අසාධාරණද? මේ ගොල්ලන් සියයට 150ක දඩ මුදලක් ගෙවන්න ඕනෑ; ප්‍රමාද වන දවසකට වෙනම ගණනක් ගෙවන්න ඕනෑ; මුද්‍රණ දෝෂ තිබෙනවා නම් වෙනම ගණනක් ගෙවන්න ඕනෑ. ඒත් අධ්‍යාපන ඇමතිතුමා කරන්නේ මේ පෙළ පොත් ටික හය වෙනි මාසයේ ළමයින්ට දීලා ළමයින්ගේ අධ්‍යාපනය විනාශ කරලා, පෙළ පොත් මුද්‍රණය කරපු මුද්‍රණාලය ගෙවන්න තිබෙන දඩ මුදලෙන් නිදහස් කරන්න අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන එකයි. ඒ අමාත්‍ය මණ්ඩල සන්දේශය තමයි මේ මා අතේ තිබෙන්නේ. ඒ ගෙවන්න තිබෙන මුදල කැපීම සාධාරණීකරණය කරලාත් තිබෙනවා. මෙම අමාත්‍ය මණ්ඩල සන්දේශයේ මෙසේ සඳහන් වෙනවා:

"1) විවෘත ටෙන්ඩරයක් බැවින් තමන්ගේ ධාරිතාවට වඩා වැඩි ප්‍රමාණයකට මිල ගණන් ඉදිරිපත් කිරීම."

ඉතින් කාගේද වැරැද්ද? තාක්ෂණික කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවෙන් ගිහින් මේවා බලනවා. ඒවායේ තිබෙන අඩු පාඩු නිසා තමයි අධ්‍යාපනයට හෙණ ගහලා තිබෙන්නේ.

ඒකේ තවදුරටත් මෙහෙම සඳහන් වෙනවා:

"2) හැකිතාක් අවම මිල ගණන් ඉදිරිපත් කිරීම"

මෙහෙම කියන්නේ කවුද? අධ්‍යාපන ඇමතිතුමායි කියන්නේ. මේ සාධාරණ කරුණු නිසා දඩ මුදල කපන්නලු. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"3) මේ නිසා ආයතනයේ මුද්‍රණ ධාරිතාවට වඩා පෙළපොත් ප්‍රමාණයක ඇණවුම් ලැබීම."

අන්තිමට මෙසේ සඳහන් වෙනවා:

"2008 වර්ෂයට අදාළ පෙළපොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්වලට එළඹී ඇති මුද්‍රණ ආයතන එම ගිවිසුම් අනුව කටයුතු නොකිරීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාර ව දෙපාර්තමේන්තුවට අය විය යුතු ගිවිසුම්ගත වටිනාකමින් 150%ක් වූ දඩ මුදල අය නොකිරීමටත් මෙම සමාගම් මුද්‍රණය නොකළ පෙළපොත් වෙනත් මුද්‍රණ ආයතන මගින් මුද්‍රණය කරවා ගැනීම නිසා දෙපාර්තමේන්තුවට දැරීමට සිදු වූ අමතර පිරිවැය අය නොකිරීමටද"

ඒ සමාගම්වලට මුද්‍රණය කරන්න බැරි වෙලා වෙනත් මුද්‍රණ සමාගම්වලට දීලා මුද්‍රණය කළොත් ඒ අමතර පිරිවැයත් ඒ ගොල්ලන්ගෙන් අය නොකරන්න කියනවා. මම අහන්නේ මේ වාගේ හෙණ ගහන අපරාධ කරන්නේ ඇයි කියලායි ගරු කථානායකතුමනි. පෙළ පොත් ටික පරක්කු වෙලා. ඒ පරක්කු කරපු මුද්‍රණ සමාගම්වලින් අය කර ගන්න තිබෙන දඩය අයින් කරන්න තමයි මෙතුමා අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කරන්නේ. මේ පාඩුව කීයක්ද දන්නවාද? අත්තිකාරම හැටියට දීලා තිබෙනවා, රුපියල් මිලියන 116ක්. සියයට 20ක් නේ අත්තිකාරම් දෙන්නේ. ඒ කියන්නේ රුපියල් මිලියන 580ක පෙළ පොත්. රජයට දඩ විධියට අය වෙන්න ඕනෑ, රුපියල් මිලියන 870ක්. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 8,700ක්. ඒ මුදල කපා හරින්න තමයි මේ කැබිනට් සන්දේශය ඉදිරිපත් කර තිබෙන්නේ. කරුණාකරලා මේකට උත්තර දෙන්නය කියා අපි ඉල්ලා සිටිනවා.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, 10, 11 ශ්‍රේණියේ ගණිතය පෙළ පොත් ගැනත් සඳහන් වෙනවා. මේ පොත්වල තිබෙන්නේ මුද්‍රණ වැරැදි නොවෙයි, තාක්ෂණික වැරැදි. වැරැදි 330ක් තිබෙනවා. ගරු කථානායකතුමනි, අඩු තරමින් මේ පොත්වල ජාතික ගීයවත් හරියට නැහැ. ජාතික ගීයේ "ඔබ අප ජීවන වේ" කියන එක, "ජීවන දේ" කියලායි මේකේ තිබෙන්නේ. 10 වන ශ්‍රේණියේ, 11 වන ශ්‍රේණියේ විභාගය කියන්නේ අධ්‍යාපනයේ ලොකුම කඩ ඉමක්. ඒ ළමයා උසස් අධ්‍යාපනය ලබන්න නම් ගණිතය පාස් වෙන්න ඕනෑ. එහෙම තිබියදී මේ 10, 11 වන ශ්‍රේණිවල ගණිතය පෙළ පොත්වල වැරැදි 330ක් තිබෙනවා. මේවා තාක්ෂණික වැරැදි. ළමයාට උගන්වන පොතේ වැරැදි තිබෙනවා නම් ළමයා කොහොමද ඉගෙන ගන්නේ ගරු කථානායකතුමනි? මේවා වෙනස් කරන්න කියලා අපි අධ්‍යාපන ඇමතිතුමාට කියනවා. මේ අවස්ථාව ළමයින්ගේ අධ්‍යාපනයේ කඩ ඉමක්.

ඒ විතරක් නොවෙයි. සාහිත්‍යය විෂයේ පෙළ පොත දීලා තිබෙන්නේ පසු ගිය ජූනි මාසයේයි. මේ පොතේ තිබෙනවා පාඩම් 11ක්. 10, 11 ශ්‍රේණිවල සිංහල සාහිත්‍යය විෂයට පාඩම් 11 ක් තිබෙනවා. පෙළ පොත දුන්නේ මාස 06ක් පහු වෙලා. දැන් මේ ගොල්ලන් තීන්දු කර තිබෙනවා, පාඩම් හතකින් විභාගය පවත්වන්න. කොච්චර අසාධාරණද ගරු කථානායකතුමනි? ඔබතුමා ඉස්කෝලේ ගිය කාලයේ මෙහෙම වුණා නම්, ඔබතුමාගේ රසවත් සාහිත්‍යය, ඔබතුමාගේ රස බස්, ඔබතුමා සිංහල භාෂාව හසුරු වන විධිය අපිට අහන්න වෙන්නේ නැහැ. මට මතක් වුණේ ඔබතුමාව. සිංහල සාහිත්‍යය පෙළ පොත දීම පරක්කු කරලා, පාඩම් 11න් පාඩම් 7කින් විභාගය පවත්වන්න යනවා. ඒක හරිද ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි? අධ්‍යාපනය මේ වාගේ විනාශ කරන්නේ ඇයි? අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ හැම අංශයකම මේ වාගේ දූර්වලකම් තිබෙනවා ගරු කථානායකතුමනි. ඔබතුමාට මා මේවා කියන්නේ ඔබතුමා මේ රටේ ඌව පළාතෙන් බිහි වූ උගතකු නිසායි; හිටපු අධ්‍යාපන ඇමතිවරයකු නිසායි; දැන් ගරු කථානායකතුමා නිසායි. අඩු තරමින් මේවා සම්බන්ධව ඇහුම් කන් දෙන්න, තීන්දු ගන්න අවස්ථාවක් ආවොත් කථා කරන්නයි අපි ඔබතුමාට මේ ගැන කියන්නේ. තවත් මේ වාගේ ප්‍රශ්න විශාල සංඛ්‍යාවක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගිය අවුරුද්දේ පළමු වැනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීම ගැන අපි කථා කළා.

අපේ නායකතුමා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා ළමයින් ඇතුළත් කර ගැනීම සම්බන්ධ ප්‍රශ්නය ආණ්ඩුවට තනිවම විසඳන්න බැරි නම් නිසි වැඩ පිළිවෙළක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. නැත්නම් විශේෂ කාරක සභාවක් පත් කරලා රජයේ පක්ෂ, එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සහ දෙමළ පක්ෂ ඇතුළු මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුම පක්ෂ එකතු වෙලා සාකච්ඡා කරලා ඒ සම්බන්ධ ප්‍රතිපත්තියක් හදමු කිව්වා. මේ ප්‍රශ්නය ඇති වුණේ අවුරුද්දේ ජනවාරි මාසයේ. මේ රටේ ඉතිහාසයේ ප්‍රථම වරට මේ අවුරුද්දේ මාස තුනක් යන තෙක් පළමු වැනි පන්තියට ළමයින් ඇතුළත් කර ගත්තේ නැහැ. දැන් මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසය. ගරු කථානායකතුමනි මේ සම්බන්ධව යම් වැඩ පිළිවෙළක්, පනත් කෙටුම්පතක්

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න රජයට තවමත් බැරි වෙලා තිබෙනවා. අධ්‍යාපනය සම්බන්ධ ඕනෑම දෙයකට, ඕනෑම උදව්වක් දෙන්න එක්සත් ජාතික පක්ෂය ලෑස්තියි කියා අපි රජයට කියනවා. නමුත් අද රජය ඒකට විසඳුමක් දෙන්න අපොහොසත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි අධ්‍යාපනයේ ඔළුව තමයි, අධ්‍යාපන පරිපාලන සේවය. අද අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු වැනි පන්තියේ දෙසිය දෙනෙක් ඉන්න ඕනෑ. පරිපාලන සේවයේ පළමු වැනි පන්තියේ ඉන්න 198 දෙනෙක්ම වැඩ බලන කට්ටිය. ඒ කියන්නේ දේශපාලන පළිගැනීම් මත පත්වීම් දුන්න අය. ගරු ඇමතිතුමාගෙන් මම මීට කලින් මේ ගැන ඇහුවාම කිව්වා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තිබෙනවාය කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ඉවර වෙලා දැනට මාස හතරක් වෙනවා. තවම ඒ පුරප්පාඩු පුරවන්න ඇමතිතුමා අපොහොසත් වෙලා තිබෙනවා. අධ්‍යාපනයටත් දේශපාලනය ගාවලා. අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු වැනි පන්තියේ සිටිය යුතු දෙසිය දෙනාගෙන් 198 දෙනෙක්ම තමන්ගේ දේශපාලන උදවුකාරයෝ නම් අධ්‍යාපනයට හරි යන්නේ කොහොමද? වයඹ පළාතේ අවුරුදු හැටත් පැනපු පළාත් අධ්‍යක්ෂවරයෙක් ඉන්නේ. අශෝක ජයසිංහ. දැන් එයාට අවුරුදු හැටත් පැනලා. සේවා දීර්ඝ කිරීම් දෙකක් දීලා තිබෙනවා. ඒ එක උදාහරණයක්. අවුරුදු හැටෙන් පස්සේ සේවය දීර්ඝ කරන්න බැහැයි කියලා ගිය සතියේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී අග්‍ර විනිශ්චයකාරතුමා තීන්දුවක් දුන්නා නේ කථානායකතුමනි. හැට පැන්න අයට දෙන්න බැහැයි කියලා තීන්දුවක් දුන්නා නේ. මෙයාට අවුරුදු හැටදෙකයි. මේවා කරන්නේ කොහොමද කියලායි අපි අහන්නේ. අවුරුදු හැටෙන් පස්සේ සේවය කරන්න බැහැයි කියලා ආණ්ඩුව යවපු චක්‍රලේඛයේම තිබෙනවා. මා කියන්නේ මේවා හදලා විතරක් මදි, මේ වැරදි කරපු අයට දඬුවම් දෙන්නත් ඕනෑය කියන එකයි. එතකොට තමයි ආයෙත් වැරදි නොකරන්නේ. අවුරුදු 60 පැන්න කට්ටියයි මේකේ තියා ගෙන ඉන්නේ. කරුණාකර මේ සම්බන්ධව තීන්දු ගන්න. [බාධා කිරීමක්] මෙහෙමයි ඒ චක්‍රලේඛනවල තිබෙන්නේ ගරු ඇමතිතුමනි. 60න් පසුව දෙන්න පුළුවන් ඒ තනතුරුවලට සුදුසුකම් තිබෙන අය එතැන නැත්නම් විතරයි. නමුත්, වයඹ පළාතේ මේ කියන නිලධාරියාට -මා නම කියන්නේ නැහැ- වඩා ඉහළ සුදුසුකම් තිබෙන තව තුන් දෙනෙක් ඉන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වෙලාව තමයි ප්‍රශ්නය.

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මට තව ටිකක් වෙලාව දෙන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
[බාධා කිරීමක්] දීර්ඝ කර තිබෙනවා. නමුත්, 60න් පසුව ඔහුගේ සේවා කාලය දීර්ඝ වන්නේ නැහැ.

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
මා කියන්නේ මේකයි. සාමාන්‍යයෙන් සේවය දීර්ඝ කරන්න දෙන්නේ සුදුසුකම් තිබෙන නිලධාරින් එතැන නැත්නම් විතරයි. මෙයාට වඩා ඉහළින් තව අය ඉන්නවා. මා ඕනෑ නම් කියන්නම්, වෙබ් අඩවියේ ඒක දමලා තිබෙනවා. ඉහළින් ඉන්න තුන් දෙනෙකුත් ඉන්නවා. ඒ තියෙද්දී අවුරුදු 62 වෙනකම් දෙනවා. කරුණාකර අධ්‍යාපනය මේ විධියට විනාශ කරන්න එපාය කියා මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] අවුරුදු 62යි.

මා දැන් කාරණා කීපයක් සම්බන්ධව කථා කළා. විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා විභාගය පැවැත්වුවා. ගරු කථානායකතුමනි, මේ විභාගය පැවැත්වුයේ 2005 මාර්තු මාසයේ. අද තිබෙන විද්‍යාල 9,724න් විද්‍යාල 8,000ක විතර ඉන්නේ වැඩ බලන අයයි. වැඩ බලන අයය කියන්නේ දේශපාලන උදවුකරුවන්. දැන් මේ වැඩ බලන අය අයින් කරන්න වෙයි කියා විභාගයෙන් සමත් වුණු අයට පත්වීම් දෙන්නේ නැහැ. ඒ ගැසට් නිවේදනයේ පැහැදිලිවම තිබෙනවා, මේ තනතුරුවලට පත් කළ හැක්කේ විභාගයෙන් ගත් ලකුණු පිළිවෙළට අනුවයි කියා. ඒ ගැසට් නිවේදනය දැන් මා ළඟ තිබෙනවා. කියවන්න වෙලාවක් නැති නිසා මා දැන් කියවන්නේ නැහැ. දැන් මේ අය ගිහින් පළාත් සභාවල සම්මුඛ පරීක්ෂණ තියනවා. කොහොමද ගරු කථානායකතුමනි, අධ්‍යාපනයක් හරි යන්නේ? මේක අද දේශපාලනීකරණය කරලා ඉවරයි. මේ විදුහල්පති විභාගය තියලා අවුරුදු තුනයි. විදුහල්පතිවරු පත් කරන්නේ නැහැ. මේ තත්ත්වය තමයි අද අධ්‍යාපන ක්ෂේත්‍රයේම අද තිබෙන්නේ. අධ්‍යාපනයේ පළමු වෙනි ශ්‍රේණියේ සිට, පාසල් පෙළ පොත ලබා දීමේ සිට, විභාග පැවැත්වීමේ සිටම මේක තිබෙනවා.

අනික් එක, ගුරුවරයාගේ වැටුප් විෂමතාව. මීට වඩා මොනවාද අධ්‍යාපනයේ තිබෙන ප්‍රශ්නය? අධ්‍යාපන ඇමතිතුමාට කථා කළාම කියනවා ප්‍රශ්නය විසඳනවාය කියා. හැම දාම වාද විවාදවලදී එතුමා හම්බ වනවා. ප්‍රශ්නය විසඳනවාය කියනවා. නමුත් විසඳපු කාලයක් නම් නැහැ. ගිය අවුරුද්දේ කිව්වේත් ඔය කථාව. මේ අවුරුද්දේ ජනවාරිවල කිව්වේත් ඔය කථාව. දැන් කියන්නෙත් ඒ කථාව. අපි කියන්නේ මේකයි. රටක තිබෙන ප්‍රධානම ආයෝජනය තමයි අධ්‍යාපනය. අපේ රටේ සම්පත තමයි මේ දරුවන්. ලෝකයේ අනික් රටවල් අධ්‍යාපනය වෙනුවෙන් තමයි ප්‍රමුඛත්වය දෙන්නේ. අපේ රටේ දරුවන් ගැන සිතනවා නම්, අපේ රටේ අනාගතය ගැන හිතනවා නම් ඇයි අහිංසක දරුවන් ගැන තීන්දු අර ගෙන මේ කටයුතු කරන්නේ නැත්තේ? අපි රජයට බල කරනවා ඒක කරන්නය කියා.

ඒ විතරක් නොවෙයි මේ වෙලාවේ මා මතක් කරන්න ඕනෑ, රට, ජාතිය වෙනුවෙන් සේවය කළ ජානක පෙරේරා රණ විරුවා ගැනත්. එදා යාපනයෙන් හමුදාව ඉවත් කර ගන්න යන කොට, ඉන්දියන් හමුදාවට හෙළිකොප්ටර් එවන්නය නැව් එවන්නය කියා උත්තර දෙන කොට එතුමා තමයි ගිහින් යාපනය බේරා ගත්තේ. එල්ටීටීඊ කොටි බර ගණනක් මරා එතුමා තමයි වැලිඔය බේරා ගත්තේ. එතුමා මේ රට ත්‍රස්තවාදයෙන් බේරා ගත්තා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ මාතෘකාවට අදාළව නොවෙයි නේ.

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
කමක් නැහැ. මට අවස්ථාව දෙන්න. රටේ යුද්ධයක් තිබෙන වෙලාවක වීරවරයෙක් වෙනුවෙනුයි මේ කතා කරන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක හරි. අඩු ගණනේ අධ්‍යාපනය සම්බන්ධ කරලාවත් කතා කරන්න.

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, එතුමාගේ වීරකම නැති වෙනවාද එක්සත් ජාතික පක්ෂයට ආවාම? එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභාවේ විපක්ෂ නායකවරයා වුණාම එතුමාගේ වීරත්වය නැති වෙනවාද? අපි රජයට කියන්නේ රජය කළේ මහා දේශ ද්‍රෝහී, අමන, තුච්ඡ වැඩක් බවයි. ඊයේ එතුමාගේ දේහය පැය 4ක්

[ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

රත්මලානේ තියා ගෙන සිටියා. රජය වීරවයන් ගැන කතා කරද්දී වීරවරයන්ට සලකන්නේ මෙහෙමද කියා අපි රජයෙන් අහනවා. කරුණාකරලා මේ වාගේ වැඩ කරන්න එපාය කියා අපි රජයට කියනවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමිය, කරුණාකරලා වාඩි වෙන්න. අපි දෙදෙනා මේක මොනරාගලදී බේරා ගනිමු.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - சிறுவர் அபிவிருத்தி, பெண்கள் வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Child Development and Women's Empowerment)

ඒ එක්කම අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා කතා කරලා කිව්වා ප්‍රමාදය වළක්වා ඉක්මනට මේ කටයුතු කරන්නය කියා. අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා එවෙලේම උපදෙස් දුන්නා. මේක ආරංචි වුණු ගමන්ම ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා උපදෙස් දුන්නා, රස්තියාදු කරන්නේ නැතුව ප්‍රමාද කරන්නේ නැතුව මේ කටයුත්ත කරන්නය කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)

(An Hon. Member)

ජානක පෙරේරා මරා ගත්තේ රනිල් වික්‍රමසිංහ.

**ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**

(மாண்புமிகு ஆர்.எம். ரஞ்சித் மத்தும பண்டார)

(The Hon. R.M.Ranjith Madduma Bandara)

රනිල් වික්‍රමසිංහ නොවෙයි තමුන්නාන්සේලායි.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

සුමේධා ජයසේන ඇමතිතුමිය කතා කරන්න.

[පූ.භා. 10.21]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**

(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)

(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධව කතා කිරීමේදී මා කියන්න ඕනෑ, ජාතික අවශ්‍යතාවට ගැළපෙන පරිදි අධ්‍යාපන ක්‍රමය විධිමත් කිරීම සහ විශිෂ්ටත්වය කරා මෙහෙයවීම අරමුණු කර ගෙන අද මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන බව. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් වසරක් පාසා පවත්වන තරග විභාග අතර පසු ගිය වසරේදී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ දෙසිය හැට ගණනකට අධික අනිකුත් විභාග ප්‍රමාණයක් පවත්වා තිබෙනවා පසු ගිය අවුරුද්ද අවසානයේ අය වැයේදී ඉදිරිපත් කළ සම්පූර්ණ අය වැය ඇස්තමේන්තුගත මුදල නොලැබීම නිසා එම තරග විභාග පැවැත්වීම අසීරු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අමතර තරග විභාග වරින් වර පවත්වන්න සිදු වීමෙන් මුදල් වැඩියෙන් වියදම් වීම නිසා මේ වර්ෂයේ දෙසැම්බර් මාසයේ පවත්වන විභාගය සහ අනෙකුත් විභාග සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති වීම නැත්නම් හිඟකම නිසා මේ පරිපූරක මුදල ඉදිරිපත් කරන්න කටයුතු කර තිබෙනවා.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව 2007 වර්ෂයේදී පවත්වන ලද විභාගවල වියදම් සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා; නැත්නම් වියදම් දරලා තිබෙනවා. ඒක රුපියල් මිලියන 148ක්. පරිපාලන සේවා, ග්‍රාම සේවා, විගණන සේවා, කළමනාකරණ සහකාර සේවා, ලේඛන සහකාර වැනි ලේඛනගත නොවූ විභාග පැවැත්වීම හා ඒවායේ ඇගැයීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 188ක්, ඒ වාගේම 2007 අපොස සාමාන්‍ය පෙළ විභාගයේ ඇගැයීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 256ක් මේ වර්ෂයේදී ගෙවීමට සිදු වී තිබෙනවා. ඒ අනුව 2008 වර්ෂයට අනුමත වූ මුළු ප්‍රතිපාදන මුදල වන රුපියල් මිලියන 692න් 2007 වර්ෂයේ විභාග සඳහා රුපියල් මිලියන 592ක් ගෙවූ පසු 2008 වර්ෂයේ විභාග කටයුතු සඳහා ඉතුරු වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 100ක් පමණයි. මෙම වර්ෂයේ අගෝස්තු මාසයේදී පැවැත් වූ අපොස (උසස් පෙළ) සහ 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ පරිපාලන හා ඇගැයීම් ගාස්තු ගෙවීමටත්, දෙසැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත අපොස (සාමාන්‍ය පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගයේ පරිපාලන ගාස්තු ගෙවීමටත් රුපියල් මිලියන 588ක ප්‍රතිපාදන අවශ්‍ය වෙලා තිබෙනවා. එහෙත් විභාග වැය විෂය යටතේ ඉතිරිව ඇති ප්‍රතිපාදනවලින් හා වෙනත් වැය විෂයයන් යටතේ ඉතිරිව ඇති ප්‍රතිපාදනවලින් ආවරණය කර ගත හැක්කේ රුපියල් මිලියන 142.2ක් පමණයි. මේ අනුව රුපියල් මිලියන 141.8ක ප්‍රතිපාදන ඌනතාව මඟ හරවා ගැනීම සඳහායි මෙම පරිපූරක මුදල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, පසු ගිය වර්ෂය තුළ වරින් වර නොයෙකුත් අමතර විභාග පවත්වන්න සිදු වූ නිසා, එම වියදම් සීමාව ඉක්මවා ගිහින් තිබෙන නිසා, මේ වර්ෂයේ අවසානය වන විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු සාර්ථකව නිම කර ගැනීම වෙනුවෙන් මෙම පරිපූරක මුදල කැබිනට් මණ්ඩලයේ අනුමතිය ඇතිව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව අපි කථා කරන කොට අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කථාව ඇත්තටම මම අනුමත කරනවා. අපේ දිස්ත්‍රික්කවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ කටයුතුවලදී පැන නඟින ගැටලු සම්බන්ධව- [බාධා කිරීමක්]නැහැ, අර ජානක පෙරේරා මහත්මයාගේ මරණය පිළිබඳව රජයට කරපු චෝදනාව විතරක් මම ප්‍රතික්ෂේප කරනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳව ඒ කථාව අනුමත කරනවා. ඇත්තටම පසු ගිය වර්ෂවල පැවැති ගුරු හිඟය පියවා ගැනීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සිදු කර තිබෙනවා. පළාත් සභා මට්ටමෙන් උපාධිධාරි ගුරුවරුන් සහ ඩිප්ලෝමාධාරීන්, ඒ වගේම ස්වේච්ඡා ගුරුවරුන් බඳවා ගැනීම විශේෂයෙන්ම සිදු කර තිබෙනවා. මේ බඳවා ගැනීම් නිසාම මේ වෙන කොට මොණරාගල දිස්ත්‍රික්කය තුළත් අපි හැම දාම කථා කරන ගුරු හිඟය යම් කිසි ප්‍රමාණයකින් අවම වෙලා තිබෙනවා. නමුත් ස්වේච්ඡා ගුරුවරුන් වශයෙන් බඳවා ගත් අයගේ පත්වීම් විධිමත් කරන්නට ඉතා ඉක්මනින් ඒ අයට අවශ්‍ය පුහුණුව ලබා දීම කළ යුතුව තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාටත්, විශේෂයෙන්ම ලේකම්තුමන්ලා ඇතුළු නිලධාරි මණ්ඩලටයත් මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න මා මේ වෙලාවේ බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම මේ ගුරුවරුන් බඳවා ගෙන පාසල්වලට ස්ථානගත කිරීමේදී ඌව පළාත තුළ විශාල අඩුපාඩු රාශියක් සිදු වෙලා තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත් කළ වෙනත් පළාත්වලත් ගුරුවරු ස්ථානගත කිරීමේ ගැටලු ඇති වෙලා ඇතියි කියලා මම විශ්වාස කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව කොට්ඨාසයේ උඩික්කැප්පුආර විද්‍යාලයේ අද ඉන්නේ ළමුන් 25ක් පමණයි. නමුත් ගුරුවරුන් 18ක් පමණ මෙම විද්‍යාලයට පත් කර තිබෙනවා. ඉතාමත්ම අසාධාරණ තීන්දු අරගෙන මෙම ක්‍රමවලට පත්වීම් කරන්නට කටයුතු කර තිබෙනවා. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තමයි මේ පත්වීම් ලබා දුන්නේ. අනෙකුත් රජයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ඊට අදාළ කලාප සහ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම් මත එහෙම නැත්නම් ඒ අයගෙන් මේ තොරතුරු හරියාකාරව ලබා ගෙන ඒ අනුව මේ ගුරුවරු පත් කළා නම් මේ ස්ථානගත කිරීම් මේ ආකාරයට සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මේ පත්වීම් ලබා දුන්නත් අද මොණරාගල දිස්ත්‍රික්කය තුළ ගුරු ගැටලු රාශියක් ඇති වෙලා තිබෙනවාය කියන එක මා විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] අන්න ඒක තමයි. විද්‍යා පීඨවලින් out වන ගුරුවරුන්ට පත්වීම් ලබා දීමේදී ඇත්තෙන්ම ඒ ඒ දිස්ත්‍රික්ක ලබා දෙනවා නම් මේ ගැටලු බොහෝ දුරට විසඳෙනවා. මා හිතන හැටියට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් පළාත් සභාවේ අධ්‍යාපන ලේකම්තුමාත්, ඒ වගේම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් එකට එකතු වෙලා

සම්බන්ධීකරණයක් ඇතිව මේ කටයුතු කරනවා නම් බොහෝ දුරට මේ තත්ත්වයන් මඟ හරවා ගන්න පුළුවන්කම තිබෙනවා. අද බොහෝ විට ප්‍රධාන අමාත්‍යතුමා එක පැත්තක කටයුතු කරනවා; ආණ්ඩුකාරවරයා තව පැත්තක කටයුතු කරනවා; රාජ්‍ය සේවා කොමිෂන් සභාව තව පැත්තක කටයුතු කරනවා; පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා තවත් පැත්තක කටයුතු කරනවා. මේ තත්ත්වයන් උඩ මේ ගැටලු පැන නැඟිලා තිබෙනවාය කියන එක අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] අනෙක් පළාත්වල කොහොමද කියන්න මම දන්නේ නැහැ. අපේ පළාතේ වුණත්, කුමන පළාතක වුණත් මේ වගේ ගැටලු මහජනතාව නිරන්තරයෙන්ම අපි ළඟට අරගෙන එනවා. ඉතින් මේ ප්‍රශ්න විසඳන්න ගියාම ගොඩක් ගැටලු සහගත තත්ත්වයන්ට අපත් මැදි වෙනවා. අපට විසඳන්න අපහසුයි. ඒ නිසා සියලුම නිලධාරීන් සහ දේශපාලන නායකයිනුත් -ඒ කියන්නේ දිස්ත්‍රික්කය තුළ දේශපාලන නායකයිනුත්- පක්ෂ භේදයකින් තොරව එකට එකතු වෙලා සාකච්ඡා කරලා මේවාට තීරණ ගන්නවා නම් ඇත්තටම හොඳයි කියලා මා විශ්වාස කරනවා. මොකද, දරුවන් කියන්නේ අපේ රටේ, අපේ දැයේ සම්පතක්. අධ්‍යාපන ක්ෂේත්‍රය රටේ ඉතාමත්ම වැදගත් ක්ෂේත්‍රයක්. අධ්‍යාපන සංවර්ධනය තුළින් තමයි අපට හැම කටයුත්තක්ම කරන්න පුළුවන්කම ලැබෙන්නේ. සෞඛ්‍ය ක්ෂේත්‍රය, අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතාම වැදගත්. ඒ නිසා අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව කටයුතු කිරීමේදී ඉතා වැදගත් ලෙස සලකා කටයුතු කළ යුතු බවයි මා දකින්නේ.

ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කිරීමේදී, ඇත්තටම මම ආඩම්බරයෙන් කියනවා, අපේ රජයේ වැඩ පිළිවෙළ යටතේ පළාත්වලට, පාසල්වලට වාගේම ග්‍රාමීය මට්ටමේ අපේ ශිෂ්‍යයන්ට පවා බොහෝ පහසුකම් අද ලබා දීලා තිබෙන බව. බොහෝ පාසල් ළමුන් සඳහා පරිගණක තාක්ෂණය ලබා දීමට කටයුතු කර තිබීම ඉතාමත්ම වැදගත් අවස්ථාවක් හැටියට අප දකිනවා. ඒ වුණත් විශේෂයෙන්ම ඉතාම ග්‍රාමීය මට්ටමේ ජීවත් වන දරුවන්ට පරිගණක පාඨමාලා හැදෑරීමට අවශ්‍ය පහසුකම් නොමැතිව තිබුණු හෙයින් මේ වන විට solar power ක්‍රමය යටතේ විදුලිය ලබා දීම තුළින් ඒ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු විධිමත්ව ක්‍රියාත්මක වී ගෙන යනවා.

ඒ වාගේම මොණරාගල දිස්ත්‍රික්කයේ සහ තවත් දිස්ත්‍රික්ක ගණනාවක ජල ප්‍රශ්නය තිබූ පාසල්වලට solar power ක්‍රමය මඟින් ජල ප්‍රශ්නයත් විසඳා ගන්න පුළුවන්කම ලැබී තිබෙනවා. පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය වී තිබෙනවා. ඒ වාගේම පාසල් ගොඩනැඟිලි -විද්‍යාගාර, පුස්තකාල, පරිගණක කාමර, ගෘහ විද්‍යා ගොඩනැඟිලි- කඩිනමින් ඉදි වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල මුදලක් වැය කරලා මේ කටයුතු සම්පූර්ණ කර තිබෙනවා. ඉතාමත්ම වැදගත් වන්නේ, අර මම කලින් සඳහන් කළා වාගේ විදුලිය නොමැති පාසල්වල ඒ දරුවන්ට අධ්‍යාපනය ලබන්නට solar power ක්‍රමයෙන් විදුලිය ලබා දෙන්නට කටයුතු කර තිබීමයි.

අද බොහෝ දරුවන් විශ්වවිද්‍යාලවලට සමත් වෙලා යනවා. මොණරාගල වැනි අපි හැම දා ම දුෂ්කරයි කියන දිස්ත්‍රික්කවල පවා දරුවන් විශ්වවිද්‍යාලයට යනවා. ඇත්තෙන්ම මේ දරුවන්ට විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන්නට ඒ අලුත් පාඨමාලා බිහි වීම තුළින් විශේෂයෙන්ම උපාධිධාරීන්ට අද අලුත් රැකියා ක්ෂේත්‍ර විවෘත වෙලා තිබෙනවා. විශේෂයෙන් අපොස උසස් පෙළ සමතුන්ට විද්‍යා පීඨවලට ඇතුළත් වී පුහුණුව ලබා ගුරුවරුන් වශයෙන් කටයුතු කරන්න අද අවස්ථාව සැලසිලා තිබෙනවා. මේවා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වීම තුළ සිදු වූ දේවල්. ඒ තුළින් තමයි භෞතික සම්පත් සහ අනෙකුත් මානව සම්පත් යම් කිසි ප්‍රමාණයකින් හෝ අද අප දිස්ත්‍රික්කවලටත් ලබා ගන්න පුළුවන්කම ලැබිලා තියෙන්නේ. ඒ වුණත් මම කනගාටුවෙන් වුවත් කිව යුතු කාරණයක් තිබෙනවා. මොණරාගල දිස්ත්‍රික්කයේ ජාතික පාසල් කිහිපයක්ම තිබෙනවා. ඉන් රාජකීය විද්‍යාලය සහ මහානාම මහා විද්‍යාලයේ තත්ත්වය, භෞතික සම්පත් සහ මානව සම්පත් සංවර්ධනය මේ වන කොට ඉතාමත්ම අවම මට්ටමකට -කඩා වැටෙමින් පවතින තත්ත්වයකට- පත් වෙලා තිබෙනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මහානාම ජාතික පාසල නේද?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඔව්, මහානාම ජාතික පාසල. මහානාම ජාතික පාසලේ අප පසු ගිය දිනවල ජාතික ළමා දින උත්සවය පැවැත් වූවා. ඒ වෙලාවේ එම විද්‍යාලයේ අඩු පාඩු රාශියක් තිබෙන බව දුටුවා. මහානාම ජාතික පාසලේ පිරිමි සහ ගැහැනු දරුවන් වෙනුවෙන් hostel ක්‍රමයක් කාලයක් තිස්සේ සිටම පැවතුණා. ඒ වාගේම මෙය ක්‍රීඩා පාසලක් හැටියටත් ආරම්භ කර තිබුණා. අද මේ ක්‍රීඩා පාසල සම්පූර්ණයෙන්ම වැහිලා යන තත්ත්වයට පත් වී තිබෙනවා. ඒ වාගේම hostels ටික සම්පූර්ණයෙන්ම වසා දමා තිබෙනවා. මමත් ඒ ස්ථානයට ගිහිල්ලා බැලුවා. කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි සියල්ල වාගේම, වැසිකිළි පද්ධතිය ඔක්කෝම විනාශ වෙලා ගිහිල්ලා. මේවා කාලයක් පාළුවට තිබෙන කොට දිරලා යනවා; විනාශ වනවා. මේකට හේතුව hostel පාලිකාවක් හෝ පාලකයකු මේ hostels වලට නොමැතිකමයි. වරින් වර අපි මේ ගැන ඉල්ලීම් කර තිබෙනවා. අපි කීප වතාවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් ඉල්ලීම් කර තිබෙනවා. ගරු අධ්‍යාපන අමාත්‍යතුමන් විශේෂයෙන්ම මේවා ලබා දෙන්න අදාළ නිලධාරීන්ට උපදෙස් දීලා තිබෙනවා. නමුත් ඒ නිලධාරීන්ගේ ලිපි ගොනුවලට පමණක් සීමා වුණා, මෙම ඉල්ලීම්. ඊට පසුව මේවා ක්‍රියාත්මක වෙලා නැහැ. කිලෝමීටර් 35ක්, 40ක් දුර සියඹලාණ්ඩුව වැනි ඈත එපිට ප්‍රදේශ වාගේම තවත් පැතිවලින් ගත්තාමත් අපේ දිස්ත්‍රික්කය ඉතාම විශාල දිස්ත්‍රික්කයක් බව ඔබතුමා දන්නවා. ඒ කොට්ඨාසවලින් එන දරුවන්ට විශේෂයෙන්ම අද පාසල් බස් රථ ලබා ගැනීමේ අපහසුවකුත් තිබෙනවා. පාසල් බස් රථ පමණක් නොවෙයි. කවුරුත් දන්නා පරිදි පසු ගිය කාලවල ප්‍රවාහන ක්ෂේත්‍රය ඉතාමත් දුර්වලතාවකින් පැවතුණා. අපේ ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා දැනට මේ පිළිබඳව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යනවා. මේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් සාර්ථක කර ගන්නට නම් අපට තවත් අවුරුදු දෙකක් පමණ ඉදිරියට යන්න වේවි. අර කඩා වැටුණු ප්‍රවාහන සේවය තුළ දැනට කටයුතු කිරීම අපහසු වන නිසා දරුවන්ට පාසල් ඒමේ හැකියාව නැතිව ගිහින් තිබෙනවා. මොකද, hostel ක්‍රමයත් වැසී තිබෙන නිසා ඒ දරුවන්ට ඉතාම දුෂ්කර අවස්ථාවක් තමයි ගත කරන්න සිදු වෙලා තිබෙන්නේ.

කියන්නත් කනගාටුයි, කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසලකට යන අපේ දැරියක් පසු ගිය සැප්තැම්බර් 30 වන දා, අවුරුදු 4ක් තිස්සේ අබලන් වී තිබුණු පාසල් බස් රථයක යන විට බස් රථයේ යට ලෑල්ලක් කඩා ගෙන ගොස් එතැනින් ඒ දැරිය පාරට වැටීමෙන් අවාසනාවන්ත විධියට මිය ගිය බව පුවත් පත් මඟින් ඔබතුමන්ලා දකින්න ඇති. හරියටම ඔක්තෝබර් 01 වන දා ලෝක ළමා දිනය දවසේ තමයි මේ කනගාටු දායක පුවත අහන්නට ලැබුණේ. මෙවැනි තත්ත්වයන් යටතේ දිවෙන බස් රථ තමයි අද අපේ රටේ වැඩි වශයෙන් තිබෙන්නේ. ඒ නිසා මේකට ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඒ පැත්තෙන් සකස් විය යුතුයි.

මා මතක් කරන්න ගත්තේ විශේෂයෙන්ම මහානාම ජාතික පාසලේ වසා තිබෙන hostels ගැනයි. විශාල දුරක් ගෙවා මේ පාසලට එන දරුවන්ට මේ පාසලේ නවාතැන් ගෙන අධ්‍යාපනය ලැබීමට හැකි වන පරිදි වසා තිබෙන hostelsවලට අනිවාර්යයෙන් hostel පාලකයකු හෝ පාලිකාවක හෝ යොදවා මේ කටයුත්ත ආරම්භ කරන්න.

තවත් කාරණයක් කියන්න තිබෙනවා. උසස් පෙළ විෂයන් සඳහා අප කොතෙකුත් මානව සම්පත් සහ භෞතික සම්පත් ලබා දී තිබුණත්, මහානාම මහා විද්‍යාලයේ හා රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ උසස් පෙළ විෂයන්ට -විශේෂයෙන් විද්‍යා විෂයන්ට- ලබා දෙන ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. මේ වන විට

[ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය]

පළාත් සභා පාසල්වල ගුරුවරුන් ටිකක් තමයි ඒ සඳහා අනුයුක්ත කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම උසස් පෙළ විද්‍යා විෂයයන් උගන්වන ගුරුවරුන් පළාත් සභා පාසල්වලට පත් කරනවා. ඒ අය ජාතික පාසල්වලට පත් කළ යුතුව තිබුණත් එසේ කරන්නේ නැහැ. පළාත් සභාවෙන් ඒකට අවසර නැහැ. සමහර විට පළාත් සභාව විරුද්ධ වෙනවා. මෑතක සිට අවුරුද්දක පමණ කාලයක් ඒ ගුරුවරුන් අනුයුක්ත කර ගෙන තමයි මේ පාසල්වල කටයුතු කර ගෙන යන්නේ. නමුත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඒ අය කොහොමවත් ස්ථිර කරන්නේ නැහැ. ඔවුන් මේ පාසලටම පත් කරන ලෙස අපේ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙනුත් මා ඉල්ලීමක් කළා. එතුමාත් විශේෂ ආරාධිත අමුත්තා හැටියට අපේ ළමා දින ජාතික උත්සවයට මහානාම මහා විද්‍යාලයට පැමිණියා. ඒ අවස්ථාවේදීත් විශාල පිරිසක් ඉල්ලීම් කළා, දැනට ජාතික පාසල්වලට අනුයුක්ත කර තිබෙන පළාත් සභා ගුරුවරුන් ඒ පාසල්වලටම ලබා දෙන්න, එහෙම නැත්නම් මේ පාසල්වල අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවාය කියලා. නමුත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඒ සඳහා කිසිම ඉඩක් නැහැ. ඒ අය ලබා දෙන්න බැහැයි කියනවා. ඉතින් මේක ඇත්තටම විහිළුවක්. පළාතක් තුළ කටයුතු කිරීමේදී පළාතට අවශ්‍ය පරිදි, පාසලට අවශ්‍ය පරිදි, අධ්‍යාපන ක්ෂේත්‍රයට අවශ්‍ය පරිදි නිලධාරින් යම් කිසි නම්‍යශීලීභාවයකින් යුතුව ක්‍රියා කරනවා නම් මීට වඩා හොඳ අධ්‍යාපනයක් අපේ දරුවන්ට ලබා දෙන්න හැකි වෙනවා කියලායි මගේ විශ්වාසය. ඒ නිසා රාජ්‍ය නිලධාරින් මීට වඩා ක්‍රමවත් විධියට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා. ඌව පළාතේ විස්තර තමයි මා ඉදිරිපත් කරන්නේ. අනික් පළාත්වලත් මේ හා සමාන ප්‍රශ්න ඇතියි කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී තවත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. රුපියල් කෝටි ගණනක් වැය කර හිටපු ජනාධිපති ප්‍රේමදාස මහත්මයා විශ්වවිද්‍යාලයක් බවට ආරම්භ කළ මොනරාගල දිස්ත්‍රික්කයේ ගම් උදාවේ විශ්වවිද්‍යාලයේ මෑත කාලය වන තුරු අවුරුදු ගණනාවක් තිස්සේ ව්‍යවහාරික විද්‍යා පීඨය පවත්වා ගෙන ගියා. යම් යම් කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක් නිසා සම්පූර්ණ විශ්වවිද්‍යාලයම අස් කර ගෙන සබරගමුව විශ්වවිද්‍යාලයට ගෙන ආවා. මේ වන විට එම විශ්වවිද්‍යාලයේ තිබුණු රුපියල් කෝටි ගණනක් වටිනා ද්‍රව්‍ය, විශේෂයෙන්ම ෆෑන් සහ තවත් සම්පත් රාශියක් ඒ ස්ථානවලින් ගලවා ගෙන ගිහින් තිබෙනවා. රුපියල් කෝටි ගණනක් වැය කර අක්කර දෙසියයක පමණ බිම් කොටසක පවත්වා ගෙන ගිය මේ විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන් කඩා බිඳ වැටෙන තත්ත්වයකට පත් කර තිබෙනවා. මා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාටත් මේ පිළිබඳව ඉල්ලීම් කරලා, සාකච්ඡා කීපයක් පැවැත්වූවා. අලුතින් විශ්වවිද්‍යාල ඇති කරන්න අපි වර්ෂයක් පාසා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කරනවා; ඒවායේ අලුත්වැඩියාවන් සහ වැඩ කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා. විශ්වවිද්‍යාලයක් බවට ගෙන යන්න පුළුවන් තත්ත්වයකට අංග සම්පූර්ණව තිබුණු බුත්තල විශ්වවිද්‍යාලය නැවත වතාවක් ආරම්භ කරන්න.

මොනරාගල දිස්ත්‍රික්කය දුප්පත්ම දිස්ත්‍රික්කය නමින් හැම දාම හඳුන්වනවා. පසු ගිය කාලවල නොයෙකුත් රාජ්‍ය නොවන ආයතනවලට, රාජ්‍ය ආයතනවලට, විශේෂයෙන්ම යුනිසෙෆ් ආයතනයට පවා වාර්තා වෙලා තිබුණේ මොනරාගල දිස්ත්‍රික්කය ඉතාම දුප්පත් දිස්ත්‍රික්කයක් වශයෙනුයි. එහෙම නම් දුප්පත් දිස්ත්‍රික්කවල යම් කිසි සංවර්ධනයක් වෙමින් පවතින දේවල් වෙනස් කරන්නේ ඇයි කියන එක පිළිබඳව විශේෂයෙන් මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්න කැමැතියි. [බාධා කිරීමක්] දැන් සෞභාග්‍ය වේගෙන එනවා. ඇත්තටම මා "නැහැ" කියන්නේ නැහැ. මේ සෞභාග්‍යය කරා යන අවස්ථාවක්. එම නිසා මෙහි තිබෙන ඒවා වෙනත් තැන්වලට අර ගෙන යන්නේ නැතිව කටයුතු කරන්න ඕනෑ. අර ගෙන ගියත් කමක් නැහැ, අපේ දිස්ත්‍රික්කයත් සංවර්ධනය වෙලා. පසු ගිය දවස්වල නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක් ඝාතනය කළ නිසා ඒක කොතැනටද ගෙනි යන්නේ කියා තීරණයක් කර ගන්න බැරිව හිටියා. එවැනි අවස්ථාවල මොනරාගල මේ විශ්වවිද්‍යාලය ආරම්භ කරන්නට හොඳටම පුළුවන්කම තිබුණා. ඒ ආකාරයට නැවත වතාවක් බුත්තල විශ්වවිද්‍යාලය විවෘත කරන ලෙස ගරු අමාත්‍යතුමාට හා රජයේ බලධාරින්ට මතක් කරනවා. විශේෂයෙන් ඒ පිළිබඳව නිලධාරින්ට මතක් කරන්නට කැමැතියි. බොහෝ විට අමාත්‍යවරුන් උපදෙස් දෙනවා. [බාධා කිරීමක්] කැබිනට් එකේත් මේ සම්බන්ධව කථා කර තිබෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් පියවර ගනීවිය කියා මා විශ්වාස කරනවා. ඒ විශ්වවිද්‍යාලය පිළිබඳව ඒ කටයුතු ඒ විධියට අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි. අද ඒ විශ්වවිද්‍යාලයේ වැඩ කළ නිලධාරින් සීසී කඩ ගිහින් තිබෙනවා. මොනරාගල සිට සබරගමුවට එන්න ඒ අයට පහසුකම් නැහැ. ඒ අය මොනරාගල සිටමයි සබරගමුව විශ්වවිද්‍යාලය දක්වා එන්නේ. එතැන වැඩ කළ නිලධාරින් මොනරාගල දිස්ත්‍රික්කයෙන් වාගේ බඳවා ගත්තා. මොනරාගල කිව්වාට මොනරාගල දරුවන් නොවෙයි මෙහි ඉගෙන ගත්තේ. වෙනත් පිටස්තර දිස්ත්‍රික්කවල දරුවන් පමණයි ඉගෙන ගත්තේ. මා දන්නා තරමට මොනරාගල කිසිම ළමයෙක් මෙහි අධ්‍යාපනය ලැබුවේ නැහැ. එහෙම නම් ඒ ස්ථානය සහ තිබුණු සම්පත් ගැන බලන විට සම්පත් විශාල ප්‍රමාණයක් තිබුණා. දැනට වුණත් කෘෂිකර්ම ප්‍රදේශයක් හැටියට මොනරාගල දිස්ත්‍රික්කයේ ඒ සම්පත් උපයෝගී කර ගෙන කටයුතු කරන්නට පුළුවන්. මෙහි පවත්වා ගෙන ගියේ ආහාර තාක්ෂණය පිළිබඳ පාඨමාලායි. එම නිසා එවැනි කටයුත්තකට මෙය විශ්වවිද්‍යාලයක් බවට පත් කරන්නට පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා තව කාරණයක් මතක් කරන්නට ඕනෑ. මා කියා ගෙන ආ මහානාම මහා විද්‍යාලයේ - [බාධා කිරීමක්] උසස් පෙළ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනුවේදනීය කථාවක්. හැබැයි වෙලාව නම් -

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු කථානායකතුමනි, අද දරුවන් පාස් වෙන්නේ, විශ්වවිද්‍යාලයට තේරෙන්නේ ඇත්තටම බාහිර පන්තිවලට ගිහිනුයි. ඒකට හේතුව මා මතක් කළ පරිදි උසස් පෙළ පන්තිවලට උගන්වන්න ගුරුවරුන් නැති කම නිසා ළමයින් වෙනත් පන්තිවලට යැමයි. නමුත් උසස් පෙළ විභාගයට ඉදිරිපත් වෙන්න ගිය විට සියයට අසූවක් පැමිණීම නැහැයි කියා ඒ ළමයින්ට උසස් පෙළ විභාගයට පෙනී සිටින්නට අවස්ථාවක් ලබා දෙන්නේත් නැහැ. ඉස්කෝලවල ගුරුවරුනුත් නැහැ. නමුත් සියයට අසූවක් පැමිණීම නැති වුණාම විභාගයට ඉදිරිපත් වීමේ අවස්ථාව ලබා දෙන්නේත් නැහැ. ඒ ආකාරයට කටයුතු කිරීම ඉතාමත් අසාධාරණයි කියා මා මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි. මේ ගැන දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළ බලධාරින්ගේ අවධානයට ලක් කර ගන්නටය කියා මා විශේෂයෙන් මතක් කරනවා.

මගේ අමාත්‍යාංශයට සම්බන්ධ පූර්ව ළමා විය පිළිබඳව විවිධ වැඩසටහන් මේ වන විට ක්‍රියාත්මක කර ගෙන යනවා. මුල් ළමා විය සංවර්ධනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් අප සකස් කර තිබෙනවා. පෙර පාසල් ආරම්භ කර තිබෙනවා. [බාධා කිරීමක්] අවම ප්‍රමිතීන්ට අනුව ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම නියමිත ප්‍රමිතීන්ට පෙර පාසල් ලියා පදිංචි කිරීම අප කර ගෙන යනවා. [බාධා කිරීමක්] පළාත් සභාවේ ඒවා තිබෙනවා. මගේ අමාත්‍යාංශයටත් පෙර පාසල් සම්බන්ධව සොයා බලන්න ළමා ලේකම් කාර්යාලයක් තිබෙනවා. ඒ වාගේම ළමා ලේකම් කාර්යාලය මඟින් ලියා පදිංචි වුණු ආයතනවලටයි ඩිප්ලෝමා ලබා දෙන්න පුළුවන්. ඩිප්ලෝමා ලබා දෙන ආයතන අනිවාර්යයෙන්ම අපේ අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයේ ලියා පදිංචි වන්නට ඕනෑ. ඒ ආයතනවලට පමණයි පෙර පාසල් ගුරුවරුන් පුහුණු කරන්නට පුළුවන්කම ලැබෙන්නේ. අද විවිධ ආයතන තිබෙනවා.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
පෞද්ගලික ආයතන?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
පෞද්ගලික ආයතන අපේ ළමා ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරන්නට ඕනෑ. ඒවාට නීත්‍යනුකූලභාවයක් අනිවාර්යයෙන්ම ලබා දී තිබෙනවා. ඒවා නියමිත ප්‍රමිතීන්ට අනුව පුහුණු කරන ආයතන වෙන්නට ඕනෑ. ප්‍රමිතීන් බලලයි අප ලියාපදිංචි කරන්නේ. [බාධා කිරීමක්] පිළිගන්නවා. පළාත් සභාවත් සමඟ අප එකට ඒකාබද්ධ වෙලායි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. ඒක ජාතික මට්ටමෙන්. අනෙක් වැඩ පිළිවෙළ ඒකාබද්ධ නොවුණාට ඒ වැඩ පිළිවෙළ ඒකාබද්ධව අප කරනවා. ඒකේ ගැටලුවක් නැහැ. ඒ අයත් එකඟයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා බලා ගෙන ඉන්නවා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මා කියා ගෙන ආවේ ජාතික පාසල්වල අවුරුදු පහළොව විස්ස දිගටම එක තැන වැඩ කරන ගුරුවරුන් සිටිනවා කියලායි. මේ අය සඳහාත් ප්‍රතිපත්තිමය වශයෙන් ස්ථාන මාරු කිරීමේ වැඩ පිළිවෙළක් හදන්නට වෙනවා. මොකද, අලුතෙන් ගුරුවරයෙක් ආවොත් ඒ ගුරුවරුන්ට වැඩ කරන්නට දෙන්නේ නැති තත්ත්වයකුත් තිබෙනවා. එම නිසා ගුරු මාරු සම්බන්ධයෙන් කටයුතු කරන කොට එක කොටසකට වෙනමත, තවත් කොටසකට වෙනමත් නැතිව සාධාරණීකරණය කර කටයුතු කරනවා නම්, මේ ගුරු මාරු ක්‍රමය හරියට ක්‍රියාත්මක කරනවා නම් ඉතාමත් වැදගත් වෙනවා.

දැනට අලුතෙන් බඳවා ගත් උපාධිධාරින්ට සහ ඩිප්ලෝමාධාරි ගුරුවරුන්ට ලබා දෙන පුහුණුව කඩිනම් කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ සඳහා දැනට ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නැහැ. ඒ සඳහාත් පරිපූරක ඇස්තමේන්තු මගින් හෝ වෙනත් මාර්ගයකින් හෝ මුදල් ලබා ගෙන ඉතා කඩිනමින් පුහුණු කර විද්‍යාලවල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඒ අය යොද වන්නටය කියා ඉල්ලීමක් කරමින් මා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යතුමාගේත්, ඉහළ බලධාරින් සියලු දෙනාගේත් අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමාට මූලාසනය ගන්න කියා මා ආරාධනය කරනවා.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

[පූ.භා. 10.43]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පුනරාවර්තන වියදම් අපේක්ෂාවෙන් අධ්‍යාපන අමාත්‍යතුමා පරිපූරක මුදලක් ඉල්ලා සිටිනවා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයත්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවත්, එහි ක්‍රියාකාරිත්වයත් පිළිබඳ බොහෝ කරුණු කථා කරන්න ඕනෑකමක් තිබෙනවා. කෙසේ වුවත් ගරු අමාත්‍යතුමා මේ ගරු සභාවට පැමිණේවි කියා අප හිතනවා. එතුමා මේ ගරු සභාවේ සිටින වෙලාවක මේ සාකච්ඡාව - කථා බහ - කර ගන්න ලැබුණා නම් හොඳයි කියා මම හිතුවා. ඒ මොකද, එතුමා අධ්‍යාපන අමාත්‍යතුමා පමණක් නොවෙයි. එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමා. මම අවධානය යොමු කර වන්න කැමැතියි, මෙන්න මේ කාරණය කෙරෙහි. එතුමා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට කරන කටයුතු ක්‍රියාකාරකම්වලට වඩා වැඩියෙන් ටිකක් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා හැටියට ඔහුගේ කාර්ය භාරය පිළිබඳ යමක් පැහැදිලි කරන්න කියා මම ඉල්ලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය පැහැදිලි කරන්න සිද්ධ වෙන්නේ විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අතර සන්ධාන ආණ්ඩුවක් ගොඩ නැඟීමට අත්සන් කරන ලද ගිවිසුමක්, එකඟතාවක් තිබුණ නිසායි. ඒ එකඟතාවත්, ඒ ගිවිසුම් එකින් එක බිඳ වට්ටමින්, කඩා වට්ටමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කටයුතු කරන ආකාරය පිළිබඳව ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන අමාත්‍යතුමාට, ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයාට අවධානය පිණිස යොමු කරන්න ඕනෑය කියා මා කල්පනා කළා. මේ අද ගොඩ නැඟී තිබෙන ආණ්ඩුවත්, ඒ වාගේම අද අපේ රට පාලනය කරන ජනාධිපතිතුමාත් ඕපපාතිකව ඔහේ පහත් වුණා නොවෙයි. මේ රටේ ඓතිහාසික දේශපාලන තීන්දු තීරණවල ගමන් මඟක ප්‍රතිඵල ලෙස තමයි අද මේ ආණ්ඩුව පවතින්නෙත්; අද මේ ජනාධිපතිවරයා පවතින්නෙත්. ඒ නිසා ඒ ඓතිහාසික තීන්දු තීරණවල ඒ ගමන් මඟ පිළිබඳව නැවත අපි අගැයීමක්, සමාලෝචනයක් කර ගත යුතු අවස්ථාවකට ඇවිල්ලා තිබෙනවා. මොකද, මේ වෙලාවේ රටේ සිද්ධ වන සිදු වීම් සහ ක්‍රියාකාරකම් දෙස අවධානය යොමු කර බලන විට ඒක කළ යුතුව තිබෙනවා. අප කාටත් මතකයි, 2000 මහ මැතිවරණයේදී පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කර 2001 වැනි කෙටි කාලයක් ඇතුළත පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව කඩා වැටුණා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එවකට පොදුජන එක්සත් පෙරමුණේ හිටපු මුස්ලිම් කොංග්‍රසය ඉවත් වීමත්, ඒ වාගේම එහි ඇමතිවරු නියෝජ්‍ය ඇමතිවරු එකොළොස් දෙනෙක් ඉවත් වීමත් හරහා ඒ ආණ්ඩුව කඩා වැටුණා. 2001 අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 5 වන දා පැවැති මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළා. එක්සත් ජාතික පක්ෂය 2001 අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 5 වන දා ජයග්‍රහණය කර ගත කළ අවුරුදු දෙකකුත් මාස දෙකකට ආසන්න කාල පරිච්ඡේදය ඇතුළත අපේ රට ඉතාමත් අහිතකර තීන්දු තීරණ ගත්ත අහිතකර ගමනක් දක්වා ගෙන ගියා. විශේෂයෙන්ම අපි දන්නවා, රටේ මතු වී තිබෙන ජාතික ගැටලුව අරභයා එක්සත් ජාතික පක්ෂය අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය, ක්‍රමානුකූලව අපේ රට තුළ එල්ටීටීඊ සංවිධානය සමාන්තර රාජ්‍යයක් ගොඩ නැඟීම දක්වා තල්ලු වෙමින් ආව බව. 2002 අවුරුද්දේ පෙබරවාරි මාසයේ 22 වන දා කොටි සංවිධානයත් සමඟ සටන් විරාම ගිවිසුමකට අත්සන් කර එතැන් සිට ගත වුණු සෑම දිනයක්ම සතියක්ම මාසයක්ම ගත කරමින් තිබුණේ වෙනම රාජ්‍යයක් ගොඩ නැඟීමේ දිසාවට. අවසානයේදී තමයි කොටි සංවිධානය විසින් අපේ රටේ වෙනම රාජ්‍යයක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යවස්ථානුකූලවත්, නීත්‍යනුකූලවත්, ජාත්‍යන්තරයේ පිළිගැනීමටත් ලක් වන පරිදි වෙනම රාජ්‍යයක් ගොඩ නැඟීමට අවශ්‍ය වන අන්තර්පාලන යෝජනාවලිය ඉදිරිපත් කළේ. ඒ 2003 අවුරුද්දේ නොවැම්බර් මාසය මුලදීයි. ඒ අන්තර් පාලන යෝජනාවලිය සාකච්ඡාවට ගැනීමත්, ඒ අන්තර් පාලන යෝජනාවලිය ක්‍රියාවට නැඟීමත් අනිවාර්යයෙන්ම අපේ රට තුළ වෙනම රාජ්‍යයක් ගොඩ නැඟීමට

[ගරු අනුර දිසානායක මහතා]

අවශ්‍ය වන යටිතල පහසුකම් සහ ගොඩ නැඟීම බල කර තිබුණා. එක්සත් ජාතික පක්ෂය ජාතික ප්‍රශ්නය අරභයා ඒ ගමන් කරමින් තිබුණු ගමන් මාර්ගය වෙනස් කරන්න, ඒ වෙනුවට අපේ රටේ ඒකීය භාවය, සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සමඟිය, මාතෘ භූමියේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා දැඩි තීන්දු තීරණ ගැනීමට එළඹීමට අවශ්‍ය වන වටපිටාවක් නිර්මාණය කළා, එක්සත් ජාතික පක්ෂයේ අවුරුදු දෙකකුත් මාස දෙකක කාල පරිච්ඡේදය ගමන් කළ විධියට අනුව.

ඒ විතරක් නොවෙයි. ආර්ථික පැත්තෙන් බැලුවොත් එක පැත්තකින් දුම්රිය දෙපාර්තමේන්තුව දුම්රිය අධිකාරියක් බවට පත් කර පෞද්ගලීකරණය කිරීමට තමයි සැලැස්ම හදලා තිබුණේ. ඒ වාගේම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව තිබුණු තෙල් ගෙන්වීමේ, බෙදා හැරීමේ, විකිණීමේ ඒකාධිකාරය අහෝසි කරන පනත 2003 වර්ෂයේදී පාර්ලිමේන්තුවට ගෙනැවිත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කොටස් තුනෙන් එකක්, ඒ වගේම ගබඩා කෙරෙන පද්ධතියේ කොටස් තුනෙන් එකක්, ඒ වගේම petrol sheds 100ක් Indian Oil Company එකට විකුණලා දැම්මා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉතුරු ටික විකුණන්න මහා භාණ්ඩාගාරයට දාලා තිබුණා. ඒ වගේම විදුලිබල මණ්ඩල සංශෝධන පනත ගෙනැවිත් එතෙක් විදුලිබල මණ්ඩලය සතුව තිබුණු විදුලිබල උත්පාදනයේ, බෙදා හැරීමේ සහ සම්ප්‍රේෂණයේ ඒකාධිකාරය කඩලා වෙනම පෞද්ගලික සමාගම් වෙත ලබා දීමේ ගමනකට එක්සත් ජාතික පක්ෂය අවතීර්ණ වෙලා තිබුණා. ඒ වගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත්, සුරා බදු දෙපාර්තමේන්තුවත්, රේගු දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධ කරලා ආදායම් බදු අධිකාරියක් හදලා එහි කටයුතු පෞද්ගලීකරණය කිරීම සඳහා සැලැස්මක් හදලා තිබුණා. ඒ විතරක් නොවෙයි. "Regaining Sri Lanka" කියන සැලැස්ම යටතේ අපේ රටේ බීජ ගොවි පොළවල්වල පැවැත්ම, රජය සතුව තිබෙන මහඉලුප්පල්ලම ගොවි පොළ සහ රජය සතුව තිබෙන අනෙකුත් ගොවි පොළවල් ටික බහු ජාතික සමාගම් වෙත පැවරීම සඳහා සැලැස්මක් සකස් කර තිබුණා. "Regaining Sri Lanka" පොතේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, අපේ රටේ වනාන්තරවල කළමනාකරණය ක්‍රමානුකූලව පෞද්ගලික සමාගම් වෙත පැවරීම සඳහා සැලැස්මක් සකස් කර තිබෙන බව. ජල සම්පත පෞද්ගලීකරණය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් එවකට වාරිමාර්ග අමාත්‍යවරයා ලෙසට කටයුතු කරපු ජයවික්‍රම පෙරේරා මැතිතුමා විසින් සකස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා කැස කවමින් තිබුණා. ඒ වාගේම ලංකා බැංකුව හා මහජන බැංකුව විකිණීම පිළිබඳවත් කටයුතු කරමින් තිබුණා. මේ පාර්ලිමේන්තුවේදී අපි ඇහුවා, ලංකා බැංකුවත් මහජන බැංකුවත් විකුණනවාද කියලා. ඒ වෙලාවේදී ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ලෙස කටයුතු කරපු මිලින්ද මොරගොඩ මැතිතුමා කිව්වා, ලංකා බැංකුවත් මහජන බැංකුවත් මේ අවුරුද්දේ විකුණන්නේ නැහැ, විකිණීමට අවශ්‍ය පරිදි සූදානම් කිරීම තමයි මේ අවුරුද්දේ කාර්ය භාරය කියලා. එක පැත්තකින් ජාතික ප්‍රශ්නය පිළිබඳවත්, අනෙක් පැත්තෙන් ආර්ථිකය පිළිබඳවත්, තව පැත්තකින් අපේ රටේ සම්ප්‍රදායන්, සංස්කෘතීන් පිළිබඳවත් ඉතාම නරක ගමනකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් අපේ රට අවතීර්ණ කරමින් තිබුණා. මේ ගමන පරාජයට පත් කිරීම, මේ ගමන නතර කිරීම අනිවාර්ය සාධකයක් බවට ඒ මොහොතේ පැන නැඟිලා තිබුණා. ඒ අනිවාර්ය සාධකයේ ප්‍රධාන පංගුකරුවන් හැටියට ජනතා විමුක්ති පෙරමුණ ඉදිරියෙන්ම ඉඳිමින් කටයුතු කරමින් තිබුණා. රටට විෂකුරු වූ, රටට අහිතකර වූ එක්සත් ජාතික පක්ෂයේ මේ ගමන පරාජයට පත් කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරන්නේ කොහොමද කියලා අපි කල්පනා කළා. ඒ අනුව පාරට බැහැලා උද්ඝෝෂණ කරමින්, ජනතාවත් එක්ක එකට පෙළ ගැහිලා පා ගමන් කරමින් එක්සත් ජාතික පක්ෂය මේ ගෙන යන දුර්දාන්ත පාලනය පරාජයට පත් කිරීම සඳහා, දුර්දාන්ත තීන්දු පරාජයට පත් කිරීම සඳහා උත්සාහ කළා. නමුත් එවකට අගමැතිවරයා ලෙසට කටයුතු කරමින් සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනතාවගේ හඬට ඇහුම් කන් නොදී, පාරට බහින ජනතාවගේ හඬට ඇහුම් කන් නොදී, ජනතාවගේ ජන මතයට ඇහුම් කන් නොදී හිතුවක්කාර ලෙස තීන්දු තීරණ අරගෙන කටයුතු කරමින් තිබුණා. ඒ නිසා මේ රට ඇද ගෙන යන ඉතාමත් බියකරු ව්‍යසනකාරී ගමන නතර කරන්න නම් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් කිරීම අනිවාර්ය සාධකයක් ලෙස තිබුණා. ඒ ගමන පරාජයට පත් කළ හැක්කේ එකම එක විධියටයි, ඒ අන් කවරක් නොව, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පෙරළා දැමීමෙන් පමණක්මයි කියා අප කල්පනා කළා. ඒ ආණ්ඩුව පරාජයට පත් කරන්නේ කෙසේද යන සාකච්ඡාව සමාජයේත් තිබුණා; අපේ පක්ෂය තුළත් තිබුණා. ඒ අනුව තමයි අපි කල්පනා කළේ මෙය පරාජයට පත් කරන්නට හැකිව තිබෙන්නේ වෙන කවර අන්දමකින්වත් නොවෙයි, අවම කොන්දේසි යටතේ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අපත් අතර ඇති කර ගන්නා එකඟතාවකින්, ඒ එකඟතාව මත පිහිටුවා ගන්නා ආණ්ඩුවකින් පමණයි කියලා. මොකද, ඒ නිශ්චිත මොහොතේ ජනතා විමුක්ති පෙරමුණට තනිව එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් කර වෙනත් ආණ්ඩුවක් ගොඩ නැඟීමේ හැකියාව තිබුණේ නැහැ; ශක්‍යතාව තිබුණේ නැහැ. ඒ නිසා කළ හැකි වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක ඒකාබද්ධතාවකට ඇවිත් මේ ගමන පරාජයට පත් කිරීමයි කියා අප කල්පනා කළා. ඒ අනුව දීර්ඝ ඉතිහාසයක් තුළ අපි සාකච්ඡා කළා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත් සමඟ, ඒ වාගේම මංගල සමරවීර මැතිතුමා, කදිර්ගාමර් ඇමතිතුමා වැනි අයත් සමඟ මේ පිළිබඳව අපි දීර්ඝ ලෙස සාකච්ඡා කළා. මේ සාකච්ඡාවල අවසාන ප්‍රතිඵලයක් හැටියට එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩ නැඟීම කියන කාර්ය භාරයට එන කොට නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැත්තෙන් මේක අත් හැරියා. අත් හැරලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකාව තීන්දු කළා, එක්සත් ජාතික පක්ෂයත් එක්ක සමඟි සම්පන්න පාලනයක් ගෙන යන්න පුළුවන්ද කියලා බලන්න, මනෝ-මලික් සාකච්ඡා පටන් ගන්න. මනෝ තිත්තවැල්ල මහතා සහ මලික් සමරවික්‍රම මහතා අතර සාකච්ඡා පටන් ගත්තා, එක්සත් ජාතික පක්ෂයත් සමඟ එකඟතා වැඩ පිළිවෙළකට යන්න. හැබැයි ඒ එකඟතා සහිත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණා නම් ඒක රනිල් වික්‍රමසිංහ මැතිතුමා අනුගමනය කරමින් තිබුණු ආර්ථික ප්‍රතිපත්තිය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අනුගමනය කරමින් තිබුණු ජාතික ප්‍රශ්නය පිළිබඳ ප්‍රතිපත්තිය ආපසු හැරවීමේ ගමනක් වන්නේ නැහැ. ජනාධිපතිතුමියගේ විධායක බලතලත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආශීර්වාදයත්, ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු බලයත්, පළාත් පාලන ආයතනවල බලයත් යන මේ සියල්ල පාවිච්චි කර ඒ දුර්දාන්ත ගමන තවත් වේගවත් කරන, ඒ දුර්දාන්ත ගමන කාර්යක්ෂම කරන එකක් වන්නට ඉඩ තිබුණා. ඒ දුර්දාන්ත ගමනෙන් අපේ රට බෙදා වෙන් වෙන ඉම දක්වා තල්ලු වීමේ අනතුර තිබුණා. මේ අනතුර ඉතාමත් දැඩිව ගැඹුරින් කල්පනා කරලා මේක පරාජයට පත් කිරීම අනිවාර්ය සාධකයක් කොට සලකලා ජනතා විමුක්ති පෙරමුණේ අපි අත් නොහැර සාකච්ඡා මේසයේ වාඩි වෙමින් සාකච්ඡා කළා. එහි එක අවස්ථාවක් මට මතකයි. 2004 පෙබරවාරි මාසය වෙන කොට වයඹ පළාත් සභා මැතිවරණය කැඳවා තිබුණා. වයඹ පළාත් සභා මැතිවරණය කැඳවපු වෙලාවේ සාකච්ඡා පවත්වමින් තිබුණා. අපි කිව්වා, වයඹ පළාත් සභා මැතිවරණය ඉතාමත් තීරණාත්මක අවස්ථාවක් වන නිසා එක්සත් ජනතා නිදහස් සන්ධානය වයඹ පළාත් සභා මැතිවරණයේ නාම යෝජනාවලට පෙර ගොඩ නැඟිය යුතුයි කියලා. ඒ අපේ කොන්දේසිය. මට මතක හැටියට 2004 අවුරුද්දේ පෙබරවාරි මාසයේ 15 වෙනි දා තමයි, වයඹ පළාත් සභාව සඳහා නාම යෝජනා කැඳවා තිබුණේ. වයඹ පළාත් සභා නාම යෝජනාවලට පෙර එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩ නැඟෙන්නේ නැත්නම්, වයඹ පළාත් සභා මැතිවරණයට අපි තනිවම තරග කරනවා, එතැන් සිට අප අතර එක්සත් ජනතා නිදහස් සන්ධානය හෝ එකට ආණ්ඩු කිරීම හෝ එකට සන්ධාන ගත වීම හෝ පිළිබඳව සාකච්ඡාවක් නැහැ කියලා, 2004 අවුරුද්දේ පෙබරවාරි 15 වෙනි දා සාකච්ඡාවේ කඩ ඉම් තීන්දුවක් හැටියට අපි දුන්නා. විශේෂයෙන්ම එවකට මංගල සමරවීර මැතිතුමාත්, ඒ වාගේම කදිර්ගාමර් ඇමතිතුමාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළේ කර ගන්නා ලද යම් සාකච්ඡාවක් තිබුණා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය තමන්ගේ විධායක ජනාධිපති ධුරයේ හිර වෙලා තිබුණු අවස්ථාවක් එය. මේ සියල්ල පාවිච්චි කරලා ජනතා විමුක්ති පෙරමුණේ අප්‍රතිහත මැදිහත් වීමත්, අප්‍රතිහත කාර්ය භාරයත් විසින් අපට පුළුවන්කම ලැබුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩ නඟන්න.

අපේ රටේ ඉතිහාසයේ ඕනෑ තරම් සන්ධාන ගොඩ නැඟිලා තිබෙනවා. 1956 දී මහජන එක්සත් පෙරමුණ, 1970 දී සමඟි පෙරමුණ, 1994 දී පොදුජන එක්සත් පෙරමුණ, 2001 දී එක්සත් ජාතික පෙරමුණ ගොඩ නැඟුණා. 2004 දී එක්සත් ජනතා නිදහස් සන්ධානය කියන ඓතිහාසික සන්ධානය ගොඩ නැඟුණා. අපේ රටේ ඉතිහාසයේ ඕනෑම සන්ධානයක් ගොඩ නැඟෙන කොට ප්‍රධාන ලියවිලි දෙකකට අත්සන් කරනු ලබනවා. එකක් තමයි, ඒ ගොඩ නඟන ආණ්ඩුව කරනු ලබන වැඩ පිළිවෙළ මොකක්ද, ක්‍රියාවට නඟන වැඩ පිළිවෙළ මොකක්ද කියන එකඟතාව. දෙ වෙනි එක, එම සන්ධානය තුළට ඇතුළු වන ඒ ඒ දේශපාලන පක්ෂවල අයිතීන්, ඒ ඒ දේශපාලන පක්ෂවල සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගැනීම සඳහා එකඟ කර ගන්නා අවබෝධතා ගිවිසුම. මා හිතන්නේ මේක තමයි හැම දාමත් සන්ධාන ගොඩ නැඟෙන කොට ප්‍රධාන ලෙස කාර්ය භාරයට ලක් කරන්නේ. එකක් තමයි, ඒ ගොඩ නඟන ලද ආණ්ඩුවේ කාර්ය භාරය, වැඩ පිළිවෙළ මොකක්ද කියන එක. දෙ වෙනි එක, ඒ ගොඩ නැඟෙන සන්ධානයේ ඒ ඒ පක්ෂවල අයිතිය, ඒ ඒ පක්ෂවල සුරක්ෂිත භාවය ආරක්ෂා වෙන්නේ කොහොමද කියන එක. මේ විධියට ප්‍රධාන ලියවිලි දෙකකට අත්සන් කරනවා. ඒ අනුව තමයි 2004 අවුරුද්දේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව ගොඩ නැඟුණේ. ඒ පාලනය තුළ "රට පෙරට" වැඩ පිළිවෙළ ක්‍රියාවට නැඟීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි දීර්ඝ ලෙස සාකච්ඡා කරලා, අප අතර එකඟතාවකට එන්න පුළුවන් වුණා. ඊළඟට තමයි, ඒ ඒ පක්ෂවල සුරක්ෂිතභාවය, ඒ ඒ පක්ෂවල අයිතිය පිළිබඳව එකඟතාවකට එන්නේ කොහොමද කියන ප්‍රශ්නය පැන නැඟුණේ. ඒ ඒ පක්ෂවල අයිතිය පිළිබඳවත්, ඒ ඒ පක්ෂවල සුරක්ෂිතභාවය පිළිබඳවත් එකඟතාවකට එන්න අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබුවා. මේ තිබෙන්නේ ඒ අවබෝධතා ගිවිසුමයි. මට මතක විධියට මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කළේ 2004 අවුරුද්දේ ජනවාරි මාසයේ 20 වෙනි දා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ජනතා විමුක්ති පෙරමුණේ ලේකම් ටිල්වින් ද සිල්වා සහෝදරයාත් මේ ගිවිසුම අත්සන් කළා. පළමු වැනි එක, ඒ ගොඩ නඟන සන්ධානය විසින් ආණ්ඩු බලය ගත් විට ක්‍රියාවට නඟන වැඩ පිළිවෙළ ඇතුළත් ලියවිල්ල. දෙ වැනි එක ඒ ගොඩ නඟන සන්ධානය ඇතුළේ ඒ ඒ පක්ෂවල සුරක්ෂිතභාවය, ඒ ඒ පක්ෂවල අයිතිය ආරක්ෂා වෙන එකඟතාව ඇතුළත් ලියවිල්ල. එම එකඟතාව ඇතුළත් ලියවිල්ල මා සතුව තිබෙනවා. මේ ලියවිල්ල මත පදනම්ව ගොඩ නැඟෙන ව්‍යවස්ථාවක් තිබෙනවා. එතකොට එක්සත් ජනතා නිදහස් සන්ධානයට ප්‍රධාන ලියවිලි තුනක් තිබෙනවා. එකක් තමයි, එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව ක්‍රියාවට නඟන "රට පෙරට" වැඩ පිළිවෙළ ඇතුළත් ලියවිල්ල. දෙ වෙනි එක, එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩ නැඟීමේදී ඒ ඒ පක්ෂවල සුරක්ෂිත භාවය, අයිතිය ආරක්ෂා වෙන අවබෝධතා ලියවිල්ල. තුන් වෙනි එක, ඒ අවබෝධතා ලියවිල්ලේ ගත හැකි කරුණු අරගෙන ගොඩ නඟන ව්‍යවස්ථාව. මේ ලියවිලි තුන තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මුල් ගල් තුන, පැවැත්මට පදනම් වන කාරණා තුන. ඒ කියන්නේ "රට පෙරට" වැඩ පිළිවෙළ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඒ ඒ පක්ෂ අතර සුරක්ෂිතභාවය ආරක්ෂා කරන අවබෝධතා ගිවිසුම, ඒ සුරක්ෂිතභාවයේ යම් යම් වගන්ති අරගෙන ගොඩ නඟන එක්සත් ජනතා නිදහස් සන්ධාන ව්‍යවස්ථාව. මේක තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මුල් පවුරු තුන. 2004 දී මේ රට ඉතාමත් දුර්භාග්‍ය සම්පන්න තත්ත්වයකට ඇද දමන වෙලාවක, රට ඉතාමත් අතුරු අන්තරාකාරී, ව්‍යසනකාරී ගමනකට ඇද දමන වෙලාවක රටේ හිටපු නැති මහත්වරුන්, 2004 දී ඡන්දය පාවිච්චි කරන්නට හිටපු නැති මහත්වරුන්, 2004 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අනුගමනය කරන ලද තීන්දු තීරණ පරාජයට පත් කිරීම සඳහා පාරට බැහැලා එක අඩියක් පයින් ගමන් කළේ නැති මහත්වරුන්, එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩ නැඟීමේදි ඇති වුණු මූලික කාර්ය භාරයන් පිළිබඳව අබ මල් රේණුවක් තරම් දන්නේ නැති මහත්වරුන්, ඒ කාර්ය භාරය, ලියවිලි පිළිබඳව දන්නේ නැති, වරු ගණන්, දවස් ගණන්, මාස ගණන්, අවුරුදු ගණන් සාකච්ඡා කරපු ඒ සාකච්ඡා මේසයේ අහලකින් ගියේ නැති මහත්වරුන් අද මෙහි තීන්දු තීරණ ගන්නා තැනට ඇවිත් තිබෙනවා. ඒ නිසා ඉතාම නිර්ලජ්ජිත ලෙස, සදාචාර විරෝධී ලෙස, ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස, අයුක්ති සහගත ලෙස මේ ලියවිලි සියල්ල පසෙක ලා කටයුතු කරන තැනට අද මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. එය ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයක්. අප කවුරුත් අපේක්ෂා නොකරන තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සන්ධාන ගොඩ නඟන විට එකඟ වන ආණ්ඩුව ක්‍රියාවට නඟන වැඩ පිළිවෙළ බිඳෙන්න පුළුවන්. මා හිතන්නේ එහෙම තමයි බොහෝ සන්ධාන බිඳුණේ. 1970 දී ගොඩ නැඟුණු සමඟි පෙරමුණු ආණ්ඩුව ක්‍රියාවට නැඟු වැඩ පිළිවෙළ පිළිබඳ එකඟ නොවුණු නිසා සන්ධානයේ කොටසක් එළියට ගියා. එවිට පැන නැඟෙන්නේ කොයි ලියවිල්ලද? එකට ආණ්ඩුව ගොඩ නඟලා ක්‍රියාවට නඟන වැඩ පිළිවෙළට එකඟ නැත්නම් සන්ධානය බිඳෙනවා. හැබැයි ඒ බිඳුණු හැම සන්ධානයක්ම, හැම පක්ෂයක්ම බැඳී සිටියා, ප්‍රවේශම් සහගත වුණා ඒ ඒ පක්ෂවල අයිතිය, ඒ ඒ පක්ෂවල සුරක්ෂිතභාවය, ඒ ඒ පක්ෂවලට සන්ධානයේ අවබෝධතා ගිවිසුමෙන් ලැබී තිබෙන අයිතීන් සුරක්ෂිත කරන්න. කවුරුවත් එය උල්ලංඝනය කරලා නැහැ. එවැන්නක් මා දන්නේ නැහැ. ඉතිහාසයේ එවැනි අවස්ථා ගැන මා දන්නේ නැහැ. සන්ධාන ගොඩ නැඟීමේදී ඒ ඒ පක්ෂ අතර තිබෙන අයිතීන්, ඒ ඒ පක්ෂවල තිබෙන සුරක්ෂිතභාවය, ඒ ඒ පක්ෂවලට තිබෙන පිළිගැනීම ඉතිහාසයේ කවුරුවත් උල්ලංඝනය කරලා නැහැ. සන්ධාන ගොඩ නැඟීමේදී ආණ්ඩු පාලනය පිළිබඳ එකඟතාව උල්ලංඝනය කර තිබුණා.

අපි උදාහරණයක් ගනිමු. 2005 දී අප එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවෙන් එළියට ආවේ වෙන කවරක්වත් නිසා නොවෙයි, "රට පෙරට" වැඩ පිළිවෙළට අහිතකර සුනාමි සහන මණ්ඩලය කියන වැඩ පිළිවෙළක් ආ නිසයි. ඒක වෙන්න පුළුවන් ඕනෑම වෙලාවක. ඉතිහාසයේ සන්ධාන බිඳෙන්න පුළුවන් එහෙම. හැබැයි ඒ ඒ පක්ෂ අතර පැවැති එකඟතාව, ඒ ඒ පක්ෂවල අයිතිය පිළිබඳ එකඟතාව, ඒ ඒ පක්ෂවල සුරක්ෂිත භාවය පිළිබඳ එකඟතාව, ඒ ඒ පක්ෂවලට තිබූ අයිතීන් පිළිබඳ එකඟතාව කප්පාදු කරලා කඩාකප්පල් කරලා ඉතිහාසයේ ලංකා ආණ්ඩුව ඇතුළේ කිසිම සන්ධානයක් බිඳිලා නැහැ. එහෙම අපේ රටේ කවදාවත් සන්ධාන බිඳිලා නැහැ. හැම පක්ෂයක්ම තමන් සමඟ එක මොහොතකදී අවබෝධතා ගිවිසුම් අත්සන් කරලා එකට හිටපු දේශපාලන පක්ෂවල අයිතිය ආරක්ෂා කරන්න ප්‍රවේශම් වෙනවා. එකට හිටපු දේශපාලන පක්ෂවල තිබෙන සුරක්ෂිතභාවය ආරක්ෂා කරන්න පෙනී සිටිනවා. ඒක තමයි අපේ රටේ දේශපාලනයේ තිබෙන අවම සදාචාරය. ඒක තමයි මෙතෙක් හැම දේශපාලන පක්ෂයක්ම අවම වශයෙන් ආරක්ෂා කරපු සදාචාරය. වර්තමාන ආණ්ඩුව ඒ අවම සදාචාරයවත් ආරක්ෂා කරන්නේ නැති තැනට අද ඇවිත් තිබෙනවා. මා එකින් එක කියන්නම්. අපේ පක්ෂය තීන්දුවක් ගත්තා, අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු හැටියට සිටි වසන්ත සමරසිංහ සහෝදරයා - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විෂයට අදාළවද ඔය කථා කරන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, සන්ධානයේ ලේකම්තුමා හිටියා නම් මෙය එතුමාගේ විෂයට අදාළ වෙන්න තිබුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ සාකච්ඡාව යන්නේ අධ්‍යාපන විෂයට සම්බන්ධවයි. ඔබතුමා ඒ ගැන කථා කළොත් හොඳයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, කමක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේ, ආණ්ඩුවේ අධ්‍යාපනයක් නැතිකම තමයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අධ්‍යාපන විෂයට අදාළව කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කියන එක මා පිළිගන්නවා. ඔබතුමා කියන දේ ඉතා වැදගත් ලෙස පිළිගන්නවා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ එහෙම වෙලා නැහැ. ඔබතුමා මගෙන් විතරක් එසේ ඉල්ලා සිටින්න එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මා මූලාසනයේ සිටින අවස්ථාවේදී විෂයට අදාළව - [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම හොඳයි. අප ඒ ගැනත් අවධානය යොමු කරන්නම්. මා මේ කියන්නේ සන්ධානයේ ලේකම්තුමාගේ අධ්‍යාපනය පිළිබඳවයි. අධ්‍යාපනය නොමැති වීම පිළිබඳ ප්‍රශ්නයයි මා මේ සාකච්ඡා කරන්නේ. සදාචාරය සහ ඒ ඔක්කෝම එකට බැඳිලායි තිබෙන්නේ. සදාචාර ප්‍රශ්නයයි මේ මතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුරු මැද පළාත් සභාවට පත් කිරීම සඳහා ගරු වසන්ත සමරසිංහ මන්ත්‍රීවරයා අප විසින් ඉල්ලා අස් කර ගනු ලැබුවා. ඉන් පසුව අප විවිධ අවස්ථාවල සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයාට දැනුම් දීම් කළා, නමුත් ඒ කිසි දෙයක් සිදු වුණේ නැහැ. මා ඒවා එකින් එක කියන්නම්. අප අතර ඇති වුණු අවබෝධතා ගිවිසුම මා ළඟ තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

මේ මන්ත්‍රී ධුරය අපට අයිති වන්නේ කොහොමද කියා එහි වගන්ති කිහිපයක් උපුටා දක්වමින් මා කියන්නම්.

අවබෝධතා ගිවිසුමේ 17හි මෙසේ සඳහන් වී තිබෙනවා:

"සන්ධානය ඉදිරි මහා මැතිවරණයට ඉදිරිපත් වීමේ දී එය විසින් ඉදිරිපත් කරන දිස්ත්‍රික් නාම යෝජනා ලැයිස්තුවලත්, ජාතික ලැයිස්තුවෙන් ජනතා විමුක්ති පෙරමුණට හිමි විය යුතු සංඛ්‍යාවන් (1) පළමුවන උපලේඛණයේ සඳහන් වන පරිදි විය යුතු ය."

පළමු වැනි උපලේඛනයේ සඳහන්ව තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණට අපේක්ෂක තනතුරු ලැබෙන්නේ කොහොමද කියා. කොළඹින් තුනයි, ගම්පහින් තුනයි, කළුතරින් තුනයි, ගාල්ලෙන් තුනයි ආදි වශයෙන් අපේක්ෂක තනතුරු ප්‍රමාණය තිබෙනවා. ඊළඟට අංක 2 යටතේ මෙසේ සඳහන් වනවා:

"ජාතික ලැයිස්තුවෙන් ජනතා විමුක්ති පෙරමුණ සඳහා මන්ත්‍රී ධුර පහක් හිමි විය යුතුයි."

---

** **පුස්තකාලයේ තබා ඇත.***
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

මේ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ කවුද? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ ටිල්වින් සිල්වා සහෝදරයායි. ජාතික ලැයිස්තුවෙන් ජනතා විමුක්ති පෙරමුණට මන්ත්‍රී ධුර පහක් හිමි විය යුතුයි. මැතිවරණයෙන් පසුව චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත් සමඟ සාකච්ඡා කරන වෙලාවකදී එතුමිය ඇහුවා, "ලොකු අර්බුදයක අප පැටලිලා ඉන්නේ. එක්සත් ජනතා නිදහස් සන්ධානය ඇතුළේ කොමියුනිස්ට් පක්ෂය, සම සමාජ පක්ෂය වැනි තවත් පක්ෂ තිබෙනවා. ඒ නිසා ඒ අයට මන්ත්‍රී ධුරයක් පිරිනැමීමේ දුෂ්කරතාවකට මා මුහුණ දී සිටිනවා. මේ දුෂ්කරතාවෙන් ගැලවෙන්න උදව්වක් කරන්න ඔබතුමන්ලාට බැරිද?" කියා. අපි සෘජුව කිව්වා, "ඒ කියන්නේ ගරු ජනාධිපතිතුමියනි, ඔබට ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරවල අඩුවක් තිබෙනවාය කියන එකද, එහෙම නම් අපි ලෑස්තියි, අපේ මන්ත්‍රී ධුර දෙකක් දෙන්න" කියා. අපේ රටේ දේශපාලන ඉතිහාසයේ මෙවැනි පරිත්‍යාග කරපු කවුරුවත් ඉන්නවාද කියා අප දන්නේ නැහැ. මන්ත්‍රීකම්වලට පොර කන, මන්ත්‍රීකම්වලට පත් වෙන්න කවුරු හෝ මිය යන තුරු බලා ඉන්න මහා දූෂ්ට සම්පන්න සමාජයක්, දේශපාලනයක් තිබෙන්නේ. එවැනි සමාජයක් තුළ අප කිව්වා, "අප ලෑස්තියි මන්ත්‍රී ධුර දෙකක් දෙන්න" කියා. පස්සේ අපි මන්ත්‍රී ධුර දෙකක් දුන්නා. ඊට පසුව ජාතික ලැයිස්තුවෙන් අපට හිමි වන්නේ මන්ත්‍රී ධුර තුනයි. මේ අවබෝධතා ගිවිසුම අනුව අපට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුර පහක් හිමි විය යුතුයි. අපි එයින් දෙකක් ලබා දුන්නා. අනතුරුව අපට තිබෙන්න ඕනෑ මන්ත්‍රී ධුර තුනක්. එහෙම නම් ගරු වසන්ත සමරසිංහ මන්ත්‍රීවරයා කියන්නේ අවබෝධතා ගිවිසුමෙන් ජනතා විමුක්ති පෙරමුණට හිමි මන්ත්‍රී ධුරයක් දැරූ අයෙක්. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර පහක් අපට හිමි වුවත්, එය තුනක් කර ගත්තාට පසුව වසන්ත සමරසිංහ මන්ත්‍රීවරයා දැරුවේ අපට අයිති ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයකුයි. එතුමා ඉවත් වුණාට පසුව අපේ පක්ෂයේ ක්‍රියාකාරීව වැඩ කරන සුජිත් කුරුවිට සහෝදරයා ඒ පුරප්පාඩුවට පත් කරන්න නම් කරලා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට ඒ බව දන්වා යැව්වා. ඒක අපි නිකම් කරනවා නොවෙයි. ව්‍යවස්ථාවේ මොකක්ද තිබෙන්නේ? මේ මහත්වරු ගැන අපි හොඳින් දන්නා නිසායි මේවා ව්‍යවස්ථාවට ඇතුළත් කළේ. ඒ නිසා අපි ව්‍යවස්ථාවට මේ විධියට ඇතුළත් කළා. "සන්ධානය විසින් නම් කිරීම මත -නම් කිරීම මත කියන්නේ ජාතික ලැයිස්තුවෙන්- පත් වන මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා, පළාත් පාලන ආයතනවල -ඒ කියන්නේ පළාත් සභාත්, පළාත් පාලන ආයතනත් අපිත් එක්ක තරග කරනවා නම්- සන්ධානයේ නාම යෝජනා මත තේරී පත් වන, සන්ධානය විසින් පත් කරනු ලබන මන්ත්‍රීවරයෙක් එසේ පත් වීමෙන් පසුව එම ධුරය හිස් වූ විට -මතක තියා ගන්න- එම පුරප්පාඩුව පිරවීම සඳහා තත් කාලයේ බලපාන මැතිවරණ නීතියට යටත්ව සන්ධානයේ ලේකම්වරයා විසින් අයෙක් නම් කළ යුතු වෙයි. මැතිවරණ කොමසාරිස්වරයා හෝ මැතිවරණ කොමිසම විසින් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක එම තෝරා පත් කරනු ලබන මන්ත්‍රී ධුරය සඳහා තරග කරනු ලැබූ හෝ නම් කරනු ලැබූ අවස්ථාවේ දී එම පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරයා සාමාජිකයකු වශයෙන් සිටි සාමාජික පක්ෂය ඉදිරිපත් කරන අයගේ නම එම පුරප්පාඩුව පිරවීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට හෝ මැතිවරණ කොමිසම වෙත හෝ තේරීම් භාර නිලධාරින් වෙත දන්වා යැවීම සන්ධානයේ ප්‍රධාන ලේකම්වරයාගේ වගකීම වේ."

සන්ධානයේ ප්‍රධාන ලේකම්වරයාගේ වගකීම මොකක්ද? ජාතික ලැයිස්තුවෙන් පත් කරන මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ හෝ යම් මන්ත්‍රීවරයකු ඉවත් වෙනවා නම් ඔහු මැතිවරණයට ඉදිරිපත් වන වෙලාවේ කවර පක්ෂයක සාමාජිකයෙක්ද -වසන්ත සමරසිංහ සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක්- ඔහු ඉවත් වන්නේ නම් ඒ වෙනුවට කෙනකු නම් කිරීමේ බලය තිබෙන්නේ එම සාමාජිකත්වය හිමි පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාටයි. ඔහු විසින් නම් කොට එවන ලද ඒ නම පමණයි සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට -සන්ධානයේ ලේකම්වරයාට- යවන්න පුළුවන්කම තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, ඔබතුමිය පසුව කථා කරන්න. මම කියන්නේ සන්ධානයේ ලේකම්වරයාට යවන්න තිබෙන එකම -

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
උසාවියෙන් තීන්දුවක් එන තුරු ඔය ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න බැහැ නේද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සන්ධානයේ ලේකම්වරයාට-

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
පාර්ලිමේන්තුවේ කථා කරන එක වැරදියි නේද? උසාවියේ තීන්දුව එන තෙක් ඉන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම එහා පැත්තේ ලොබියේ දී සන්ධානයේ ලේකම්වරයා වන සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයා එක්ක සාකච්ඡා කළා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
මොන ස්ථාවර නියෝගය උඩ ද මේ කථා කරන්නේ. උසාවියෙන් තීන්දුවක් දෙන තුරු මේ කරුණු පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයාත් එක්ක සාකච්ඡා කරන වෙලාවේ -

**ගරු සාලින්ද දිසානායක මහතා (පොල් සංවර්ධන අමාත්‍යතුමා සහ ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திஸாநாயக்க - தெங்கு அபிவிருத்தி அமைச்சரும் தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சரும் )
(The Hon. Salinda Dissanayake - Minister of Coconut Development and Minister of Nation Building))
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව උසාවියේ නඩුවක් පවතින නිසා පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරන්න බැහැ. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නඩු අංකය කියන්න. [බාධා කිරීම්] නඩු අංකය කියන්නය කියන්න. [බාධා කිරීම්]

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திஸாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
තමුන්නාන්සේලා මේ පිළිබඳව නඩුවක් දමා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නඩු අංකය මොකක් ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විෂයට අදාළව කථා කරන්න. ඔබතුමා කථා කරන කාරණයට අදාළව උසාවියේ නඩුවක් පවරා තිබෙනවා නම් -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තවම නඩුව විභාගයට අරගෙන නැහැ. තවම ෆයිල්ගත කරලා විතරයි තිබෙන්නේ. ඒක ගන්නවා ද නැද්ද කියලා කියලාත් නැහැ. තවම උසාවියේ නැහැ. [බාධා කිරීම්] තිබෙනවා නම් කියන්න. නඩු අංකය කියන්න. නිකම් එහෙම කියන්න බැහැ. නඩු අංකය කියන්න අමාරුද?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඔබතුමා අධ්‍යාපන විෂය යටතේ කථා කරන්න කෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, මේ ගැන කථා කරන්න ඕනෑ. අධ්‍යාපන ඇමතිතුමාට.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඒක අධ්‍යාපනයට අයිති විෂයයක්. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා විෂයට අදාළව කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ලොබියේ දී හම්බ වුණාම එතුමා මට කියනවා, "කිසි කෙනෙක් පත් කරන්නේ නැහැ, ඔබතුමා බය වෙන්න එපා, මා කෙරෙහි විශ්වාසය තබන්න"යි කියලා. "මට දැනට බාධා කරනවා, ඉහළ කට්ටිය, ඉහළ කට්ටිය කියනවා මේක පමා කරන්න කියලා, හැබැයි ඉහළ කට්ටිය පමා කරන්න කිව්වාට " [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, විෂයට අදාළව කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව -

**ගරු මහින්ද අමරවීර මහතා (ජලසම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්. උසාවියට ඉදිරිපත් කළ ප්‍රශ්නයක් ගැන පාර්ලිමේන්තුවේදී කථා කරන්න බැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නඩු අංකය කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උසාවියට ඉදිරිපත් කළ ප්‍රශ්නයක් නිසා ඒ ගැන මෙතැනදී සාකච්ඡා කරන්න එපා. දැන් කථා කරන විෂයට අදාළව කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නඩු අංකය කියන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා සදාචාරය ගැන කථා කරනවා නම් සදාචාරාත්මකව මීට පෙර දැනුම් දී තිබෙනවා ජනතා විමුක්ති පෙරමුණ සන්ධානයෙන් ඉවත් වුණා කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒකට පිළිතුරු දෙන්නම්. [බාධා කිරීම්] කථාව අහ ගෙන ඉන්න. පිළිතුරු දෙන්නම්. ඕක තමයි කියන්නේ. ඕක තමයි තිබෙන සදාචාර ප්‍රශ්නය. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඕක ද කථාව. ලජ්ජයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි, සන්ධානයෙන් ඉවත් වුණත් මේක තේරෙන්න ඕනෑ. මේක නේ තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීම්] අපේ රටට හරි වැදගත් අධ්‍යාපනය. අමාත්‍යවරුන්ට අධ්‍යාපනය ලබා දෙන කොට ගිවිසුමක් කියවා තේරුම් ගැනීම පිළිබඳව අධ්‍යාපනයක් ලැබිය යුතු වෙනවා. ඒ මොකද? අධ්‍යාපනයේ ඉතා වැදගත් සාධක කිහිපයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනයේ ඉතා වැදගත් සාධකයක් තමයි ලියා තිබෙන දෙයක් කියවා තේරුම් ගැනීමට ඇති හැකියාව. ඒ එක. දෙ වැනි එක තමයි යමක් කියන කොට සාවධානව එය අසා සිට එය තේරුම් ගෙන එයට පිළිතුරු සැපයීම. ඒකත් අධ්‍යාපනයේ ඉතා වැදගත් සාධකයක්. මා දැන් ඉතා වැදගත් ලෙස පෙන්නුම් කරනවා, අපේ රටේ අධ්‍යාපනයේ එවැනි මහා විෂමතාවක් මතු වෙලා තිබෙන බව. යමක් කියවා තේරුම් ගන්න බැරි, තිබෙන ගිවිසුමක් කියවා තේරුම් ගන්න බැරි, කියන දෙයක් මැනැවින් අසා සිට - හික්මීමක් සහිතව සාවධානව යමක් අසා සිට - ඒකට පිළිතුරු සපයන්න බැරි අන්දමේ අධ්‍යාපනයේ කඩා වැටීමක් අද අපේ රටේ තිබෙනවා. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, උසාවියට යොමු කර තිබෙන කාරණයක් ගැන කථා නොකර විෂයට අදළව කතා කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසාන වේගෙනයි යන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ, අධ්‍යාපනයට අදාළවයි කතා කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා වැදගත් ලෙස මේ සභාව තුළත් අද පෙන්නුම් කරමින් තිබෙනවා - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උසාවියේ නඩු නිමිත්තක් තිබෙන නිසා කරුණාකර විෂයට අදාළව කතා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විෂයට අදාළවයි කතා කරන්නේ. හරි. එතුමා කියනවා නම් මා විෂයට පිටින් ගියාය කියා දැන් එහෙම නම් මම විෂයට එන්නම්. අධ්‍යාපනය බොහොම වැදගත්. අධ්‍යාපනයේදී ලිපි ලේඛන කියා වර්ගයක් තිබෙනවා. ඒ ලිපි ලේඛන කියවා බලා තේරුම් ගැනීමට අධ්‍යාපනයේදී දරුවා මැනැවින් යොමු කළ යුතුව තිබෙනවා. මට මෙතැනදී ප්‍රශ්නයක් තිබෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා හා අප අතර යම් ලියවිල්ලක් තිබෙනවා නම් එම ලියවිල්ල කියවා බලා තේරුම් ගන්නේ කොහොමද? එය තේරුම් ගැනීමේදී අධ්‍යාපනය ඉතාම දුර්වල අවස්ථාවක තිබෙනවා. ඒ තමයි මැනැවින් තේරුම් ගන්න බැරිකම. දැන් මෙවැනි ලියවිල්ලක් තියෙනවාය කියලා හිතමුකෝ. උදාහරණයක් හැටියට යම් සාමාජිකයෙක් ඒ ඒ පක්ෂවල සන්ධානයකට ඇතුළත් වෙලා ඉන්නවා. ඒ ඒ සාමාජිකයන්ගේ විනය සහ ඒ ඒ සාමාජිකයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව වගකීම තිබෙන්නේ ඒ ඒ පක්ෂවල ලේකම්වරුන්ටය කියා වගන්තියක් තිබෙනවා නම් ඒ වගන්තිය කොහොමද අර්ථ නිරූපණය කර ගන්නේ? පෙළ පොතක හෝ කොතැනක හෝ තිබෙන වගන්තියක් තේරුම් ගන්නේ කෙසේද? එසේ තේරුම් ගන්නවා විතරක් නොවෙයි අධ්‍යාපනයේදී හරිම වැදගත් වෙනවා සම්මුඛ සාකච්ඡා කියන දෙය. සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන්නේ කොහොමද, ආකර්ෂණීය ලෙස ඔහුට ඒ කාර්ය භාරය හොඳින් කරන්න පුළුවන්ය කියා එතැන ඉන්න අයට ඒත්තු ගන්වන්නේ කොහොමද සහ සම්මුඛ සාකච්ඡාවේදී කියන කරුණු සත්‍ය කරුණු බවට පත් කරන්නේ කොහොමද කියන එකත් ඉතා වැදගත් වෙනවා. උදාහරණයක් හැටියට මමත් සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමාත් එක්තරා කරුණක් පිළිබඳව සාකච්ඡා කළා. ඒක සම්මුඛ සාකච්ඡාවක්. ඔහු මා ඉදිරිපිට සහ මා ඔහු ඉදිරිපිට. ඒ සාකච්ඡාවේදී ඔහු කියනවා "බය වෙන්න එපා, මෙය ඔබලාට අයිති මන්ත්‍රී ධුරයක්ය, මෙයට කිසි සේත්ම වෙන කෙනකු පත් කරන්නේ නැහැ, මගේ මේ අතින් අත්සන් කරලා තමයි යවන්න ඕනෑ, ඒ නිසා මා කෙරෙහි විශ්වාසය තබන්න මම ඒ විශ්වාසය බිඳින්නේ නැහැ"යි කියා. ඒ විශ්වාසය බිඳුණාම එතැනදී පෙන්නුම් කරන්නේ මොකක්ද? එතැනදී පෙන්නුම් කරනවා අධ්‍යාපනයේදී ගුරුවරුන් විසින් ලබා දුන් ශික්ෂණයේ බිඳ වැටීමක් තිබෙනවාය කියා. ඒකට කියන්න පුළුවන් සදාචාර විරෝධීයි කියා. ඒකට කාට හෝ කියන්න පුළුවන් ප්‍රජාතන්ත්‍ර විරෝධීයි කියා. ඒකට කාට හෝ කියන්න පුළුවන් වංචාකාරීය කියා. කාට හෝ කියන්න පුළුවන් සොර දෙටුවෙක්ය කියා. මා කියන්නේ නැහැ එතැනට යා යුතුයි කියා. නමුත් කියන්න පුළුවන්. එම නිසා වාචිකව හෝ ලිඛිතව එන එකඟතාවලදී මා හිතනවා ඒ දෙසට යොමු කරන ක්‍රියාදාමයකට අපේ රටේ අධ්‍යාපනය යොමු කළ යුතුව තිබෙනවාය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනයේ අනික් වැදගත් සාධකය තමයි ඉතිහාසය. වර්තමානයේ ලබන අත් දැකීම් වාගේම ඉතිහාසයේ තිබෙන අත් දැකීම් යහපත් පුරවැසියන් බවට පත් කරන්න මිනිසුන්ට උදවු වෙනවා. හැබැයි කවුරු හෝ ඉතිහාසය අමතක කරනවා නම්, කවුරු හෝ ඉතිහාසයේ සිදු වුණු සිදු වීම්වලට පයින් ගහනවා නම් ඔහු කුහකයෙක්, ගුණ මකුවෙක් මිසක් වෙන කවුරුද කියා කියන්නද? මා පෙන්වා දුන්නේ ඒකයි,

උදාහරණයක් විධියට ගත්තොත් සන්ධානය ගොඩ නැගීමේ ඉතිහාසය. අපේ රටේ දේශපාලන ඉතිහාසය ගත්තොත් ඒකත් ඉතිහාසයක්. ඒවා ඒ ඒ පක්ෂ අතර ඇති කර ගත් එකඟතාවන්. එසේ ඒ ඉතිහාසය අමතක කිරීම්, ඒවාට පයින් ගැසීම්, ඒවා නොසලකා හැරීම් සිද්ධ වුණොත් ඒවා වර්තමානයේ කුහකයෙක්, මෝඩයෙක්, තකතිරුවෙක්, පණ්ඩිතයෙක්, නරුමයෙක් ගොඩ නඟන්න බලපානවා. මට මතකයි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව කාලයේදී ඉතිහාසය විෂයයක් වශයෙන් ඉගැන්වීම අයින් කරලා දැම්මා. ඒ 1977 දීයි. විශේෂයෙන්ම අපේ රටේ දේශපාලකයන් අපේ පෞරාණික ඉතිහාසයට වඩා දේශපාලන ඉතිහාසය අමතක කරනවා නම් -තමන් වාඩි වෙලා ඉන්න පුටුවේ වාඩි වෙන්න හැකියාව ලැබුණේ කොහොමද? ඒ පුටුවේ වාඩි වෙන්න තමන්ට ධෛර්යය ලැබුණේ කොහොමද? ඉතිහාසයෙන්. - ඒවා අමතක කරන කෙනෙකුට ගුණ මකුවෙක්, සොර දෙටුවෙක් කියනවාට වඩා වෙන මොනවා කියන්නද? ඒ නිසා මම හිතන විධියට අධ්‍යාපනයේදී ඉතිහාසයත් ඉතා වැදගත්. අපේ රටේ අධ්‍යාපනයට යළි ඉතිහාසය අවතීර්ණ කළ යුතු කාලයක් ඇවිත් තිබෙනවා. මොකද, දේශපාලන ඉතිහාසය අමතක කර තිබෙන නිසා.

ඒ වාගේම අන්‍යෝන්‍ය සහයෝගිතාවේ වැදගත්කමක් තිබෙනවා. ඕනෑම වැඩක් කරන කොට තනි තනි පුද්ගලික අභිමතාර්ථයන්ට එහා ගිහිල්ලා පොදු සාමූහික සහයෝගිතාවකට එන්න පුළුවන් නම්, ඒ සහයෝගිතාව ආරක්ෂා කරනවා නම්, අපේ රට මුහුණ දී තිබෙන බොහෝ දුර්භාග්‍ය සම්පන්න තත්ත්වයන්ගෙන් ගොඩ එන්න පුළුවන් කියා මම හිතනවා. හැබැයි සිදු වී තිබෙන්නේ මොකක්ද? එවැනි සහයෝගිතාවන් අමතක කරලා තිබෙනවා. එවැනි සහයෝගිතාවන් වාචිකව සිදු වෙන්න පුළුවන්. එවැනි සහයෝගිතාවන් ලිඛිතව සිදු වෙන්න පුළුවන්. එවැනි සහයෝගිතාවන් භාවිතාවෙන් සිදු වෙන්න පුළුවන්. එකට වැඩ කිරීමෙන් එවැනි සහයෝගිතාවන් සිදු වෙන්න පුළුවන්. මම හිතන විධියට ලිඛිතව ඇති කර ගත් සහයෝගිතා බිඳලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩ නැඟීමේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ අප අතර ලිඛිත සහයෝගිතාවක් ඇති වුණා. ඒ වාගේම සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයා සහ මා අතර වාචික සහයෝගිතාවක් ඇති වුණා. එහෙම සහයෝගිතාවක් ගොඩ නැඟිලා අවුරුද්දක විතර කාලයක් ප්‍රායෝගිකව එක ආණ්ඩුවක් ඇතුළත එකට වැඩ කරන තත්ත්වයක් ඇති වුණා. හැබැයි තමන්ට තනතුරු, තානාන්තර, බලය හෝ මොකක් හරි දෙයක් ලැබුණාට පස්සේ ඒ සහයෝගිතාව මුළුමනින්ම අමතක කරනවා නම්, එහෙම අමතක කරලා හැසිරෙනවා නම් ඔහු කුහකයෙක්, ගුණ මකුවෙක් කියා අපි හිතනවා. ඒ නිසා අධ්‍යාපනයේදීත් ඒ ක්ෂේත්‍රයත් ඉතා වැදගත්. අධ්‍යාපනයේදී තවත් වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රට තුළ යහපත් සමාජයක් ඇති කරන්න අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙතෙක් අපි අත නොගැසූ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමකුත් අද අත්‍යවශ්‍ය වී තිබෙනවා. යමෙකුට අධ්‍යාපනය ඉතා වැදගත් සාධකයක්. කුඩා කාලයේ පාසල් යන කොට යුතුකම්, වගකීම් හා කළ ගුණ සැලකීම ගැන කාටත් උගන්වනවා. ඒවා අධ්‍යාපනයේදී හරි වැදගත්. බෞද්ධයන්ට බෞද්ධ දර්ශනයේදී, හින්දු ආගමිකයන්ට හින්දු දර්ශනයේදී, කතෝලික භක්තිකයන්ට කතෝලික දර්ශනයේදී, ඉස්ලාම් භක්තිකයන්ට ඒ ආගමේදී ගුරුවරුන්ට සැලකීම, කළ ගුණ සැලකීම ගැන උගන්වනවා. කළ ගුණ සැලකීම ගැන පොඩි කාලයේ අපි කාටත් උගන්වනවා. කළ ගුණ අමතක කරන්නෙකුට අපි මොකක්ද කියන්නේ? එය අධ්‍යාපනයේදී ඉතාමත් වැදගත් සාධකයක්. එහෙම කළ ගුණ අමතක කරන මිනිසුන්ට අපි මොකක්ද කියන්න ඕනෑ. මෙතැන කාට හරි තණ්හාව තියෙන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අප විසින් මතු කරන්නේ තණ්හාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි; මේ මන්ත්‍රීකම් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. එහෙම නැත්නම් පුද්ගලයන්ට තිබෙන දේවල් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. අපි ඕනෑ තරම් දේවල් දීලා තිබෙනවා. ඒක හොඳ දාන පාරමිතාවක්. අපි ඕනෑ තරම් දීලා තිබෙනවා. ඒක ඉතා හොඳ ප්‍රවේශයක්. සාමාන්‍යයෙන් පුද්ගල දේපොළ හොරකම් කිරීම් ගැන අපිට කල්පනා කරන්න පුළුවන්. මැණික්, ස්වර්ණාභරණ, මුදල් වාගේ දේවල්. ඊට වඩා ඉතාමත් බරපතළ සොරකමක් තමයි තනතුරු නැත්නම් ධුර හොරකම් කිරීම. විශේෂයෙන්ම මහජන මන්ත්‍රීකම් හොරකම් කිරීම. සොරකමේ ඉතාම නරකම සොරකම තමයි මහජන මන්ත්‍රී ධුර හොරකම් කිරීම. මම හිතන විධියට මෙන්න මේ හොරකම් වැළැක්වීමේ දිසාව වෙතට අපේ රටේ අධ්‍යාපනය යොමු කරන්න ඕනෑකම තිබෙනවා. [බාධා කිරීමක්] සමහර ඒවා දණ්ඩ නීති සංග්‍රහයේත් නැහැ. මොකද, දණ්ඩ නීති සංග්‍රහය හදන කොට අපේ නීතිවේදීන් හෝ ඒ ගැන සාකච්ඡා කරපු මහත්වරු හිතුවේ නැහැ මේ ජාතියේ හොරකම් සිදු වෙයි කියා. මොකක් හෝ නීති සංග්‍රහයක් හදන්නේ ඒ මොහොතේ පවතින තත්ත්වයන්ට අනුවයි. මේ මේ දේවල් වේ යැයි කියා උපකල්පනය කර නීති හදනවා. ඒ නිසා නීති හැදුවේ නැහැ, මන්ත්‍රීකම් හොරකම් කළොත් මොකද කරන්නේ කියා. එහෙම වෙයි කියා කවුරුවත් අපේක්ෂා කළේ නැහැ. මනෝ ලෝකයේ තිබෙන ඒවාට නීති හදන්නේ නැහැ නේ. ඒක නීති අධ්‍යාපනයේ ඉතා වැදගත් කාරණයක්. අහසේ තිබෙන ප්‍රශ්නවලට නීති හදන්නේ නැහැ. මනෝ ලෝකයේ තිබෙන ප්‍රශ්නවලට නීති හදන්නේ නැහැ. විය හැකි යැයි උපකල්පනය කරන ප්‍රශ්නවලට තමයි නීති හදන්නේ. මෙතරම් දරුණු පන්නයේ හොරු. සාමාන්‍ය හොරුන්ට කියන්නේ හොරා කියලා. හැබැයි, මෙවැනි හොරුන්ට කියන්නේ කම්බ හොරු කියලා. මන්ත්‍රීකම් හොරකම් කිරීම. එවැනි තැනකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා එවැනි සොරකම් පිළිබඳවත් සලකා අපේ රටේ අධ්‍යාපන විෂයය මීට වඩා පුළුල් කරන්න ඕනෑ අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා. අපි මෙතෙක් කල් කල්පනා කළේ දේපොළ වංචා වැනි සොරකම් ගැන නම් දැන් සොරකම් සම්බන්ධයෙන් "මන්ත්‍රී ධුර සොරකම් කිරීම" කියලා පරිච්ඡේදයක් ඇතුළත් කරන්න වෙලා තිබෙනවා. මම හිතනවා, ගරු අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට ඒ පිළිබඳව විශේෂ අත් දැකීමක් තිබෙනවාය කියලා. මොකද, මේ ලිපියට අත්සන් කළේ එතුමා නේ. මේ සොරකමේ ප්‍රධාන සොර කාර්යය අත්සනකින් කෙරෙනවා. ඒ අත්සන් කර තිබෙන්නේ අපේ අධ්‍යාපන ඇමතිතුමායි. ඒ නිසා සොරකම් පිළිබඳ අපේ නීතියේ විෂයය මන්ත්‍රී ධුර නැත්නම් තනතුරු සොරකම් කිරීම දක්වා තව දුරටත් වැඩි කරන්න වේවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ අධ්‍යාපනයේ ඉතා පුළුල් විය යුතු ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒ ක්ෂේත්‍ර පුළුල් වෙන්න ඕනෑකම තිබෙනවා. මේවා හොරකම් කරලා ඒ වෙලාවේ ලැබෙන ලාභ; ඒ වෙලාවේ ලැබෙන සතුට; ඒ වෙලාවේ ලැබෙන මහා ධෛර්යය ගැන කවුරු හෝ කල්පනා කරනවා නම් ඒවා හැම දාම තියෙන්නේ නැහැ. ඉතා කෙටි කාලයයි තියෙන්නේ. සමාජය කියන්නේ නිරන්තරයෙන් තත්ත්වයන් වෙනස් වෙන තැනක්. ඒක අපි පිළිගන්නා මූල ධර්මයක්. අනිවාර්යයෙන්ම තත්ත්වයන් වෙනස් වෙනවා. තත්ත්වයන් වෙනස් වීම ගැන සලකා බැලීමේදී 2000ට කලින් ගොඩක් මහත්වරු හැසිරුණේ කොහොමද කියලා අපට මතකයි. හැබැයි එහෙම හැසිරිච්ච මහත්වරු අවුරුදු දෙකකට පස්සේ වැටිලා දැඟලුවේ කොහොමද කියලාත් අපේ ඇස් පනා පිටම අපි දැක්කා. ඒ නිසා එවැනි උද්දච්ච, උඩඟු නොසලකා හැරීම් හැම දාමත් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැති බව මේ ඉතිහාසයේ ඕනෑ තරම් ඔප්පු කරලා තිබෙනවා. අනිවාර්යය ලෙසම එම තත්ත්වයන් වෙනස් කරනවා. ඒකයි අපට අධ්‍යාපනයෙනුත් උගන්වන පාඩම. එදාට මේ ප්‍රශ්න ගොඩක් බේරා ගන්න පුළුවන් වේවි කියලා කල්පනා කරනවා. ඒ වාගේම අපේ රටේ විභාග ප්‍රශ්න පත්‍ර තවත් පුළුල් කරන්න වේවි. විෂය නිර්දේශයන් තව තවත් පුළුල් කරන්න වේවි. විභාග ප්‍රශ්න පත්‍රයට තව අලුත් අලුත් ප්‍රශ්න ඇතුළත් කරන යුගයක් ඇති වේවි. කවුරු හරි හිතනවා නම් ඉරි ගහලා -උත්තර හතරක් තිබෙනවා හතරෙන් එක උත්තරයකට ඉරි ගහලා- බේරෙන්න පුළුවන් කියලා එහෙම බේරෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි මේක. කවුරු හරි හිතනවා නම් මේ ප්‍රශ්නයට වගන්තියකින්, වාක්‍යයක් දෙකකින් උත්තර ලියලා බේරෙන්න පුළුවන් කියලා, ඒකත් වෙන්නේ නැහැ. "විභාගය ලියන්න ආවාට ඔයා ඊට කලින් ඉස්කෝලෙන් අස් වුණ කෙනෙක්" කියනවා වාගේ කථා කවුරු

[ගරු අනුර දිසානායක මහතා]

හරි කියනවා නම් ඒවා නිකම් තාර්කික නොවන කථා. ඒ නිසා අපි ඒ හැම මහත්මයෙකුටම කියන්නේ කරුණාකරලා තමන්ගේ දේශපාලනය ගැන ආපහු හැරිලා බලන්න කියලායි. උඩඟු වෙච්ච, උද්දච්ච වෙච්ච නොසලකා හැරීම් කරන එවැනි නායකයන්ටත්, ඒ ගෝල බාලයින්ටත් ඉතිහාසයේ හිමි වෙච්ච තැන ඉතාම නරකයි. ඉතාම නරක ඉතිහාසයක් තමයි හිමි වෙලා තිබෙන්නේ. ඒ අය කුණු බක්කියට යන එක වළක්වන්න බැහැ. අපි කැමැති නැහැ, ඔවුන් වේගයෙන් කුණු බක්කියට වැටෙනවාට. හැබැයි ඔවුන් විසින්ම තෝරා ගෙන තිබෙන පාර කුණු බක්කිය කරා යන පාරක් නම්, ඔවුන් විසින්ම තෝරා ගෙන තිබෙන පාර අනෙක් සියලු දේ නොසලකා හරිමින් යන පාරක් නම්, ඔවුන් විසින්ම තෝරා ගෙන තිබෙන පාර නීතිය පසෙක ලා යන ගමනක් නම්, ඔවුන් විසින්ම තෝරා ගෙන තිබෙන පාර සදාචාරය පැත්තක තියලා යන ගමනක් නම්, ඔවුන් විසින්ම තෝරා ගෙන තිබෙන පාර ප්‍රජාතන්ත්‍රවාදය පැත්තකින් තියලා යන ගමනක් නම්, ඔවුන් විසින්ම තෝරා ගෙන තිබෙන පාර ඒකාධිපති වියරුව දක්වා යන ගමනක් නම් ඒ ගමන පරාජයට පත් කරන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම් බව ප්‍රකාශ කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.22]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு பந்துல குணவர்தன - வர்த்தகம், சந்தைப்படுத்தல் அபிவிருத்தி, கூட்டுறவுத்துறை, நுகர்வோர் சேவைகள் அமைச்சர்)

(The Hon. Bandula Gunawardane-Minister of Trade, Marketing Development, Co-operatives and Consumer Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක ශූරීන් දේශපාලන කථාවක් කළා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කර තිබෙන මේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ කරුණු කිහිපයක් පැහැදිලි කරන්න මා බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපන ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ. මා විශ්වාස කරන විධියට එතුමා දිවයිනෙන් බැහැරව සිට අද එන්නට උත්සාහ දරමින් සිටිනවා. අධ්‍යාපන ඇමතිතුමා වෙත යොමු කරපු ප්‍රශ්න පිළිබඳව එතුමා පිළිතුරු දෙයි කියලා මම විශ්වාස කරනවා. අද මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ විභාග දෙපාර්තමේන්තුව සඳහා පසු ගිය වර්ෂයේ අය වැය ලේඛනයෙන් වෙන් කර තිබෙන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම නිසා අතිරේක මුදලක් සම්මත කර ගැනීම සඳහායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතාම පුළුල්, සංකීර්ණ, වෙනස් වන, ඒ වාගේම ප්‍රශ්න රාශියකට සහ අභියෝගවලට මුහුණ දෙන ක්ෂේත්‍රයක්. ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන පාසල් 10,429ක් තිබෙනවා. විශ්වවිද්‍යාල හැර, සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන පාසල් දසදහසකට වඩා තිබෙනවා. 2,19,368ක් ගුරුවරු ඉන්නවා. දෙලක්ෂයකට වඩා ගුරුවරු සංඛ්‍යාවක් දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ නිරත වෙනවා. ලක්ෂ හතළිහකට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා. එතකොට අපි අද මේ උත්තරීතර සභාවේදී සාකච්ඡා කරන්නේ හතළිස් ලක්ෂයකට වඩා වැඩි පිරිසකගේ ජීවිතවලට, අනාගතයට බලපාන ප්‍රශ්නයක් සම්බන්ධයෙන්. පසු ගිය 2007 වර්ෂයේදී මේ ගරු සභාව විසින් ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 72,592ක් අය වැය ලේඛනයෙන් වෙන් කර දී තිබෙනවා. එදිනෙදා පඩිනඩි ගෙවීම්, ලිපි ලේඛන කටයුතු ආදී නැවත නැවතත් දැරිය යුතු වන, දරන වියදමේ ස්වභාවය වියදම දරන කාල පරිච්ඡේදයට පමණක් සීමා වන පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 72,592ක් වෙන් කර දී තිබෙනවා. ගොඩනැඟිලි තනන්න, ගොඩනැඟිලි අලුත්වැඩියා කරන්න යනාදී දිගු කාලීන වැඩවලට රුපියල් මිලියන 19,948ක් ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කර දී තිබෙනවා. එතකොට 2007 වර්ෂයේදී රුපියල් මිලියන 92,540ක් සාමාන්‍ය අධ්‍යාපනයට වියදම් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා අප වාර්ෂිකව කෝටි 9,000ක් 10,000ක් පමණ මහජනතාවගේ මුදල් -බදු මුදල්- වියදම් කරනවා. සාමාන්‍ය අධ්‍යාපනයට දරන වියදම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත්තොත්, සාමාන්‍යයෙන් සියයට දෙකත්, සියයට තුනත් අතර පරාසයක් තුළ තමයි විවිධ ආණ්ඩු යටතේ තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබුණත්, සන්ධාන ආණ්ඩුව තිබුණත් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට දෙකක්, සියයට තුනක් පමණ වියදම් කරනවා. දැන් මේ වියදම සම්බන්ධව 2008 වර්ෂයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මේකයි. සමහර වෙලාවට අය වැය ඇස්තමේන්තු සකස් කිරීමේදී විවිධ හේතු නිසා වර්ෂයේ අපේක්ෂිත වියදම වෙනස් වනවා. එක හේතුවක් තමයි නිශ්චිත වශයෙන් පූර්වානුමානය කළ නොහැකි වියදම් විටින් විට ඇති වීම. දෙ වැනි හේතුව, ඒ වර්ෂයේදී ගෙවන්න තිබෙන සමහර වියදම් ඊට පසුව එන වර්ෂයේදී ගෙවන්න සිදු වීම. උදාහරණයක් වශයෙන් ගත්තොත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ විභාග පැවැත්වෙන්නේ, පරීක්ෂණ පැවැත්වෙන්නේ විවිධ ආකාරයට. ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන කාල පරිච්ඡේදය එකක්. අගෝස්තු මාසයේදී අපොස උසස් පෙළ විභාග පැවැත්වෙනවා. අවුරුද්ද අවසානයේ දෙසැම්බර් මාසයේදී තමයි සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වෙන්නේ. එතකොට ඒ වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුළත් කරන දෙසැම්බර් මාසයේ වියදම සමහර වෙලාවට ඊළඟ වර්ෂයේදී තමයි ගෙවන්න සිද්ධ වන්නේ. අනික් කරුණ තමයි අනපේක්ෂිත ලෙස, අසාමාන්‍ය ලෙස ඉහළ යන වියදම් වර්ග තිබීම. උදාහරණයක් වශයෙන් කිව්වොත්, අවුරුදු තිහකට පසුව 2007, 2008 වර්ෂවල තමයි ලෝකයේ ඛනිජ තෙල් මිල වැඩිම ලෙස වැඩි වීම වාර්තා වුණේ. 2003 දී ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක් තිබුණේ ඇමෙරිකන් ඩොලර් 29ට. ඒක මේ වර්ෂය වන විට ඇමෙරිකන් ඩොලර් 146 දක්වා වැඩි වුණා. ඒක ලෝක ඉතිහාසයේ නොවූ විරූ තත්ත්වයක්. එතකොට විභාග පැවැත්වීම, ඒ සඳහා ප්‍රශ්න පත්‍ර ප්‍රවාහනය කිරීම, පරීක්ෂකවරුන්ගේ ගමන් වියදම් යනාදී සියල්ලටම කිසිම අය වැය ලේඛනයකින් අනුමාන කරන්න බැරි අතිරේක වියදමක් දරන්න සිද්ධ වනවා. ඒ විභාගවල ප්‍රමාණයේ ස්වභාවයත් ඉතා විශාලයි. උදාහරණයක් වශයෙන් ගත්තොත්, විෂය නිර්දේශ වෙනස් වනවා. ලෝකයේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුව අධ්‍යාපනයේ විවිධ විෂය ක්ෂේත්‍රවල විෂය නිර්දේශ වෙනස් කරනවා. කාලයක් තිස්සේ එක්තරා විෂය නිර්දේශයකට දරුවන් ප්‍රගුණ කරනු ලැබුවා. ඊට පසු පරම්පරාව නව විෂය නිර්දේශයකට යොමු කළාම පැරණි විෂය නිර්දේශය ඉගෙන ගත් අයට තව කීප විටක් එම පරීක්ෂණය සඳහා පෙනී සිටින්න ඉඩකඩ සලසන්න සිද්ධ වනවා. ලාංකීය නිදහස් අධ්‍යාපනයේ පසු ගිය දශක කීපය තුළ මේ රටේ දරුවන්ගේ අනාගත ජීවිතය තීන්දු කරන අපොස සාමාන්‍ය පෙළ, අපොස උසස් පෙළ වාගේ විභාග විවිධ ආකාරයට වෙනස් වෙලා තිබෙනවා. 2007 දී අපොස සාමාන්‍ය පෙළ නව නිර්දේශය හා පැරණි නිර්දේශය යනුවෙන් විභාග දෙකක් පවත්වා තිබෙනවා. ඒ කටයුත්තට අපේක්ෂකයන් 550,000ක්, විභාග මධ්‍යස්ථාන 5,500ක්, කාර්ය මණ්ඩලය 75,000ක් සම්බන්ධ වෙලා තිබෙනවා. එතකොට අපට, තමුන්නාන්සේලාට තේරෙනවා, මේ ප්‍රශ්නයේ තිබෙන වියදමේ බරපතළකමේ ස්වභාවය. මොකද, අපේක්ෂකයෝ පන්ලක්ෂ පණස්දාහක් පෙනී සිටිනවා. උතුරු නැඟෙනහිර ඇතුළුව මේ වර්ග සැතපුම් 25,332 ඇතුළත මධ්‍යස්ථාන 5,500ක් තිබෙනවා. මේ සඳහා අදාළ වන නිලධාරින් සංඛ්‍යාව හැත්තෑපන්දාහක්. ඉතා විශාල සංකීර්ණ ක්‍රියාවලියක්. දැන් විභාග දෙපාර්තමේන්තුව මේ ආකාරයේ විභාග 260ක් පවත්වනවා. සාමාන්‍යයෙන් වර්ෂයකට අපොස (සාමාන්‍ය පෙළ), අපොස (උසස් පෙළ) විභාගත්, ඒ වාගේම ග්‍රාම නිලධාරින් බඳවා ගැනීම, විගණන පරීක්ෂකයන් බඳවා ගැනීම වැනි රජයේ විභාගත් සමඟ විභාග දෙපාර්තමේන්තුව ඉතාම අසීරු, වග කිව යුතු ජාතික කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. ඒ ගැනත් මේ ගරු සභාවේ ගෞරවය හිමි විය යුතුයි. මොකද, අපේ රටේ විවිධ වංචා, දූෂණ අක්‍රමිකතා යනාදිය පිළිබඳ චෝදනා එල්ල වන විට, ලංකාවේ විභාග දෙපාර්තමේන්තුවට හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටත් ඉතිහාසයේ එල්ල වෙලා තිබෙන්නේ ඉතාම අඩු චෝදනා ප්‍රමාණයක්. කුමන ආණ්ඩු යටතේත්, කාගේ ආණ්ඩුවක් තිබුණත් විශ්වවිද්‍යාලයට දරුවෙක් ඇතුළු වීම පිළිබඳවත්, විභාග සමත්වීම පිළිබඳවත් දේශපාලන හෝ වෙනත් මැදිහත් වීමක් වෙන්නේ නැහැ. මොකද, එය රටේ අනාගතයට බලපාන නිසයි.

අද වෙන තුරු ඉතා සුපිරිසිදු ලෙස මේ විභාග පවත්වා ගෙන ඒම ගැන මේ ගරු සභාවේ ගෞරවය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටත්, විභාග දෙපාර්තමේන්තුවටත් හිමි වන්නට ඕනෑ. විභාග දෙපාර්තමේන්තුව අපේ කාලවල නො දුටු ලෙස විශාල අභියෝගවලට පසු ගිය වර්ෂවල මුහුණ දුන්නා.

දරුවන්ගේ ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීම තමන්ගේ වෘත්තීයේ වග කීමක් ලෙස උගන්වන ගුරුවරු විශ්වාස කරනවා. ඒ වාගේ ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීමක් වර්ජනය කරනවා වාගේ තීන්දුවකට ගුරු පරම්පරාව පැමිණියාම ඒ ශිෂ්‍ය ජීවිත හා සම්බන්ධයෙන් තීන්දු ගන්නට විභාග කොමසාරිස්වරයාටත්, විභාග දෙපාර්තමේන්තුවටත් සිද්ධ වනවා. එය ජාතික වග කීමක් මෙන්ම විශාල අභියෝගයක්ද වෙනවා. පාසල් නොගිය කෙනෙකු ලවා ප්‍රශ්න පත්‍ර බලවන්නට බැහැ. ඒ සඳහා අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබෙන, අත් දැකීම්, පළපුරුදු, කුසලතා, දක්ෂතා තිබෙන පරීක්ෂකවරු සොයා ගැනීම පිළිබඳ ගැටලු මතු වෙනවා. එතැනදී සමහර වියදම් අතිරේකව දරන්නට සිද්ධ වෙනවා. මොකද, එහෙම විභාග සඳහා සාමාන්‍යයෙන් පවතින පිළිවෙතට අතිරේකව, මේ ඇති වන අවුල් සහගත තත්ත්වයන් තුළදී දැරිය හැකි වියදමේත් වැඩි වීමක් සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙහිදී මේ කාරණය විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි. උපතින් ඉඩ කඩම්, වතු පිටි, යාන වාහන, හරකා බාන ප්‍රාග්ධනය නොමැති දරුවෝ ලක්ෂ ගණන්; කෝටි ගණන් ඉන්න රටක මේ සමාජ ක්‍රමය තුළ දෙපයින් නැඟී සිටීමේ එකම ක්‍රමෝපාය ලෙස පවතින්නේ නිදහස් අධ්‍යාපනය පමණයි. බොහෝ විට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන වැඩි දෙනෙකුත් මධ්‍ය මහා විද්‍යාල, මහා විද්‍යාල හරහා බැංකු ණය යටතේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ අයයි. එතකොට මේ ගරු සභාවේ අවධානය යොමු විය යුතු වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. දරුවන්ගේ තීරණාත්මක කඩ ඉම වන්නේ උසස් පෙළ විභාගයයි. යම් කිසි ලෙසකින් මේ විභාග ප්‍රතිඵල පමා වුණොත් ඉදිරි අනාගතය සැලසුම් කරන දරුවෙකුට තමන්ගේ මුළු අනාගතයම නැති වන්නට ඉඩ තිබෙනවා. අද අපේ රටේ අවාසනාවන්ත තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ රටේ උසස් පෙළ සමත් වන දරුවන්ගෙන් බහුතරයකට විශ්වවිද්‍යාලයට ඇතුළු වන්නට බැරි වෙනවා. එතකොට අප කැමති වුණත් අකැමැති වුණත්, විශ්වවිද්‍යාලයට ඇතුළු වන්නට බැරි වන වැඩි පිරිසට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙන් බැහැරව විදේශ රටවල අධ්‍යාපනය කරා ගමන් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. පිට රටවල අධ්‍යාපනය ලබන්නට යන දරුවෝ හොඳට සල්ලි තිබෙන අයයි, මේ රටේ අධ්‍යාපනය මදි නිසා වෙන රටවලට යනවාය කියා කෙනෙකුට තර්ක කරන්නට පුළුවන්. ඒක වැරදි තර්කයක්. මොකද අප දන්නා පෞද්ගලික උදාහරණ තිබෙනවා. පරම්පරිකව උරුම වෙච්ච පර්චස් 10 නැත්නම් පර්චස් 20ක එකම බිම් කැබැල්ල තමන්ගේ දරුවා වෙනුවෙන් අලෙවි කර -විකුණා දමා- පාරම්පරික හදා ගත්ත ගෙය අත් හැර කුලී ගෙදරකට ගිහින් දෙමව්පියෝ තමන්ගේ ළමයා වෙනත් රටක විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යවනවා. එහෙම කරන්නට සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි කිව්වොත්, කොයි තරම් නරක ලෙස මේ තත්ත්වය තිබෙනවාද කිව්වොත් ඉතාම නොදියුණු, අපට වඩා අඩු ඒක පුද්ගල ආදායමක් තිබෙන, අනෙක් සියලුම දෙය අපට වඩා අඩු වෙන් තිබෙන බංග්ලාදේශයේ, චිතගොං විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහාත් ලංකාවේ ශිෂ්‍යයන් තුන් සියයකට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඉන්දියාව ගත්තත්, ඇමෙරිකාව, එංගලන්තය, ඕස්ට්‍රේලියාව වගේ රටවල් ගත්තත්, නේපාලයට ගිහින් බැලුවත් එහෙමයි. මේ රටේ විභාග දෙපාර්තමේන්තුවේ තිබෙන විභාග ප්‍රතිඵලය අරගෙන වෙන රටවල්වල විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යෑමේ ඉතා විශාල ප්‍රවණතාවක් තිබෙනවා. සල්ලි තිබෙන අය විතරක් නොවෙයි, සාමාන්‍ය පන්තියේ අයත්, සමහර රජයේ සේවකයෝත් අද ඉතා විශාල ලෙස පෙලඹී තිබෙනවා, මොනවා හෝ කරලා -දේපොළ, ඉඩකඩම් විකුණා, තිබෙන දේවල් උකස් කරලා, පුළුවන් තරම් දහ අතේ ණය වෙලා- තමන්ගේ දරුවාට ඉහළ අධ්‍යාපනය ලබා දීම සඳහා වෙනත් රටකට පිටත් කර යැවීමට. මේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක්. මේ ගරු සභාව වැනි තැනක මේ ජාතික ප්‍රශ්නය පිළිබඳව දේශපාලන පක්ෂ, පාට භේදයක් නැතිව ප්‍රබුද්ධ සංවාදයක් ඇති වෙන්න ඕනෑ.

විදේශ විනිමය අපට හිඟ සම්පතක්. හිඟ විදේශ විනිමය සම්පත්වලින් නිශ්චිත ගණනකුත් නැහැ, වෙනත් රටක අධ්‍යාපනයට කොපමණ ප්‍රමාණයක් කැප කරනවාද කියලා. වෛද්‍ය උපාධිය වගේ උපාධියක් වෙනත් රටකින් ලබා ගන්න සමහර දෙමවුපියන්ට ලංකා මුදලින් අඩු තරමින් රුපියල් මිලියන 10ක -රුපියල් ලක්ෂ 100ක- මුදලක් වැය වෙනවා. එතකොට එතරම් මුදලක් වැය කරලා ඒ රටේ අධ්‍යාපනය ලබන්න යන්න වෙන්නේ අපේ රටේ උපන්, අපේ ජාතික වග කීමක් ලෙස ඉෂ්ට වන, මේ ගරු සභාව විසින් රුපියල් කෝටි ගණන් මුදල් වෙන් කරලා ලබා දෙන අධ්‍යාපනයේ අවසාන අවශ්‍යතා ටික ඉෂ්ට කරන්න මේ දේශයට පුළුවන්කමක් ඇති වෙලා නැති නිසායි. ඒ තත්ත්වයේ නරකම ප්‍රතිඵලය තමයි, මේ රටේ දෙමවුපියන් ණය වෙලා තමන්ගේ දරුවන් ඒ රටට යැව්වාට පසුව කවදාවත් නැවත ලංකාවට එන්නේ නැති දරු පරම්පරාවක් ඇති වන එක.

මා එක උදාහරණයක් සඳහන් කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චීනයේදී මට මුණ ගැසුණා, චීනයේ වෛද්‍ය අධ්‍යාපනය ලබන අපේ රටේ වෛද්‍යවරුන්ගේ දරුවන් පිරිසක්. චීන තානාපතිතුමාගේ තානාපති නිල නිවසේදී තමයි මේ ශිෂ්‍ය පිරිස මට මුණ ගැසුණේ. ඔවුන්ගෙන් මා ඇසුවා, දැන් වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය කොහොමද කියලා. ඒ අය කිව්වා, "ලෝකයේ අනික් රටවල් සමඟ සාපේක්ෂව සසඳන විට එංගලන්තය, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව වැනි රටවලට වඩා අඩු මුදලකට චීනයෙන් වෛද්‍ය අධ්‍යාපනය ලබන්න පුළුවන්. හැබැයි, චීනයෙන් ලබා ගන්නා වෛද්‍ය උපාධිය ලංකාවේ වෛද්‍ය සභාව විසින් අනුමත කරන්නේ නැහැ"යි කියලා. එතකොට ඒ අයගේ බලාපොරොත්තුව කුමක්ද කියා මා ඇහුවාම, "කිසි ප්‍රශ්නයක් නැහැ; චීනයේ වෛද්‍ය උපාධිය, ඇමෙරිකාව ඇතුළු බටහිර රටවල් සියල්ල එක පයින් පිළිගන්නවා; කිසිම ප්‍රශ්නයක් නැතිව වෛද්‍ය වෘත්තියේ යෙදෙන්න ඒ රටවලට යන්න පුළුවන්; ඒ නිසා අපේ කල්පනාව, මේක අවසන් වූ ගමන්ම ඇමෙරිකා එක්සත් ජනපදයට, එංගලන්තයට, එහෙම නැත්නම් වෙන රටකට යන එකයි" කියලා ඒ අය කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රටවලට ගියාට පසුව, බොහෝ විට තරුණ ළමයින් එහිදී විවාහයක් වුණොත් ඒ ළමයින් ආපසු මෙහේට එන්නේ නැහැ. ඒ ළමයින්ගේ දරුවනුත් කවදාවත් මේ රටට එන්නේ නැහැ. ජාතියක් විධියට ගත්තොත්, රටක් විධියට ගත්තොත් අපේ රටේ මිනිසුන්ගේ තුන් වන පරම්පරාවක්, හතර වන පරම්පරාවක් මේ රටට නැති වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මා දැන් මේ පොඩි ප්‍රශ්නයක් මතු කරන නිසා මට තව විනාඩි 5ක් දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයට උත්තරයක් ඕනෑ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ප්‍රශ්නයට උත්තරය තමයි, මේ යන විදේශ විනිමය ප්‍රමාණය ඉතිරි කර ගන්න අපට බැරි ඇයි? ලෝකයේ අනික් සියලුම රටවල් පෞද්ගලික අංශයටත් විශ්වවිද්‍යාල ආරම්භ කරන්න ඉඩ දෙන කොට, වෙනස් වන ලෝකයේ අධ්‍යාපනයේ අවශ්‍යතා තේරුම් නොගෙන, දූපත් මානසිකත්වය යටතේ පටු තැනක ඉන්නේ නැතිව මේ රටේත් පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරන්න ඉඩ දෙන්න ඕනෑ. අඩු ගණනේ මුදල් තිබෙන අයටවත් එවැනි විශ්වවිද්‍යාලවලට ඇවිත් මානව අයිතිවාසිකමක් ලෙස තමන්ට අවශ්‍ය අධ්‍යාපනය රට ඇතුළෙන් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථාව දෙන්න ඕනෑ. ඒකට මේ ගරු සභාවේ දේශපාලන පක්ෂ, පාට භේදයක් නැතිව තමුන්නාන්සේලාත්, අපත් මේ රටේ අනාගතය තීන්දු කරන්න ඉන්න -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි කවදාවත් ඒකට විරුද්ධ වුණේ නැහැ. ඔය පැත්තයි විරුද්ධ වුණේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. මේ පැත්තේ කවුරුත් විරුද්ධ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැත්තේ මොකද? සන්ධාන ආණ්ඩුවයි පිට රට විශ්වවිද්‍යාලවලට විරුද්ධ වුණේ. ඔබතුමා කථා කරන්නේ මේ පැත්තේ ඉන්න කාලයේ කරපුවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. මම කියන්නේ පෞද්ගලික- [බාධා කිරීමක්] දේශපාලනය ගාවන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ඔය පැත්තේ හිටියට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධයි; ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධයි. නමුත් මම කියන්නේ ඒක නොවෙයි. පුද්ගලයින් වශයෙන් අපට වග කීමක් තිබෙනවා, දේශපාලන න්‍යාය පත්‍රවල එල්බ ගෙන ඉන්නේ නැතිව, රටේ ප්‍රබුද්ධ සංවාදයක් ඇති කර ගන්න. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමනි, ඒක අපට කියලා වැඩක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ඔය පැත්තේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ නිකම් බබා වෙන්න හදන්න එපා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම කියන්නේ - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා බබා වෙන්න හදනවා නේ. අපට මොනවටද ඕවා කියන්නේ? අපට කියන්න වැඩක් නැහැ. ඔය පැත්තට කියන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම මේ කියන්නේ පාර්ලිමේන්තුවටයි. ජාතික වශයෙනුයි. එදිනෙදා තුට්ටු දෙකේ, දෙකේ පන්තියේ දේශපාලනය කථා කරන තැනක් විධියට නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නායකතුමාට කියන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
දෙකේ පන්තියේ දේශපාලනය, අගු පිළේ තිබෙන ඒවා කථා කරන තැනක් නොවෙයි මේ. මේ පාර්ලිමේන්තුව, රටේ ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව, එක එක වර්ගවල පුද්ගලයින් මුහුණ පාන ප්‍රශ්න පිළිබඳව ප්‍රබුද්ධ සංවාද කේන්ද්‍රයක් වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව මෙහෙම වැටිලා එක් එක් කෙනාට ඇඟිල්ල දික් කරලා කොහොමද රටක ජාතික ප්‍රතිපත්ති තීරණය කරන්නේ? මම කිව්වේ, රටේ ප්‍රශ්නයක් තිබෙන බවයි. ප්‍රශ්නය තමයි - [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි විරුද්ධ නැහැ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, ඔබතුමන්ලා විරුද්ධ නැහැ කියන එක නොවෙයි. මේකට ප්‍රතිපත්තියක් හදා ගන්න ඕනෑය කියන එකයි මම කියන්නේ. මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවයි විභාගවලට මුදල් වෙන් කරන්නේ. විභාග වියදම්වලට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගිය වර 2007 දී අපොස උසස් පෙළ විභාගය සඳහා පමණක් මිලියන 147ක වියදමක් දරා තිබෙනවා. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ග්‍රාම නිලධාරි වැනි විභාග පවත් වන්න මිලියන 188ක වියදමක් දරා තිබෙනවා. සාමාන්‍ය පෙළ විභාගය පවත් වන්න මිලියන 256ක වියදමක් දරා තිබෙනවා. ඔක්කෝම මිලියන 592ක වියදමක් දරා තිබෙනවා, 2007 වර්ෂයට පමණක්.

අපොස සාමාන්‍ය පෙළ, උසස් පෙළ වාගේ විභාග සඳහා මහජනයාගේ බදු මුදල්වලින් වියදම් දරමින් මේ පරිපූරක ඇස්තමේන්තුත් තමුන්නාන්සේලා කොන්දේසි විරහිතව සම්මත කරලා දෙන්නේ මේ අයගේ අනාගතය නිර්මාණය කරන්නයි. ඒ නිසා එතැනදී මතු වන ගැටලුවටත් විසඳුම් දෙන තත්ත්වයක් ඇති කර ගනිමින් මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීමට අවශ්‍ය පූර්ණ සහය අප ලබා දෙන බව සඳහන් කරමින් මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා

[மு.ப. 11.42]

**ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கல்வி அமைச்சுக்கான குறைநிரப்புத்தொகை ஒதுக்கீட்டின்மீதான இவ்விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு எனக்கு வாய்ப்புக் கொடுத்தமைக்காக நன்றி தெரிவித்துக்கொள்கிறேன். இந்தக் குறைநிரப்புப் பிரேரணை மிகவும் அத்தியாவசியமானதென்பதிலே எமக்கு மாறுபட்ட கருத்து இல்லை. ஆனால், நிதி ஒதுக்கீட்டின்போது ஒரு முக்கியமான அமைச்சுக்கு உரிய நிதியை ஒதுக்காது, அதன் தாற்பரியத்தை விளங்கிக்கொள்ளாது, இந்தக் குறைநிரப்புப் பிரேரணைமூலம் நிதியைப் பெற்றுக் கல்வி வளத்துக்காகச் செலவழிக்க எத்தனிப்பதுதான் எங்களுக்குக் கவலையைத் தருகின்றது. கல்வி அமைச்சுக்கென ஒதுக்கப்படுகின்ற இந்த நிதி குறிப்பாக பரீட்சைத் திணைக்களத்தினால் மேற்கொள்ளப்படுகின்ற பரீட்சைச் சேவைகளுக்காகச் செலவிடப்படவிருப்பதனால் இந்த நிதி ஒதுக்கீடு மிகவும் முக்கியமானது. இன்று பரீட்சைத் திணைக்களம் எந்தவித ஊழலும் இன்றி, எந்தவித பாகுபாடுமின்றித் தரமாகவும் திறமையாகவும் இயங்குவதனை நாங்கள் பார்க்கின்றோம். குறிப்பாக வடக்கு-கிழக்கு மாகாணங்களில் போர்க்கால நடவடிக்கைகளினால் பாதிக்கப்பட்ட மாணவர்களுக்குப் பரீட்சைத் திணைக்களம் பல கஷ்டங்களின் மத்தியிலே சில மேலதிக பரீட்சை நிலையங்களை அமைத்துக்கொடுத்து அவர்கள் பரீட்சைகளை எழுதுவதற்கேற்றவாறு தரமானமுறையில் ஒழுங்குகளை மேற்கொண்டது. இவ்விதம் பாதிக்கப்பட்ட மாணவர்கள் இலங்கையிலே மாத்திரமன்றி இந்தியாவிலும் பரீட்சை எழுதக்கூடிய விதத்தில் பரீட்சைத் திணைக்களம் ஒழுங்குகளைச் செய்து உதவி செய்திருக்கிறது. அதற்காக நாங்கள் கல்வி அமைச்சர் அவர்களுக்கும் பரீட்சை ஆணையாளர் நாயகத்துக்கும் அவர்களுடைய பொறுப்புமிக்க ஊழியர்களுக்கும் எங்களுடைய மனப்பூர்வமான நன்றியைத் தெரிவித்துக்கொள்கின்றோம். கல்விக்காகச் செலவிடுகின்ற மூலதனம் அல்லது உள்ளீடு இந்த நாட்டுக்கு மிகவும் தரமான வெளியீடுகளை விளைவிக்கக்கூடியதென்பதிலே எந்த விதமான சந்தேகமும் இல்லை. கல்வியிலேதான் எங்களுடைய நாட்டினுடைய எதிர்காலம் தங்கியிருக்கின்றது. நாங்கள் கல்வி வளர்ச்சிக்காகப் பெருந்தொகையான நிதியை முதலீடு அல்லது உள்ளீடு செய்கின்றோம். அது நிச்சயமாக இந்த நாட்டு மக்களுக்கு காலங்காலமாகப் பெரும் பயனை வழங்கும் என்பதிலே எந்தவிதமான ஐயப்பாடும் இல்லை.

இன்று பல்வேறு கஷ்டங்களுக்கு மத்தியிலேயே பரீட்சைத் திணைக்களம் இப்பரீட்சைகளை நடாத்திக்கொண்டிருக்கின்றது. அண்மையிலே க.பொ.த. உயர்தர பரீட்சை வினாப்பத்திரங்களை மதிப்பீடு செய்கின்ற கடமை தொடர்பாக அரசாங்கத்துக்கும், ஆசிரியர்களுக்கும் இடையே இருந்த முரண்பாடுகளையும் இவற்றினால் ஏற்பட்ட கசப்பு உணர்வுகளையும் நாங்கள் எண்ணிப்பார்க்கின்றோம். கல்விச் சேவையைப் பொறுத்தளவிலே உண்மையாகவே அதனை நாங்கள் சட்டத்தினாலோ நிர்வாகத்தினாலோ அல்லது சுற்றறிக்கைகளினாலோ கட்டுப் படுத்திச் செயற்படுத்த முடியாது. ஏனெனில், ஒரு மனிதன் மனம்வைத்துச் செய்யக்கூடிய சேவைதான் கல்விச் சேவை. சாதாரணமாக நாங்கள் ஒரு தொழிலாளியிடமிருந்து வேலையைப் பெற்றுக்கொள்வதைப் போன்று அல்லது அதனை மதிப்பீடு செய்வதைப்போன்று கல்வி உலகத்திலே வேலையைப் பெறவோ, மதிப்பீடு செய்யவோ முடியாது. ஆகவே, கல்வி உலகத்திலே இருக்கிற அத்தனை பேரும் - அவர் உயர் அதிகாரியாக இருந்தாலும் சரி, அடி மட்டத்திலுள்ள உத்தியோகத்தராகவிருந்தாலும் சரி - நல்ல பரந்த மனப்பான்மையுடனும் அர்ப்பணிப்புணர்வுடனும் கடமையாற்றும் போதுதான் மாணவர்கள் ஒரு தரமான கல்விச் சேவையைப் பெறமுடியும். ஆனபடியால் நாங்கள் எப்பொழுதும் கல்வி அமைச்சு, கல்வித் திணைக்களம், கல்வி அலுவலகங்கள், பாடசாலைகள், பாடசாலைச் சமூகம் ஆகியவற்றுக்கிடையே புரிந்துணர்வுடன் அந்நியோன்னியமான - மிகவும் நெருக்கமான - உறவைப் பேணிப் பாதுகாக்கவேண்டும். அரசாங்கத்தினுடைய கஷ்டத்தை ஆசிரியர்கள் புரிந்துகொள்ளவேண்டும்; ஆசிரியர்களுடைய கஷ்டங்களை அரசாங்கம் புரிந்துகொள்ளவேண்டும். இவ்வாறு பரஸ்பர நல்லுறவு இருந்தால்தான் ஒரு தரமான கல்விச் சேவையை இந்த நாட்டில் எதிர்பார்க்க முடியும். நீதிமன்றம் செல்வதன்மூலமோ கடுமையான சுற்றுநிருபங்களை வெளியிடுவதன்மூலமோ அல்லது வேறு ஏதாவது சட்ட நடவடிக்கை எடுப்பதன்மூலமோ ஆசிரியர்களின் மனங்களை வென்றுவிடமுடியாது. ஆசிரியர்களின் மனங்களை வெல்லாவிட்டால் அவர்களிடமிருந்து நாம் நல்ல சேவையை எதிர்பார்க்க முடியாது. ஆனபடியினால் கல்வி உலகம் என்ற ரீதியிலே ஆசிரியர்கள், கல்வி அமைச்சு, கல்வித் திணைக்களம், கல்வி அலுவலகம் என்பவற்றுக்கிடையே ஒரு பரஸ்பர புரிந்துணர்வை ஏற்படுத்திக்கொள்ள வேண்டியது மிக முக்கியம். கல்வித் திணைக்களங்களை ஆசிரியர்கள் வெறுப்புணர்ச்சியுடன் பார்க்கின்ற நிலைமையும், ஆசிரியர்கள் விடயத்திலே கல்வித் திணைக்களங்கள் முரண்படுகின்ற நிலைமையும் இன்று மலிந்துகொண்டு வருகின்றது. இப்படியான நிலைமைகள் நீடித்தால் நிச்சயமாக நாங்கள் கல்வித்துறையின்மூலம் எதனையும் சாதித்துவிட முடியாது.

இன்று பல்கலைக்கழக மாணவர்கள் பல போராட்டங்களை நடத்துகிறார்கள். பல்கலைக்கழக மாணவர்களைப் பொறுத்தளவிலே அவர்களில் பெரும்பாலானோர் நல்ல குடும்பங்களிலிருந்து வருபவர்கள். அவர்கள் போராட்டத்தை நடாத்துகின்றார்கள் என்றால், அவர்களுக்கு சில அடிப்படைத் தேவைகள் நிறைவேற்றப்படாதிருக்கின்றன என்பதை விளங்கிக்கொள்ள வேண்டும். அந்த மாணவர்களை, மாணவத் தலைவர்களை அடிக்கடி சந்தித்து, அவர்களுடைய கஷ்ட நஷ்டங்களை அறிந்து, நிர்வாகத்தினரின் கஷ்டநஷ்டங்களையும் அவர்களுடன் பகிர்ந்துகொண்டால் இப்படியான பிரச்சினைகள் இருக்கப்போவதில்லை. நான் ஒரு மத்திய கல்லூரியிலே இருபத்தாறு வருடங்களுக்குமேல் அதிபராக கடமைபுரிந்தவன். அந்த இருபத்தாறு வருட காலப்பகுதியில் எனக்கு அங்கிருந்த உயர்தர வகுப்பு மாணவர்களால் - கலைப் பிரிவு, விஞ்ஞான பிரிவு, வர்த்தகப் பிரிவு மாணவர்களால் - எந்தவிதமான கஷ்டமும் ஏற்படவில்லை; அவர்களிடமிருந்து எந்தப் பிரச்சினையையும் நாங்கள் எதிர்நோக்கவில்லை; அவர்கள் மிகவும் உதவியாக இருந்தார்கள். அவர்கள் இன்று இலங்கையின் பல பாகங்களிலும் கடமைபுரிவது மட்டுமல்ல, நாட்டுக்கு வெளியிலும் பொறுப்புவாய்ந்த பல பதவிகளில் நன்றாக இருக்கிறார்கள். க.பொ.த உயர்தர வகுப்பில் படித்த ஒவ்வொரு மாணவரும் அந்தப் பாடசாலையிலே கற்பித்த ஆசிரியர்களுடன் நல்லிணக்கமாகவும் கீழ்ப்படிவாகவும் நடந்துகொண்டதுடன், தமக்குக் கீழுள்ள மாணவ சகோதரர்களை நல்வழிப்படுத்தி, அவர்களுக்கு உதவியாகவிருந்து பாடசாலை அபிவிருத்திக்கு வேண்டிய உதவிகளையும் செய்து, எப்பொழுதும் பாடசாலையின் அபிவிருத்தியில் பங்காளிகளாகவும் இருந்தார்கள். அதற்குக் காரணம் என்னவென்றால், அங்கு 'மாணவர் கவுன்சில்' ஒன்று அமைக்கப்பட்டிருந்தது. ஒவ்வொரு மாதமும் நானும் ஆசிரியர்களும் அவர்களைச் சந்திப்போம். அவர்கள் கூறுகின்ற குறைகளைக் கேட்போம். அவற்றில் சிலவற்றை எங்களால் நிறைவேற்ற முடியாமல் இருக்கும்; சில பிரச்சினைகளை உடனடியாகத் தீர்த்துவைக்க முடியாமலிருக்கும். ஆனால், ஒவ்வொரு மாதமும் அவர்களுடைய குறைகளைக் கேட்டு, எங்களுக்குள்ள கஷ்டங்களையும் அவர்களுடன் நாங்கள் பகிர்ந்துகொண்டு ஒரு புரிந்துணர்வு நிலைமையை ஏற்படுத்தியதனால்தான் உயர்தர வகுப்பு மாணவர்களின் உதவியோடு பாடசாலையைக் கட்டியெழுப்பக்கூடிய ஒரு சூழ்நிலை உருவானது. முன்னாள் கல்வி அமைச்சர்கள், கல்வி அதிகாரிகளுக்கெல்லாம் அந்தப் பாடசாலையைப் பற்றித் தெரிந்திருக்குமென நான் நினைக்கின்றேன். 'சாந்தி நிகேதனம்' என்று சொல்லப்பட்ட அந்தப் பாடசாலை, வசதி வளங்கள் மிகக் குறைந்ததாகும். கிராமப்புறத்திலுள்ள அந்தப் பாடசாலை முன்னேற்றமடைந்ததற்கு ஒரு காரணம் மாணவர்களுக்கும் ஆசிரியர்களுக்குமிடையே இருந்த புரிந்துணர்வுதான். இதை ஏன் நான் சொல்கின்றேன் என்றால், இன்று இப்படியான நல்லுறவுகள் இல்லாமல் இருப்பதனாலாகும்.

[ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා]

எனக்கு நன்றாக ஞாபகத்தில் இருக்கின்ற ஒரு சம்பவத்தை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன். கௌரவ எதிர்க்கட்சித் தலைவர் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் அன்று கல்வி அமைச்சராக இருந்தபொழுது மாவட்டக் கல்விப் பணிப் பாளர்களையெல்லாம் அழைத்து இங்கே கல்வி அமைச்சில் ஒரு கூட்டம் நடத்தினார். அந்த நேரத்திலே எங்களுடைய மாவட்டக் கல்விப் பணிப்பாளரிடத்திலே, "உங்களுடைய மாவட்டத்திலே உள்ள சிறந்த பாடசாலை எது?" என்று கேட்டார். எங்களுடைய மாவட்ட கல்விப் பணிப்பாளராக அன்று இருந்தவர் பெரு மதிப்புக்குரிய எம்.ஏ.திலகரத்ன அவர்கள். அவரது பெயருக்கு முன்னாலும் 'எம்.ஏ.' இருக்கும்; பெயருக்குப் பின்னாலும் 'எம்.ஏ.' இருக்கும். அவர் மிகவும் ஒரு சிறந்த கல்விமான். அந்தக் கூட்டத்திலே முதலாவதாக அவருடைய turn தான் வந்தது. அப்பொழுது அவர் சொன்னார், "சேனையூர் மத்திய கல்லூரி" என்று. அது அன்று கல்வி அமைச்சருக்குத் தெரியவில்லை. சேனையூர் எங்கிருக்கின்றதென்பதை அவருக்கு விளங்கப் படுத்துவது கஷ்டமாக இருந்தது, சேருவிலைக்கு பக்கத்திலோ, பன்சலைக்குப் பக்கத்திலோ இருக்கிறதென்று ஏதோ ஒருவாறு அவருக்கு விளங்கப்படுத்தினார்கள். "ஏன் அந்தப் பாடசாலையை ஒரு சிறந்த பாடசாலையாகக் கருதுகின்றீர்கள்?" என்று கேட்ட தற்கு எங்களுடைய கல்விப் பணிப்பாளர், "வசதி வளங்களற்ற மிகவும் பிற்போக்கான இடத்திலே அமைந்திருந்தும், நாங்கள் கொடுக்கின்ற கல்வி உள்ளீடுகளை மிகவும் உச்சக்கட்டமாகப் பிரயோசனப்படுத்தித் தரமான பெறுபேறுகளைத் தருகின்ற ஒரு கல்வி நிறுவனமாக அது இருக்கின்றது" என்று ஒரு வரைவிலக் கணத்தைக் கொடுத்ததோடு, "அப்பாடசாலை கிராமப்புறத்திலே அமைந்திருந்தாலும்கூட பட்டினத்திலிருந்தும் அங்கு மாணவர்கள் வருகின்றார்கள்" என்றும் குறிப்பிட்டார். இச்சந்தர்ப்பத்தில் நான் சிறப்பாக கௌரவ கல்வி அமைச்சர் அவர்களுக்கும் பரீட்சை ஆணையாளர் நாயகம் அவர்களுக்கும் மற்றும் அவருடைய ஊழியர்களுக்கும், அவர்கள் ஆற்றிய சேவைக்காக நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன். ஏனெனில், 2005ஆம் ஆண்டு திருகோணமலை மாவட்டத்திலே இராணுவ நடவடிக்கை மேற்கொள்ளப்பட்டபொழுது மூதூர் கிழக்கு, வெருகல், ஈச்சிலம்பற்று, வாகரை, கதிரவெளி, மட்டக்களப்பு, படுவான்கரை போன்ற பிரதேசங்களைச் சேர்ந்த மாணவர்களும் பெற்றோரும் இரவோடிரவாக உடுத்த உடையுடன் அகதிகளாக இடம்பெயரவேண்டிய ஒரு சூழ்நிலை ஏற்பட்டது. அதனால் அம்மாணவர்கள் கல்வி கற்கமுடியாது மிகுந்த கஷ்டத்தை அனுபவித்தார்கள். அப்பொழுது ஐந்தாந்தரப் புலமைப் பரிசில் பரீட்சை, க.பொ.த. சாதாரண தரப் பரீட்சை, க.பொ.த. உயர்தரப் பரீட்சை ஆகிய பரீட்சைகள் நடைபெறவிருந்த காலகட்டம். அச்சமயத்திலே அங்குள்ள பெற்றோரும் பிள்ளைகளும் பரீட்சையையும் அங்குள்ள நிலைமையையும் எண்ணிக் கலங்கியிருந்த நேரத்திலே கல்வி அமைச்சர் அவர்களும் பரீட்சை ஆணையாளர் நாயகம் அவர்களும் அவர்களுடைய ஊழியர்களுடன் சேர்ந்து மிகவும் கஷ்டப்பட்டு மிகவும் குறுகியகால அவகாசத்துக்குள்ளே அந்த இடம்பெயர்ந்த மாணவர்களுக்கு மிகவும் வசதியான பரீட்சை நிலையங்களை அமைத்துக் கொடுத்து அப்பரீட்சைகளை நடத்தியிருக்கிறார்கள். இந்த வருடமும் அதேபோன்று மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி, ஆகிய இடங்களிலே நாளாந்தம் பல்குழல் எறிகணைத் தாக்குதல்கள், 'கிபிர்' விமானக் குண்டுவீச்சுக்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்ற வேளையிலே பதுங்குகுழிகளிலே பீதியுடன் இருந்து படித்துவிட்டுத்தான் அங்குள்ள மாணவர்களுக்குப் பரீட்சை எழுதவேண்டிய நிலை ஏற்பட்டது. அந்த மாணவர்கள் பரீட்சை எழுதுவதற்காகச் செல்லும்பொழுது பரீட்சைத் திணைக்களத்தினால் ஒவ்வொரு நாளைக்கு ஒவ்வொரு பரீட்சை நிலையங்கள் அறிவிக்கப்படும். அதன்பிரகாரம் அப்பரீட்சை நிலையத்துக்குச் சென்றால், அந்தப் பரீட்சை நிலையம் இன்னொரு இடத்துக்கு மாற்றப்பட்டிருக்கிறது என்றும் அங்கு வந்து பரீட்சை எழுதும்படியும் சொல்வார்கள். அதன் பிரகாரமே அந்த மாணவர்கள் சென்று பரீட்சை எழுதவேண்டிய நிர்ப்பந்தம் ஏற்பட்டது. இப்படியான சூழ்நிலையில் குறிப்பாக மன்னார், கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டத்தில் இருந்த மாணவர்கள் மிகுந்த மன அழுத்தத்தோடும் வசதிக் குறைவோடும் கடந்தமுறை நடைபெற்ற க.பொ.த. உயர்தரப் பரீட்சையையும், ஐந்தாம் ஆண்டுப் புலமைப்பரிசில் பரீட்சையையும் கஷ்டப்பட்டு எழுதியிருக்கிறார்கள்.

இங்கு இந்த அரசாங்கம் கல்வி நடவடிக்கைகளைவிட ஒரு தேர்தலுக்குக் கொடுக்கின்ற முக்கியத்துவத்தையிட்டு நாங்கள் மிகவும் கவலைப்படுகின்றோம். அதேவேளை, யுத்த நடவடிக்கைகளுக்குக் கொடுக்கின்ற முக்கியத்துவத்தைக் கல்வி நடவடிக்கைகளுக்குக் கொடுக்காமல் இருப்பதும் மிகுந்த வேதனையைத் தருகின்றது. இறுதியாக நடத்தப்பட்ட வட மத்திய மாகாண சபைத் தேர்தல், சபரகமுவ மாகாண சபைத் தேர்தல் என்பவற்றைப் பொறுத்தளவிலே அவற்றை ஒரு மாதம் முந்தி நடத்துவதிலோ அல்லது ஒரு மாதம் பிந்தி நடத்துவதிலோ எமக்கு ஆட்சேபனை இருந்ததில்லை. ஆனால், பரீட்சைத் திணைக்களம் ஒரு பரீட்சைக் கால அட்டவணையை ஒழுங்குபடுத்தி, அந்தப் பரீட்சையை நடத்துவதற்கான ஒழுங்குகளை மேற்கொண்டிருந்தவேளையிலே, அந்த மாகாண சபைத் தேர்தல்களை நடத்துவதற்காக, இரண்டு கட்டங்களாகப் பிரித்து அப்பரீட்சையை நடத்திய வரலாறு எமது நாட்டிலேதான் இருந்திருக்கிறது; அது மிகவும் வேதனைக்குரியது. ஒரு பரீட்சையை ஒழுங்குபடுத்தி, அந்தப் பரீட்சையை இடையிலே நிறுத்தி, திரும்பவும் அந்தப் பரீட்சையை ஒழுங்கு படுத்திச் செய்வதிலுள்ள கஷ்ட நஷ்டங்களை - அதிலுள்ள தாக்கத்தை - நான் முன்பு ஆசிரியராகவும், பின்னர் அதிபராகவும் இருந்த காரணத்தினாலே மிக ஆழமாக உணரமுடிகிறது. இத்தகைய ஏற்பாடுகளினால் பரீட்சைத் திணைக்களம் மிகுந்த கஷ்டப்பட்டிருக்கிறது. அத்துடன் அரசாங்கத்துக்கு மேலதிகமான செலவுகளும் ஏற்பட்டிருக்கின்றன. இந்த அரசாங்கம் மாணவர் களைப் பற்றியோ, இந்தப் பரீட்சையை இரண்டாகப் பிரித்து நடத்துவதால் ஏற்படுகின்ற மேலதிகச் செலவுகளைப் பற்றியோ சிந்திக்கவில்லை. சிலவேளைகளில் மாகாண சபைத் தேர்தல் சுபநேரம் பார்த்து ஆரம்பிக்கப்படுவதற்காக இந்தப் பரீட்சை ஒத்தி வைக்கப்பட்டுப் பின்னர் நடத்தப்பட்டதோ என்பது எங்களுக்குத் தெரியவில்லை. இருப்பினும் இவ்வாறான சம்பவங்கள் எமக்கு மிகுந்த கவலையைத் தருகின்றன.

இந்தமுறை நடத்தப்பட்ட ஐந்தாந்தரப் புலமைப்பரிசில் பரீட்சையின்பொழுது 200 மாணவர்கள் இரண்டு பாடத்திலும் பூச்சியப் புள்ளிகளைப் பெற்றிருக்கிறார்கள். இது மிகவும் ஆச்சரிய மான பெறுபேறாக இருக்கின்றது. ஐந்தாம் தரத்தில் படித்த மாணவர்கள் இரு பாடங்களிலும் புள்ளிகள் ஒன்றையும் பெறாமல் பூச்சியப் புள்ளியைப் பெறுவதென்றால் அவர்களிடத்தில் ஒரு திறமையும் இல்லையா? அந்த மாணவர்கள் ஆண்டு 1 தொடக்கம் ஆண்டு 5 வரை கல்வி கற்றபொழுதிலும் அவ்வாறான புள்ளி களைப் பெறுவதாயின் அவர்களுடைய கல்விச் செயற்பாட்டில் என்ன நடைபெற்றது? அது மாணவர்களின் பிழையா அல்லது பரீட்சையின் பிழையா? இது தொடர்பாகப் பரீட்சைத் திணைக் களம் நிச்சயமாக மிகவும் ஆழமாக ஆராயவேண்டிய கடமைப் பாட்டில் உள்ளது. மாவட்டரீதியாக இந்த 200 மாணவர்களையும் அணுகி, அந்நியோன்னியமான முறையிலே அவர்களிடம் வினாக் களைத் தொடுத்து, அவர்களுடைய கல்வித் தரத்தின் உண்மையான நிலைமையை அறிந்துகொள்ளவேண்டும். இதேபோன்று O/L பரீட்சையிலும் எல்லாப் பாடங்களிலும் சித்தியடையத் தவறுகின்ற மாணவர்கள் இருக்கின்றார்கள். A/L பரீட்சையும் இதற்கு விதி விலக்கல்ல; A/L பரீட்சையில் எல்லாப் பாடங்களிலும் 'F' எடுக் கின்ற மாணவர்களும் இருக்கின்றார்கள். ஏன் இந்த நிலைமைகள் ஏற்படுகின்றன என்பதை நாங்கள் மிகவும் ஆழமாக யோசிக்க வேண்டியவர்களாக இருக்கின்றோம்.

மேலும், இந்தப் பாராளுமன்றத்திலும் இதற்கு வெளியிலும் பரீட்சை வினாப்பத்திரங்களைப் பற்றி கல்விமான்களும் ஆசிரியர் களும் கல்விச் சமூகமும் விமர்சிப்பதை எங்களால் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. பரீட்சை வினாப்பத்திரங்கள் சிங்கள மொழியிலே தயாரிக்கப்பட்டு அவை தமிழுக்கு மொழிபெயர்க்கப் படுகின்றன. இப்படியாக மொழிபெயர்த்து வழங்கப்படுகின்ற வினாப்பத்திரங்கள் தமிழ் மாணவர்களுக்குப் பல கஷ்டங்களையும் கருத்து முரண்பாடுகளையும் ஏற்படுத்துகின்றன. இந்த விடயத் திலும் கடமையுணர்வோடு நடக்கவேண்டிய பொறுப்பு பரீட்சைத்

திணைக்களத்துக்கு இருப்பதாக நான் நினைக்கின்றேன். பரீட்சையை மிகவும் நன்றாக எழுதவேண்டுமென்ற ஆதங்கத்தோடு பரீட்சை மண்டபத்துக்கு மாணவர்கள் செல்லும்போது, வினாப் பத்திரத்திலுள்ள வினாக்கள் அவர்களை முற்றுமுழுதாகக் குழப்பி விட்டால் அவர்களால் அந்தப் பரீட்சையை எழுத முடியாத ஒரு மனோநிலை உருவாகின்றது. பரீட்சை வினாக்களைப் பொறுத்தளவிலே அவை பல கோணங்களிலிருந்து மதிப்பீடு செய்யப்படல் வேண்டும். வினாப்பத்திரமாக அச்சிட்டு மாணவர்களுக்கு இரகசியமாக வழங்குவதற்கு முன்னர், பரீட்சைத் திணைக்களம் இந்த விடயங்களிலே அவதானம் செலுத்தவேண்டும். அதாவது, விஞ்ஞான வினாப்பத்திரத்தை விஞ்ஞானம் தெரியாத ஒருவர் மொழிபெயர்த்தால் நிச்சயமாக அதிலே பிழைகள் ஏற்படுவதற்கு இடமுண்டு. ஏனென்றால், அவருக்கு முக்கியம் மொழிபெயர்ப்புத்தான். ஒவ்வொரு சொற்களுக்கும் பொருத்தமான தமிழ் சொற்களையோ ஆங்கிலச் சொற்களையோ கண்டுபிடித்து எழுதவேண்டுமென்ற நினைப்போடு மொழிபெயர்க்கின்ற நேரத்திலே நிச்சயமாக அதிலே பிழைகள் ஏற்பட வாய்ப்பிருக்கும். விஞ்ஞான வினாப் பத்திரங்கள் மொழிபெயர்க்கப்படும்பொழுது நிச்சயமாக விஞ்ஞான பாடத்தைப்பற்றி அறிந்தவர்கள், ஆற்றலுள்ளவர்கள்தான் அதைச் செய்யவேண்டும். ஆகவே, மாணவர்களின் பரீட்சை எழுதக்கூடிய மனநிலையைக் குழப்பிவிடாதவகையில், அவர்களை மேலும் உற்சாகப்படுத்தும் வகையில் இது சம்பந்தமான எதிர்காலச் செயற்பாடுகள் அமைவது பொருத்தமாக இருக்கும்.

அடுத்தது, மாணவர்களைப் பொறுத்தளவிலே அவர்களுக்கு ஒரு நல்ல மனநிலையோடு பாடசாலையிலே கற்கவேண்டிய ஒரு தேவை இருக்கின்றது. பாடசாலைகளில் கற்கக்கூடிய விதத்தில் அக மற்றும் புறச் சூழ்நிலைகளை மாணவர்களுக்கு ஏற்படுத்திக் கொடுக்கவேண்டியது ஓர் அரசாங்கத்தினுடைய பொறுப்பாகும். அந்தச் சூழ்நிலையை ஏற்படுத்திவிட்டால் அங்கு கற்றல் செயற்பாடுகள் தானாகவே நடைபெறும். ஆனால், இன்று அப்படியான அக, புறச் சூழ்நிலைகள் வடக்கு, கிழக்கில் இல்லை. யுத்தம் நடைபெற்ற இடங்களிலே இப்பொழுது மீள்குடியேற்றம் நடைபெற்று வருகின்றது; பாடசாலைகள் தொடங்கப்பட்டிருக்கின்றன. ஆனால், அங்கு சென்று பார்த்தால் மாணவர்கள் கற்கக்கூடிய அக, புறச் சூழ்நிலைகள் இல்லாமலிருப்பதைக் காணக்கூடியதாக விருக்கும். பாடசாலைக் கட்டிடங்கள் உடைந்த நிலையிலே திருத்தப்படாமல் அலங்கோலமாகக் காட்சியளிக்கின்றன. மக்கள் அந்த இடத்தைவிட்டு வெளியேறி இரண்டரை வருடங்களுக்குப் பிறகு அங்கு மீள்குடியேற்றப்படுகின்ற நேரத்திலும் அப்பாடசாலைகள் மிகவும் பயங்கரமாகக் காட்சியளிக்கின்றன. அவர்கள் அந்த இடத்தைவிட்டு வரும்பொழுது அந்தப் பாடசாலைகள் ஓர் ஒழுங்கான அமைப்பில்தான் இருந்தன. மீண்டும் இரண்டரை வருடங்களுக்குப் பிறகு அந்தப் பாடசாலைகளை மிகவும் அதிர்ச்சியுடன் பார்க்கவேண்டிய நிலைமை அந்த மாணவர்களுக்கு இருக்கின்றது. இது மாணவர்களுடைய உள்ளத்தை மிகக் கடுமையாகப் பாதிக்கின்றது. இன்று அப்பாடசாலைகள் கட்டிடச் சிதைவுகளோடு காட்சியளிப்பது மட்டுமல்ல, அங்கு தளபாட வசதிகளும் இல்லை. அதிபர், ஆசிரியர்களுக்குக்கூட தேவையான தளபாடம் இல்லை. மூதூர் கிழக்கிலுள்ள வெருகல் - ஈச்சிலம்பற்றிலே தொடங்கப்பட்ட பல பாடசாலைகளிலும் மட்டக்களப்பு படுவான் கரைப் பகுதியிலே தொடங்கப்பட்ட பாடசாலைகளிலும் இன்று வரை கட்டிடங்கள் திருத்தப்படாத நிலையிலே இருக்கின்றன. அங்கு போதியளவு தளபாடங்களும் கல்வி உபகரணங்களும் வழங்கப்படாமல் இருக்கின்றன. கௌரவ கல்வி அமைச்சர் அவர்கள் மிகவும் கடமையுணர்வோடும் பொறுப்புணர்வோடும் செயற்படுகின்ற ஓர் அமைச்சர். தயவுசெய்து நீங்கள் உங்களுடைய மேற்பார்வையிலே ஒரு குழுவாகச் சேர்ந்து மீள்குடி யேற்றப் பாடசாலைகளுக்கு விஜயம் செய்து, அங்குள்ள அக, புறச் சூழ்நிலைகளை அந்த மாணவர்கள் கல்வியை மனக்கிலேசமின்றித் தொடரும்வகையில் எவ்வாறு ஏற்படுத்திக் கொடுக்கலாம்? என்ற ஒரு மதிப்பீட்டைச் செய்யவேண்டுமென்று நான் மிகவும் விநயமாக வேண்டிக்கொள்ள விரும்புகின்றேன்.

கல்வியிலே இன்று சம வாய்ப்பு அளிக்கப்படுவதாகச் சொல்லப்படுகின்றது. நாங்கள் பல வருடங்களுக்கு முன்பிருந்தே கல்வியில் சம வாய்ப்பளிக்கப்படாமைதான் இந்த நாட்டிலே உள்ள முக்கிய தவறென்று கூறிக்கொண்டு வந்தாலும், இன்றும் குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே கல்வித்துறையில் சமவாய்ப்பற்ற நிலைமையே தொடர்கின்றது. வடக்கு, கிழக்கு மாகாணத்திலுள்ள பாடசாலைகளில் போதிய ஆசிரியர்கள் இல்லை. இன்று ஆங்கிலம் கட்டாய பாடமாக்கப்பட்டுள்ளது. ஆங்கிலமும் கணினி அறிவும் இல்லாவிட்டால் மாணவர்கள் படிப்பதில் பிரயோசனமில்லை. "எண்ணும் எழுத்தும் கண்ணெனத் தகும்" என்ற காலம்போய் இன்று "கணினிக் கல்வியும் ஆங்கிலக் கல்வியும் முக்கியம்" என்று சொல்லப்படுகின்ற காலத்திலே நாங்கள் வாழ்ந்து கொண்டிருக்கின்றோம். ஆனால், வடக்கு, கிழக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், அங்கு ஏறக்குறைய எண்பது சதவீதமான பாடசாலைகளில் ஆங்கில ஆசிரியர்கள் இல்லை. அதேபோன்று கணிதம், விஞ்ஞானம் ஆகிய பாடங்களுக்கும் போதிய ஆசிரியர்கள் இல்லை. க.பொ.த. சாதாரண தர வகுப்பு மாணவர்கள்கூட கணித, ஆங்கில, விஞ்ஞான ஆசிரியர் கள் இல்லாதநிலையில் தமது பாடசாலைக்குச் சென்று வகுப்பு களில் இருந்துவிட்டு வருகிறார்கள். பெற்றோர்களும் அப் பிரதேசங்களில் இராணுவக் கெடுபிடி அதிகரித்துள்ளதனால், பிள்ளைகள் வீட்டில் இருந்தால் அல்லது வெளியில் நின்றால் இராணுவத்தினர் பிள்ளைகளைப் பிடித்துக்கொண்டு போய்விடு வார்கள் என்றும் அதனால் பிள்ளைகளைப் பாடசாலைக்கு அனுப்பினால் அங்கு பாதுகாப்பாக இருந்துவிட்டு வருவார்கள் என்றும் எண்ணிப் பிள்ளைகளைப் பாடசாலைக்கு அனுப்புகிறார் கள். கிழக்கு மாகாணத்திலே உள்ள மாணவர்கள் பாடசாலைக்குச் சென்று மிகுந்த வேதனையுடனும் விரக்தியுடனும் பாடசாலையில் இருந்துவிட்டு வருகின்ற நிலைமைகள் கூடுதலாக இருக்கின்றது. தயவுசெய்து நீங்கள் இந்த விடயத்தைக் கவனத்துக்கு எடுத்துக் கொள்ளவேண்டும். ஆங்கில ஆசிரியர்களை வெளியிலிருந்து இறக்குமதி செய்ய முடியாது. இலங்கையிலே குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே ஆங்கிலத்தில் திறமைச் சித்தியடைந்த மாணவர்கள் பலர் இருக்கிறார்கள். அவர்களைத் தேர்ந்தெடுத்து, சிறப்பான ஆங்கிலப் பயிற்சிகளைக் கொடுத்து, அவர்களைத் தரமான ஆங்கில ஆசிரியர்களாக உள்வாங்கலாம். அதனை விடுத்து, "இன்று பாடசாலைகளில் ஆங்கில ஆசிரியர்கள் பற்றாக் குறையான அல்லது ஆங்கில ஆசிரியர்கள் இல்லாத நிலைமையே சாதாரணமாக எல்லாப் பாடசாலைகளிலும் காணப்படுகின்றது" என்று சாக்குப்போக்குச் சொல்லிக்கொண்டிருக்க முடியாது. எனவே, கல்வியில் சமவாய்ப்பு என்று பேச்சளவில் மாத்திரம் நிற்காமல், அதற்கு ஏதாவது திட்டவட்டமான நடவடிக்கை எடுத்தாகவேண்டும்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
මට තව විනාඩියක් දෙන්න.

இன்று தேசியப் பாடசாலைக்கும் மாகாணப் பாடசாலைக்கும் நிருவாக முறையிலே சிக்கல் நிலை காணப்படுகிறது. கடந்த இரண்டு-மூன்று தினங்களுக்கு முன்பு திருகோணமலையிலே உள்ள "சென். மேரிஸ் கொலிஜ்" என்ற தேசியப் பாடசாலையில் கல்விகற்கும் மாணவர்களுடைய பெற்றோர் என்னுடன் தொலைபேசியில் தொடர்புகொண்டு தமது பிள்ளைகளுக்குப் பரீட்சைக் காலம் நெருங்கிவிட்டது; அவர்களுக்குக் கணிதம் கற்பிப்பதற்கு ஆசிரியர்கள் இல்லை எனக் கூறினார்கள். திருகோணமலைப் பட்டினத்திலே உள்ள ஒரு தேசியப் பாடசாலைக்கே இந்த நிலைமை ஏற்பட்டுள்ளது. நான் உடனடியாக வலயக் கல்விப் பணிப்பாளரைத் தொடர்புகொண்டு கேட்டபொழுது, அவர் "இது ஒரு தேசியப் பாடசாலை என்பதால் நாங்கள் இப்பாடசாலைக்கு ஆசிரியரை நியமிப்பதிலே பல

[ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා]

கஷ்டங்கள் இருக்கின்றன." என்று சொன்னார். அதன் பின்னர் நான் மாகாணக் கல்விப் பணிப்பாளருடன் தொடர்புகொண்டு, "நீங்கள் உடனடியாக இதற்கு ஒரு மாற்று வழியாக pending approval எடுத்துக்கொடுத்தாவது ஓர் ஆசிரியரை நியமிக்கவேண்டும்" என வலியுறுத்திக் கேட்டிருந்தேன். இவ்வாறு நாங்கள் வலியுறுத்திக் கேட்டதன் பின்னரே அங்கு ஓர் ஆசிரியரை நியமிக்கின்ற நிலைமை காணப்படுகின்றது. எனவே, கல்வித் திணைக்கள மட்டத்திலே இதுபற்றிச் சிந்திக்கவேண்டும். நாட்டிலுள்ள ஒரு பாடசாலையிலே ஆசிரியர் இல்லாவிட்டால் கல்வித் திணைக்களம் அப்பாடசாலை யின் குறையை அறிந்து அதனை நிவர்த்தி செய்கின்ற நிலைமை உருவாகவேண்டும்.

இன்று வன்னியிலே இருக்கின்ற மாணவர்களின் நிலைமையைப் பார்த்து நாங்கள் மிகவும் வேதனைப்படுகின்றோம். அங்கு ஒரு யுத்தம் நடைபெற்றுக்கொண்டிருக்கிறது. அங்குள்ள பாடசாலைகள் பல அழிந்துவிட்டன. அங்குள்ள மாணவர்களுட் பட மக்கள் அனைவரும் ஓடுகிறார்கள்; ஓடிக்கொண்டே இருக்கிறார்கள். மக்கள் மன்னாரிலிருந்து கிளிநொச்சிக்கு, பின்னர் கிளிநொச்சியிலிருந்து முல்லைத்தீவுக்கு என இவ்வாறு ஓடிக் கொண்டே இருக்கிறார்கள்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

இந்த யுத்தத்தைத் தொடர்வதனால் நீங்கள் சாதிக்கப்போவது ஒன்றுமில்லை. நிச்சயமாக இந்தப் பிரச்சினையை நாங்கள் யுத்தத்தினால் அன்றி ஒரு சமாதானப் பேச்சுவார்த்தைமூலம்தான் தீர்க்க முடியும். இதனைப் பலரும் பல மட்டத்திலிருந்தும் இடித் துரைத்தபொழுதிலும் அரசாங்கம் யுத்த முனைப்புடனேயே இருக் கின்றது. இந்த யுத்த முனைப்பினால் இன்று வடக்கு, கிழக்கு மாகாணத்தின் கல்வி முற்றுமுழுதாகச் சீரழிக்கப்பட்டிருக்கின்றது. அதுமட்டுமன்றி, அந்த மாகாணத்திலுள்ள மக்களுடைய பொருளா தாரம், அவர்களுடைய இயல்பு வாழ்க்கை என்பன சீரழிக்கப் பட்டிருக்கின்றன. இவ்வளவைச் சீரழித்தும் யுத்தத்தின்மூலம் ஒரு தீர்வைப் பெற முடியாமலிருக்கும்போது, தொடர்ந்தும் யுத்தத்தை மேற்கொள்வதானது, இந்த அரசாங்கம் வேண்டுமென்றே வடக்கு, கிழக்கு மாகாணத்தில் தமிழ் மக்களுடைய கல்வியையும் பொருளா தாரத்தையும் அவர்களுடைய இயல்பு வாழ்க்கையையும் சீரழிக்க எடுத்த முடிவென்றே நாங்கள் கருதவேண்டியிருக்கிறது என்று கூறி, எனக்குப் பேசுவதற்கு வாய்ப்பளித்ததற்கு நன்றி தெரிவித்து அமர்கின்றேன். நன்றி.

[අ.භා. 12.06]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීම සඳහා පැවැත් වෙන්නා වූ විවාදයේදී අද අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වී තිබෙන වින්නැහිය ගැන නැත්නම් අධ්‍යාපනයට කණ කොකා හඬා තිබීම ගැන අපි කථා කළ යුතුයි.

මේ රටේ විතරක් නොවෙයි ලෝකයේ ඕනෑම රටක අධ්‍යාපනය කියන්නේ ඒ රටේ ජීවනාලියයි. ඒ රට ගමන් කරන්නේ කොයිබටද කියන නිර්ණායකය සපයන්නේ, ඒ රටේ ජනතාව ඒ රටේ අනාගත පරපුර ඉදිරියට ගමන් කිරීමේ මාර්ගය පාදන්නේ අධ්‍යාපනය තුළිනුයි. අප බලන්න ඕනෑ, අපේ රටේ මේ අධ්‍යාපන ක්ෂේත්‍රය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා. නිදහස් අධ්‍යාපනයේ වරම් ලබා ඒ තුළින් විශ්වවිද්‍යාලයට ගිය කෙනකු විධියට මා දකින්නේ අද අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය එකම අවුලක් බවට පත් වී තිබෙන බවයි. ඇයි මම එහෙම කියන්නේ? අද පළමු වන වසරට ළමයින් ඇතුළත් කිරීමේ සිට පහ වසරේ ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රය, අපොස සාමාන්‍ය පෙළ හා අපොස උසස් පෙළ ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීම දක්වා වූ සියලුම අංශවලින් මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එහෙම නැත්නම් අධ්‍යාපන බලධාරීන් විසින් දැඩි අර්බුදයකට ලක් කර තිබෙනවාය කියන එකයි මගේ විශ්වාසය.

අපොස උසස් පෙළ උත්තර පත්‍ර බැලීමේදී සාමාන්‍ය සිරිත තමයි ප්‍රශ්න පත්‍රය සකස් කරපු මහාචාර්යවරයාව ගෙන්වලා, ඒ ප්‍රශ්න පත්‍රයේ උත්තර පත්‍ර බලන එක් එක් විදුහල්වල ගුරුවරුන් කැඳවලා ඔවුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම. ඒ ප්‍රශ්න පත්‍රය පිළිබඳව සාකච්ඡා කරනවා. සාකච්ඡා කරලා විවිධ අදහස් මතු කර ගෙන ඊට පස්සේ ඒ මහාචාර්යවරයා විසින් ඒ ගුරුවරුන්ට උපදෙස් දෙනවා, "මම බලාපොරොත්තු වුණේ මේ මේ දේවල්, මේ මේ විධියට තමයි පිළිතුරු ලැබෙන්න ඕනෑ" කියලා. නමුත් පසු ගිය අපොස උසස් පෙළ උත්තර පත්‍ර බැලීමේ කටයුත්තේදී එහෙම දෙයක් දකින්නට ලැබුණේ නැහැ. ප්‍රශ්න පත්‍ර කීපයක් සම්බන්ධයෙන් විතරයි අපට එහෙම දකින්නට ලැබුණේ. විශේෂයෙන්ම සත්ත්ව විද්‍යාව වැනි තීරණාත්මක ප්‍රශ්න පත්‍රවල උත්තර පත්‍ර බැලීමේදී ඒ පිළිබඳ සාකච්ඡාවක් කළේ නැහැ. ඒත් එක්කම උත්තර පත්‍ර බැලීමට යොදා ගන්නා මේ ගුරුවරුන් එක් එක් විදුහල්වල ඒ විෂයය උගන්වන ගුරුවරුන් වෙන්න ඕනෑ. ඒක තමයි සාමාන්‍ය ස්වරූපය. ඒ ගොල්ලන්ට තමයි ඒ විෂයය ගැන දැනුමක් තිබෙන්නේ. ඒ වාගේම එක් එක් ගුරුවරයාට ඒ උත්තර පත්‍ර බැලීමට හැකියාවක් තිබෙනවාද කියා ඔහුගේ නිපුණතාව පිළිබඳව විදුහල්පතිවරයා රහස්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. මේ කිසිවක් නැහැ. අද අනෙක් හැම ක්ෂේත්‍රයකම තීරණ ගන්නවා වාගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේත් ගුරුවරුන් ගැන කිසිම සොයා බැලීමක් නැතුව මේ උත්තර පත්‍ර බැලීමේ කටයුත්තට යොමු කරලා තිබෙනවා. මේ තුළින් උද්ගත වන ප්‍රතිඵල ඉතාම භයානකයි. මේ හැමෝම දන්නවා, තමන්ට කොයි තරම් අමාරුකම් තිබුණත් තමන්ගේ දරුවන්ට උගන්වන්නට දෙමව්පියන් දුක් මහන්සි වන බව. තමන්ගේ දරුවෙක් වෛද්‍යවරයකු වෙනවා දකින්න, ඉංජිනේරුවකු වෙනවා දකින්න, නීතිඥයකු වෙනවා දකින්න සමාජයේ හොඳ තැනකට යනවා දකින්න ඕනෑම දෙමව්පියෙක් කැමැතියි. ඒ සඳහා තමයි සියලු දේවල් කැප කරන්නේ. ඉංජිනේරුවකු වීමේදී, විශේෂයෙන්ම වෛද්‍ය වෘත්තියට ඇතුළු වීමේදී අපොස උසස් පෙළ විභාගයේ එක ලකුණක් නැත්නම් ලකුණු දෙකක් කියන එක ඉතාමත් වැදගත්. විෂයය දැනුමක් නැති ගුරුවරුන් උත්තර පත්‍ර බැලීමේදී ඇති වන අර්බුදය එහෙම නැත්නම් ඒ ප්‍රතිඵල දීමේදී ඇති වන විකෘතිභාවය වළක්වන්න පුළුවන් කාටද කියලා මම මේ අවස්ථාවේදී ප්‍රශ්න කරනවා.

ඔක්තෝබර් 06 වැනි දා ලෝක ගුරු දිනයයි. මේ ආණ්ඩුව ගුරු දිනය සැමරුවේ කොහොමද? ලංකාවේ ගුරුවරුන් අයත් වන වෘත්තීය සමිතිවල නායකයින් ටික උසාවියට ගෙනාවා. එහිදී අධිකරණයට පවා අසත්‍ය ප්‍රකාශ කළාය කියා මා මේ අවස්ථාවේදී කියනවා. මොකද, ඒ අවස්ථාවේදී රජය වෙනුවෙන් පෙනී සිටි අය කිව්වා උත්තර පත්‍ර බලා ඉවරයි කියා. ඒ වගේ ප්‍රකාශ තමයි කළේ. නමුත් මම පැහැදිලිව කියනවා, මේ වන කොටත් උත්තර පත්‍ර බලමින් සිටින බව. ටී.බී. ජයා විද්‍යාලයේ ක්‍රිස්තියානි ආගම විෂයය සම්බන්ධ දෙමළ මාධ්‍ය උත්තර පත්‍ර බලන්න පටන් ගත්තේ ඊයේ. ඊට අමතරව ශුද්ධ ගණිතය, සත්ත්ව විද්‍යාව, භෞතික විද්‍යාව වැනි විෂයන්වල උත්තර පත්‍ර තවමත් බලමින් පවතිනවා. ඒ නිසා මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බලධාරීන් අධිකරණය පවා නොමඟ යවා තිබෙනවාය කියා මම කියනවා.

ඒ වාගේම බලන්න, 5 වසර ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව. 5 වසර ශිෂ්‍යත්වය තරගකාරී විභාගයක්, කඩ ඉම් විභාගයක්. මෙවර 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍රය ඒ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි දරුවන්ට විතරක් නොවෙයි, මේ රටේ ගුරුවරුන්ට විතරක් නොවෙයි, දෙමාපියන්ටත් ප්‍රශ්නයක් වුණා. ඇයි එහෙම කියන්නේ? මම අර ඉස්සෙල්ලා කියපු විධියට, මේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදීත් ප්‍රශ්න පත්‍රය විභාගයට දෙන්න ඉස්සෙල්ලා ප්‍රශ්න පත්‍රය හදපු ගුරුවරුන් නැත්නම් මහාචාර්යවරයා ඒ පිළිබඳව ගුරුවරුන් එක්ක සාකච්ඡාවක් කරනවා. නැත්නම් ඒක model paper එකක් විධියට ඒ පිළිබඳව ගුරුවරුන් එක්ක සාකච්ඡා කරනවා. ඒ ප්‍රශ්න පත්‍රය හදන්න දෙනවා. මෙවර 5 වසර ශිෂ්‍යත්ව

විභාගය සඳහා මේ කිසිවක් කරලා නැහැ. මට ගුරුවරුන් පිරිසක් කිව්වා, මෙවර 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ පළමු වැනි ප්‍රශ්න පත්‍රයට ඒ අදාළ කාලය තුළ ගුරුවරුන්ටවත් පිළිතුරු දෙන්න බැහැය කියලා. සාමාන්‍යයෙන් ප්‍රශ්න පත්‍රයක් හදන්නේ සරලභාවයේ සිට සංකීර්ණභාවය දක්වායි. 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා එහෙම ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණේ නැහැ. සංකීර්ණභාවයේ සිට සරලභාවය දක්වායි හදලා තිබුණේ. ඒත් එක්කම ප්‍රශ්න පත්‍රයේ 06, 07 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න ළමයකුට විනාඩි දහයකට වඩා යනවා. ගුරුවරුන් කියපු විධියට ගුරුවරයකුටත් ඒවාට පිළිතුරු ලියන්න විනාඩි දහයකට වැඩි කාලයක් යනවාලු. ඒ වාගේම 19, 20 ප්‍රශ්න 7 වසර ළමයින්ගේ ගණිත සංකල්පවලට අයත් ප්‍රශ්න. ඉතින් මෙහෙම වුණාම මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කඩා වැටීම ගැන අපට කථා නොකර ඉන්න පුළුවන්ද? මේ තුළ කඩා වැටීමක් නැහැයි කියා කාටවත් කියන්න පුළුවන්ද? ඉතින් මේක තමයි සැබෑ තත්ත්වය. දැන් බලන්න, මේ ප්‍රශ්න පත්‍රයට ලකුණු දුන්නේ ලකුණු අසුවෙනුයි. ඇයි ලකුණු අසුවෙන් දුන්නේ. ඒ ලකුණු දීම තුළින්ම පෙනෙන්න තිබෙනවා, මෙතැන ලොකු අඩු පාඩුවක් වුණාය කියා අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගෙන තිබෙන බව. ඊට පස්සේ ඉතිරි ලකුණු 20 දුන්නේ ප්‍රසාද ලකුණු වශයෙන්. එහෙම නැත්නම් වෙනම ක්‍රමයකටයි ඒ ලකුණු 20 දුන්නේ. ඉතින් මේ වාගේ ප්‍රශ්න තිබෙනවා.

දැන් බලන්න, අපොස උසස් පෙළ ප්‍රශ්න පත්‍ර බැලීම සම්බන්ධ ප්‍රශ්නය තිබෙනවා. ඊළඟට 5 වසර ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙනුත් ප්‍රශ්න තිබෙනවා. අනික් ප්‍රශ්නය පෙළ පොත් ප්‍රශ්නයයි. දැන් මේ රටේ පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පෙළ පොත් ලබා දීම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කාලයක් තිස්සේ කර ගෙන එන එකක්. උදේ කථා කළ අපේ මන්ත්‍රීවරයාත් පැහැදිලිව ප්‍රකාශ කළා, මේ පෙළ පොත් ප්‍රශ්නය ගැන මේ ආණ්ඩුව විශාල ඇන ගැනීමක් කර ගත්තාය කියා. ඇයි, එහෙම කියන්නේ? කලින් වසරේ දෙසැම්බර් 31ට පෙර මේ පෙළ පොත් ලබා දෙන්න ඕනෑ. නමුත් රජයට තවම බැරි වෙලා තිබෙනවා මේ වසරේ මේ පෙළ පොත් ලබා දෙන්න. සමහර පාසල්වල මේ වසරේ අපොස (සා.පෙළ) විභාගය කරන ළමයින්ගේත් පෙළ පොත් ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒක මම පැහැදිලිව වග කීමෙන් කියනවා. සමහර අවස්ථාවලදී අපේ අධ්‍යාපන ඇමතිවරයා සහ අදාළ පාර්ශ්වයන් පෙළ පොත් ලබා දීලා අවසානයි කියලා කියනවා මට ඇහුණා. මම ඒක මේ කැබිනට් අමාත්‍ය සංදේශයෙන් ඔප්පු කර පෙන්වන්නම්. මේ තමයි 2008 වර්ෂය සඳහා මුද්‍රණය කරන ලද පෙළ පොත්වලට මුදල් ලබා දීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සන්දේශය. මේකේ එක තැනක මෙහෙම සඳහන් කර තිබෙනවා:

"මෙම ආයතන 2007.11.15 වන දිනට පෙර නියමිත පරිදි පොත් භාර දී නොතිබුණු නිසා හා කෙසේ හෝ මෙම පොත් හැකි ඉක්මනින් මුද්‍රණය කරවා ගැනීමට අත්‍යාවශ්‍යව තිබූ බැවින් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් විසින් අවස්ථා කීපයකදී පොත් භාර දීමට දින ලබා දී ඇත. මෙසේ ලබා දී තිබූ දින අතරින් අවසාන දිනය වූයේ 2008.04.28 වන දින ය."

පෙළ පොත් ලබා දීමේ අවසාන දිනය වශයෙන් මේ කැබිනට් සන්දේශය මඟින් ප්‍රකාශ කර තිබුණේ මේ වසරේ අප්‍රේල් 28 නම් පසු ගිය වසරේ දෙසැම්බර් 31 දින වන විට ළමයින්ට ලබා දිය යුතුව තිබුණු පෙළ පොත් ඒ ආකාරයෙන් ලබා දීලා නැහැ කියන එක මේකෙන් මොනවට පැහැදිලි වෙනවා. ඒ වාගේම මේ අවස්ථාවේ අධ්‍යාපන ඇමතිතුමාත් සිටින නිසා මම නැවත වතාවක් ප්‍රකාශ කරන්න ඕනෑ මේ පෙළ පොත්වල විශාල අඩු පාඩු තිබෙන බව. මාගේ අතේ මේ තිබෙන්නේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ගහපු 11 ශ්‍රේණියේ ගණිතය පොත. මේකේ තාක්ෂණික වැරදි තුන්සිය ගණනක් තිබෙනවා. සුළුපටු නැහැ. මේ වාගේ පොත් අපේ අනාගත ශිෂ්‍ය පරපුරට දීමෙන් අධ්‍යාපනය විකෘති වෙනවාය කියන එක වැරදිද කියා මම මේ අවස්ථාවේදී අහනවා. ඒ වාගේම 2007 දෙසැම්බර් Ordinary Level විභාගය කළ ළමයින්ට සාහිත්‍යය පොත් දුන්නේ අවුරුද්ද මැදදීයි. ඊට පස්සේ මේ ගොල්ලෝ තීරණය කරනවා, ඒකක 11න් ඒකක 7කින් ප්‍රශ්න හදන්න. එතකොට මොකද වෙන්නේ? අර ශිෂ්‍යයින්ට නියමිත විෂය ධාරාව හදාරන්න නොහැකි වුණා වාගේම සාහිත්‍යය පිළිබඳව නියම දැනුම ඒ ළමයින්ට ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අද බලන්න, ජනප්‍රිය පාසල්වලට ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම සම්බන්ධව තිබෙන අර්බුදය. මේ අර්බුදය දිගින් දිගටම තිබුණා. පසු ගිය කාලයේදී අපි මේ පිළිබඳව දිගින් දිගටම රට දැනුවත් කළා. මේක පළමු වන වසරට ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීමේ සිට අර්බුදයක් බවට පත් වුණා. අන්තිමට අධිකරණයට යන්න සිදු වුණා. අන්තිමට අධිකරණ නියෝගයක් මත තීරණ ගන්න වුණා. දැන් අධ්‍යාපන අමාත්‍යාංශය පුරුදු වෙලා තිබෙනවා කාට හෝ කියලා මූලික අයිතිවාසිකම් නඩුවක් දමලා අධිකරණයෙන් තීරණය ගන්න. මේක ඉතාම නරක තත්ත්වයක්. අපේ හිතවත් අධ්‍යාපන ඇමතිතුමා, තමුන්නාන්සේලාට විශාල වග කීමක් තිබෙනවා භය නැතිව තීරණ අරගෙන, නිසි නිලධාරින් අරගෙන -ඒ පිළිබඳව හොඳ හසළ දැනුමක් තිබෙන අය අරගෙන- මේ ප්‍රශ්නවලට විසඳුම් සකස් කරලා සාකච්ඡා කරලා මේවාට විසඳුම් ලබා දෙන්න. අද ආපසු මේ තත්ත්වය විකෘති වෙලා තිබෙනවා. මේ චක්‍රලේඛ විටින් විට වෙනස් කළා. අද පළමු වන වසරට ළමයින් ඇතුළත් කර ගැනීමත් විශාල අවුලක් වෙලා තිබෙනවා. ඒක තවදුරටත් කියනවා නම් 5 වසර ශිෂ්‍යත්වය කියන්නේ කඩ ඉම් විභාගයක්. ළමයි ඔක්කොම මහන්සි වෙලා ඒ විභාගය පාස් කරනවා. ඒ විභාගය පාස් කරලා ජනප්‍රිය පාසල්වලට ළමයින් කොටසක් යනවා. ඒ අතර ශිෂ්‍යත්වයේ සමත් ලකුණු ප්‍රමාණය ආසන්නයේවත් නැති තවත් ළමයි කොටසක් දේශපාලනඥයින්ගේ හස්තය ක්‍රියාත්මක වෙලා ගොඩක් පාසල්වලට යනවා. උදාහරණයක් විධියට කැලණිය ගුරුකුල මහා විද්‍යාලය ගන්න පුළුවන්. මේකේ වෙනම පන්තියක් තිබෙනවා, රජයේ ඇමතිවරයකුගේ ළමයින් දමන්න. ප්‍රධාන පාසල්වලත් එහෙමයි. අපට නම් වශයෙන් කියන්න පුළුවන්. ලියුම් දීපු අය කියන්න පුළුවන්. සමහර අමාත්‍යවරුන්ගේ පවුලේ අය ගිහිල්ලා ඒවාට කථා කරන ඒවා ගැන කියන්න පුළුවන්. මේ තත්ත්වය මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉතාමත්ම නරක, අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නක් බව මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිව යුතු අනික් කරුණ තමයි අපි හැම දාම කථා කරන දේශපාලනීකරණය වීම. අධ්‍යාපන ක්ෂේත්‍රය තරම් දේශපාලනීකරණය වී තිබෙන ක්ෂේත්‍රයක් තවත් නැහැ. පසු ගිය දවස්වල පුවත් පතක තිබෙනවා මම දැක්කා, අල්ලස් ගැනීම අතින් පොලීසිය පළමු වන තැනට තිබුණා, දැන් ඒක වෙනස් වෙලා අධ්‍යාපන ක්ෂේත්‍රය පළමු වන ස්ථානයට පත් වෙලා තිබෙනවාය කියලා. ඉතින් අපි කාට කියන්නද? මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගන්නය කියා මම අධ්‍යාපන ඇමතිවරයාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. නැත්නම් කවදා හෝ තමුන්නාන්සේලාට විතරක් නොවෙයි මේ සම්බන්ධයෙන් කථා කළේ නැහැ කියලා විපක්ෂයේ ඉන්න අපටත් අනාගත පරපුර සාප කරයි. අද අධ්‍යාපන ක්ෂේත්‍රය කොතරම් දේශපාලනීකරණය වෙලා තිබෙනවාද? මම අධ්‍යාපන පරිපාලන සේවය ගැන කියන්නේ නැහැ. Cadre එකේ 200ක් ඉන්නවා. මම දන්නා විධියට නියම සුදුසුකම් තිබෙන අය එක් කෙනයි ඉන්නේ. 199ක්ම දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා යයි කියන අය තමයි අද මේ කලාප අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන් බහුතරයක් පත් වෙලා තිබෙන්නේ. දේශපාලන පළිගැනීම්වලට ලක් වුණත්, වැටුප් තලය ලබන්න සුදුසුකම් ලැබුවත්, ඒ ගොල්ලන්ට කිසි සේත් ඒ තනතුරු හොබවන්න අයිතියක් මේ රටේ නීතියෙන් දීලා නැහැ. එහෙම නම් ඇයි මේ විධියට මේවා දේශපාලනීකරණය වන්නේ?

මා නියෝජනය කරන්නේ කුලියාපිටිය ආසනයයි. ඒක අධ්‍යාපන ඇමතිවරුන් දෙදෙනකු හිටපු ආසනයක්. කුලියාපිටිය ආසනයේ දැන් සිටින කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ඉස්සර කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ හිටපු කෙනෙක්. ඔහුට විරුද්ධව මුදල් වංචාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වුවා. ඒක නැවතුණා. ඊට කලින් හිටපු පාසැලේත් විවිධ ප්‍රශ්න තිබුණා. ඒවා එකින් එක කියන්න ඕනෑ නැහැ. මා පෞද්ගලික තරහකට මේවා කියන්නේ නැහැ. නමුත් එයාව කලාප අධ්‍යක්ෂ කරලා තිබෙනවා. අද වන විට වයස අවුරුදු 60 ඉක්මවලායි ඉන්නේ. වසරින් වසර සේවය දීර්ඝ කරනවා. මේ චක්‍රලේඛන - circulars - ඔක්කොම උල්ලංඝනය කරමින් තමයි මේ ගොල්ලන්ට පත්වීම් දෙන්නේ.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

වයඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙනුත් එහෙමයි. දැන් වයස අවුරුදු 62යි. නැවතත් මාස හයකින් කාලය දීර්ඝ කරන්න කටයුතු කරලා. මෙවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුදුසුකම් තිබෙන අය නැතුවද මෙහෙම කරන්නේ? ඉදිරියට එන්න දක්ෂ, සුදුසුකම් තිබෙන අය ඕනෑ තරම් ඉන්නවා. අද මේ ඉන්න බහුතරයකට සුදුසුකම් නැහැ. මේ ගොල්ලන් නියම සුදුසුකම් නැති අය. නමුත් මේවා තුළට ඒ අය පත් කිරීම තුළින් ඇති වන අර්බුදය බලන්න. අද මේ රටේ පාසල් නවදහස් ගණනක් තිබෙනවා. මේ පාසල් නවදහස් ගණනින් බහුතරයක ඉන්න විදුහල්පතිවරු දේශපාලන පත්වීම් ලැබූ අයයි. එවැනි අය පත් වුණාම- [බාධා කිරීමක්] සමහර විදුහල්වල හොඳට සුදුසුකම් ලැබූ පශ්චාත් උපාධි තිබෙන, විදුහල්පති ශ්‍රේණි දරන ගුරුවරු ඉන්න බව මම දන්නවා. ඒ කාලයේ අපි රුපියල් 1,000 වැටුපට පත්වීම් දුන්නා. ඒ විධියට කිසිම සුදුසුකමක් නැති ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපන අංශයේ ඉන්න ගුරුවරු දේශපාලනය තුළින් විදුහල්පතිවරු වෙලා සිටිනවා. ඒ අයට විදුහලක් පාලනය කරන්න පුළුවන්ද? ඒ අයට පාසල් ගෙන යන්න පුළුවන්ද? මේ වාගේ විදුහල්පතිවරු -මේ වාගේ දේශපාලන හෙංචයියලා- දෙන අණ පිළිපදින්න ගුරුවරු ලැහැස්තිද?

මේ ක්ෂේත්‍රය ගැන අපි හැම දාම කථා කරනවා. අය වැය විවාදයේ දී කථා කරනවා. පරිපූරක ඇස්තමේන්තු සම්මත කරන විවාදවලදී කථා කරනවා. අධ්‍යාපන ප්‍රශ්න ගැන කථා කරන අවස්ථාවලදී කථා කරනවා. ඒ වාගේ විවිධ අවස්ථාවලදී කථා කරනවා. නමුත් මේක එකම තැන පල් වෙනවා. මෙතැනින් මේවාට විසඳුම් ලැබෙනවා කියලා අපි දකින්නේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වඩා වග කීමෙන් යුතුව කටයුතු කරන්නය කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන වශයෙන් තිබෙන තවත් කාරණයක් ගැන කියන්න ඕනෑ. ඒක තමයි ජාතික විද්‍යා පීඨ සංකල්පය. විද්‍යා පීඨ ඇති කළේ හොඳ පරමාර්ථයකිනුයි. මේ විද්‍යා පීඨවලින් කළේ විවිධ ක්ෂේත්‍රවලට නියම විධියට පුහුණු කිරීමයි. නිල්වලා වාගේ විද්‍යා පීඨවලින් ඉංග්‍රීසි මාධ්‍ය පිළිබඳ ප්‍රවීණයන් ගුරුවරුන් විධියට බිහි කරලා එළියට දමනවා. අනෙක් විවිධ ක්ෂේත්‍රවලිනුත් එහෙමයි. ඒ පරමාර්ථයෙන් හොඳ පුහුණු ගුරුවරු බිහි කරන්න තමයි විද්‍යා පීඨ සංකල්පය ඇති කළේ. දැන් ඒක වෙනස් කරලා උපාධිධාරින් -උපාධිය ලැබූ අය- නැවතත් විද්‍යා පීඨවලට අනුයුක්ත කරන්න හදනවා. මොකක්ද මේ විහිළුව? ශිෂ්‍යයෙක් විශ්වවිද්‍යාලයකට ගිහිල්ලා අවුරුදු හතරක් විතර විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරලා ඊට පස්සේ තවත් අවුරුදු තුනක් විද්‍යා පීඨයක අධ්‍යාපනය ලබනවා. එතකොට අවුරුදු හතක්. [බාධා කිරීමක්]

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)

(The Hon. A. D. Susil Premajayantha - Minister of Education)

විශ්වවිද්‍යාලයකින් උපාධියට අදාළ දැනුම දෙනවා මිසක්, අධ්‍යාපන විද්‍යා පීඨයක හැර විශ්වවිද්‍යාලයකින් උගන්වන්නට කියා දෙන්නේ නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)

(The Hon. Akila Viraj Kariyawasam)

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)

(The Hon. A. D. Susil Premajayantha)

නැහැ. ඔබතුමාට පැහැදිලි නැති නිසායි මම ඒක පැහැදිලි කර දුන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)

(The Hon. Akila Viraj Kariyawasam)

නැහැ. මට හොඳට පැහැදිලියි. මොකද අපි ඒ අධ්‍යාපනය ලබලා තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)

(The Hon. A. D. Susil Premajayantha)

හැබැයි, මම කථා කරන කොට ඔබතුමා ඉන්න. මම උත්තර දෙන කොට ඔබතුමා ඉන්න. එතකොට -

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)

(The Hon. Akila Viraj Kariyawasam)

ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ තමුන්නාන්සේ බලන්නේ එක අංශයක් ගැන විතරක් වීමයි. ඊට වඩා පුළුල්ව බලන්න ඕනෑ. වසර හතරක් විශ්වවිද්‍යාලයේ උපාධිය හදාරලා තවත් අවුරුදු තුනක් ඒ ශිෂ්‍යයා උපාධිධාරියකු වශයෙන් නැවතත් ගුරු පුහුණුව ලබනවා කියන එකෙන් සිදු වන එක දෙයක් තමයි ඒ ශිෂ්‍යයාගේ නැත්නම් උපාධිධාරියාගේ කාලය නාස්ති කිරීම. අනික් එක සමහර විට විශ්වවිද්‍යාලයේ හදාරන විෂයන් නොවෙයි එතැනදී ඔවුන් හදාරන්නේ. විශ්වවිද්‍යාලයේදී වෙනම විෂය ධාරාවක් හදාරලා අධ්‍යාපන විද්‍යා පීඨයට ගිහින් තවත් එකක් හදාරනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා මේක හොඳ ක්‍රමයක් නොවෙයි කියන එක. මේක අපි දකින විධියට නම් මේ රටේ ශිෂ්‍ය පරම්පරාවට, අනාගතයට හොඳ දෙයක් නොවෙයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වඩා සාකච්ඡා කරලා යම් ක්‍රමවත් වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. විශේෂයෙන්ම පළමු වෙනි වසර වන්න පුළුවන්, වෙනත් විෂයන් සඳහා වන්න පුළුවන් උපාධිධාරී ගුරුවරු දැම්මාය කියා ඒකේ විශේෂත්වයක් නැහැ. විද්‍යා පීඨ තුළ කෙළින්ම අවුරුදු තුනක් ගුරුවරුන් විධියට පුහුණු කිරීමෙන් ඊට වඩා ඵලදායිතාවක් ඇති වනවාය කියන එක තමයි මාගේ විශ්වාසය.

මෙන්න මේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තමුන්නාන්සේගේ අවධානය යොමු කරලා අපේ මේ කඩා වැටිලා තිබෙන අධ්‍යාපන ක්ෂේත්‍රයට විසඳුම් සෙව්වේ නැත්නම් මේක ඉතාම බරපතළ තත්ත්වයකට පත් වන්න පුළුවන්. මා විතරක් නොවෙයි. මීට කලින් කථා කළ ගරු සුමේධා ජී. ජයසේන අමාත්‍යතුමියත් එතුමියගේ කථාවේදී පැහැදිලිව ප්‍රකාශ කළා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු -ප්‍රශ්න- තිබෙනවාය කියා එතුමියලා කවුරුත් පිළිගන්නා බව. එහෙම නම් විපක්ෂය විතරක් නොවෙයි, ආණ්ඩු පක්ෂය විතරක් නොවෙයි හැමෝම -මුළු රටම- පිළිගන්නවා අධ්‍යාපනය අද අවුලක්ය කියා. ඒ නිසා ඉතාම ඉක්මනින් මේ පෙළ පොත් ප්‍රශ්නයට විසඳුම් දෙන්නය, මේ තාක්ෂණික ගැටලු ඉතා ඉක්මනින් නිවැරදි කරන්නය කියා අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේ මෙතැනදී පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා. නමුත් පොත් මුද්‍රණකරුවන් ඒ ටෙන්ඩර් පටිපාටියේ ක්‍රියා දාමයන් උල්ලංඝනය කරන්න කටයුතු කරන විට තමුන්නාන්සේලා ඒ අයට උඩ ගෙඩි දීමක් කර තිබෙනවා. කැබිනට් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් දමලා කෝටි ගණන් කපා හැර තිබෙනවා. මෙය ඉතාම වැරදියි. මොකද සාමාන්‍ය ක්‍රමය අනුව මේ පෙළ පොත් මුද්‍රණයේදී ඒවා නියමිත කාලයට අනුව දුන්නේ නැත්නම්, ඒ නියමිත ක්‍රියා පටිපාටිය අනුගමනය කර තිබුණේ නැත්නම් සියයට 150ක දඩයක් ගහනවා. මේ දඩය කපා හැරලා තිබෙනවා. මේ තරම් capacity එකක් -මේ තරම් ප්‍රමාණයක්- දරන්න බැරි අංශවලට නැත්නම් ඒ මුද්‍රණකරුවන්ට ලබා දීලා මේ පෙළ පොත් බෙදා හරින්නේ නැතිව තිබෙනවා; ඒ විධියේ ප්‍රශ්න තිබෙනවා. ඉතින් මේ කෝටි ගණන් කපා හරින්නේ කාගේ වුවමනාවකටද? ඇයි මෙහෙම කරන්නේ? අපි මේ විධියට කටයුතු කරලා මෙයින් දෙන ආදර්ශය මොකක්ද? අපි ඊළඟ අවුරුද්දේ මුද්‍රණකරුවන්ටත් දෙන්නේ වැරදි ආදර්ශයක්. එක්කෝ නැත්නම් මේක බෙදලා දෙන්න ඕනෑ. මේක අඩුම ටෙන්ඩර්කරුවන්ට දුන්නාය කියන එක උත්තරයක් නොවෙයි. ඒකට අධ්‍යාපන අමාත්‍යාංශය විධියට පුළුවන් වන්න ඕනෑ මේ

පෙළ පොත් කොයි තරම් තිබෙනවාද, කී දාහක් මුද්‍රණය කරනවාද, කී ලක්ෂයක් මුද්‍රණය කරනවාද, මේ අයට මේක කරන්න පුළුවන්ද, මේ අයගේ මීට කලින් පසුබිම මොකක්ද කියන මේ ඔක්කොම බලලා පුළුවන් නම් ඒක බෙදා හරින්න. නැත්නම් වෙන ක්‍රමයක් අනුගමනය කරන්න ඕනෑ. මේ වාගේ විශාල මුදලක් කපා හැරලා - කෝටි ගණන් කපා හැරලා- අද පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරනවා. මේක ඒ තරම් හොඳ තත්ත්වයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් - අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු සම්බන්ධයෙන්- මට ඕනෑ නම් දවසක් කථා කරන්න පුළුවන්. නමුත් මේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන්නේ නැත්නම්, තමුන්නාන්සේලා ඒ විසඳුම් සොයා ගන්නා බවක් අපට පෙනෙන්නේ නැත්නම් අපි මේ සම්බන්ධයෙන් කොපමණ කථා කළත් වැඩක් නැහැ. අපි දන්නවා, ඔබතුමා හොඳ ඇමතිවරයෙක් බව. පුද්ගලයෙක් විධියට හොඳ පුද්ගලයෙක්. අපි ඔබතුමාට ගරු කරනවා. නමුත් අපි ඔබතුමාට කියන්නේ මීට වඩා මේ පිළිබඳව සැලකිලිමත් වෙලා මීට වඩා කොටස් පවරා දීලා මීට වඩා හොඳ විශේෂඥ ඥානය තිබෙන පිරිස් මේවාට යොමු කර ගෙන මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියා මාර්ග ගන්නය කියන එකයි. එහෙම වුණොත් අපේ රටේ අනාගත අධ්‍යාපනය සාර්ථක වනවා. ලෝකයේ දියුණු වූ රටවල් ඒ දියුණුවේ හිණි පෙත්තට ගිහින් තිබෙන්නේ අධ්‍යාපනය නිසායි. අපේ රටත් ඒ වාගේ දියුණුවක් කරා ගෙන යන්න ඕනෑ නම් තමුන්නාන්සේ ඒකට පෙරමුණ ගත යුතු වනවා. අපිත් පක්ෂ භේදයෙන් තොරව ඊට ලබා දෙන්න පුළුවන් සෑම සහයෝගයක්ම තමුන්නාන්සේට ලබා දෙනවාය කියා ප්‍රකාශ කරමින් මාගේ වචන ස්වල්පය මා අවසන් කරනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි. දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස්වරු 1.00 තෙක් තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**නියෝජ්‍ය මහ ලේකම්**
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)

කරුණාකර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේව යෝජනා කරන්න.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

"ගරු පූජ්‍ය උඩවත්තේ නන්ද ස්වාමීන් වහන්සේ දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු එම්.ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம். ரி. ஹசன் அலி)
( The Hon. M. T. Hasen Ali)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு (வண.)உடவத்தே நந்த தேரர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Hasen Ali, you may speak now.

[பி.ப. 1.01]

**ගරු එම්. ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம். ரி. ஹசன் அலி)
( The Hon. M. T. Hasen Ali)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி அமைச்சின் குறைநிரப்புத்தொகை மீதான இன்றைய விவாதத்திலே கலந்துகொள்வதையிட்டு நான் சந்தோஷமடைகின்றேன். ஏனென்றால், இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற இனப் பிரச்சினைக்கு கல்வி அமைச்சின் மூலமாகப் பாடசாலை மட்டத்திலேயே தீர்க்கமானமுறையில் சில பாடத்திட்டங்களையும் வேலைத்திட்டங்களையும் முன்வைப்பதன்மூலம் ஓரளவு முடிவை எட்டலாம் என்று நான் நினைக்கின்றேன். இன்று கல்வித் திணைக்களங்கள் அனைத்தும் ஓரளவுக்குத் திறம்படச் செயற்பட்டாலும் கூட, அங்கு கடமையாற்றுகின்ற உத்தியோகத்தர்கள் சிலர் இனவாதச் சிந்தனையுடன் செயற்படுவதனால், கல்வித் திணைக்களத்திற்குள்ளும் மற்றும் பல்கலைக்கழகங்களிலும் பாடசாலைகளிலும் மிகவும் மோசமான ஒரு சூழ்நிலை நிலவுவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அதில் ஒரு விடயத்தை நான் மிகவும் முக்கியமாகச் சொல்லவேண்டும். அதாவது, அண்மைக் காலத்தில் தென்கிழக்குப் பல்கலைக்கழகத்திலே நடக்கின்ற சம்பவங்கள் மிகவும் மனவேதனையைத் தரக்கூடியதாக இருக்கின்றன. எல்லாப் பிரதேசங்களிலுமுள்ள எல்லா மக்களும் ஒருமித்துக் கல்வியறிவைப் பெற்றுக்கொள்ளவேண்டும் என்ற கோட்பாட்டில் எங்களுக்கு எந்தவித முரண்பாடும் இல்லை. ஆனால், அந்தக் கோட்பாட்டை நடைமுறைப்படுத்துவதற்கு அவர்கள் திடீர்திடீரென மேற்கொள்கின்ற திட்டங்கள் எங்களுக்குச் சந்தேகத்தை ஏற்படுத்துவனவாக அமைந்திருக்கின்றன. இன்று தென்கிழக்குப் பல்கலைக்கழகத்திலுள்ள மாணவர்கள் மனச்சஞ்சலமடைந்திருக்கின்றார்கள் என்பதை நான் இங்கு சொல்லித்தானாக வேண்டும். இந்த நாடு நம் எல்லோருக்கும் உரியதாகும். ஆனால், அந்தந்தப் பிராந்தியத்தில் வாழ்கின்ற மக்களின் கல்வி, கலாசார மற்றும் மத விழுமியங்கள் ஒழுங்காகப் பேணப்படவேண்டும் என்பதில் நாம் எல்லோரும் ஒத்த கருத்தைக் கொண்டிருக்க வேண்டும். இம்முறை அந்தப் பல்கலைக்கழகத்திற்குப் பெரும்பான்மை இன மாணவர்கள் சேர்த்துக் கொள்ளப்பட்டதில் பிழையில்லை. ஆனால், அவர்களை அங்கு அனுப்புவதற்கு முன்பு அங்குள்ள மாணவர்கள், விரிவுரையாளர்கள் மற்றும் ஆளுநர் சபையுடன் ஆலோசனை நடத்தி, அவர்கள் எல்லோரினதும் விருப்பத்தின்பேரில் மிகவும் புரிந்துணர்வுடன் குறித்த விடயங்கள் அணுகப்பட்டிருக்கவேண்டும். அதைவிடுத்து நீங்கள் ஒருதலைப்பட்சமான முடிவை எடுத்துப் பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த மாணவர்களை அங்கு அனுப்பிவிட்டு, அந்த மாணவர்களைப் பாதுகாப்பதுபோன்று அங்கு ஆயுதப் படைகளை அனுப்பிய அந்தத் திடீர் முடிவானது, அங்குள்ள மாணவர்கள் மனதிலே சஞ்சலத்தைத் தோற்றுவித்திருக்கின்றது. நாங்கள் சொல்லவில்லை, அந்தப் பிரதேசத்திலே எங்களுடைய மக்கள் மட்டுந்தான் வாழ வேண்டும் என்று. ஆனால், எல்லா விடயங்களும் புரிந்துணர்வுடன் அணுகப்படவேண்டும். கொழும்பிலே இருந்து எடுக்கின்ற முடிவுகளைக் கிழக்கிலிருக்கின்ற மக்கள்மீது திணிப்பதன்மூலம் நாட்டிலே சமாதானத்தையோ மக்களிடையே புரிந்துணர்வையோ ஏற்படுத்திவிடமுடியாது. இந்த நாட்டிலே வாழ்ந்து மறைந்த அரசியல் தலைவர்கள் இவ்வாறு திடீர்திடீரெனப் பிழையான முடிவுகளை எடுத்து மக்கள் மத்தியிலே திணித்ததன் காரணமாகத் தான் இன்று இந்த நாடு ஒரு மோசமான சூழலிலே இருந்து கொண்டிருக்கின்றது. எனவே, இனிமேலும் இவ்வாறான நிலைமை ஏற்படுவதற்கு அரசாங்கம் இடமளிக்கக்கூடாது.

அடுத்ததாக, இன்னுமொரு முக்கிய விடயமான மௌலவி ஆசிரியர் வெற்றிடங்கள் பற்றிக் கூற விரும்புகிறேன். இப்பொழுது அந்த வெற்றிடங்களை நிரப்புவதற்கு அரசாங்கம் முடிவெடுத்திருப்

[ගරු එම්. ටී. හසන් අලි මහතා]

பதாக நாங்கள் அறிகின்றோம். ஆனால், அது எவ்வளவுக்கு உண்மையானது என்று என்னால் சொல்ல முடியவில்லை. ஏனெனில், 1992ஆம் ஆண்டிலிருந்து இந்த நாட்டிலே இந்தப் பிரச்சினை இருந்து கொண்டிருக்கின்றது. அந்த ஆண்டில் கல்வி அமைச்சு வெளியிட்ட ஓர் அறிக்கையில் 495 மௌலவி ஆசிரியர் வெற்றிடங்கள் இருப்பதாகக் குறிப்பிட்டிருக்கின்றது. அந்த வெற்றிடங்கள், இன்று சுமார் 800 வரை அதிகரித்திருப்பதாக எங்களுக்குத் தகவல் கிடைத்திருக்கின்றது. எனவே, 495 வெற்றிடங்கள் என்றில்லாமல், இருக்கின்ற எல்லா வெற்றிடங் களையும் நிரப்புவதற்குரிய வழிவகைகளை இச்சந்தர்ப்பத்தில் மேற்கொள்ளவேண்டும். பன்னிரண்டு வருடங்களுக்கொரு முறையே குறிஞ்சி பூக்குமென்று சொல்வார்கள். அதேபோல், பல ஆண்டுகளுக்குப்பின் உங்களது மனதிலே மாற்றம் ஏற்பட்டு, இன்று மௌலவி ஆசிரியர் பிரச்சினையைத் தீர்ப்பதற்கு நீங்கள் முன்வந்திருக்கின்ற நேரத்தில், அதனை முழுமையாகத் தீர்க்கா விட்டால் இன்னும் பல வருடங்களுக்கு பிறகுதான் இந்த விடயத்திலே விமோசனம் கிடைக்கும். எனவே, தயவுசெய்து இந்த விடயத்திலே அதிகமான அக்கறை கொள்ளவேண்டுமென்று கௌரவ அமைச்சரவர்களிடம் வேண்டிக்கொள்ளுகின்றேன். சிறுபான்மைச் சமூகத்தின் விஷயத்திலே மிகவும் நிதானமாகவும் நீதியாகவும் நடந்துகொள்கின்ற கல்வி அமைச்சர் அவர்களிடம் நான் பலமுறை சென்று பல விஷயங்களைச் செய்து முடித்திருக் கின்றேன். அந்த வகையிலே இந்த விஷயத்திலும் அவர் கூடிய கவனம் எடுத்துச் செயற்படுவாரென்பதில் எனக்கு நம்பிக்கை இருக்கின்றது.

அடுத்து, கிழக்கு மாகாண பட்டதாரி ஆசிரியர் நியமனம் சம்பந்தமாகக் கூறவேண்டும். மீண்டும் ஒரு பரீட்சையை நடத்தி அந்தப் பட்டதாரி ஆசிரியர்களைத் தெரிவுசெய்ய முடிவு எடுக்கப் பட்டுள்ளதாகப் பத்திரிகைகளிலே செய்தி வெளியாகியிருக் கின்றது. ஆனால், இந்த முறை கைவிடப்படவேண்டும். ஏனெனில் பல்கலைக்கழகங்களில் இருந்து வெளியேறுகின்ற பட்டதாரிகள் ஏழெட்டு வருடங்களாகத் தொழில்வாய்ப்பு இல்லாமல் இருக்கின்ற போது மீண்டும் அவர்களுக்கு ஒரு பரீட்சையை நடத்தி அந்த நியமனங்களை வழங்குவது என்பது முறையற்ற செயலாகும். எனவே, அவர்கள் பல்கலைக்கழகத்தைவிட்டு வெளியேறியது தொடக்கம் ஒவ்வோர் ஆண்டையும் ஓர் அளவுகோலாக எடுத்து, அதன் அடிப்படையில் அவர்களுக்கு அந்த நியமனங்களை வழங்கி, நீண்டகாலம் தொழில் இல்லாமல் இருக்கின்ற பட்டதாரிகளுக்கு விமோசனம் கொடுக்கவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

கல்வி அமைச்சர் அவர்கள் தற்பொழுது இங்கு சமுகமா யிருக்கின்றபடியால் நான் இன்னுமொரு விஷயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். அமைச்சர் அவர்கள் சபைக்கு வருவதற்கு முன்பு கல்வி அமைச்சிலுள்ள சில உயரதிகாரிகள் சம்பந்தமான பிரச்சினைகளைப் பற்றிக் குறிப்பிட்டேன். கௌரவ அமைச்சர் அவர்களே, ஆசிரியத் தொழிலுக்காக மாலைதீவுக்குச் சென்ற ஒரு தம்பதியினரின் விடயம் சம்பந்தமாக நான் உங்களிடம் முன்னர் குறிப்பிட்டிருந்தேன். நீங்கள் அவர்களுக்கு உதவுவதற்காக மன முவந்து பல முயற்சிகளைச் செய்தீர்கள். பயங்கரவாதப் பிடி யிலிருந்து தப்புமுகமாக நாட்டைவிட்டு வெளியேறிச் சென்ற அவர்கள், பின்னர் நாட்டுக்குத் திரும்பியதும் மீண்டும் அவர்களைச் சேவையில் சேர்த்துக்கொள்வதற்காக மேல் மாகாண ஆளுநர் கௌரவ அலவி மௌலானா அவர்களின் சிபாரிசுக் கடிதத்துடன் உங்களிடம் வந்து சம்பந்தப்பட்ட ஆவணங்களைக் கொடுத்த போது, நீங்கள் அந்த விடயத்தைக் கட்டாயம் நிறைவுசெய்து கொடுக்குமாறு விடய அதிகாரிகளுக்கு உத்தரவிட்டிருந்தீர்கள். ஆனால், துரதிஷ்டவசமாக குறித்த ஆவணங்கள் இன்று ஓர் அதிகாரியின் மேசையிலே தூங்கிக்கொண்டிருக்கின்றன. இந்தத் தம்பதியர் முஸ்லிம் என்கின்ற ஒரே காரணத்திற்காகவே இந்த அதிகாரி அதனைச் செய்யாமல் தாமதித்துக் கொண்டிருக்கின்றார். இதை நான் இந்த உயரிய சபையிலே சொல்வதற்கு வெட்கப்படுகின்றேன். ஏனெனில், அமைச்சர்களாகிய நீங்கள் எங்கள் பிரச்சினைகளை அறிந்து அவற்றைத் தீர்த்துவைப்பதற்கு முன்வருகின்றபோதிலும், துரதிஷ்டவசமாக உங்களுடைய கட்டளைகள்கூட நிறைவேற்றப்படாத ஒரு சூழ்நிலை காணப்படு கின்றது. உதாரணத்துக்கு இந்த முஸ்லிம் தம்பதியினரின் இந்த விடயமும் உங்களது அமைச்சில் இருக்கின்ற உயர் அதிகாரிகளின் செயற்பாடுகளினால்தான் தடைப்பட்டிருக்கின்றது என்பதை மீண்டும் நான் இவ்விடத்திலே சொல்லிக்கொண்டு, குறித்த விடயங்கள் அனைத்திற்கும் நீங்கள் விமோசனம் பெற்றுத்தர வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 1.11]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මාර්ගස්ථ මගී ප්‍රවාහන අමාත්‍යතුමා)**

(மாண்புமிகு லசந்த அலகியவன்ன - வீதிப் பயணிகள் போக்குவரத்து அமைச்சர்)

(The Hon. Lasantha Alagiyawanna - Minister of Road Passenger Transport)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද දින අධ්‍යාපන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විභාග දෙපාර්තමේන්තුවට අදාළ පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් වන විවාදයට සහභාගි වීමට ලැබීම ගැන මා ඉතාමත් සතුටු වෙනවා. අපට දකින්නට අහන්නට ලැබෙන දේවල් දිහා බැලුවාම අධ්‍යාපන අමාත්‍යාංශයත්, විභාග දෙපාර්තමේන්තුවත් වර්තමානයේදී විශාල අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටින බව මා ප්‍රථමයෙන්ම කියන්න කැමැතියි. ඒ කුමන අභියෝග තිබුණත් විභාග දෙපාර්තමේන්තුව කිසිදු අපේක්ෂකයකු අසාධාරණයකට ලක් නොවන පරිදි ඉතාමත් විශිෂ්ට සේවයක් මේ වන විට ඉටු කරමින් තිබෙන බවත් මා මුලින්ම සඳහන් කරන්නට ඕනෑ. විභාග දෙපාර්තමේන්තුවේ ඒ කාර්ය භාරය පිළිබඳ පත්‍රිකාවක් අපට ලබා දී තිබෙනවා. ඒ පත්‍රිකාවේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම විභාග කොමසාරිස්වරයාට සහ අදාළ නිලධාරීන්ට විතරක් තනියෙන් කරන්නට පුළුවන්කමක් නැහැ. විභාග දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්ය භාරයන් සියල්ලක්ම ජාතික වග කීමකින් යුතු කාර්ය භාරයන් බව අපි තේරුම්ගත යුතුයි. ජාතික වග කීමකින් යුතු කාර්ය භාරයන් ඉටු කිරීමේදී ඇති වන සෑම අභියෝගයකදීම අප සියලු දෙනාගේම සහයෝගය සහ දායකත්වය කොන්දේසි විරහිතව ලබා දීම ජාතික වග කීමක් සහ යුතුකමක් බව අප සියලු දෙනාම තේරුම් ගත යුතුයි.

විභාග දෙපාර්තමේන්තුවෙන් අවුරුද්දකට විභාග 260ක් පමණ පවත්වන බව අප දන්නවා. පසු ගිය වර්ෂවල ඒ සෑම විභාගයකටම ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. අපේක්ෂකයන් වැඩි වෙනවාය කියන්නේ විභාග දෙපාර්තමේන්තුවෙන් ඉටු කළ යුතු කාර්ය භාරය වැඩි වීමයි. ඒ වාගේම අප කාගේත් අවධානය යොමු වන ප්‍රධාන විභාග තිබෙනවා. පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අපොස (සාමාන්‍ය පෙළ) විභාගය, අපොස (උසස් පෙළ) විභාගය ඒ අතර වනවා. ඒ විභාග ප්‍රතිඵලවලින් කෙනෙකුගේ අනාගතය ගමන් කරන දිසාව තීරණය වනවාය කිව්වොත් එය නිවැරදියි. දෙමවුපියන් ඉතාමත් අමාරුවෙන් හරිහම්බ කරන මුදල් වියදම් කරමින් දරුවන්ට උගන්වනවා. අවුරුදු පහක් පාසල තුළ අධ්‍යාපනය හදාරන දූව හෝ පුතා පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් කරනවා. අවුරුදු දහයකට ආසන්න කාලයක් අධ්‍යාපනය හදාරන දරුවා අපොස (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත් කරනවා. අවුරුදු දොළහක, දහතුනක කාලයක් අධ්‍යාපනය හදාරා අපොස (උසස් පෙළ) විභාගයට පෙනී හිටිනවා. මේ සමස්ත කාල සීමාව තුළදීම ලබා ගත් අධ්‍යාපනය අනුව ඒ දරුවාගේ ඉදිරි අනාගතය තීරණය වන්නේ පැය කිහිපයක් තුළ පැවැත්වෙන විභාගයෙන්. පැය තුන හතරක් තුළ ඒ දරුවාගේ සියලුම කුසලතාවන් සහ මතක ශක්තිය මැන බැලීමක් තමයි මේ විභාග තුළින් සිද්ධ කරනු ලබන්නේ. ඉහත කී තත්ත්වය තුළ දැඩි වග කීමකින් යුතුව මේ කාර්ය භාරය ඉටු කළ යුතු බව අපි මනාව අවබෝධ කර ගත යුතු වෙනවා.

මේ සෑම ප්‍රශ්න පත්‍රයකම ප්‍රශ්න වර්ග දෙකක් තිබෙන බව අපි දන්නවා. එකක් විස්තරාත්මක ප්‍රශ්න. විස්තරාත්මක පිළිතුරුවලට ලකුණු ලබා දීමේදී පිළිතුරු පත්‍රය බලන පරීක්ෂකවරයාගේ මානසික තත්ත්වය ලකුණු ලබා දීම කෙරෙහි අනිවාර්යෙන්ම බලපාන බව අපි අමුතුවෙන් අවබෝධ කර ගත යුතු වන්නේ

නැහැ. විභාග පරීක්ෂකවරුන් විභාග මධ්‍යස්ථානවලට පැමිණෙන විට තීන්ත ගහනවා නම්, මැර ප්‍රහාර එල්ල වනවා නම් එය බරපතළ ප්‍රශ්නයක්. මා හිතන්නේ එවැනි අය එවැනි පීඩනයන්ට ලක් කිරීම අප විසින් සිදු කළ යුතු දෙයක් නොවේය කියායි. සැබෑ වෘත්තීයමය අයිතීන් පිළිබඳව අමාත්‍යාංශයේ සියලුම අය වග කිව යුතුයි. ඒ පිළිබඳව අපේ විවාදයක් නැහැ. ඒ අයිතීන් ලබා දිය යුතුයි. නමුත් එවැනි අයිතීන් වෙනුවෙන් මෙවැනි ආකාරයෙන් ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව හදවතට එකඟව සිතා බැලිය යුතු කාලයක් අද එළඹ තිබෙන බව අප සියලු දෙනාම අවබෝධ කර ගත යුතුයි.

විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිඵල නිකුත් කරනු ලැබීමෙන් අනතුරුව එහි කාර්ය භාරය එතැනින් අවසාන වෙනවා. නමුත් අපේ රටේ සැබෑ අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් මේ ප්‍රතිඵල කොතෙක් දුරට විග්‍රහ කර ගන්නවාද කියන දේ පිළිබඳව අපේ අවධානය යොමු විය යුතුයි. මෙයින් කියවෙන්නේ නැහැ පසු ගිය දශක පහ තුළ අපේ රටේ අධ්‍යාපනයේ කඩා වැටීමක් තිබෙනවාය කියා. අද වන විට අපේ රටේ අධ්‍යාපනයේ විශාල දියුණුවක් ළඟා කර ගන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ප්‍රතිඵලවලින් මෙන්ම ගුණාත්මක අතිනුත් අපේ රටේ අධ්‍යාපනයේ දියුණුවක් ඇති වෙලා තිබෙනවාය කියන තැන ඉඳ ගෙන, එතැන් සිට තවත් ඉදිරියටත් අධ්‍යාපන ක්‍රියාවලිය ගෙන යැම සඳහා අප සිතා මතා කටයුතු කළ යුතුයි.

මට මතකයි, මීට අවුරුදු තුන හතරකට පෙර ප්‍රතිඵල නිකුත් කිරීමේ කාර්යය පවා කර තිබුණේ මීට පෙර තිබුණු අධ්‍යාපන කලාප, පරිපාලන දිස්ත්‍රික්ක අනුවයි. නමුත් අප ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ අවධානයට යොමු කළාට පස්සේ ගරු අමාත්‍යතුමා විභාග දෙපාර්තමේන්තුවත් සමඟ එක්ව වර්තමාන පරිපාලන ප්‍රදේශ - කලාප ක්‍රම, කොට්ඨාස ක්‍රම - අනුව ප්‍රතිඵල නිකුත් කිරීමේ කාර්යය සිදු කර තිබෙනවා. මෙය එතැනින් නතර විය යුතු වන්නේ නැහැ. අධ්‍යාපන සංවර්ධනයේ වග කිව යුතු අය - විෂයය භාර අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, ඒ වගේම පන්ති භාර ගුරුවරයා දක්වාම - මේ ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයන් ලබා ගැනීම අනිවාර්යයෙන්ම අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයක් බව අප තේරුම් ගත යුතුයි. අද එය ප්‍රමාණවත් තරම් සිදු නොවන බව අප දන්නා කරුණක්.

තමන්ගේ කලාපයේ, තමන්ගේ විෂයයේ ප්‍රතිඵල විග්‍රහය කුමක්ද කියන එක පිළිබඳව විදුහල්පතිවරයකුගෙන් හෝ විෂයය අධ්‍යක්ෂවරයකුගෙන් හෝ අප ඇහුවොත්, බොහෝ අවස්ථාවල අපට ඒ පිළිබඳව සියයට සියයක්ම නිවැරැදි තොරතුරු ලබා ගන්න පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. එවැනි තත්ත්වයන් තුළ අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය හරිහැටි ගොඩ නඟා ගන්න පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. විභාග දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ප්‍රතිඵල විග්‍රහයන් මීට වඩා අපේ අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියේ අපේක්ෂිත මට්ටම දක්වා ගෙන යැමට අප සියලු දෙනාගේ අවධානය යොමු වුවහොත් දැනට වඩා ප්‍රගතියක් ලබා ගන්න පුළුවන්. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල ගත්තොත්, සමස්තයක් හැටියට එහි ශීඝ්‍ර දියුණුවක් තිබෙනවා. ප්‍රධාන විෂයන්වලත් ශීඝ්‍ර දියුණුවක් තිබෙනවා. නමුත් ප්‍රධාන විෂයන්වල මීට වඩා දියුණුවක් ලබා ගත යුතුයි. එසේ වීමට නම් මේ ප්‍රතිඵල පිළිබඳව පන්ති කාමරය දක්වාම සැබෑ විග්‍රහයක් ලබා ගත යුතුයි. පහේ ශිෂ්‍යත්ව විභාගයේදී මා නියෝජනය කරන කොට්ඨාසයට අපි ඉලක්ක ලබා දුන්නා. ඒ තුළින් අපි ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන තිබෙනවා. මේ ප්‍රතිඵල විග්‍රහයන් සමඟ ඒ නිලධාරින්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් සමඟ කටයුතු කළා. මහර මැතිවරණ බල ප්‍රදේශයේ පසු ගිය අවුරුදු 5 තිස්සේම සියයට 6යි, 8යි, 9යි සමත් වෙලා තිබුණේ. නමුත් ගිය වර ඒ ප්‍රතිඵල සියයට 15 දක්වා වැඩි කර ගන්නට පුළුවන් වුණා. මෙවර ඒක තවත් වැඩි වෙලා තිබෙනවා. අත් දැකීමෙන් ලබා ගත්තු දෙයක් නිසායි මම මේ කියන්නේ. මේ පිළිබඳව පරිශීලනය කිරීමෙන් ලැබෙන තීන්දු තීරණ අනුව ලකුණු 50ට වඩා අඩුවෙන් ලබා ගත් සිසුන්ගේ ප්‍රමාණය සැලකිය යුතු අන්දමින් අඩු වෙලා තිබෙනවා. ඒ අභියෝග ලබා දීලා, දක්ෂ විදුහල්පතිවරුන්, ගුරුවරුන් අගයා අදක්ෂ අන්දමින් කටයුතු කරන අයට ඉලක්ක සහාය ලබා දී ඉදිරි වර්ෂවල ඒවා නිවැරදි කර ගැනීමේ වැඩ පිළිවෙළක් අප ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා අපට අමාත්‍යාංශයත්, විභාග දෙපාර්තමේන්තුවත් ඉතාමත් හොඳ සහයෝගයත්, දායකත්වයත් ලබා දෙනවා. ඒ නිසා මේ තත්ත්වය තව තවත් ව්‍යාප්ත විය යුතුයි.

ඒ වාගේම පසු ගිය කාලයේදී අධ්‍යාපන විද්‍යා පීඨ පිළිබඳව යම් ප්‍රතිපත්තිමය තීන්දුවක් අර ගෙන තිබුණා, විද්‍යා පීඨ සඳහා උපාධිධාරින් පමණක් බඳවා ගන්නවාය කියා. ඒ පිළිබඳව අමාත්‍යතුමා සමඟත් අදාළ නිලධාරින් සමඟත් අප සාකච්ඡා කළා. මේ වන විට දැන ගන්න ලැබී තිබෙනවා, අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා සිසුන් බඳවා ගැනීමේ කටයුත්ත අනිවාර්යයෙන්ම පෙර පරිදිම සිදු කරලා අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා උපාධිධාරින් බඳවා ගැනීම නතර කර තිබෙනවාය කියා. ඒ පිළිබඳව මේ අවස්ථාවේදී අමාත්‍යතුමාටත්, ඒ නිලධාරින්ටත් මගේ ස්තුතිය පුද කළ යුතුයි. විශේෂයෙන්ම අද අපි කවුරුත් පිළිගත යුතුයි, ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව අවුරුදු 2ක නේවාසික පුහුණුවක් සහ එක අවුරුද්දක ප්‍රායෝගික පුහුණුවක් වශයෙන් අවුරුදු තුනක අංග සම්පූර්ණ පුහුණුවක් ලබා ගෙන අධ්‍යාපන විද්‍යා පීඨවලින් බිහි වන ගුරුවරුන් අද ඒ ක්ෂේත්‍රය තුළ ඉදිරියෙන් සිටින බව. එම නිසා අප කළ යුතු වන්නේ මේ තත්ත්වය තවත් වැඩි කර, වර්ධනය කර පවත්වා ගෙන යාමයි. එහෙම නැතිව උපාධිධාරින් විද්‍යා පීඨවලට අර ගෙන ගුරුවරුන් වශයෙන් බිහි කිරීම ඵලදායී නොවන බව අප සියලුම දෙනා අවබෝධ කර ගත යුතුයි. ඒ තීන්දුව, තීරණය අර ගෙන තිබෙනවාය කියා නිල නොලත් ආරංචියක් විතරයි දැනට තිබෙන්නේ. ඒ තත්ත්වය අනිවාර්යයෙන්ම නිවැරදි වෙලා පෙර තිබුණු ආකාරයටම අධ්‍යාපන විද්‍යා පීඨ ක්‍රමය ක්‍රියාත්මක වෙයි කියන බලාපොරොත්තුවක්, ප්‍රාර්ථනයක් අප තුළ තිබෙනවා.

අපේ රටේ ජාතික වග කීමක් ඉටු කරන ආයතනයක් හැටියට පිළිගන්නා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස්තුමා ඇතුළු සියලුම නිලධාරින්ට, අමාත්‍යතුමාගේ නායකත්වයෙන් මඟ පෙන්වීම යටතේ මේ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය සියලු ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 1.24]

**ගරු පියසිරි විජේනායක මහතා**
(மாண்புமிகு பியசிறி விஜேநாயக்க)
(The Hon. Piyasiri Wijenayake)

මූලාසනය හොබ වන ගරුතර ස්වාමීන් වහන්ස, අද දිනයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සඳහා වන පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේදී පළමුවෙන්ම ජාතික නිදහස් පෙරමුණ විධියට ඒ සඳහා අපේ සහයෝගය, එකඟතාව පළ කරනවා. ඒ වාගේම මේ පරිපූරක ඇස්තමේන්තුවට අදාළ කරුණු අතර උත්තර පත්‍ර ඇගැයීම් කටයුතු සඳහා අවශ්‍ය මුදල් වෙන් කර ගැනීම ප්‍රධාන කර්තව්‍යයක් විධියට දක්වා තිබෙනවා. එය ඉතාමත්ම අවශ්‍ය හා වැදගත් කාරණාවක් නිසා ඒ සඳහා අපේ එකඟතාව පළ කරනවා. විශේෂයෙන්ම අපි අද මේ සාකච්ඡා කරන මූල්‍ය කාරණය හා බැඳී තිබෙන විභාග දෙපාර්තමේන්තුව හා උසස් පෙළ විභාගය ඇගැයීම් කියන එක මේ මොහොතේදී ගැටලුවකට මුහුණ දෙන ලද කාරණාවක් වෙලා තිබෙනවා. ලංකාවේ තියෙන ආයතන අතරින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත්, විභාග දෙපාර්තමේන්තුවත් පිළිබඳව මේ රටේ ජනතාවගේ තිබෙන්නේ ඉතාමත්ම ගෞරවයක්. මම එහෙම කියන්නේ විභාග දෙපාර්තමේන්තුවෙන් උත්තර පත්‍රයක් ඇගැයීම් කරලා ප්‍රතිඵල දුන්නාට පස්සේ ඒක සාධාරණයි කියා අපේ රටේ ජනතාවගේ විශ්වාසයක් තිබෙනවා. විශ්වවිද්‍යාලයට සිසුවෙක් තෝරා ගත්තාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම අපක්ෂපාතිව ඒ කාරණය ඉටු කරයි කියා රටේ ජනතාවගේ විශ්වාසයක් තියෙනවා. මූලාසනාරූඪ අපේ හාමුදුරුවනේ, මෙතෙක් කල් ගෞරවය ආරක්ෂා කර ගත්ත විභාග දෙපාර්තමේන්තුව තමන්ට තිබූ ඒ ගෞරවය විනාශ වෙන තැනකට පත් වෙන කාරණා උත්තර පත්‍ර ඇගැයීම් වර්ජනය කිරීමේ කටයුත්තත් එක්ක මේ මොහොත වන විට උදා වෙලා තිබෙනවා. උසස් පෙළ විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කරන්නේ මා දන්නා පරිදි විශ්වවිද්‍යාල ආචාර්යවරු. විශ්ව විද්‍යාල ආචාර්යවරයෙක් උසස් පෙළ ප්‍රශ්න පත්‍රය සකස් කරලා ඒ සඳහා අදාළ උත්තර ටික හදලා ඒ ඇගැයීම් වාර්තා සමඟ උත්තර

[ගරු පියසිරි විජේනායක මහතා]

පත්‍ර සමීක්ෂණය කරන සියලුම ගුරු භවතුන් එක මධ්‍යස්ථානයකට හෝ ඒ වාගේ මධ්‍යස්ථාන කිහිපයකට කැඳවලා උත්තර පත්‍ර ඇගැයීම් කටයුතු කිරීමට පූර්ව අදාළ ප්‍රශ්න පත්‍රය සකස් කළ ආචාර්යවරයා එතැනදී ප්‍රධාන පරීක්ෂකවරුන්ගේත්, පරීක්ෂකවරුන්ගේත් සහභාගිත්වය ඇතිව ඔවුන් සමඟ සාකච්ඡාවක් කරනවා. මෙන්න මේ අර්බුදය හමුවේ අපිට 2007 අවුරුද්දේත් යම් තැන්වල මේක මතු වුණා. 2008 අවුරුද්දෙත් උසස් පෙළ විභාගයේ උත්තර පත්‍ර ඇගැයීම් කිරීමේදී ප්‍රශ්න පත්‍රය සකස් කරන ලද ආචාර්යවරයාට තමන්ගේ ඇගැයීම් කරන ගුරුවරුන් අමතලා තමන්ගේ බලාපොරොත්තුව අභිලාෂය - කුමන දිසාවකටද මේ පිළිතුරු පත්‍ර තිබිය යුත්තේ, මේකෙන් බලාපොරොත්තු වන කරුණ මොකක්ද, මේකෙන් ලකුණු දීමේදී තිබෙන විවිධත්වය කුමක්ද කියා - පැහැදිලි කිරීමට ඉඩකඩ ලැබුණේ නැහැ. මේක ඉතාමත්ම කනගාටු දායක තත්ත්වයක්. මොකද, සමහර විෂයන්වල මේක කළා. සමහර විෂයන්වල මේක කළේ නැහැ. එහෙම නොකරපු එකේ ප්‍රතිඵලය නිසා උත්තර පත්‍ර ඇගැයීම් කිරීමේදී සමහර ළමයින් බරපතළ අසාධාරණයකට ලක් වෙන්න ඇති. ගුරුවරයාගේ ඒ මොහොතේ දැක්ම අනුව තමයි උත්තර පත්‍ර ඇගැයීමේදී, ලකුණු සටහන් කිරීමේදී සිද්ධ වන්නේ. ඒ නිසා මෙවර උසස් පෙළ සිසුන්ට එහෙම නැත්නම් අවුරුදු 13ක් පාසල් ගිහිල්ලා අධ්‍යාපනයේ අවසන් බලාපොරොත්තුව එහෙම නැත්නම් සරසවියට පිවිසීමට බලාපොරොත්තු වන දරුවන් මෙන්න මේ මහා ඛේදවාචකයක් දක්වා තල්ලු වුණා. මේක අපි බලවත් සේ කම්පා වන කාරණයක්. මොකද, මේ ඇගැයීම් කර්තව්‍ය අදාළ ආචාර්යවරයා හමුවේ සාකච්ඡා කරලා, පරීක්ෂකවරුන් හා ආචාර්යවරයා අතර මේ පිළිබඳව ප්‍රශ්න කරලා සාකච්ඡා කරලා පොදු එකඟතාවකට ආවාට පස්සේයි මූලාසනාරූඪ අපේ හාමුදුරුවනේ, ඒ උත්තර පත්‍ර බැලීමේ ක්‍රියාවලිය තුළින් නිවැරදිතාව තහවුරු කර ගන්න පුළුවන් වන්නේ. ආදර්ශ උත්තර පත්‍රයක් පරීක්ෂා කරලා ඒ පිළිබඳ පොදු එකඟතාවක් අරගෙන තමයි මේකේ අවසාන නිගමනය තීන්දු කර ගැනීමට පිවිසෙන්නේ. ඒ කටයුත්ත මේ වතාවේ බාධා මැද්දේ අපෙන් ගිලිහිලා ගියා. එහෙම ගිලිහිලා යැමෙන් ජාතියට අයහපතක් වුණේ. මෙහෙම ජාතියට අයහපතක් වන තැනට විභාග දෙපාර්තමේන්තුවට මේ කටයුත්ත කරන්න බැරි වුණා කියන එක පිළිබඳව අපි කවුරුත් බරපතළව කල්පනා කරන්න ඕනෑ. මේ විභාගය අපේ රටේ දරුවන්ගේ ඉරණම තීන්දු වන ප්‍රධාන විභාගයක්. ඒක නිසා මම මෙතැනදී රජය පැත්තට විශේෂ අවධානය යොමු කරනවා. මොකද, රජය ගුරුවරුන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමේ ක්‍රියාවලිය දීර්ඝ කාලයක් සාකච්ඡා කළා. මේක ආරම්භ වුණේ අද ඊයේ නොවෙයි. බී. සී. පෙරේරා වැටුප් කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කරන කොට, බී. සී. පෙරේරා වාර්තාවේ ගුරුවරුන්ගේ වැටුප් පිළිබඳව සටහන් නොකර ඒ වාර්තාවේ කිව්වා, ගුරුවරුන් පිළිබඳව පස්සේ වාර්තාවක් ඉදිරිපත් කරන්නම් කියා. ඒ වෙන කොට ගුරු සේවය ස්ථාපිත කරලා එකෙන් ලැබුණු ප්‍රතිඵලය මත ගුරුවරුන් සඳහා කිසිදු සඳහනක් නොකර ගුරු සේවය තුළ තිබිය යුතු වැටුප් ක්‍රමය පිළිබඳව නිවැරදි එකඟතාව නැති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, දිගින් දිගටම අවුරුදු ගණනාවක් මේ වැටුප් ප්‍රශ්නය ආපු එකේ ප්‍රතිඵලයක් වශයෙන් 2008 වෙන කොට උත්තර පත්‍ර ඇගැයීම හෙට්ටු කරන තැනට පත් වුණා. මෙන්න මේ ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යාත කොමිෂන් සභාවේ පැවැති ඒ සාකච්ඡාවලට මූලාසනාරූඪ අපේ හාමුදුරුවනේ, මමත් සහභාගි වුණා. ඒ සාකච්ඡාවලදී මතු වුණු ප්‍රධානම කරුණු තමයි ගුරුවරුන්ගේ වැටුප් වැඩි කරන කොට ප්‍රශ්නයක් වෙනවා, ගුරුවරුන්ගේ වැටුප් පරිපාලන සේවයේ වැටුප්වලට වඩා වැඩි වෙයි, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් අතර වැටුප් පිළිබඳ ගැටලුවක් ඇති වෙයි, රාජ්‍ය සේවයේ අනික් අයට වැටුප් වැඩි කිරීමේදී මේක ගැටලුවක් වෙයි, ඒ නිසා මේ ගැටලුව වළක්වා ගන්න අනිවාර්යයෙන් කටයුතු කරන්න ඕනෑය කියන එක.

මුළු ලෝකයේම ගුරු වෘත්තිය කියන්නේ අති පූජනීය වෘත්තියක්. ගුරුවරු කියන්නේ, මේ රටේ බලවත් කාර්ය භාරයක් ඉටු කරන පිරිසක්. වැඩ වර්ජනවලට ගුරුවරුන් තල්ලු කරනවා නම්, උද්ඝෝෂණවලට ගුරුවරුන් තල්ලු කරනවා නම්, පිකට් බෝඩ් උස්සා ගෙන ඉන්න තැනට ගුරුවරුන් තල්ලු කරනවා නම් ඒක සමාජ සංවර්ධනය ආපස්සට යැමේ ක්‍රියාවලියක් වෙනවා. දරුවන් විශාල පිරිසක් හා මේ රටේ අනාගතය ගොඩ නැඟීමේ ක්‍රියාවලියට මූලිකත්වය දරන, කැප වන ගුරුවරුන්ට වැටුප් වැඩි කිරීමේ ක්‍රියාවලිය අනිවාර්ය වැදගත් කාරණාවක්.

01/2006 වැටුප් චක්‍රලේඛනය ඉදිරිපත් කළ ඒ වාර්තාවේ සඳහන්ව තිබුණේ ගුරුවරුන් සාමාන්‍ය රජයේ සේවකයන් හා සම කර ඉදිරිපත් කිරීමකුයි. අපේ ඇමතිතුමාත් දන්නවා, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සුදුසුකම් මත බඳවා ගන්නා වෙනත් සේවාවන් පොලිස් නිලධාරින්ට සම කරලා තිබුණු බව. ඒ කොමිෂන් සභාවේ හිටපු සමහර මහත්වරු කිව්වා, "මේ කට්ටිය පැය පහයි නේ උගන්වන්නේ. ඒක නිසා ගුරුවරුන්ට ඔය වැටුප තිබුණාම ඇති"යි කියලා. සමහර අය කිව්වා, "ගුරුවරුන්ට වැටුප් වැඩි කරන්න ඕනෑ නැහැ. ගුරුවරුන්ට වැටුප් වැඩි කළොත් අනික් කට්ටියත් ඉල්ලයි. ඒ නිසා අපෝ ඕකට නම් අත ගහන්න බැහැ"යි කියලා. මෙතැන ප්‍රශ්නය තිබුණේ, ගුරු වෘත්තිය හා ගුරුවරයා කියන කාරණාව පිළිබඳව සියුම් අවබෝධයක්වත් වැටුප් හා සේවක සංඛ්‍යාත කොමිෂන් සභාවට තිබුණේ නැති එකයි. එහි ක්‍රමවේදය හා පැවරුණු කාර්ය භාරය පිළිබඳ කල්පනා කළේ නැහැ. දරුවා ඕනෑ දිසාවට ගෙන යන්න සමාජයේ අනාගතය සඳහා දරුවන් මෙහෙය වන ගුරුවරුන් පන්ති කාමරයේ ඉන්න පැය ගණන ගණනය කරලා තකතිරු විධියට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කරපු එකේ ප්‍රතිඵලය තමයි අද දක්වා ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය අධ්‍යාපන ඇමතිතුමාටත් විසඳන්න බැරි වෙලා ජනාධිපතිතුමා දක්වා ගිහින්, ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගිහින් ඉතාමත්ම විශාල සමාජ පරිහානියකට පියවර තබන කාරණාවක් බවට පත් වුණේ. අපේ රටේ ගුරුවරයාගේ තත්ත්වය, ගුරුවරයාගේ වගකීම හා ගුරුවරයාගේ කාර්ය භාරය පිළිබඳ නොසලකා මුදලේ ප්‍රමාණය මත ගුරුවරයා වෙනුවෙන් තීන්දු ගත් එකේ ප්‍රතිඵලයක් විධියට තමයි මෙන්න මේ බරපතළ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා විභාග දෙපාර්තමේන්තුවට අවශ්‍ය මුදල් අනුමත කිරීම නොවෙයි අද වෙලා තිබෙන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාරණා කරන්නයි විභාග දෙපාර්තමේන්තුවට සිද්ධ වුණේ. ගුරුවරුන් උත්තර පත්‍ර ඇගැයීම්වලට එන්නේ නැත්නම් ගුරුවරුන්ට දඬුවම් කරන්න විභාග කොමසාරිස්වරයාට වුවමනා නැහැ.විභාග කොමසාරිස්වරයා විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා වගකීම ඉටු කරන්න පත් කරපු නිලධාරියා. එතුමාට තිබෙන්නේ නිවැරදිව හා වඩාත්ම විශ්වසනීයත්වයක් ඇතිව විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා විභාග දෙපාර්තමේන්තුවේ ගෞරවනීය කාර්ය භාරය ඉටු කිරීමයි. එහෙම නැත්නම් විභාග දෙපාර්තමේන්තුවට උසාවි ගිහින් වැටුප් පිළිබඳ උත්තර කියන තත්ත්වයට පත් වෙනවා. විභාග දෙපාර්තමේන්තුවට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යන්න වෙනවා. "අනේ අපේ උත්තර පත්‍ර ටික බලවා ගන්න විධියක් නැහැ, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් මේක නිවැරදි කරලා දෙන්න" කියලා ඉල්ලන්න වෙනවා. විභාග දෙපාර්තමේන්තුවට සිද්ධ වෙනවා, මේ ප්‍රශ්නය විසඳන්න මොකක් හෝ චක්‍රලේඛයක් නිකුත් කරන්න කියලා අධ්‍යාපන අමාත්‍යාංශයට කියන්න. මොකක්ද, ඒ තත්ත්වය? මේකේ තිබෙනවා, අපි නොදන්නා, සමාජයට නොතේරෙන කුමන්ත්‍රණයක්. මෙතුවක් කල් සමාජීය වශයෙන් අපේ රට වටිනා රාජ්‍යයක් බවට ලෝකය පුරාම ප්‍රචලිත වන්න බලපෑ කරුණු අතර ප්‍රධාන කාරණයක් තමයි ශ්‍රී ලංකාවේ ඉගෙන ගත් පුද්ගලයකුට ලෝකයේ ඕනෑම රටක, ඕනෑම අභියෝගාත්මක රැකියාවක් කරන්න ගිහින් වඩා හොඳ නිර්මාණ කරන්න පුළුවන් වීම. එවැනි මිනිසුන් බිහි වුණු රටක් මේක; තවදුරටත් බිහි වන රටක්. ඒ නිසා අපේ රටේ අධ්‍යාපනය විනාශ කිරීමේ කර්තව්‍ය කරන, ඕනෑකම තිබෙන අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණකරුවෝ සිටිනවා. අන්න ඒ කුමන්ත්‍රණකරුවන්ගේ වුවමනාවට විවිධ තැන්වලදී, එක එක අවස්ථාවලදී මේක ආවා. අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනැවිත් එක වරක් මේක ක්‍රියාත්මක වෙන්න ආවා. සමහර අවස්ථාවලදී නිදහස් අධ්‍යාපනයේ තිබුණු ඉඩකඩ කැල්ලෙන් කැල්ල කපා ඉවත් කරමින් මේ රටේ ජනතාවගේ අධ්‍යාපන අයිතිය හකුළා දැමීමේ ක්‍රියාවලියට ආවා. එතැනින් නැවතුණේ නැහැ. ඊට පසුව මොකද වෙන්නේ? දවසින් දවස මේ සඳහා බලපෑම් කරන අදෘශ්‍යමාන බලවේගයන් මේ තුළ ගොඩ නැඟෙන්න පටන් ගත්තා. මූලාසනාරූඪ අපේ හාමුදුරුවනේ, ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි උසස් පෙළ උත්තර පත්‍ර ඇගැයීම් කිරීම සඳහා ගුරුවරුන් නොපැමිණීමේ තත්ත්වයට පත් වුණේ. ඊට පසුව කණ්ඩායමක්

ගුරුවරුන්ට දොස් කියන්න පටන් ගත්තා. තව කණ්ඩායමක් ආණ්ඩුවට දොස් කියන්න පටන් ගත්තා. ඊට පසුව නියමිත දිනයට ප්‍රතිඵල දෙන එක ගැන විභාග කොමසාරිස් ජනරාල්තුමාගේ ඔළුවේ වැඩ කරන්න පටන් ගත්තා. අපි ඒක අසාධාරණයි කියනවා නොවෙයි. නමුත් එතුමාට සිද්ධ වෙනවා, කොහොම හරි ඉක්මනින් නියමිත දිනයට ප්‍රතිඵල ලබා දෙන්න. ඒ වුණත් නියමිත දිනයට ප්‍රතිඵල ලබා දෙන්න බැහැ. මේක භෞතිකව මිනිසුන් කළ යුතු දෙයක්. මේක පරිගණකයට උත්තර පත්‍රය දාලා උත්තර ගන්න පුළුවන් එකක් නොවෙයි. ගුරුවරයකුට දවසකට උත්තර පත්‍ර 20කට වැඩි ප්‍රමාණයක් බලන්න බැහැ. උපරිමය බැලුවත් 20ක් වගේ ප්‍රමාණයකුයි බලන්නේ, උසස් පෙළ විෂයන්වල. එතකොට උත්තර පත්‍ර ඒ සා ප්‍රමාණයක් බලන ගුරුවරයකු ඒ මානසික තෘප්තිය, මානසික විවේකය, මානසික ඒකාග්‍රතාව ඇතිව පන්ති කාමරයේ උගන් වනවා වාගේම, උත්තර පත්‍ර ඇගැයීමේ ක්‍රියාවලිය දක්වා ගෙන යන්න, මෙන්න මේ වැටුප් විෂමතාව කියන මර උගුලෙන් බරපතළ තත්ත්වයක් ඇති වුණු නිසායි, මූලාසනාරූඪ අපේ ගරු හාමුදුරුවනේ මේ තත්ත්වය සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අද වන තුරු මොකද වෙලා තිබෙන්නේ? උත්තර පත්‍ර ඇගැයීමේ කොටස තවමත් සිදු වෙමින් යනවා. මේ නිසා අද වන කොට අපේ රටට මතු වුණු ගැටලුවක් තිබෙනවා. අපේ රටේ උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල ලබා දීම ප්‍රමාද වන කොට ලෝකයේ අනෙකුත් රටවල්වල විශ්වවිද්‍යාලවල අපේ ප්‍රතිඵල එනකම් පාඨමාලා පටන් ගන්න බලා ගෙන ඉන්නේ නැහැ. වාර්ෂිකව අපේ රටේ ළමයින් තුන්සිය පනහකට වැඩි ප්‍රමාණයකට ශිෂ්‍යත්ව සඳහා දොර ඇරෙනවා, ලෝකයේ ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාලවල. මේ අවුරුද්දේ උසස් පෙළ ප්‍රතිඵල ප්‍රමාද වෙන කොට අන්න ඒ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලට අපේ වැඩි දස්කම් දක්වපු දරුවන්ට යන්න තිබෙන දොර වැහිලා යනවා. අන්න එතකොට අධ්‍යාපනය කප්පාදු කරන්න, කපා ගෙන යන්න, බලා ගෙන ඉන්න කුමන්ත්‍රණකරුවන්ට, මේ රටේ ජාත්‍යන්තර පාසල්වලට විතරක් ඒ දොරකඩ විවර කිරීමට හැකියාව ලැබෙන අතර, අපේ ගමේ ඉගෙන ගන්න අහිංසක දරුවන්ට ජාත්‍යන්තරව අන්න ඒ තිබෙන ඉඩ කඩ අහිමි වීමේ අනතුරකට අද වන කොට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවත් මේකේ වගකීම දරලා මේක නිවැරදි කරනවා වාගේම වෘත්තීය සමිතිත් ඒ වගකීම දරලා නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීමට කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා මේ දෙ පාර්ශ්වයම වහාම මැදිහත් වුණේ නැත්නම් මේක බරපතළ තත්ත්වයකට පත් වනවා. මොකද, විභාග කොමසාරිස්තුමාට ගැටලුවක් නැහැ. එතුමා තව සුමානයකින් විතර කියාවි, "උත්තර පත්‍ර ඇගැයීමේ කටයුතු බොහොම හොඳින් සිද්ධ වුණා. සියලු දෙනාටම ස්තුතියි, සහා තොමෝ සතුටින් විසිරි ගියාය" කියා. නැවත වරක් ලබන අවුරුද්දේ උසස් පෙළ විභාගය තිබෙනවා. නැවත වරක් වැටුප් ප්‍රශ්නය විසඳා ගන්න බැරිව ආපසු මේක කල් ඇද ඇද යනවා. වැටුප් චක්‍රලේඛය නිකුත් නොකළාට පස්සේ නැවත වරක් ගුරුවරුන් අලුත් වටයකින් මේ සටන් පෙරමුණට යන එක වළක්වන්න බැහැ.

එහෙම නම් මූලාසනාරූඪ අපේ ගරු හාමුදුරුවනේ, අද අපට තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේ ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව නිවැරදි කරලා ගුරුවරුන් නිසි වැටුප් තලයේ පිහිටුවා තැබීම මේ රටේ ජාතියේම තිබෙන වග කීමක් වන්නේ, ජාතියේ මඟ පෙන්වන නියමුවන් වන ගුරුවරුන් අනිවාර්යයෙන් නිවැරදි තැනට ගෙන යන්න ඕනෑ නිසායි. ගුරුවරුන්ට වැටුප් වැඩි කරන කොට මෙතැනදී කවුරු හරි කල්පනා කරනවා නම් එය සුදුසු නැහැ කියා ඒක වැරදියි. සමහර ගුරුවරුන් අවුරුදු තිහක් උගන්වා තිබෙනවා. ඒ ගුරුවරයා පළමු වැනි ශ්‍රේණියට එනවා. පළමු වැනි ශ්‍රේණියට එන කොට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව කියනවා, "ඒ ගුරුවරයාට වැටුප තියන්න බැහැ, අධ්‍යාපන පරිපාලන සේවයට උඩින්" කියලා. පුදුම කථාවක් නේ, මූලාසනාරූඪ අපේ ගරු හාමුදුරුවනේ. විශ්වවිද්‍යාලයට ගිහින් උපාධියක් ලබා ගෙන ගුරුවරයා දැන් ඉස්කෝලේ උගන්වනවා. අවුරුදු 25ක් ඉස්කෝලේ උගන්වපු ගුරුවරයාට, අධ්‍යාපන පරිපාලන සේවයට අද බැඳෙන නිලධාරියාට වඩා ඉහළින් වැටුප තියන්න බැහැය කියලා කියනවා නම් ඒකේ මොකක්ද තිබෙන සාධාරණය. අපි අහන්නේ, මොකක්ද මූලාසනාරූඪ අපේ ගරු හාමුදුරුවනේ ඒකේ තිබෙන සාධාරණය. මේ වැටුප් සංඛ්‍යා, තීරු අතර මොළේ තියා ගෙන ඉන්න වැටුප් හදන නිලධාරි මහත්වරුන්ට පේන්නේ නැද්ද, උපාධියක් අර ගෙන උපාධිධාරි ගුරුවරයකු වශයෙන් අවුරුදු විස්සක්, විසිපහක් පන්ති කාමරයේ උගන්වා ලබන පරිචයට ඔහුට දෙන වැටුප, අධ්‍යාපන පරිපාලන සේවයට හෝ විදුහල්පති සේවයට හෝ එහෙම නැත්නම් වෙන මොනවා හෝ සේවයකට වඩා පහළින් තියෙන්න ඕනෑය කියලා කල්පනා කරලා වැටුප් සකස් කළොත් මොකද වෙන්නේ කියා. එතකොට පන්ති කාමරය තුළ දක්ෂකම් පාන, පන්ති කාමරය තුළ වඩාත් හොඳින් දරුවන්ට උගන්වන්න පුළුවන් ගුරුවරුන් පන්ති කාමරයෙන් එළියට යනවා. එතකොට ඉච්ඡා භංගත්වයට පත් වනවා. මොකද, ඔහුගේ සීමාව බලන්නේ ඊළඟ නිලධාරියාට වඩා උඩින් පනින්න බැහැ කියලායි. ඒක වැරදියි. අපි දන්නවා, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට වඩා වැටුප් ගන්න මහාචාර්යවරුන් සිටිනවා කියා. එහෙම නම් උපකුලපතිවරයා නේ විශ්වවිද්‍යාලය පාලනය කරන්නේ. උපකුලපතිවරයා සහ රෙජිස්ට්‍රාර්වරයා යන දෙදෙනා තමයි පරිපාලනයේ ප්‍රධානීන් වන්නේ. එතකොට විශ්වවිද්‍යාලයේ ගුරුවරයකුට, ආචාර්යවරයකුට, මහාචාර්යවරයකුට අයිතියක් නැද්ද, විශ්වවිද්‍යාලයේ උගන්වන වෙනත් ආචාර්යවරයකුට, වයිස් චාන්සලර්ට, රෙජිස්ට්‍රාර්ට වැඩි වැටුපක් ගන්න? මේකෙදී අධිරාජ්‍යවාදී කෝණයෙන් වැටුප් තලය බලනවා, නිලධාරියා බෙදීමේ සංකේතයක් විධියට දාගෙන; නිලධාරියා සීමා කිරීමේ සංකේතයක් විධියට දාගෙන. නිලධාරියා ආපස්සට හැර වීමේ මිනුම් දණ්ඩක් විධියට වැටුප දිහා බැලීමේ ක්‍රියාවලිය තමයි මෙන්න මේ බරපතළ කුමන්ත්‍රණයක් දක්වා, රටේ ජාතික අධ්‍යාපනය විනාශ කිරීම දක්වා තල්ලු කර ගෙන යන ගමනකට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපේ හාමුදුරුවනේ අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මෙයයි. මොනවා කිව්වත් වැඩක් නැහැ. ගුරුවරු ආපහු පාරට බහිනවා. ගුරුවරු ආපහු මේ වැටුප් ප්‍රශ්නය විසඳන්න කියලා ඉල්ලනවා. ගුරුවරු ආපහු උත්තර පත්‍ර ඇගැයීමෙන් ඉවත් වෙනවා. එතකොට ආපහු ශ්‍රේෂ්ඨාධිකරණයට යයි. ආපහු නීති පනවයි. නමුත් ගුරුවරයාගේ ප්‍රශ්නයවත්, දරුවාගේ ප්‍රශ්නයවත් රටේ අනාගතයේ ප්‍රශ්නයවත් විසඳෙන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලන්නේ මෙයයි. අර නිලධාරින් කිහිප දෙනෙක් පටු සීමාව දිහා බලන වැටුප් ක්‍රියාවලිය විවෘත කරන්න. පන්ති කාමරයේ උගන්වන දක්ෂ ගුරුවරයාට ඒ සීමාවෙන් ඉහළට යාමට ඉඩකඩ තබන්න. ඒ ඉඩකඩ තබලා ගුරුවරයාගේ වැටුප් විසමතාව ඉවත් කරන්න වහාම ක්‍රියා මාර්ගයක් නොගත්තොත් එහෙම මේක නැවතත් ඛේදවාචකයක් බවට පත් වෙනවා. අද මේ දරුවන්ට වෙච්ච අසාධාරණය ආයෙත් කාටවත් පියවන්න බැහැ. අවුරුදු 13ක් පන්ති කාමරයේ ඉගෙන ගෙන විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පෙනී සිටි දරුවාට තමන්ගේ වගකීම ඉටු කරලා අවසාන වශයෙන් තමන්ට හෘදය සාක්ෂිය නිවැරදි කර ගන්න බැහැ. ළමයි හෙට දවසේ කියනවා නම් වැඩ වර්ජනය නිසා තමන්ගේ උත්තර පත්‍ර ඇගැයීම් කිරීමෙන් තමන්ට අසාධාරණයක් වුණයි කියලා ආයෙත් ඒක කාටවත් නැහැ කියන්න බැහැ. ඒ නිසා ක්‍රමවේදය නිවැරදි කර ගැනීමට තිබෙන බාධාව වඩා හොඳින් තේරුම් ගත්තොත් ඒ බාධාව නිවැරදි කරන්න ජාතියක් විධියට අපේ වග කීමක් තිබෙනවා. ඒක ජාතික වග කීමක් වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ගුරු වැටුප් විසමතාව ඉවත් කිරීමට ඔබතුමා එන අය වැයෙන් හෝ මුදල් වෙන් කර ගන්න. නමුත් ගුරුවරයාට ගුරු වැටුප් නිවැරදි කිරීමේ ක්‍රියාවලිය තුළ අර චක්‍රලේඛය ඔය කියන බලපෑම්වලින් තොරව වහාම නිකුත් කරන්න වෙනවා. එහෙම නැත්නම් සිද්ධ වෙනවා, මේ රටේ අධ්‍යාපනය විනාශ කරන කුමන්ත්‍රණකරුවන් ඒ විනාශ කිරීම කරන තෙක් ඇස් කන් පියා ගෙන සිටින්න. ගුරුවරයා මේ වැඩ වර්ජනය කරන කොට, ගුරුවරයා ගිහිල්ලා උද්ඝෝෂණය කරන කොට, ගුරුවරයා උත්තර පත්‍ර ඇගැයීම නතර කරනවා කියන කොට මොන අධිකරණයෙන් කිව්වත්, කොයි විධියේ බලපෑම් කළත් උත්තර පත්‍රය ඇගැයීම සඳහා ආධ්‍යාත්මිකව ගුරුවරයා සූදානම් නැහැ. ගුරුවරයාට භෞතිකව බලපෑම් කරලා කෙවිට ගෙනැල්ලා කියයි. හැබැයි ආධ්‍යාත්මිකව තමන් උගන්වපු දරුවාගේ උත්තර පත්‍රය බලලා වඩා නිවැරදි සතුටු විය හැකි විධියට ඒ තීන්දුව දෙන්න ඔහුගේ මානසිකත්වය නිවැරදි කරලා දෙන්නේ නැහැ. අන්න ඒ නිසා අපේ හාමුදුරුවනේ මේක අද ජාතික මෙහෙවරක කර්තව්‍යයක් වෙනවා. මේක විභාග දෙපාර්තමේන්තුවේ වග කීමක් නොවෙයි. විභාග දෙපාර්තමේන්තුවේ වගකීම වෙන්නේ උත්තර පත්‍ර ඇගැයීම හා ප්‍රතිඵල දීම, එහි ස්වාධීනත්වය තිබීම හා ජාතියට තමන්ගේ වගකීම ඉටු කිරීමයි. නමුත් රජයේ වගකීම වෙන්නේ - ආණ්ඩුවේ වගකීම වෙන්නේ- ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නය වහාම

[ගරු පියසිරි විජේනායක මහතා]

විසඳීමේ ක්‍රියාවලිය දිහාවට අර ගෙන යාමයි. එහෙම නැතිව මේ සඳහා නිවැරදිව පිළිතුරු දෙන්නේ නැතිව මේ ප්‍රශ්නය කල් ඇරලා ඇද ගෙන යාමෙන් සිදු වන්නේ මොකක්ද? මා දන්නවා, අපේ අධ්‍යාපන ඇමතිතුමා වැටුප් කොමිසමට ගියා. මා හිතන්නේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් තමන්ගේ නිලධාරින්ට වැටුප් නිවැරදිව ලබා දෙන්නය කියලා වැටුප් කොමිසමට ගියා නම් ඒ ගිය එකම ඇමතිවරයා අධ්‍යාපන ඇමතිවරයායි කියායි. මම හිතන්නේ වෙන කිසිදු ඇමතිවරයෙක් ඔය වැටුප් හා සේවක සංඛ්‍යාත කොමිෂන් සභාවට ගිහිල්ලා නැහැ කියලායි. තමන්ගේ දෙපාර්තමේන්තුවක නිලධාරින්ගේ වැටුප් ප්‍රශ්නය විසඳන්න කියලා වෙනත් කිසිම ඇමතිවරයෙක් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ගිහිල්ලා නැහැ. මම හිතන්නේ ඔය සියලුම දෙනා ගෙන්වලා ජනාධිපතිවරයා ඉස්සරහ -රටේ රාජ්‍ය නායකයා ඉස්සරහ- එකම ප්‍රශ්නයට සාකච්ඡා තුනක් පවත්වා තිබෙනවා නම් ඒකත් ගුරු වැටුප් ප්‍රශ්නයක්. නමුත් උත්තරයක් නැතිව -නිවැරදි පිළිතුරක් නැතිව- අවසන් වීමක් නැතිව ජාතිය බේදවාචකයට ඇදගෙන යාම දක්වා ගිහිල්ලා තිබෙන්නේ මෙන්න මේ ක්‍රියාවලියයි. ඒ නිසා තමයි අපි කියන්නේ මේක ඇතුළේ කුමන්ත්‍රණකරුවෝ ඉන්නවා කියලා. මේක ඇතුළේ බලවත් කුමන්ත්‍රණකරුවෝ බලා ගෙන ඉන්නවා. පනත් ගෙනැල්ලා මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න බැරි වුණා. විවිධ නීතිරීති රෙගුලාසි ගෙනැල්ලා මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න උත්සාහ කළා. ඒක අසාර්ථක වුණා. මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න පෞද්ගලික පාසල් හා පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කළා. ඒත් ඒ ක්‍රියාවලිය සාර්ථක කර ගන්න බැරි වුණා. දැන් එහෙම නම් විභාග ක්‍රියාවලිය අසාර්ථක කිරීම තුළින් මේ රටේ නිදහස් අධ්‍යාපනයට බලපෑම් කරන්න හදනවා නම්, විභාග ක්‍රියාවලිය අසාර්ථක කිරීමෙන් විශ්වාසභංගත්වයට මේ රට පත් කිරීම තුළින් ලංකාවේ අධ්‍යාපනය විනාශ කරන්න හදනවා නම් ඒක වළක්වන්න ඒ සඳහා කටයුතු කරන එක ජාතික මෙහෙවරක්. ඒ නිසා මම දැඩි ලෙස ඉල්ලීමක් කරනවා. මේ අවුරුද්ද ඉවර වෙන්නට ඉස්සර වෙලා මේ වැටුප් විසමතා ඉවත් කරලා වඩාත් හොඳ ගුරු සේවයක් වඩාත් හොඳ අධ්‍යාපන කර්තව්‍යයක් ඉටු කිරීමට ඉඩකඩ සලසා දෙන්නය කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. ඊළඟට ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා.

[අ.භා. 1.47]

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අධ්‍යාපනය අමාත්‍යාංශය යටතේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් වෙලා තිබෙන මේ මොහොතේ කාරණා කිහිපයක් ඉතාම කෙටියෙන් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ගරු අමාත්‍යතුමනි, මීට කලින් කථා කළ පක්ෂ විපක්ෂ මැති ඇමතිවරුන් බොහොමයක් විසින් අවධාරණයට ලක් කළ කරුණු කාරණා අතර, ශ්‍රී ලංකා ගුරු සේවාව තුළ, ඒ වාගේම විදුහල්පති සේවාව තුළ වැටුප් විෂමතාව මූලික කර ගත් ගැටලු රාශියක් ඇති වී තිබෙනවාය කියන කාරණයත් මතු කළා. දීප ව්‍යාප්ත සෙසු සේවාවන් හා සංසන්දනාත්මකව බලද්දී මේ සම්බන්ධයෙන් මතු වී තිබෙන ගැටලු තවදුරටත් උග්‍ර වෙලා තිබෙනවා, අර්බුදයකට පත් වී තිබෙනවා. මේ පිළිබඳව වූ සියලු ලිපිලේඛන ඔබතුමාගේ අවධානය පිණිස මා සභාගත කරන්නට කැමැතියි. ශ්‍රී ලංකා ගුරු සේවය ආරම්භ කර ඒ සඳහා ඇති කර ගත් ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක නොවීම නිසාත් ගැටලු රාශියක් මතු වී තිබෙනවා. ලැබී තිබෙන කාලය කෙටි නිසා ඒ ගැටලු එකින් එක මා **සභාගත*** කරනවා.

ඒ වාගේම ඔබතුමා දන්නවා අපේ රටේ ගුරු අධ්‍යාපනඥ සේවය. විශේෂයෙන් ගුරු මධ්‍යස්ථාන සියයක් පමණ ආරම්භ කර තිබෙනවා. ඒ තුළ ගුරු මධ්‍යස්ථාන භාරකරුවන් හැටියට ඉන්නා පිරිස තමන්ගේ සේවා ස්ථාවරභාවය පිළිබඳ ගැටලුවලට මුහුණ දී තිබෙනවා. ඒ පිළිබඳ කරුණු කාරණාත් මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අධ්‍යාපන සේවක සමුපකාර ණය දෙන සමිතියේ - EDCS එකේ - නිලවරණය හා පසුව ඇති වෙච්ච තත්ත්වයන් පිළිබඳ ලබා ගත් ජයග්‍රහණ ගුරුවරුන් හැටියට භුක්ති විඳින්නට බැරි ඉඩකඩක් මතු වී තිබෙනවා. ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්නට ඒ අදාළ කරුණු කාරණාත් මා **සභාගත*** කරනවා.

ඒ වාගේම නිශ්චිත කාලවල විභාග, කඩ ඉම් විභාග පැවැත්වීම පමා කිරීම නිසා -කල් ගත වීම නිසා- දැනට ගුරු සේවයේ නියැලී සිටින ගුරුවරුන් බොහොමයක් ගැටලු රාශියකට මුහුණ දෙමින් සිටිනවා. නිශ්චිත කාල සීමාව තුළ තමන්ගේ උසස්වීම්, ඊට අදාළ හිඟ වැටුප් ලබා ගැනීමේ අපහසුතාවකට ඔවුන් පත් වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට ඉල්ලීමක් ඉදිරිපත් කළ එච්.එම්. ධර්මදාස ගුරු මහත්මයාගේ ලිපිය සියලු ගුරුවරුන් වෙනුවෙන් මේ අවස්ථාවේ හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, විෂයය භාර අමාත්‍යවරයාට ඍජුව අදාළ නොවුණත් පසු ගිය දවස්වල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය තුළ විශාල අර්බුද ගණනාවක් ගොඩ නැඟුණු බව කියන්නට ඕනෑ. 2006 වර්ෂයේ සිට 2007, 2008 වර්ෂය දක්වා වසර තුනක් ඇදී ගිය ගැටලු රාශියක් තිබෙනවා. 2006 වසර තුළ මේ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් ඔවුන්ගේ එදිනෙදා අධ්‍යාපන කටයුතු පවත්වා ගෙන යාම සඳහා ඉල්ලීම් කිහිපයක් කළා. විශේෂයෙන් භෞතික හා මානව සම්පත් වැඩි කරන ලෙසත්, ශිෂ්‍ය මර්දනය නතර කරන ලෙසත්, සරසවි සිසුන්ට බීමට අවශ්‍ය ජලය ලබා දෙන ලෙසත්, ඒ වාගේම ව්‍යවහාරික විද්‍යා පීඨයට පීඨ සංකීර්ණයක් ලබා දෙන ලෙසත්, සරසවියට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩි කරන ලෙසත් මේ ශිෂ්‍යයන් ඉල්ලීම් කළා. නමුත් ඒ කිසිදු ඉල්ලීමකට සාධාරණ ඇහුම් කන් දීමක් පරිපාලනය පැත්තෙන් යොමු කර තිබුණේ නැහැ. එම නිසාම ඔවුන්ට උද්ඝෝෂණ කරන්නට සිද්ධ වුණා. ඒ වාගේම පන්ති වර්ජනය කරන්නට, සත්‍යග්‍රහ කරන්නට සිද්ධ වුණා. පානීය ජලය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්නට 2006 වර්ෂයේ දී කරන ලද ඉල්ලීම 2007 වර්ෂය තුළදීත් ඊට වඩා බරපතළ විධියට ඉස්මතු කරමින් සරසවි සිසුන්ට නැවත වරක් මහ පාරට බහින්නට සිද්ධ වුණා. ඒ වාගේම කළමනාකරණ පීඨයේ කප්පාදු කළ වසරක ප්‍රායෝගික පුහුණුව නැවත ලබා දෙන ලෙස ඔවුන් ඉල්ලීම් කළා. සරසවියට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩි කරන ලෙස, කෘෂි පීඨයේ ගොවි පළක් හා සරසවියට යාමට පාරක් ලබා දෙන ලෙස, කෘෂි උපාධිය මුදලට විකිණීම නතර කරන ලෙස, ආචාර්යවරුන්ට අවම පහසුකම්වත් ලබා දෙන ලෙස ඉල්ලීම් කළා. 2006 වර්ෂයේ කළ මේ ඉල්ලීම් ඉටු නොවීම නිසා 2007 වර්ෂයේත් ඒ ඉල්ලීම් කළා. නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු බලධාරින් හෝ ඒ සඳහා ඇහුම් කන් නොදුන් නිසා තම ඉල්ලීම් ලබා ගැනීම සඳහා නැවත වතාවක් මේ ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ඉදිරිපිටට ගිහිල්ලා උද්ඝෝෂණ කරන්නට, අරගල කරන්නට සිද්ධ වුණා. එහි ප්‍රතිඵලයක් හැටියට අකැමැත්තෙන් වුණත් දින 53ක්

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

* ***පුස්තකාලයේ තබා ඇත.***
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

***ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

* ***කථාව අවසානයේ පළ කර ඇත.***
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

අඛණ්ඩව පන්ති වර්ජනය කරන්නට ශිෂ්‍යයන්ට සිද්ධ වුණා. ඒ ඉල්ලීම්වලට ලැබුණු ප්‍රතිඵලය වුණේ පොලීසිය යොදවලා සමහර සිසුන් අත් අඩංගුවට ගැනීමයි. ඒ වාගේම ශිෂ්‍යයන් විශාල ප්‍රමාණයක් පන්ති තහනමට ලක් කරනු ලැබුවා. මූලාසනාරූඪ ගෞරවනීය ස්වාමීන් වහන්ස, 2006/2007 වර්ෂයේ මේ කරන ලද සාධාරණ ශිෂ්‍ය ඉල්ලීම් නොලැබුණු නිසා 2008 වර්ෂයේ නැවත වතාවක් ඔවුන්ට ඉල්ලීම් කරන්නට සිද්ධ වුණා. විශේෂයෙන්ම ඔවුන් ඉල්ලා සිටියා, ශිෂ්‍යයන්ට පනවා ඇති 2008 වසරේ පන්ති තහනම ඉවත් කරන්න කියා. ඒ වාගේම ඔවුන් ඉල්ලා සිටියා, කළමනාකරණ පීඨයේ දේශන නිසි ලෙස වුවමනා කරන විධියට සකස් කර දෙන්න කියලා. ඒක ඉටු කර දුන්නේ නැහැ. පාඨමාලා මුදලට විකිණීම නතර කරන්න කියන ඉල්ලීම කළා. ඒක ඉටු වුණේ නැහැ. පොරොන්දු වූ පරිදි විශේෂවේදී උපාධිය ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. ඒ ඉල්ලීම් එකක්වත් ඉෂ්ට කරන්නට වයඹ විශ්වවිද්‍යාලයේ පරිපාලනය අසමත් වුණා. 2008.08.26 දින වන විට ඒ කිසිවකට උත්තර නොලැබුණු නිසා තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා, තමන්ගේ කැමැත්ත නොවුණත් නැවත වතාවක් මහ පාරට බැහැලා උද්ඝෝෂණය කරන්නට අරගල කරන්නට ශිෂ්‍යයන්ට සිද්ධ වුණා. ඒ ඉල්ලීම් කොයි තරම් සාධාරණ වුණත් ඒ ඉල්ලීම්වලට කන් නොදුන් පරිපාලනය 2008.08.31 දින ඉඳලා මේ දක්වා වයඹ විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම වසා දමා තිබෙනවා, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. ඒ නිසා අපි මේ විෂයය භාර ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ඉඩකඩ ලබා දෙන්නය, ඒ සඳහා වහාම මේ විශ්වවිද්‍යාලය විවෘත කරන්නය කියන ඉල්ලීම.

මේ වන විට ශිෂ්‍යයන්ගේ සාධාරණ ඉල්ලීම්වලට විසඳුම් ලබා දී නැහැ. ඒ විතරක් නොවෙයි. ඔවුන්ට ලබා දී තිබෙන දඬුවම් ඉතාම අසාධාරණ ඒවායි. නවක ශිෂ්‍යයන් පිළිගැනීම සඳහා උත්සවයක් සංවිධානය කළා. ඒ උත්සවය සංවිධානය කිරීම වරදක් හැටියට දැකපු මේ පරිපාලන නිලධාරින් ආයතන ප්‍රධානින් වසරකට ශිෂ්‍යයන්ගේ පන්ති තහනම් කළා. වසරකට පන්ති තහනම් කිරීම තමයි ඔවුන්ට දුන්නු දඬුවම. පීඨ දිනයේ කිරිබත් පිසීමට විශ්වවිද්‍යාලයේ පොල් භාවිත කළා කියලා වසරක් පන්ති තහනම් කළා. ඔබ වහන්සේ දන්නවා, මේ රටේ ඈත ගම්බද ප්‍රදේශවල සිටින අහිංසක දුගී දුප්පත් ජනයා තමන්ගේ දරුවන්ට කන්න වේලක් දෙන්න නැතිව, කුරුම්බා ගෙඩියක්, පොල් ගෙඩියක් අල්ලපු වත්තෙන් කඩනවා. ඒක හරියි කියනවා නොවෙයි, මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස. එහෙම වැරදි කර ඒවා වැරදි හැටියට දැකලා පැමිණිලි කර පොලීසියට අරගෙන ගිහින් උසාවියට දැමුවත් රුපියල් 100ක 200ක දඩයක් හැරුණු කොට මේ වාගේ බරපතළ දඬුවම් නියම කරන්නේ නැහැ. මේ අපේ රටේ අනාගත පරම්පරාව නිර්මාණය කරන උසස් අධ්‍යාපන ආයතනයක බලධාරින් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග. ඒ නිසා මෙවැනි අමනෝඥ ක්‍රියාමාර්ග ගැනීමෙන් වැළකිලා ශිෂ්‍යයන්ගේ සාධාරණ අයිතීන්වලට මුල් තැන දීලා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට ඉඩකඩ සලස්වන්නය කියා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන් දහම් පාසල් අධ්‍යාපනය ලබන දරුවන් දහම් පාසල් අධ්‍යාපනය ලබා ධර්මාචාර්ය විභාගයට වාඩි වෙලා ඒ විභාගය සමත් වෙනවා. ඒ දහම් අධ්‍යාපනය, සදාචාර අධ්‍යාපනය අපේ රටට අවශ්‍යයි. එහෙම මඟ පෙන්වීමක් කරන්නට පෙරට එන අපේ රටේ දූ දරුවන්ට ඒ අධ්‍යාපන පහසුකම් ලබා දී, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුහරුකම් සඳහා ඉඩ පහසුකම් ලබා දෙන විට ධර්මාචාර්ය විභාගය සමත් වන උදවියටත් ඒ සඳහා ඉඩකඩ විවෘත කර දෙන්නය කියන ඉල්ලීම කරනවා.

2007 නැඟෙනහිර පළාත් සභා මැතිවරණයේදී සිද්ධ වුණු කාරණාවක් මා අවසාන වශයෙන් සඳහන් කරන්නට කැමැතියි. කැලණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන අංශයේ සේවකයකු වන කීර්ති තෙන්නකෝන් ස්වාධීන මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක කටයුතු කළා. එහි මාධ්‍ය ප්‍රකාශකයා හැටියට සිටියේ ඔහුයි. 2007.05.10 වන දා නැඟෙනහිර පළාත් සභා මැතිවරණයේදී දූෂණ වංචා විශාල ප්‍රමාණයක් සිද්ධ වුණා කියලා හෙළිදරවු කළා. ඒ හෙළිදරවු කිරීම සම්බන්ධයෙන් ජනාධිපති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ (මාධ්‍ය) චන්ද්‍රපාල ලියනගේ මැතිතුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා හරහා මොහුට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර තිබෙනවා. එය අස්ථාන චෝදනා පත්‍රයක්. විශ්වවිද්‍යාලයේ ආයතන සංග්‍රහයට අනුව ඕනෑම සේවකයකුට අයිතිය තිබෙනවා, ඉඩකඩ තිබෙනවා, මේ වාගේ කටයුත්තක යෙදෙන්න. ඒවා පාවිච්චි නොකර, ඒ සඳහා ඉඩකඩ නොදී ඉතාම වැරදි සහගත විධියට කීර්ති තෙන්නකෝන් මහත්මයාගේ සේවය මේ වන විට අත් හිටුවලා තිබෙනවා; වැඩ තහනම් කරලා තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිමින් මට කාලය ලබා දීම පිළිබඳව ඔබ වහන්සේට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

***සභා මේසය මත තබන ලද ලිපිය :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :*
*Letter tabled.*

එච්. එම්. ධර්මදාස,
මා / කොටුවේගෙදර විද්‍යාලය,
මාතලේ.
2007.05.28.

ගරු කථානායක තුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**ගුරු සේවා ව්‍යවස්ථාව අනුව මා හට ලැබිය යුතු අන්තර්ග්‍රහණ උසස්වීම් හා හිඟ වැටුප් ලබා නොදීම.**

මා විසින් ඉල්ලුම් කළ පරිදි මා හට ලැබිය යුතු ගුරු ව්‍යවස්ථාවේ සඳහන් හිමිකම් මධ්‍යම පළාත් සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත.

(i) ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ III කොටසේ 2 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි, සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සම්බන්ධයෙන් එසේ අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව සිදු කෙරෙන උසස්වීම් සඳහා ගණන් ගත යුතු ලකුණු ප්‍රමාණය ඔවුන් සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ වැටුප් පියවර පදනම් කර ගැනීම.

(ii) 1997 මාර්තු 11 වන දින අති විශේෂ ගැසට් පත්‍රය අනුව III කොටසේ 2 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිළධාරීන් සම්බන්ධයෙන් එසේ අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව සිදු කෙරෙන උසස්වීම් සඳහා ගණන් ගත යුතු ලකුණු ප්‍රමාණය ඔවුන් සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ වැටුප් පියවර පදනම් කර ගැනීම.

(iii) 2005/04 චක්‍රලේඛයට අදාල පොදු උපදෙස් සංග්‍රහයේ 2.0හි 2.2.1 ඡේදයේ 1. 2 නිදසුන් මගින් දක්වා ඇති පරිදි, සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සම්බන්ධයෙන් එසේ අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව සිදු කෙරෙන උස්ස්වීම් සඳහා ගණන් ගත යුතු ලකුණු ප්‍රමාණය ඔවුන් සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ වැටුප් පියවර පදනම් කර ගැනීම.

ලෙස ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වෙන කරුණු උල්ලංඝනය කරමින් මාගේ මෙන්ම මධ්‍යම පළාත් ගුරු මහත්ම මහත්මීන්ටද විශාල අසාධාරණයක් සිදු කර ඇත. මා ඇතුළු මධ්‍යම පළාත් අධ්‍යාපන සේවයට සම්බන්ධ අනෙකුත් ගුරුවරුන්ටත් සිදු කෙරෙන මෙම අසාධාරණය ඉවත් කර අදාළ අන්තර්ග්‍රහණය, උසස්වීම් හා හිග වැටුප් ඇතුළු හිමිකම් ලබා දීමට මධ්‍යම පළාත් ලේකම්වරයාට නියෝගයක් නිකුත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,

විශ්වාසී,

...........................
(එච්. එම්. ධර්මදාස)

[பி.ப. 1.57]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பீ. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

சபைக்குத் தலைமைதாங்கும் வணக்கத்துக்குரிய தேரர் அவர்களே, கல்வி அமைச்சுக்கான குறைநிரப்புத்தொகை மீதான இந்த விவாதத்திலே கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடை கின்றேன். உண்மையிலே கல்வியைப்பற்றிப் பேசுகின்றபோது, எமது வடக்கு, கிழக்கிலே கல்வித்துறையிலே தொடர்ச்சியாகப் பல இன்னல்கள் எதிர்நோக்கப்படுகின்றன என்பதுதான் உண்மை. குறிப்பாக நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்திலே 2007ஆம் ஆண்டு மார்ச் மாதம் இராணுவ நடவடிக்கையொன்று மேற்கொள்ளப்பட்டது. அந்த இராணுவ நடவடிக்கையின்போது விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டில் இருந்த படுவான்கரைப் பகுதியிலே 12 பாடசாலைகளுக்கு வழங்கப்பட்டிருந்த சுமார் 120 கணினிகளுக்கு என்ன நடந்த தென்று தெரியவில்லை. ஆனால், கிழக்கு மாகாணத்தை மீட்டதாக அரசாங்கம் கூறுகின்ற இவ்வேளையிலே, அந்தப் பாடசாலைகளில் இன்றுவரை அந்தக் கணினிகள் இல்லாமலிருப்பது மிகவும் வருந்தத்தக்க விடயமாக இருக்கின்றது.

பாடசாலைக் கல்வியிலே வரலாறு என்ற பாடம் மிகவும் முக்கியமானது. ஸ்ரீ லங்கா அரசாங்கத்தைப் பொறுத்தமட்டிலே அது வரலாற்றைத் திரிபுபடுத்தி அல்லது வரலாற்றை மாற்றி எழுதுகின்ற ஒரு நிலைப்பாட்டிலேயே இன்றுவரையும் இருந்து கொண்டிருக்கின்றது. இதற்கு நான் ஓர் உதாரணத்தைக் கூறலா மென்று நினைக்கின்றேன். அதாவது, இராணுவத் தளபதியாக இருக்கின்ற சரத் பொன்சேகா அவர்கள்கூட வரலாற்றைத் திரிபுபடுத்திக் கூறுகின்றார். சரத் பொன்சேகா அவர்கள் அண்மையிலே கனேடிய நாளிதழ் ஒன்றுக்கு வழங்கிய செவ்வியில் "ஸ்ரீலங்கா என்பது ஒரு பௌத்த நாடு, அது சிங்களவர்களுக்குச் சொந்தமான நாடு, தமிழர்கள் அதில் உரிமை கேட்பதற்கு அருகதை யற்றவர்கள்" என்று கூறியிருந்தார். ஸ்ரீலங்காவில் 1947ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை இருந்த சிங்கள அரசியல் தலைவர்கள் தமது அரசியலுக்காகத் தமிழ்ச் சமூகத்தின் வரலாற்றைத் திரிபுபடுத்திக் கூறிய வரலாறுகள் பல இருக்கின்றன. ஒரு கட்டளைத் தளபதியாக இருந்து இராணுவத்தை வழிநடத்திக் கொண்டிருக்கின்ற இராணுவத் தளபதியே இவ்வாறு வரலாற்றைத் திரித்துக்கூற முயற்சிக்கின்றார் என்றால், அவர் எவ்வாறு தமிழினத்தை அழிக்கின்றார் என்பதற்கு வேறு ஓர் உதாரணம் தேவையில்லை என்றுதான் நான் நினைக்கின்றேன். இராணுவத் தளபதி அவர்கள் இவ்வாறு கனேடிய நாளிதழுக்குச் செவ்வி அளித்த அதேதினத்திலே ஸ்ரீ லங்காவின் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் நியுயோர்க்கிலே ஐ.நா. சபையிலே இடம்பெற்ற கூட்டத்திலே தமிழிலே உரையாற்றியிருந்தார். அவர் தமிழிலே உரையாற்றியதை உண்மையிலே ஊடகத்துறையினர் மற்றும் தலைவர்கள், சமூக சேவையாளர்கள், சர்வதேச அரங்கில் இருப்பவர்கள் என்று பலதரப்பட்டோரும் பாராட்டியிருந்தார்கள். ஆனால், வடக்கு, கிழக்கிலே தமிழ் மக்கள் குண்டுகளினால் அழிக்கப்பட்டுக் கொண்டிருந்தபோதுதான் அவர் அங்கே தமிழிலே உரையாற்றினார் என்பதுதான் நாங்கள் இங்கு முக்கியமாகக் குறிப்பிடுகின்ற விடயமாக இருக்கின்றது. அதாவது, வன்னியிலே இருக்கின்ற தமிழ் மக்கள் விமானக் குண்டுகள் வீசப்பட்டுப் படுகொலை செய்யப்படுகின்ற நேரத்திலேயே அவர் நியுயோர்க் கிலே தமிழிலே உரையாற்றினார். உண்மையிலே அவர் அங்கு தமிழிலே உரையாற்றத் தேவையில்லை, தமிழர்களுக்கான உரிமையைத் தந்தாலே போதும்! அந்த விடயத்தை நாங்கள் மிகவும் பெறுமதியானதாகப் பார்ப்போம்.

நான் இன்னும் ஒரு விடயத்தையும் கூற விரும்புகின்றேன். அதாவது, கிழக்கு மாகாணம் மீட்கப்பட்டதற்குப் பிற்பாடு அங்கு பல சோதனைச் சாவடிகள் அமைக்கப்பட்டிருக்கின்றன. 1983ஆம் ஆண்டு தொடக்கம் 2007ஆம் ஆண்டுவரை மட்டக்களப்பு மாவட்டத்தின் ஒந்தாச்சிமடத்திலுள்ள சோதனைச் சாவடியிலே எந்தவொரு கெடுபிடியும் இருக்கவில்லை. மட்டக்களப்பு மாவட்டம் விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டுப் பிரதேசமாக இருந்தபோது அல்லது மட்டக்களப்பு மாவட்டத்தின் எழுவான்கரைப் பகுதி இராணுவக் கட்டுப்பாட்டில் இருந்தபோதுகூட அந்த ஒந்தாச்சி மடத்திலுள்ள சோதனைச்சாவடியிலே எந்தவொரு பிரயாணியும் வாகனத்திலிருந்து இறக்கித் துன்புறுத்தப்பட்ட வரலாறு இல்லை. ஆனால், இப்பொழுது ஒந்தாச்சிமடத்திலே புதியதொரு சோதனை முகாம் அமைக்கப்பட்டிருக்கின்றது. பெரிய கல்லாறு மற்றும் கல்முனைப் பகுதியிலிருந்து வருபவர்கள் அல்லது மட்டக்களப் பிலிருந்து கல்முனைப் பகுதிக்குச் செல்பவர்கள் அந்த சோதனைச் சாவடியிலே வாகனங்களிலிருந்து இறக்கப்பட்டுப் பலத்த சோதனைக்குட்படுத்தப்படுகின்றனர். இதன் நிமித்தமாக கல்வி கற்கின்ற மாணவர்கள், கல்விச் சமூகத்தை வழிநடாத்துகின்ற ஆசிரியர்கள், கல்வித் திணைக்களத்திலே வேலை செய்கின்ற அதிகாரிகள் மற்றும் சாதாரண பொதுமக்கள் என இப்படிப் பலருக்கு அங்கு பல மணிநேரம் தரித்துச் செல்லவேண்டிய ஒரு நிலையேற்படுகின்றது. உதாரணத்துக்கு ஓர் அதிகாரி பட்டிருப்புத் தொகுதியிலிருக்கின்ற துறைநீலாவணையிலிருந்து களுவாஞ்சிக் குடிக்கு வருவதாக இருந்தால் சரியாகப் பத்து நிமிடம்தான் எடுக்கும். ஆனால், இந்த ஒந்தாச்சிமட சோதனைச்சாவடியினூடாக வந்தால் நாற்பத்தைந்து நிமிடங்களுக்குமேல் எடுக்கின்றது. அரசாங்கம் கிழக்கு மாகாணத்தை மீட்டெடுத்துவிட்டதாகக் கூறிக் கொண்டு அங்கே மேலும் பல முகாம்களை அமைத்துவருவதனால், அங்கேயிருக்கின்ற கல்விச் சமூகமாக இருந்தாலும் சரி அல்லது ஏனைய திணைக்கள அதிகாரிகளாக இருந்தாலும் சரி அல்லது சாதாரண குடிமக்களாக இருந்தாலும் சரி, அவர்களுக்கு இவ்வா றான துன்புறுத்தல் நிலைமைகள் தொடர்ந்தவண்ணமே இருக்கும் என்பதை நான் இவ்விடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

உண்மையிலே இந்த விடுதலைப் போராட்டம் ஆரம்பிக்கப் பட்டதற்குப் பல காரணங்கள் இருந்தாலும், முக்கியமாக 1970ஆம் ஆண்டுக் காலப்பகுதியிலே கொண்டுவரப்பட்ட 'தரப்படுத்தல்' என்ற விடயம்தான் தமிழ் இளைஞர்களை ஆயுதம் ஏந்திப் போராடவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைக்கு இட்டுச்சென்றது என்பதை நான் இவ்விடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். தமிழ்ச் சமூகத்துக்குரிய உரிமைகள் மறுக்கப்பட்டு வந்தாலும்கூட, தொடர்ச்சியாக கல்வி உரிமை மறுக்கப்பட்டதன் விளைவாகவே இந்த விடுதலைப் போராட்டத்தை ஆயுதமேந்தி முன்னெடுக்க வேண்டிய ஒரு கடப்பாடு எமது தமிழ் இளைஞர்களுக்கு ஏற்பட்டது. ஆகவே, இந்த நாட்டில் சகல இனத்தவருக்கும் கல்விச் சேவையைப் பாகுபாடில்லாமல் தொடரவேண்டிய கடமை இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது.

2008ஆம் ஆண்டு ஜனவரி மாதம் 1ஆம் திகதி தொடங்கி டிசம்பர் மாதம் 31ஆம் திகதி முடிவடையும் நிதியாண்டின் கல்விச் சேவைக்கென ஏறக்குறைய 441 மில்லியன் ரூபாவுக்கும் மேற்பட்ட தொகையைப் பெறுவதற்காக இன்று நீங்கள் இந்த குறைநிரப்புப் பிரேரணையைக் கொண்டுவந்திருக்கிறீர்கள். உண்மையிலே இந்த யுத்தத்தை நிறுத்திச் சமாதானத்தைக் கொண்டுவருவீர்களாக இருந்தால், இந்தக் குறைநிரப்புப் பிரேரணையைக் கொண்டுவர வேண்டிய அவசியமேயில்லை; 'குறைநிரப்பு' என்ற பேச்சுக்கே இடமில்லாமல் போகும். அதுமட்டுமல்ல, பல நிர்மாணப் பணி களை, பல வீட்டுத்திட்டங்களை இன்னும் பல அபிவிருத்தித் திட்டங்களையும் மேற்கொள்ளக்கூடியதாக இருக்கும். யுத்தத்துக்கு ஒதுக்குகின்ற பணத்தைக் கல்வி நடவடிக்கைகளுக்கோ அல்லது வேறு அபிவிருத்தித் திட்டங்களுக்கோ நீங்கள் செலவழிப்பதாக இருந்தால் அதன்மூலம் இவ்வாறான பல பாரிய அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொள்ள முடியுமென்று நான் கருது கின்றேன். இந்த யுத்த நடவடிக்கையின் மூலமாக எந்தவொரு அபிவிருத்தி இலக்கையும் எங்களால் அடைய முடியாது. உண்மை யிலே இந்த நாட்டில் புரையோடிப்போயிருக்கின்ற இந்த இனப் பிரச்சினைக்கு ஒரு தீர்வைக் காண்போமாக இருந்தால் நிச்சயமாக எந்தவொரு குறைநிரப்புப் பிரேரணையையும் கொண்டு வர வேண்டிய அவசியம் இருக்காது என்பது எனது கருத்தாக இருக்கின்றது.

மேலும், கிழக்கு மாகாணத்தை நாங்கள் எடுத்துநோக்கு வோமாக இருந்தால், மட்டக்களப்பு மாவட்டத்தில் மட்டும் - அது வாகரையாக இருந்தாலும் சரி அல்லது படுவான்கரைப் பகுதியாக இருந்தாலும் சரி - ஒட்டுமொத்தமாக இருக்கின்ற பாடசாலைகளில் தற்போது 270 ஆங்கில ஆசிரியர்கள் பற்றாக்குறையாக இருப்பதைக் கண்டுகொள்ளலாம். இதைவிட அங்கு விஞ்ஞான ஆசிரியர்கள் 75 பேரும், கணித ஆசிரியர்கள் 66 பேரும் தேவைப்படுகின்றனர். இப்பொழுது பட்டதாரிகளுக்கு அரச சேவையில் பல்வேறு பதவிகளுக்கான நியமனங்கள் வழங்கப்பட்டு வருகின்றன. ஆனால், மட்டக்களப்பு மாவட்டத்திலே சுமார் 150 பட்டதாரிகளுக்கு இன்னும் அந்த நியமனம் வழங்கப்படாததால் அதனை வழங்கும்படி கோரி அவர்கள் அங்கே ஓர் ஆர்ப்பாட்டத்தை நடாத்துவதற்கான முஸ்தீபுகளிலே ஈடுபட்டுக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, அவர்களின் மனோநிலை பாதிக்கப்படும் வண்ணம் இந்த விடயத்தை மேலும் இழுத்தடிக் காமல் அந்த மாவட்டத்திலே ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்ற பாடசாலைகளுக்கோ அல்லது கல்வித் திணைக்களங்களுக்கோ பொருத்தமான நியமனங்களை கல்வி அமைச்சினூடாக அவர் களுக்கு வழங்கி இந்தப் பிரச்சினையைத் தீர்க்கவேண்டுமென்று நான் இவ்விடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இதைவிட, மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற பல பாடசாலை களில் கட்டிட வசதிகள் போதாமலிருக்கின்றன. ஏற்கெனவே துரைரெட்ணசிங்கம் ஐயா அவர்கள் கூறியதுபோன்று அங்கு ஆளணிப் பற்றாக்குறையும் நிலவுகின்றது. தென்பகுதியிலிருக் கின்ற பல பாடசாலைகளுக்குச் சிற்றூழியர் தரத்திலான நியமனங் கள் வழங்கப்பட்டிருக்கின்றன. ஆனால், வடக்கு, கிழக்கில் இருக்கின்ற பாடசாலைகளுக்கு இன்னும் அந்த நியமனங்கள் வழங்கப்படாமல் அதனை இழுத்தடித்துக்கொண்டு போகின்ற அல்லது அதிலும் புறக்கணிப்புக் காட்டப்படுகின்ற ஒரு நிலை தொடர்ச்சியாக இருந்து வருகின்றது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, your time is over.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பீ. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

Please give me one more minute.

இந்த நாட்டிலே தமிழர்களுக்கும் சகல வளங்களையும் பெறுவதற்கு உரிமை இருக்கின்றது. ஆகவே, இவ்வாறான புறக்கணிப்பு நடவடிக்கைகளை நிறுத்தி, தமிழ்ப் பாடசாலை, சிங்களப் பாடசாலை என்று பேதம் பார்க்காமல் தமிழ்ப் பாடசாலைகளில் நிலவும் குறைபாடுகளைத் தீர்ப்பதற்கு உரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்படவேண்டுமென்று கேட்டு விடைபெறுகின்றேன். நன்றி . வணக்கம்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Thank you.

මීළඟට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයකුයි තිබෙන්නේ.

[අ.භා. 2.08]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, එක් කරුණක් පමණක් මම මේ ගරු සභාවේ අවධානය පිණිස යොමු කරන්න කැමැතියි. විශ්වවිද්‍යාලයේ සේවකයන්ට දේශපාලන අයිතිය තිබෙන බව ඔබ වහන්සේ දන්නවා. විශ්වවිද්‍යාල පනතෙන් පමණක් නොවෙයි, නඩු තීන්දු ගණනාවකින්ම එම තත්ත්වය තහවුරු කර තිබෙනවා. නමුත් මෑතකදී නිදහස් හා සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් පිහිටුවා ගන්නා ලද CAFFE නමැති රාජ්‍ය නොවන සංවිධානයේ මාධ්‍ය ප්‍රකාශක, කැලණිය විශ්වවිද්‍යාලයේ සේවය කරන කීර්ති තෙන්නකෝන් මහතාගේ වැඩ තහනම් කර තිබෙනවා. මා මේ ලිපිය කියවන්න කැමැතියි. එය ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපියක්.

"මහාචාර්ය එස්.වී.ඩී. ගාමිණී සමරනායක මහතා,
සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම,
වෝඩ් පෙදෙස,
කොළඹ 07.

දැනට කැළණිය විශ්වවිද්‍යාලයේ සේවයේ නිරතව සිටින රජිත කීර්ති තෙන්නකෝන් නැමැති අය මැයි මස 10 වෙනිදා පවත්වන ලද නැගෙනහිර මැතිවරණයේදී වංචා හා දූෂණ සිදු වූ බවට විද්‍යුත් මාධ්‍ය හරහා අවස්ථා කිහිපයකදී අදහස් පළ කර ඇත.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරයේ (CAFFE) මාධ්‍ය ප්‍රකාශකවරයා වශයෙන් රජිත කීර්ති තෙන්නකෝන් මහතා කටයුතු කරන බව වාර්තා වී තිබේ.

රාජ්‍ය ආයතනයක සේවය කරමින්, රජිත කීර්ති තෙන්නකෝන් මහතා නැගෙනහිර මැතිවරණය දූෂිත එකක් බවට පළ කරනු ලැබූ අදහස් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ජනාධිපති කාර්යාලය දැනුවත් කළ යුතුව ඇති බැවින් මේ පිළිබඳ වර්තාවක් මා වෙත ලබා දෙන්නේ නම් මැනවි.

අත්සන/....
චන්ද්‍රපාල ලියනගේ
ජනාධිපති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ (මාධ්‍ය)

පිටපත
උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය"

ජනාධිපති ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරින් මේ රටේ මූලික නීතියවත් දන්නේ නැහැ. ගොන් නාම්බෝ ටිකක් එතැන ඉන්නේ. විශ්වවිද්‍යාල සේවකයන්ට දේශපාලන අයිතිය තිබෙනවාය කියන එක විශ්වවිද්‍යාල පනතෙත් සඳහන් වෙනවා. මේ රටේ නඩු තීන්දු ගණනාවකත් එය සනාථ කර තිබෙනවා. එහෙම තියෙද්දී දේශපාලන වශයෙන් තම බලය යොදවලා, මේ ආයතනවල උපකුලපතිවරුන් භය කරලා ජනාධිපති ලේකම් චන්ද්‍රපාල ලියනගේ කියන පුද්ගලයා කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිට ලියුමක් ලියලා කීර්ති තෙන්නකෝන්ගේ වැඩ තහනම් කර තිබෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට බාධා කරනවා නොවෙයි. චන්ද්‍රපාල ලියනගේ කියා නිලධාරියකු ජනාධිපති ලේකම් කාර්යාලයේ නැහැ. [බාධා කිරීමක් ] - ලංකාවේ හිටියේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ජනාධිපති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ (මාධ්‍ය).

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

එහෙම කෙනකු නැහැ නේ මන්ත්‍රීතුමනි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ලංකාවේත් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ තියෙන්නේ ලියුම.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ කොයි කාලයේද ගරු මන්ත්‍රීතුමනි. දිනය කවදාද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
( மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
දැන් නම් එවැනි කෙනකු නැහැ. අපි දන්නා හැටියට -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
( மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
2008.05.25 වැනි දා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
නැහැ, නැහැ. ඒ කාලයේ ඉඳලා නැහැ මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට මා මේ පිටපත දෙන්නම් කෝ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
දෙන්න, දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැනට මාස හතරක් වෙනවා නේ. මාස හතරකට උඩදී එවාපු ලියුමක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ, ලියුම ලිව්ව දවස. නමුත් වැඩ තහනම් කළේ පෙරේදායි. මේ ලියුම ලියා තිබෙන්නේ චන්ද්‍රපාල ලියනගේ විසින් මහාචාර්ය ගාමිණී සමරනායකටයි. පිටපතක් යවා තිබෙනවා, කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිට. නමුත් වැඩ තහනම් වුණේ පෙරේදා. ඒකයි අපි පාර්ලිමේන්තුවේදී අද මේ ගැන කථා කරන්නේ.

අපි කවුරුත් දන්නවා, ජනාධිපතිතුමාට උපදේශකවරු 80ක් සිටින බව. සමහර විට මේ ඇමතිවරු පවා දන්නේ නැතිව ඇති. උපදේශකවරු 80ක් ඉන්නවා. ඒකත් අර කැබිනට් මණ්ඩලය වාගේයි. ඇමතිතුමා කවුද, මන්ත්‍රීතුමා කවුද කියා තෝරා ගන්න බැරි තත්ත්වයකුයි අද තිබෙන්නේ. ඒ කෙසේ වෙතත් ඒක වෙනම කථාවක්. නමුත් රටේ මූලික නීතියවත් දන්නේ නැති අය තමයි මේ වාගේ දේවල් කරන්නේ. එම නිසා අප මේ සම්බන්ධයෙන් නීති මාර්ගයෙන් කටයුතු කරනවා. අපි සියලු දෙනාම අද හෙටම මෙය අධිකරණයට ගෙන යනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. එතුමා නැහැ. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා. එතුමාත් නැහැ. අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා පිළිතුරු කථාව කරනවා ඇති.

[අ.භා. 2.13]

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මූලාසනාරූඪ ගරු ස්වාමීන් වහන්ස, අද මේ ගරු සභාවට ඉදිරිපත් වුණේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා විභාග දෙපර්තමේන්තුව වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වූ රුපියල් දසලක්ෂ හාරසිය හතළිස්එකයි දශම අටක පරිපූරක ඇස්තමේන්තුවක්. එයයි අද විවාදයට භාජනය වුණේ. විභාග දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුවට අදාළ මාගේ කරුණු ටික ඉදිරිපත් කිරීමට මත්තෙන් මම යම් නිවැරදි කිරීමක් කරන්නට ලැහැස්තියි. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ටිකක් ආවේගශීලීවද මම දන්නේ නැහැ, මේ ගරු සභාවේදී සඳහන් කළා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින කැලණිය විශ්වවිද්‍යාලයේ සේවය කරපු සේවකයකුගේ වැඩ තහනමක් පිළිබඳව. එසේ සඳහන් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සිටින අය සම්බන්ධයෙන් යම් කිසි වචනයක් එතුමා පාවිච්චි කළා. මම එය නැවත කියන්නේ නැහැ. [බාධා කිරීමක්] මොකද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉන්නේ විශ්වවිද්‍යාලවල මහාචාර්යවරු. ඒක නිසා එහෙම ඒ අය වෙනුවෙන් කියැවුණා නම් ඒක නිවැරදි කරන්නය කියලා මා ඉල්ලීමක් කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
UGC එක ගැන මම එහෙම කිව්වේ නැහැ. UGC එකට බලපෑම් කරන ජනාධිපති ලේකම් කාර්යාලයේ අය ගැනයි මම කථා කෙරුවේ. තමුන්නාන්සේ එහෙම පටලවන්න හදන්න එපා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒක තමයි මම කිව්වේ. එහෙම කිව්වා නම් ඒක නිවැරදි කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කිව්වේ UGC එකට බලපෑම් කරන ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉන්න නිලධාරින් කියලායි. ජනාධිපති උපදේශකවරු 80 දෙනෙක් ඉන්නවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මූලාසනය හොබ වන ගරුතර ස්වාමීන් වහන්ස. එතුමා සඳහන් කළේ "ගොන් නාම්බා" කියන වචනයයි. මම කනගාටු වෙනවා මේ ගරුතර සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ, විභාග දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුවක් ගැන විවාද කරන මේ අවස්ථාවේදී කුමන මාධ්‍යවේදියකුට හෝ එතුමා කිව්ව කථාව ගැන. ජනාධිපතිතුමාගේ මාධ්‍ය අංශය වෙන්න පුළුවන්, වෙනත් කෙනෙක් වෙන්න පුළුවන් ඒත් මාධ්‍යවේදියෙක්. එහෙම නම් මාධ්‍යවේදියකුට තමයි "ගොන් නාම්බා" කියන ප්‍රකාශය කරමින් මේ ගරුතර සභාවේ ගරුත්වයට හානි වන ආකාරයෙන් විපක්ෂයේ සංවිධායක හැටියට කථා කළේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පළමු වන ශ්‍රේණියට ළමයි ටික දමා ගන්න බැහැ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
තමුන්නාන්සේ කරුණාකරලා දැන් ඔතැන වාඩි වෙන්න. [බාධා කිරීම්] මගේයි කථාව. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ ගරුත්වය ආරක්ෂා කළේත් නැහැ. ඒත් මාධ්‍යවේදියෙක්. චන්ද්‍රපාල ලියනගේ මහත්මයා මාධ්‍යවේදියෙක්. ඒ මාධ්‍යවේදියාට තමයි, -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරුතර ස්වාමීන් වහන්ස, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මෙතැනදී සභාවේ ගරුත්වය ගැන කථා කරනවා. අරන්තලාවේ භික්ෂූන් වහන්සේලා ඝාතනය කරපු, පොලිසියේ හයසීයක් ඝාතනය කරපු කරුණා පාර්ලිමේන්තුවට පත් කෙරුවා. සභාවේ ගරුත්වය ගැන කියලා නිකම් බබා වෙන්න හදන්න එපා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
තමුන්නාන්සේගේ ප්‍රශ්නයක් නොවෙයි ඒක.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බබා වෙන්න හදන්න එපා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
කරුණා කියලා කෙනෙක් නැහැ. තමුන්නාන්සේ කරුණාකරලා වාඩි වෙන්න. විපක්ෂයේ සංවිධායකතුමා මාධ්‍යවේදියකුට අර වාගේ වචනවලින් මේ ගරු සභාවේදී ආමන්ත්‍රණය කිරීම ගැන මම කනගාටු වෙනවා.

මූලාසනය හොබ වන ගරුතර ස්වාමීන් වහන්ස, මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නට සිදු වුණේ විශේෂයෙන්ම විභාග දෙපාර්තමේන්තුවේ වාර්ෂික විභාග ගණනාවක් පවත්වන්න වුවමනා නිසායි. ප්‍රධාන වශයෙන් අපොස ( සාමාන්‍ය පෙළ) විභාගය, අපොස (උසස් පෙළ) විභාගය, පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය වැනි පාසල් හා සම්බන්ධ වූ මේ විභාග තුන අනිවාර්යයෙන් පැවැත් වෙනවා. ඒ වාගේම සෑම වර්ෂයකදීම පෙනී සිටින සිසුන් සංඛ්‍යාව වර්ධනය වෙමින් යනවා. විෂය නිර්දේශයන් සංශෝධනය වීමේදී සමහර වර්ෂවලදී සමහර විෂයන්වලට පැරණි නිර්දේශය සහ අලුත් නිර්දේශය කියලා ප්‍රශ්න පත්‍ර දෙකක් දෙන්නට සිද්ධ වෙනවා. මීට අමතරව උදාහරණ වශයෙන් තරග විභාගයකින් උපාධිධාරීන් ගුරුවරුන් හැටියට බඳවා ගන්න කොට විභාග පවත්වන්නට සිදු වෙනවා. විදුහල්පතිවරුන් බඳවා ගැනීම සඳහා විභාග පවත්වන්නට සිදු වෙනවා. ඊළඟට රජය තවත් විභාග ගණනාවක් පවත්වනවා. මා හිතන්නේ වර්ෂයකට විභාග 350කට වැඩි සංඛ්‍යාවක් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනවා. මේ විභාග පැවැත්වීමේදී වාර්ෂික අය වැය ලේඛනයෙන් වෙන් කරන මුදල ඒ වර්ෂය සඳහා ප්‍රමාණවත් වන්නේ නැහැ. අනපේක්ෂිත වියදම් එනවා. ඒ නිසා තමයි වෙන් කර තිබූ මුදලට අතිරේක වශයෙන් මේ රුපියල් මිලියන 441.8ක මුදල අවශ්‍ය වෙලා තිබෙන්නේ. පරිපූරක ඇස්තමේන්තුවට අදාළ යෝජනාවේ මේ පිළිබඳව ඉතා පැහැදිලිව වෙන් වෙන් වශයෙන් ශීර්ෂය 212, වැඩ සටහන 2 ආදී වශයෙන් විස්තර කර තිබෙන නිසා ඒ ගැන වෙනම විග්‍රහ කරන්නට මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වන්නේ නැහැ.

ඊළඟට, අද මේ විවාදයේ දී ඉදිරිපත් වූ කරුණු කීපයක් සම්බන්ධයෙන් මා පිළිතුරු දිය යුතුව තිබෙනවා. විශේෂයෙන් මෙහිදී සඳහන් කරන්න ඕනෑ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ පිළිතුරු පත්‍ර සමීක්ෂණ කටයුතු මේ වන විට බොහෝ දුරට අවසන් වෙමින් පවතින බව. ඊළඟ සති දෙකක පමණ කාලය තුළදී තවත් ඉතිරිව තිබෙන යම් යම් කුඩා පිළිතුරු පත්‍ර ඇගැයීම් අවසන් කිරීමට විභාග දෙපාර්තමේන්තුව කටයුතු කර තිබෙනවා. ඒ අනුව නියමිත කාලයේදී ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව කටයුතු කර ගෙන යනවා. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමකු සඳහන් කළ විධියට, උසස් පෙළ විභාගය පදනම් කර ගෙන විදේශ රටවල ශිෂ්‍යත්වවලට අයදුම් කරන දරුවන්ට කිසිම අසාධාරණයක් සිදු වන්නේ නැහැ. සාමාන්‍යයෙන් ඊළඟ වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් මාසවල විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍යයින්ගෙන් ඊට පෙර වර්ෂයේදී තමයි අයදුම්පත් කැඳවන්නේ. ඕනෑම වර්ෂයක එහෙමයි. ඒ නිසා ලබන අවුරුද්දේ අගෝස්තු, සැප්තැම්බර් මාසවල ශිෂ්‍යත්ව දෙන කණ්ඩායම තමයි දැන් කැඳවන්නේ. එතකොට නොවැම්බර් දෙසැම්බර් මාස අතරතුර දී ප්‍රතිඵල නිකුත් වුණාම නියමිත කාල සීමාවේදී ඒ කටයුතු සිදු වෙනවා. ඒ නිසා අසාධාරණයක් වෙන්න හේතුවක් නැහැ. ඒ වාගේම තවත් කාරණයක් සඳහන් කළා විශේෂයෙන්ම-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
පළමු වැනි කාරණය මේකයි. ඔබතුමා සඳහන් කළා සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගවලට පෙනී සිටින සිසුන් සංඛ්‍යාව වාර්ෂිකව වැඩි වනවා කියලා. ඔබතුමාට දැන් කියන්න බැරි වුණත් කමක් නැහැ. එහෙම වෙනවාද කියන එක අපි දැන ගන්න කැමැතියි.

අනෙක් කාරණය මේකයි ගරු ඇමතිතුමනි. අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් සමහර දෙපාර්තමේන්තුවල ගැටලු තිබෙනවා. පෙළ පොත් වැඩිපුර මුද්‍රණය කිරීම ආදී විශාල ගැටලු මතු වුණා. ඒ නිසා අපි අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල් හරියටම වෙන් කරන්න යන්නේ මොනවාටද කියලා මීට වඩා පැහැදිලි වාර්තාවක් අවම වශයෙන් උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ටවත් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තුන් වන කාරණය හැටියට මේ කාරණයත් මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ කාරණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට අයිතියි කියලා මඟ හරින්න එපා. එක්තරා කාලයකදී උසස් පෙළ විභාගයට අදාළව අභියෝගතා පරීක්ෂණය කියලා එකක් එකතු කළ බව ඔබතුමා දන්නවා. ඒ එකතු කළ අවස්ථාවේ විද්වතුන් ඇතුළු හැම දෙනාගේම මැදිහත් වීම මත ඒකෙන් ඇති වෙන්න පුළුවන් ගැටලු පිළිබඳව සාකච්ඡා කළා. ඊට පසුව එවකට පැවැති රජය - ඔබතුමා හිටපු රජයද කියලා මට මතක නැහැ- එකඟ වුණා, අභියෝගතා පරීක්ෂණය පවත්වන්නේ යම් මට්ටමක කුසලතාවක් බැලීම සඳහා පමණයි, ඒ අභියෝගතා පරීක්ෂණය සමත් වීම හෝ අසමත් වීම විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට සුදුසුකමක් කර ගන්නේ නැහැයි කියලා. මා මේ ගැන කියන්නේ ඒ නිසායි. මේක උසස් පෙළ ළමයි මුහුණ දෙන ප්‍රශ්නයක්. ඒක උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති කාරණයක් වෙන්න පුළුවන්. නමුත් "ඒ" සාමාර්ථ තුනක් ගත්තත් අභියෝගතා පරීක්ෂණය අසමත් නිසා විශ්වවිද්‍යාලයට යන්න බැරි වුණු ළමයි

[ගරු බිමල් රත්නායක මහතා]

ඉන්නවා. මේක අධ්‍යාපනයේ පුළුල් ප්‍රශ්නයක්. උසස් පෙළ ළමයින්ගේ ප්‍රශ්නයක්. ඒ නිසා උසස් පෙළ විභාගයෙන් පස්සේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම පිළිබඳව දැනට තිබෙන ප්‍රතිපත්තියට අනුව මේ අභියෝගතා පරීක්ෂණයට අදාළ කාරණය සමාලෝචනය කරන්න ඔබතුමාගේ පැත්තෙන් යම් ක්‍රියාකාරී මැදිහත් වීමක් කරන්නය කියා ඉල්ලා සිටිනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි ඒක කරන්න පුළුවන්. විශේෂයෙන්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒකාබද්ධව ඒ උපදේශක කාරක සභා දෙකේම සිටින මන්ත්‍රීතුමන්ලා කැඳවලා, අපේ අය වැය විවාදය පවත්වන කාල සීමාව තුළ දී ඒ සාකච්ඡාව පවත්වන්න අපට පුළුවන්. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයිනුත්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ විභාග දෙපාර්තමේන්තුවත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් ගෙන්වලා අපි සාකච්ඡා කරමු. ඔබතුමා සඳහන් කරපු ඒ ක්‍රමය 2001 ඉඳලා මේ දක්වා පැවැති ගෙන එන ක්‍රමය. "ඒ" සාමාර්ථ තුනක් ගත්තත් අභියෝගතා පරීක්ෂණයෙන් සාමාර්ථය ලබන්න ඕනෑ. මේ අවුරුද්දේ සාමාර්ථයක් ගන්න බැරි වුණත් ඊළඟ අවුරුද්දේ හරි සාමාර්ථය අර ගෙන විශ්වවිද්‍යාලයට ඇතුළු වෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා අවස්ථාව දීලා තිබෙනවා. ඔබතුමා සඳහන් කරන්නේ ප්‍රතිපත්තිමය කාරණයක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

ඒක වැරැදියි. මේ අවුරුද්දේ අසමත් වුණොත් ඊළඟ අවුරුද්දේ අභියෝගතා පරීක්ෂණය විතරක් සමත් වෙලා හරි යන්නේ නැහැ. ඊළඟ අවුරුද්දේ අභියෝගතා පරීක්ෂණයයි, උසස් පෙළ විභාගයයි දෙකම සමත් වෙන්න ඕනෑ. ළමයෙකුට ඒ වතාවේම අභියෝගතා පරීක්ෂණය සමත් වෙන්න බැරි වුණොත් නැවත සමත් වුණාට වැඩක් නැහැ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි ඔය ප්‍රශ්නය දැන් මතු වෙච්ච එකක් නොවෙයි. දැනට අවුරුදු හතක් තිස්සේ තිබෙන එකක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

නැහැ, ඇමතිතුමනි. අවුරුදු තුනක් විතර ඒ ක්‍රමය පැවතුණේ නැහැ. ඊට පසුව දැන් තමයි ඒක ක්‍රමානුකූලව හොරෙන්ම ඉස්සරහට ගෙනෙන්නේ. ඒකයි අපි කියන්නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඔබතුමා යෝජනා කරපු විධියට උපදේශක කාරක සභා දෙකේ මන්ත්‍රීවරුයි, අමාත්‍යාංශ දෙකේ නිලධාරිනුයි, UGC එකයි කැඳවලා අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගනිමු.

මූලාසනය හොබ වන ගරුතර ස්වාමීන් වහන්ස, ඒ වාගේම මෙහිදී තව සඳහනක් කළා, උත්තර පත්‍ර සමීක්ෂණයේදී වෙන දා පැවැත්වෙන ආකාරයෙන් කටයුතු සිදු වුණාද කියන කාරණය සම්බන්ධයෙන්. මෙහිදී මේ කාරණය පැහැදිලිව සඳහන් කරන්න අවශ්‍යයි. ලකුණු දීමේ පටිපාටිය තීරණය කරන්නේ ප්‍රධාන පාලකයා නැත්නම් ප්‍රධාන පරීක්ෂක විසිනුයි. ප්‍රධාන පරීක්ෂක සහ පාලක පරීක්ෂකවරු ඉන්නවා. ඊළඟට සම පාලක පරීක්ෂකවරු, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරු සහ සහකාර ප්‍රධාන පරීක්ෂකවරු ඉන්නවා. මේ සියලු දෙනාම එක් රැස් වෙලා තමයි ඒ පටිපාටිය සකස් කිරීම තීන්දු කරන්නේ. කොයි තරම් බාධක තිබුණත් මේ වසරේදීත් ඒ කටයුතු ඒ ආකාරයෙන්ම සිදු වුණු බව මෙහිදී සඳහන් කරන්න අවශ්‍යයි. ඒ වාගේම ප්‍රාදේශීය වශයෙන් සංවිධානය කර තිබුණු නියාමන මණ්ඩල සාමාන්‍ය පරීක්ෂකවරුන් සමඟ ලකුණු දීමේ පටිපාටිය සාකච්ඡා කරලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි. පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (வண.) உடவத்தே நந்த தேரர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (VEN.) UDAWATTE NANDA THERO *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ගරු කථානායකතුමනි. නියාමන මණ්ඩලය සමන්විත වන්නේ ප්‍රධාන පරීක්ෂකවරු, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරු, සහකාර ප්‍රධාන පරීක්ෂකවරු, සම පාලක පරීක්ෂකවරු කියන අයගෙනුයි. වෙනත් වසරවලදී වාගේම මේ අය සම්බන්ධ වෙලා සහකාර පරීක්ෂකවරුන් වෙත සෑම විෂයයක් සඳහාම ලකුණු දීමේ පටිපාටියට අදාළ උපදෙස් ලබා දී තිබෙනවා. වෙන දා සිදු වන ආකාරයටම මේ පටිපාටිය සිදු වෙලා තිබෙන නිසා ලකුණු දීමේදී කිසිදු අපේක්ෂකයකුට කිසිදු අසාධාරණයක් සිදු නොවන බව මෙහිදී සඳහන් කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා මෙහිදී සඳහන් කරන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම ඉදිරිපත් කළ කරුණු කිහිපයක් ගැන. අද පෙරවරුවේ රංජිත් මද්දුම බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ගුරු සේවය පිහිටු වීම සම්බන්ධයෙන්. ගුරු සේවයේ පිහිටු වූයේ 1994 ඔක්තෝබර් මාසයේදියි. ඊට පෙර වසර ගණනාවක් ඒ පිළිබඳව සාකච්ඡා, සම්මුතීන් ආදී සියල්ල සිදු වුණා. නමුත් හිටපු ගරු අමාත්‍ය රිචඩ් පතිරණ මැතිතුමා තමයි 1994 ඔක්තෝබර් මාසයේදී ගුරු සේවා ව්‍යවස්ථාව පිහිටු වූයේ. එතෙක් වර්ග ගණනාවක් යටතේ සිටි ගුරුවරුන් වර්ග 5කට වර්ගීකරණය කරලා වෘත්තිය වශයෙන් ලබා ගන්නා වූ නිපුණතාව මත, වෘත්තිකභාවය වැඩි කර ගැනීම මත වසරින් වසර විභාග පවත්වා උසස් වීම් ලබා ගැනීම සහ වැටුප් වර්ධක ලබා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ පදනම සකස් කරලා දුන්නා.

ගුරු හා විදුහල්පති වැටුප් විෂමතාව සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී සඳහන් වුණා. විශේෂයෙන්ම මේ ක්ෂේත්‍රයේ අද තිබෙන ප්‍රධානම ගැටලුව වන්නේ මෙයයි. මේ ගැටලුව විසඳීම සඳහා වැටුප් කොමිසම නිර්දේශ ඉදිරිපත් කරපු ආකාරයට වසරකට රුපියල් දසලක්ෂ 1,600කුත් අධිකරණය මඟින් කරන ලද නියෝගය අනුව තවත් රුපියල් මිලියන 800කුත් සමඟ රුපියල් මිලියන 2,400කුත්, ඒ වාගේම අතිරේක ප්‍රතිපාදන හැටියට රුපියල් මිලියන 3,000කට ආසන්න මුදලකුත් වැය වීමට නියමිතව තිබෙනවා. 2009 වර්ෂයේදී මේ වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට රුපියල් දසලක්ෂ 3,500ක් වෙන් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මේ වන විට යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම පෙළ පොත් ලබා දීම සම්බන්ධයෙන් කතා කරන විට 2008 වර්ෂයට අදාළ පෙළ පොත් ලබා දීමේදී-

**ගරු රේණුකා හේරත් මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரேணுகா ஹேரத்)
(The Hon. (Mrs.) Renuka Herath)
ගරු කථානායකතුමනි, පොඩි කාරණයක් පැහැදිලි කර ගන්නට මා ඔබතුමාගේ අවසරය පතනවා. ගරු ඇමතිතුමනි, ගුරු සේවයේ විදුහල්පති ශ්‍රේණියේ විභාගය සමත් වෙලා, ගුරු සේවාවේ උපරිමයට ගිහින් ඉන්න කඩ ඉම් විභාගයට වාඩි නොවුණු කට්ටියක් ඉන්නවා. මුලදී කියා තිබුණා ඒ අයට වයස අවුරුදු 45ට වැඩි නම් ඒ විභාගයට වාඩි වෙන්න අවශ්‍ය නැහැ කියා. තවම ඒ අය ගැන තීරණයක් අර ගෙන නැහැ. ඔබතුමාට මතක ඇති ගිය වර අය වැයේදීත් මා මේ ගැන කථා කළා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
එතැන වර්ග දෙකක අය ඉන්නවා. එක පිරිසක් විදුහල්පති ශ්‍රේණිවල ඉන්න අය. අනික් පිරිස තමයි ගුරු සේවයේ ඉන්න උපාධිධාරි ගුරුවරු. පුහුණු සහතිකය නැති නිසා අර වැටුප් වර්ධකය ලබා ගැනීමට තිබෙන්නා වූ බාධකය තමයි ඒ අයට තිබෙන්නේ.

**ගරු රේණුකා හේරත් මහත්මිය**
(மாண்புமிகு (திருமதி)ரேணுகா ஹேரத்)
(The Hon. (Mrs.) Renuka Herath)
මෙතැන මට තිබෙන ප්‍රශ්නය මේකයි. ගුරු සේවාවේ උපරිමයට ගිහිල්ලා විදුහල්පති විභාගය සමත් වුණත් කඩ ඉම් විභාගයට වාඩි නොවුණ නිසා වැටුප් සැකසීම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අන්න එතැනදී වයස අවුරුදු 45ට වැඩි අය ගැනවත් ඔබතුමාට මැදිහත් වෙන්න වෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගුරු සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් නම් අපි එක තීන්දුවක් ගත්තා. වයස අවුරුදු 45 පැනලා තිබෙන නිසා, ජාතික අධ්‍යාපන ආයතනයෙන් ඒ අයට මාස තුනක පුහුණුවක් ලබා දීලා ඒක ඒ කියපු විභාගයට සමාන කරලා වැටුප් වර්ධක ලබා දෙන්න කටයුතු කළා. ඊළඟ කණ්ඩායම විදුහල්පතිවරු. ඔබතුමිය කියන ආකාරයට ඒ අය සම්බන්ධයෙන් සාකච්ඡා කරලා වැටුප් කොමිසමට යොමු කර තිබෙනවා. ඒ නිර්දේශ ලැබුණාට පස්සේ ඒ අයගේ වැටුප් වර්ධක ලබා දීම සම්බන්ධයෙන් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

ගරු කථානායකතුමනි, 2009 වර්ෂයට අදාළ පෙළ පොත්වලින් සියයට හැටක් -යාපන අර්ධද්වීපයත් ඇතුළුව- මේ වන විට යවලා අවසානයි. මේ වන විට සියලුම පෞද්ගලික මුද්‍රණාලවලින් සියයට 80කට වැඩි ප්‍රමාණයක පෙළ පොත් මුද්‍රණය කර අපට ලැබී තිබෙනවා. දැන් ඒවා බෙදා හැරෙමින් පවතිනවා. ඒ වාගේම අපි ඉලක්ක කර තිබෙනවා, ලබන වර්ෂයට අදාළ පෙළ පොත් සියල්ල තුන් වන වාරයේ නිවාඩුව දීමට මත්තෙන් සෑම දරුවෙක් අතටම ලබා දීමට.

විදුහල්පති සේවයේ 2-I සිට 1 ශ්‍රේණිය දක්වාත් 2-II සිට 2-I ශ්‍රේණිය දක්වාත් උසස් වීම් ලබා දීම දීර්ඝ කාලයක් ප්‍රමාද වෙලා තිබුණා. මේ පිළිබඳව වැටුප් කොමිසමේ නිර්දේශ ලබා ගෙන, අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර එයත් අනුමත කර ගෙන, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවා තිබෙනවා. දැන් එහි අවසන් අදියරට පැමිණ තිබෙනවා. ඒ තුළින් 8,000ක් පමණ වන විදුහල්පතිවරුන්ට 2-I සිට 1 ශ්‍රේණිය දක්වාත්, 2-II සිට 2-I ශ්‍රේණිය දක්වාත් උසස් වීම් ලබා දීම සඳහා කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම විදුහල්පති සේවයේ 2-II සහ 3 ශ්‍රේණියට අදාළ විභාග පවත්වලා තිබෙනවා. 2-II ශ්‍රේණියට අදාළ විභාගයේ ප්‍රතිඵල තව සති දෙක තුනක් ඇතුළත නිකුත් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ නිසා අපි ඉලක්ක කර තිබෙනවා, මේ වර්ෂයේ ඊළඟ මාස තුන ඉකුත් වීමට මත්තෙන් විදුහල්පති 2-II සහ 3 ශ්‍රේණියේ විභාග පවත්වලා සම්මුඛ පරීක්ෂණ අවසන් කොට දැනට තිබෙන 5,800ක පමණ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට. මේවා අවුරුදු ගණනාවක් තිස්සේ ප්‍රමාද වෙලා තිබුණු කරුණු. නමුත් අපිට පුළුවන්කම ලැබුණා, ඒවා මේ ප්‍රමාණයට විසඳා ගන්න. ඒ වාගේම අධ්‍යාපන -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා විභාග ප්‍රතිඵල ගැන කියපු නිසා මේ කාරණයත් මතු කරන්න ඕනෑ. මම ඔබතුමාගෙන් කලින් දවසකත් ඇහුවා, උපාධිධාරින්ව ගුරුවරුන් ලෙස බඳවා ගැනීමට පවත්වන විභාගය ගැන. මීට මාස අටකට පමණ කලින් විභාග දෙපාර්තමේන්තුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට ඒ ප්‍රතිඵල නිකුත් කර තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
අපිට නොවෙයි, කෙළින්ම ඒ පළාත්වලටයි ප්‍රතිඵල යැවුවේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
නමුත් ඇමතිතුමා, තවම ඒ ළමයින්ට ප්‍රතිඵල ලබා දීලා නැහැ නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ප්‍රතිඵල ඕනෑ කෙනෙකුට බලන්න පුළුවන්, website එකේ තිබෙනවා නේ. Internet එකේ තිබෙනවා. මට කිහිප දෙනෙක් ඇවිල්ලා කිව්වා, "මගේ ලකුණු ගණන මෙච්චරයි" කියා. ඒ ගොල්ලන් internet එකෙන් බලා ගෙන තිබුණා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
පළාත් හතරකට අදාළව නේ ඔය තත්ත්වය තියෙන්නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්. දැනට නැඟෙනහිර පළාතේ අවසන් කළා. ඌව පළාතේ අවසන් කළා. උතුරු මැද පළාතේ අවසන් කරන්න දැන් කටයුතු කර ගෙන යනවා. සබරගමුව පළාතේ ප්‍රතිඵල දීලා තිබෙනවා. බස්නාහිර පළාතේ තිබුණේ ගිය මාසයේ 24 වන දා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ඔබතුමන්ට 700 ගණනක cadre එකක් අනුමත කර තිබෙන බවයි දැන ගන්න ලැබුණේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
කොහේද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
පළාත් සභාවලට අදාළව ගත්තොත් හත්සිය ගණනක් හෝ ඊට ආසන්න ගණනක් -සමහර විට හත්දහස් ගණනක් වෙන්න ඇති- තමයි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර තිබෙන්නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
හයදහස් ගණනක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
නමුත් ඉතිරි පළාත් පාසල් සහ මධ්‍යම ආණ්ඩුවේ ජාතික පාසල්වලට අදාළව ප්‍රතිපාදන නිකුත් කරන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නයයි මම ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
කළමනාකරණ සේවයෙන් ඒ අනුමත කිරීම කළාට භාණ්ඩාගාරයෙන් මුදල අනුමත කර ගන්න ඕනෑ. ඒ මුදල අනුමත වුණාම තමයි පත්වීම දෙන්න කටයුතු කරන්නේ. ගරු මන්ත්‍රීතුමා, දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. අපේ උපාධිධාරීන් විශ්වවිද්‍යාලයෙන් පිට වෙලා අවුරුදු දෙක, තුන, හතර ඉන්නවා. ප්‍රතිඵල දුන්න වහාම මේ අය එන්නේ පත්වීම් ගන්න. නමුත් ප්‍රතිඵල නිකුත් කරන්න වෙන්නේ දෙන තනතුරු සංඛ්‍යාවත් එක්ක. උදාහරණ වශයෙන් උතුරු මැද පළාතට 1,400 දෙනෙක් ගන්නවාය කියලා හිතමු. නමුත් 2,500 දෙනෙක් විභාගයට පෙනී සිටිනවා. එතකොට ඒ 2,500 දෙනාම මේ පත්වීම් බලාපොරොත්තුවෙන් එනවා. නමුත් 1,400 දෙනෙකුට භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන් කර ගත්තාම තමයි සියලු දෙනාට ප්‍රතිඵල නිකුත් කරලා සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
නමුත් ඇමතිතුමනි, ඔබතුමා එක දවසක් පාර්ලිමේන්තුවේදීම ප්‍රකාශ කළා ප්‍රතිඵල නිකුත් කරනවා කියා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ප්‍රතිඵල නිකුත් කර තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
මේ උපාධිධාරීන් රජයේ විභාග කිහිපයකටම ලියලා තිබෙනවා. පෞද්ගලික අංශයේ ඒවාටත් ඉදිරිපත් වෙලා ඉන්න පුළුවන්. ඒ ගොල්ලන් ජීවිතය සැලසුම් කර ගන්න පටන් ගන්න වෙලාව නේ. ඒ ගොල්ලන් හුඟක් අය අවුරුදු 28, 30, 35 මට්ටම්වල ඉන්න අය. සාමාන්‍යයෙන් ඔබතුමා කියන එක ඇත්ත වෙන්න පුළුවන්. ඔබතුමන්ලා මේකේ ප්‍රතිඵල නොදුන්නාට පසුව වන දේ තමයි-

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගන්න සංඛ්‍යාව තීන්දු කර ගෙන නේ ප්‍රතිඵල දෙන්න වෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ලකුණු දෙන්න පුළුවන් නේ. එතකොට තමන් දළ වශයෙන් දන්නවා, තමන්ගේ rank එක අනුව තමන්ට අවස්ථාවක් ලැබෙයිද කියලා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, කරුණාකර ප්‍රතිඵල නිකුත් කරන්න කියලායි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
බස්නාහිර පළාතේ විභාගය ගිය මාසයේයි පැවැත්වුවේ. ඒ හැර තව පළාත් තුනයි තිබෙන්නේ. ඒ පළාත් තුනේ ප්‍රතිඵල අපි නිකුත් කරන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ඇමතිතුමනි, ඔබතුමාට කාල සීමාව කියන්න පුළුවන්ද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
අපි දැන් ප්‍රතිඵල සූදානම් කරලායි තිබෙන්නේ. තව සති දෙකක් යන විට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ප්‍රශ්න පත්‍ර සමීක්ෂණය අවසන් වෙයි. ඊට පසුව අපි මේ ප්‍රතිඵල නිකුත් කරන්නම්. මොකද, එක දිගට විභාග ගණනාවක ප්‍රතිඵල ගොඩ ගැහිලායි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
ඔය ප්‍රතිඵල කැබිනට් එකක තිබෙනවා. අපි කියන්නේ කැබිනට් එකෙන් එළියට අරගෙන මාධ්‍යවලට දෙන්න කියලායි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
කැබිනට් එකේ නොවෙයි; පරිගණකයේ තිබෙන්නේ; දත්තවල තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)
එහෙම නම් තව පහසුයි නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්, පහසුයි. ගරු කථානායකතුමනි, මෙහිදී මා කළේ විශේෂයෙන්ම ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් කරන ලද කථාවේදී ඉදිරිපත් කරපු කරුණුවලට පිළිතුරු ලබා දීමයි.

අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් අවුරුදු 8ක් තිස්සේ නඩු කිව්වා. අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් වෘත්තීය සමිති කණ්ඩායම් අතර නඩු පැවැතුණා. ඒ නිසා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම අවුරුදු 8ක් තිස්සේ කරන්න බැරි වුණා. නමුත් මාස එක හමාරකට පමණ පෙර අධිකරණයේදී මෙය සමථයකට පත් වුණා. මේ වන විට ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කරලා, ප්‍රසිද්ධ දැන්වීම් පළ කරලා අයදුම් පත් සියල්ල කැඳවා තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් ඊළඟ මාස දෙක, තුන ඇතුළතදී අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ පත්වීම් ලබා දෙන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා.

ඒ වාගේම මෙහිදී මා සඳහන් කරන්න ඕනෑ, ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා සඳහන් කළේත් පෙළ පොත් සම්බන්ධයෙන් මේ කරුණුමයි.

ඊළඟට, මෙවර පළමු වන ශ්‍රේණියට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛන නිකුත් කරලා, මේ වන විට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම බොහෝ දුරට අවසන් වෙලා තිබෙනවා. ස්ථානීය පරීක්ෂණ සිදු වෙනවා. ඒ නිසා අප විශ්වාස කරනවා, මෙවර පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පසු ගිය වර්ෂයේ මෙන් ගැටලුවක් ඇති වන්නේ නැහැයි කියලා.

ඒ වාගේම 5 වසර ශිෂ්‍යත්වයේ ලකුණු මත මිස වෙනත් කිසිම ක්‍රමයකින්, කිසිම දේශපාලනඥයකුගේ ළමයකු හෝ වෙනත් කිසිම හිතවතකුගේ ළමයකු 6 වන ශ්‍රේණියට ඇතුළත් කරලාත් නැහැ; ඇතුළත් කරන්නත් බැහැ. ශිෂ්‍යත්ව ලකුණු මත පමණයි ඇතුළත් කරන්නේ කියා මා ඉතාම වග කීමෙන් කියනවා. එක්තරා වකවානුවක තීරණය කර තිබුණා, 6 ශ්‍රේණියෙන් ඉහළ පන්ති තිබෙන පාසල්වලට ආදි ශිෂ්‍ය සහ සහෝදර පදනමින් ගන්න. නමුත් එතැනදීත් සිදු වන්නේ අර ලකුණු මත ගන්න ළමයින්ට අසාධාරණයක් වන එකයි. ඒ නිසා අප ඒ සියල්ල නිවැරදි කර තිබෙනවා. කඩ ඉම් ලකුණු මත පමණයි, 5 වසර ශිෂ්‍යත්වයෙන් සමත් වන ශිෂ්‍යයන් කඩ ඉම් ලකුණු නියම වන පාසල්වල 6 වන ශ්‍රේණියට ඇතුළත් කරන්න පුළුවන් වන්නේ. ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා සඳහන් කළා, ගුරුකුල විද්‍යාලය සම්බන්ධයෙන්. ගුරුකුල විද්‍යාලයේ කඩ ඉම් ලකුණ 150ට අඩුයි. එතකොට ගුරුකුල විද්‍යාලය කඩ ඉම් ලකුණු නියම වන පාසලක් නොවෙයි. නමුත් ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා දැන ගෙන සිටියේ නැහැ, ඒ පාසලට කඩ ඉම් ලකුණක් නියම වන්නේ නැහැයි කියලා. ඒ නිසා මා මෙහිදී පැහැදිලිව කියනවා, කඩ ඉම් ලකුණු නියම වන කිසිම පාසලක ශිෂ්‍යත්ව ලකුණු මට්ටම මත හැර වෙනත් කිසිම ක්‍රමයකින් 6 වන ශ්‍රේණියට ඇතුළත් කරන්න බැහැ; අපි එහෙම ඇතුළත් කරන්න උපදෙස් දෙන්නේත් නැහැයි කියලා. ඒක අපි පිළිගත් ප්‍රතිපත්තිය.

ඊළඟට විද්‍යා පීඨවලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සඳහන් කළා. ගරු කථානායකතුමනි, හිටපු අධ්‍යාපන අමාත්‍යවරයකු හැටියට ඔබතුමා දන්නවා, අපේ මතකයෙන් ගත්තොත් 1960 දසකයේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ගුරු සේවයට බඳවා ගත් බව. එතකොට ආධුනික ගුරුවරුන් සිටියා; අභ්‍යාසලාභී ගුරුවරුන් සිටියා; ශිෂ්‍ය ගුරු සිටියා. මේ ආදී වශයෙන් නොයෙක් ආකාරයෙන් තිබුණා. මෙහෙම ඇවිත් ගුරු සේවා ව්‍යවස්ථාව හඳුන්වා දුන්නාට පසුව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ආසන්නම විභාගයෙන් විශ්වවිද්‍යාලයට නොතේරුණු අය ඊළඟ Z අගය අනුව තමයි, ඒ ඒ කාණ්ඩයන් යටතේ දිස්ත්‍රික් පදනමින් විද්‍යා පීඨවලට තෝරා ගත්තේ. අනික් පිරිස ගත්තේ උපාධිධාරීන්ගෙන්. දැන් මෙයින් පැහැදිලි වෙනවා, අපේ රටේත් ඉතිහාසයේ සිට පැවතුණු හැම සේවාවකටම බඳවා ගැනීමේ මූලික සුදුසුකම අද ඉහළ යමින් පවතින බව. අද ලෝකයේ දියුණු වෙනත් රටවල් ගත්තොත්, ඒ රටවල ගුරු සේවයට බැඳෙන්න මූලික සුදුසුකම උපාධියයි. ඊළඟට අධ්‍යාපන ක්ෂේත්‍රයේ අංශ ප්‍රධානියකු - sectional head - වෙන්න පශ්චාත් උපාධියක් අවශ්‍යයි කියා නීතියෙන් නියම කර තිබෙන රටවල් තිබෙනවා. අද ලෝකයේ දැනුම අවුරුදු 5කට වතාවක් දෙගුණ වෙනවා. එහෙම නම් අද ඒ ඒ විෂයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලවලින් පිටවන උපාධිධාරීන් සෑහෙන පිරිසක් ඉන්නවා. අප මේ තොරතුරු ලබා ගත්තා. එහෙම නම් මා අහන ප්‍රශ්නය මෙකයි. ඒ උපාධිධාරීන් අතරින් ගුරු සේවයට බැඳෙන්න කැමැති අය තෝරා ගෙන, ඒ අයට අවුරුදු තුනේ විද්‍යා පීඨ පුහුණුව නොවෙයි ගුරුකම පිළිබඳව, ඉගැන්වීම පිළිබඳව මාස දහඅටේ පුහුණුව ලබා දීලා, ඩිප්ලෝමාවක් ලබා දීලා ගුරුවරුන් හැටියට පත් කිරීමේ තිබෙන වරද මොකක්ද? මේ තත්ත්වය ගරු අකිල විරාජ් මන්ත්‍රීතුමාට තේරුණේ නැහැ. එතුමා ඇහුවා, උපාධියක් කළ කෙනෙකුට ආපසු විද්‍යා පීඨයක උගන්වන්නේ ඇයි කියා. උපාධියක් තිබූ පමණින් උගන්වන්න පුළුවන්කමක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමනි, මා මේ දැන ගන්නයි අහන්නේ. සරසවි පිවිසීමට නොහැකි වුණු, ආසන්නම ලකුණු ගත් අය විද්‍යා පීඨවලට ඇතුළත් කරනවා නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
එහෙමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අයට හානියක් වන්නේ නැද්ද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ අයට හානියක් වෙන්නෙත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙනම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ අයට මේ අවුරුද්දේ ගැසට් නිවේදනය නිකුත් කර අවසානයි. ඊට අතිරේකව තමයි අර උපාධිධාරීන්ව අපි බඳවා ගන්නේ. මොකද, උපාධිධාරීන්වත් විද්‍යා පීඨවල පුහුණු කර බඳවා ගන්න කොට ඉතාම හොඳ ගුරුවරයකු හැටියට පන්ති කාමරයට යවන්න අපට පුළුවන්ම තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, ගරු මන්ත්‍රීතුමනි. එතකොට මේ අය 3-II ශ්‍රේණිය නොවෙයි, 2-II ශ්‍රේණියට යන්න පුළුවන්.

**ගරු පියසිරි විජේනායක මහතා**
(மாண்புமிகு பியசிறி விஜேநாயக்க)
(The Hon. Piyasiri Wijenayake)
එතකොට ගුරුවරුන් විධියට බඳවා ගෙන තමයි පුහුණුවීම් කරන්නේ?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්. මාස 18ක පුහුණුව ලබා ඩිප්ලෝමාව දෙන කොට වැටුප් වර්ධක ලබා ගැනීමේ දී අවුරුදු හයක වාසියක් ලබා ගන්න පුළුවන්. ඊට වැඩියෙන් එනවා. ඒ නිසා මෙන්න මෙවැනි සංවර්ධනාත්මක යෝජනා තමයි අපි මෙතැනදී අරගෙන තිබෙන්නේ. මොකද, එතැනදී එක පැත්තකින් උපාධිධාරීන්ගේ තිබෙන ප්‍රශ්නය ගුරු සේවයට බඳවා ගැනීමේ දී යම් ප්‍රමාණයකින් විසඳා ගන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අධ්‍යාපනය කඩා වැටිලාද කියලා ප්‍රශ්නයක් මතු කළා. මා සංඛ්‍යා ලේඛන කිහිපයක් දෙන්නම්. 1993 අපොස සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව සමත් සංඛ්‍යාව සියයට 17.6යි. 2007 දී එය සියයට 49.1යි. 1993 අපොස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව සමත් සංඛ්‍යාව සියයට 22.6යි, 2007 දී සියයට 57යි. සාක්ෂරතාව සියයට 92.5යි. මේ වන කොට අවුරුදු 15-24 අතර වයස් කාණ්ඩයේ සාක්ෂරතාව පමණක් සියයට 96.6යි. ඒ වාගේම අවුරුදු 5 සම්පූර්ණ වෙන කොට අපේ රටේ දරුවන්ගෙන් සියයට 98ක් පළමු වන ශ්‍රේණියට ඇතුළත් වෙනවා. වතුකරය හෝ සමහර වෙලාවට ගැටුම් පවතින ප්‍රදේශවල ප්‍රායෝගික අපහසුකම් තිබෙන්නට පුළුවන්. එහෙම නැත්නම් ඒ සියයට 98ම පස් වන පන්තිය සමත් වෙලා අපේ රටේ ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කරනවා. පළමු වන ශ්‍රේණියට ඇතුළත් වන සියයට 98න් සියයට 87ක් මේ වන විට අපොස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිනවා. මේ අනුව සංවර්ධිත රටක මට්ටමට අපි ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මෙහිදී මේ කාරණය සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන කිහිපයක් පමණයි මා ඉදිරිපත් කළේ.

මා සභාවට එන්නට ප්‍රථම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාත් කරුණු කිහිපයක් සඳහන් කර තිබෙනවා. මා හිතන්නේ විභාග දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ විවාදයට අතිරේකව එතුමා සන්ධානයේ ගිවිසුම් සම්බන්ධයෙන් යම් යම්

[ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

කරුණු කිහිපයක් ප්‍රකාශ කළා. නමුත් මා ඉතාමත් කෙටියෙන් ඒ ගැන සඳහන් කරනවා නම්, විභාග දෙපාර්තමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තුවට එය කිසි සේත් අදාළ වන්නේ නැහැ. ඒ වාගේම මගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳවත් යම් යම් අදහස් පළ වුණාය කියලා මා හිතනවා. ගරු කථානායකතුමනි, මා නීති උපාධිය ලබා ගත්තේ 1982 කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන්. එම නීති පීඨයෙන් බලා ගන්න පුළුවන් මගේ උපාධි සහතිකය. ඊළඟට 1984 නීතිය අවසන් විභාගය සමත් වෙලා 1985 දී මා දිවුරුම් දුන්නා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

ගරු ඇමතිතුමනි, ඔබතුමා අනුර දිසානායක මන්ත්‍රීතුමා කළ කථාවට සම්පූර්ණයෙන් ඇහුම් කන් දුන්නා නම්-

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

නැහැ, නැහැ. එතුමා ගැන මා මොනවත් කිව්වේ නැහැ. මගේ සුදුසුකම් ටික ගැනයි මා කිව්වේ.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)

ගරු අමාත්‍යතුමාගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් ඒ තුළ තිබුණේ නැහැ. ඒ කථාව ඔබතුමා නිවැරදිව සවන් දුන්නා නම් වඩාත් හොඳයි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)

ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මා රාජ්‍ය පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධිය අවසන් කළේ 2004 වසරේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයෙනුයි. ඔබතුමාත් සිටියා, උපාධි ප්‍රදාන උත්සවයට. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔබතුමා දැන් මැදිහත් වුණු නිසා මා කියන්නට ඕනෑ, මා ඒ ලබා ගත් නීති උපාධියයි, නීතිඥ විභාගයේයි ප්‍රතිඵල හැටියට 1985 ඉඳලා 1994 දක්වා උසාවියේ නඩු සඳහා පෙනී සිටිද්දී මා වැඩිම නඩු ගණනක් පෙනී සිටියේ 1988, 1989, 1990 කියන වර්ෂවල, සමහර විට තමුන්නාන්සේලාටත් සම්බන්ධ වන්නා වූ තරුණයින් දහස් ගණනක් වෙනුවෙනුයි. පාර්ලිමේන්තු බෝම්බ නඩුවේත් එක් විත්තිකාරයකු වෙනුවෙන් මා සම්පූර්ණයෙන්ම පෙනී සිටියා. ගිවිසුම් පිළිබඳව කථා කරනවා නම්, මා එහි නීත්‍යනුකූල තත්ත්වය ගැන කියන්නට යන්නේ නැහැ. ඒ සියලු දේ පිළිබඳව මට අවබෝධයක් තිබුණු නිසා තමයි මට එදා පුළුවන් වුණේ, පාර්ලිමේන්තු බෝම්බ නඩුවේත් මා පෙනී සිටි විත්තිකරු දින 42ක් එම නඩුවට පෙනී ඉඳලා, පාපෝච්චාරණ ප්‍රකාශ 14ක් පිළිබඳව අතුරු සාක්ෂි විභාගයට ගිහිල්ලා ඒ අයව නිදහස් කර ගන්න. ඒ නිසා මා මෙහිදී සඳහන් කරන්නට ඕනෑ, අන්න එවැනි ආකාරයට අපට ගිවිසුම් පිළිබඳ අවබෝධයක් තිබෙනවා. මොකක්ද කරන්නේ කියන එක පිළිබඳව අවබෝධයක් තිබෙනවා. සදාචාරය ගැනත් අපි දන්නවා. ඒ කරුණු පිළිබඳව අපි දන්නවා. ඉතින් ඒ නිසා මම මේ වෙලාවේදී මේ පරිපූරක ඇස්තමේන්තුවට අදාළ කරුණු ගැන පමණක් කථා කරනවා. අනෙකුත් කරුණු ගැන මා සඳහන් කරන්නේ නැහැ. මොකද, ඒවා මේ වන කොට සමහර විට අධිකරණයට යොමු වෙලා තිබෙන්නට පුළුවන්. ඒ නිසා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අදාළ වන්නා වූ පිළිතුරු ලබා දෙන්නට පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගරු හසන් අලි මන්ත්‍රීතුමා මවුලවි ගුරුවරුන් සම්බන්ධයෙන් කථා කළා. මා හිතන්නේ අවුරුදු ගණනාවකට පසුව මවුලවි ගුරුවරුන් 500ක් පත් කිරීම සඳහා අපි ගැසට් නිවේදන නිකුත් කර තිබෙනවා. ඒ අනුව ඉදිරි කටයුතු සිදු වී ගෙන යනවා. ඒ වාගේම අපේ ගරු අරියනේත්‍රන් මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට පළමු වෙනි වතාවට, මා හිතන්නේ අවුරුදු 20කට පසුව නැඟෙනහිර පළාතේ උපාධිධාරින් 1,400කට ගුරු පත්වීම් ලබා දෙන්නට අපි කටයුතු කර තිබෙනවා. ඒ තරග විභාගයෙන් සමත් වුණු -ලකුණු අරගෙන තිබුණු- සංඛ්‍යාව 1,219යි. එයින් සිංහල මාධ්‍ය 195යි. 68 දෙනෙකුට ලකුණු තිබුණේ නැහැ. ඒ නිසා විභාගය සමත් වුණු උපාධිධාරින් 1,219 දෙනෙකුට නැඟෙනහිර පළාතේ පත්වීම් දෙන්න පුළුවන්කම ලැබුණා. දැන් මෙතැනදී ප්‍රශ්නයක් මතු වෙනවා. සමහර ගරු මන්ත්‍රීතුමන්ලා හිතනවා, මේ විභාගයට පෙනී සිටි ඔක්කොටම පත්වීම් දෙන්න ඕනෑය කියලා. එහෙම පත්වීම් දෙන්න පුළුවන්කමක් නැහැ. විෂය අනුව පුරප්පාඩු තියෙන්න ඕනෑ. එපමණක් නොවෙයි. මේ තරග විභාගයෙන් ලකුණු 200න් 80ක් ලබා ගෙන තියෙන්න ඕනෑ. කෙනෙක් තර්ක කරන්න පුළුවන්, තමන් ඉගෙන ගත්ත උපාධියට තියෙන විෂය නොවෙයි සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයට ආවේ කියලා. සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයට ඉගෙන ගත්ත විෂය නොවෙයි දෙන්නේ. ඒක ඇත්ත. නමුත් ගුරුවරයෙක් වෙනවා නම් සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයට ලකුණු 100න් 40ක් ගන්න පුළුවන්කමක් තියෙන්න ඕනෑ. නැත්නම් කොහොමද, අපි ගුරුවරයෙක් බවට පරිවර්තනය කරන්නේ? ගුරුවරයෙක් කියන්නේ විෂය දැනුම පමණක් නොවෙයි, විශාල දැනුම් සම්භාරයක් ඇති කර ගත යුතු කෙනෙක්. ඉතින් ඒ නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව පිළිගත්ත විභාග පටිපාටිය අනුව විභාග සමත් වෙච්ච අයට තමයි පත්වීම් දෙන්නේ. ප්‍රමාණවත් සංඛ්‍යාව නැත්නම් අපි ඊළඟට නැවත විභාගයක් තියනවා. අලුත් අයටත් ඉල්ලන්න පුළුවන්. ඒ අයට අවස්ථාව ලැබේවි. ඒ නිසා අපි නැඟෙනහිර පළාතේ ගුරු හිඟය ඉවත් කිරීමට දැනට කටයුතු කර තිබෙනවා.

ඒ වගේම EDCS එක ගැන කථා කළා. ඒක අදාළ වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට නොවෙයි. ඒක අදාළ වන්නේ සමුපකාර හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයටයි. ඒ වගේම විභාග දෙපාර්තමේන්තුව මේ පරිපූරක ඇස්තමේන්තුවලින් මුදල් වෙන් කර ගැනීම හෝ අය වැයෙන් මුදල් වෙන් කර ගැනීම පමණක් නොවෙයි කරන්නේ. විභාග දෙපාර්තමේන්තුව සහතික නිකුත් කිරීම මඟින්, ඒ වගේම වෙනත් ආයතනවල විභාග පැවැත්වීම තුළින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට වාර්ෂිකව මුදල් බැර කිරීමකුත් කරනවාය කියන එක මම මෙහිදී සඳහන් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඉතාම කෙටි වෙලාවකින් මගේ කථාව අවසන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු කරුණු කිහිපයක් සම්බන්ධයෙනුයි මේ අවස්ථාවේදී මම අවධානය යොමු කළේ. විශේෂයෙන්ම මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ විභාග දෙපාර්තමේන්තුවට වර්ෂය මැදදී සිදු වන අනපේක්ෂිත වියදම් පියවා ගෙන ඒ අවශ්‍ය පියවර ගැනීම සඳහායි. ඒ නිසා විභාග දෙපාර්තමේන්තුව නවීකරණය වෙමින්, ඒ වගේම ඒ පටිපාටිය නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක කර ගනිමින් විශ්වසනීයත්වය පවත්වා ගනිමින් කටයුතු කරනවා.

ඒ වගේම මම මේ කාරණයත් සඳහන් කරන්න අවශ්‍යයි. අපේ විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන උසස් පෙළ විභාගයේ පිළිගැනීම කොපමණ මට්ටමකට තිබෙනවාද කියනවා නම්, පසු ගිය වර්ෂයේදී අපට ලැබුණු තොරතුරු අනුව උසස් පෙළ සමත් වුණු අපේ සිසුන් 3,200ක් බ්‍රිතාන්‍ය මණ්ඩලය මඟින් - British Council එකෙන්- මහා බ්‍රිතාන්‍යයට ගිහිල්ලා තිබෙනවා; ඒ රටේ විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙලා තිබෙනවා. 3,000ක ප්‍රමාණයක් ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා තිබෙනවා. 300ත් 400ත් අතර ප්‍රමාණයක් ඇමෙරිකාවේ විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා වර්ෂයකට 7,000කට වැඩි ප්‍රමාණයක් අපේ උසස් පෙළ සමත් වන සිසුන් -හැකියාව තිබෙන අය ගෙවලා- වෙනත් රටවල විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා තිබෙනවා. මා හිතන හැටියට මේකට වෙනත් විකල්ප විසඳුමක් ලබා දීම අපි සියලු දෙනාගේම යුතුකමක් වෙනවා. අපට ඉදිරි කාලයේදී ඒවා ගැනත් සාකච්ඡා කරන්න පුළුවන්. ඒ වගේම විවිධ රටවලින් ලැබෙන ශිෂ්‍යත්ව සඳහා අපේ උසස් පෙළ විභාගය සමත් සිසුන් වර්ෂයකට 300කට

වැඩි ප්‍රමාණයක් ඒ රටවල්වලට යනවා. එහෙම නම් අපේ රටේ අධ්‍යාපනයේ මට්ටම එයින් තේරුම් ගන්න පුළුවන්. මහා බ්‍රිතාන්‍යයේ වෙන්න පුළුවන්, ඇමෙරිකාවේ වෙන්න පුළුවන්, ඉන්දියාවේ වෙන්න පුළුවන්, චීනයේ වෙන්න පුළුවන්, ඕස්ට්‍රේලියාවේ වෙන්න පුළුවන් වෙනත් රටක ද්විතියික අධ්‍යාපනය ලබපු ශිෂ්‍යයෙකුට නො දෙ වෙනි වන ආකාරයේ අධ්‍යාපනයක් අපේ රටේ ගුරුවරුන් ඒ දරුවන්ට -වෙනත් රටවල්වල විශ්වවිද්‍යාලවලට යන දරුවන්ට- ලබා දීලා තිබෙනවා. ඒ අනුව මා මෙය සඳහන් කිරීමට අවස්ථාවක් කර ගන්නවා. අපේ රටේ සමස්ත ගුරු පරපුර විසමතා තිබුණත්, අඩු පාඩුකම් තිබුණත් ඒ සියලු දේ මැද්දේ තමන්ගේ යුතුකම් කොටස ඉටු කරලා තිබෙනවා. රජයක් හැටියට මේ වර්ෂයේ දී අය වැයෙන් රුපියල් දසලක්ෂ 92,000ක් වෙන් කර තිබුණා. ඒ වගේම මෙහිදී මා මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපි ලබන අවුරුද්ද සඳහාත් ඒ ප්‍රතිපාදන වැඩි කර ගනිමින් වැටුප් විසමතාව ඉවත් කිරීම සඳහාත්, ඒ වගේම යටිතල පහසුකම් ලබා දීම සඳහාත් කටයුතු කරනවා. 2005 අග භාගයේ සිට මේ මාසය වෙන කොට -අතිගරු ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළ දී- අපි ගුරුවරු 31,000ක් අධ්‍යාපන ක්ෂේත්‍රයට බඳවා ගෙන තිබෙනවා. ලබන 13 වන දා වන විට ශිෂ්‍යභට නිලධාරීන් සහ ඉංග්‍රීසි ගුරුවරුන් හැටියට 660කට පත්වීම් ලබා දෙනවා. ඒ විශේෂයෙන් ගම්මානවල ඉංග්‍රීසි ගුරුවරුන් නැති පාසල්වලට ඉංග්‍රීසි ගුරුවරුන් ලබා දෙන්නයි. ඒ වාගේම විද්‍යා පීඨවල තවත් 260ක් සිටිනවා. භාත්ඛණ්ඩ සංගීත උපාධිය ලැබූ 63 දෙනකුට පසු ගිය අවුරුදු දෙකහමාර තුළදී පත්වීම් ලබා දී තිබුණේ නැහැ. ඒ 63 දෙනාටත් ලබන 13 වන දාට පත්වීම් ලබා දෙනවා. එතකොට තව දාහකට අධික ගුරුවරුන් සංඛ්‍යාවකට ගුරු පත්වීම් ලබා දෙනවා. රජය මේ සියල්ල කරන්නේ විවිධ ආර්ථික අපහසුකම් සහ අභියෝග මධ්‍යයේයි. මේ කරුණු සියල්ල සැලකිල්ලට අර ගෙන රජයක් හැටියට කොයි තරම් ප්‍රමාණයකින් අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා පියවර අර ගෙන තිබෙනවාද, පියවර ගනිමින් තිබෙනවාද කියන කාරණය සඳහන් කරනවා. ඒ වාගේම ගුරු ඌනතාව මේ වන විට සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් ලංකාවේ සිටිනවා. එකම ප්‍රශ්නය තිබෙන්නේ පළාත් මට්ටමින් ගුරුවරුන් ස්ථානගත කිරීමේ තිබෙන්නා වූ ඌනතාව පමණයි. අපේ රටේ රජයේ පාසල් නවදහස් හත්සිය හැටඅටක දරුවන් තිස්නවලක්ෂයකට උගන් වන්නට දැනට දෙලක්ෂ දහඅටදාහක් ගුරුවරුන් සිටිනවා. කරුණාකර බෙදා බලන්න. ගුරු ශිෂ්‍ය අනුපාතය 18 :1 ක්. සංවර්ධිත රටකටත් වඩා ගුරු ශිෂ්‍ය අනුපාතය වැඩියි. [බාධා කිරීමක්]

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
මේ ගුරු පිරිස අතර සංගීත විශාරද උපාධිධාරින් පසු ගිය උපාධිධාරි-

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
හැටතුන් දෙනෙක් සිටිනවා.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
ඒ පිරිසට නිශ්චිතව පත්වීම් ලබා දෙනවා ද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
ඉසුරුපායේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කලින් එහෙම දැනුම් දීමක් කර තිබුණා. නැවත පසු දිනයක -මීට දවස් දෙකකට කලින්- විමසද්දී-

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
වෙන්නට බැහැ. සඳුදා මා UNESCO එකට යන්න -පිටත් වෙන්නට- කලින් ඒ සියල්ල අවසන් කරලායි ගියේ.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
ඒක තමයි. ඔබතුමාගේ විශේෂ අවධානයට මේ කාරණය යොමු කරනවා. මම උපදේශක කාරක සභාවේදී මතු කරන්නම් කියා හිතා ගෙන සිටි කාරණයයි මේ විමසන්නේ. "නැවත පළාත්වලට යොමු කළා, ඒ පිරිසට විතරක් 13 වන දා පත්වීම් දෙන්නේ නැහැ" කියා දැනුම් දීමක් කර තිබෙනවා. ඒ පිළිබඳ-

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ පිරිසට පත්වීම් ලබා දෙන්නට බලාපොරොත්තු වෙන්නේ විශේෂයෙන් ගුරු ඌනතාවක් තිබෙන ප්‍රදේශවලටයි. ඒකේ යම් ප්‍රායෝගික ප්‍රශ්නයක් මතු වුණාද කියන්න මා දන්නේ නැහැ. නමුත් ඒ අයට පත්වීම් දෙන්න ප්‍රතිපත්ති තීන්දු අර ගෙන ඉවරයි.

**ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා**
(மாண்புமிகு வை.எம். நவரத்ன பண்டா)
(The Hon. Y.M. Navaratne Banda)
බොහොම ස්තුතියි. ඔබතුමා ඒ සොයා බැලීම කරන්න.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ කාරණයත් සඳහන් කරමින් මගේ පිළිතුරු කථාව අවසන් කරනවා.

මේ විවාදයට සහභාගි වූ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මගේ ස්තුතිය පුද කරනවා. විභාග කොමසාරිස්තුමාටත්, එම නිලධාරීන්ටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් ස්තුතිවන්ත වෙන අතර මෙම පරිපූරක ඇස්තමේන්තුව අනුමත කරන ලෙස මා ගරු මැති ඇමතිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි**
(மாண்புமிகு (வண.)உடவத்தே நந்த தேரர்)
(The Hon. (Ven.) Udawatte Nanda Thero)
මා ගරු ඇමතිතුමාගෙන් මේ කාරණය දැන ගන්නට කැමැතියි. දහම් පාසල් අවසාන විභාගය සමත් උදවිය යම් කිසි පත්වීමක් ලබා ගන්න කොට සහනයක් වන පරිදි අප යම් කිසි ලකුණු ප්‍රමාණයක් ලබා දුන්නා. තවම ඒක වලංගුද කියන එක දැන ගන්නට කැමැතියි. මට දැන ගන්නට තිබෙන විධියට නම් ඒක අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අහෝසි කර තිබෙනවා. එහෙම වුණාම අපේ දහම් පාසල් ටික ඇද වැටෙනවා. දරුවන් ධෛර්යවත් කරන්නට ඒ ලකුණු ප්‍රමාණය ලබා දෙනවා නම් බොහොම වටිනවා. ඒ ලකුණු ප්‍රමාණය ලබා දෙන්නය කියා මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු ස්වාමීන් වහන්ස, ඔබවහන්සේ අදහස් කරනවා ඇත්තේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේදී නේ? ඒ සහතිකවලට දෙන ලකුණු ද? අතිරේක ලකුණු ද?

**ගරු (පූජ්‍ය) උඩවත්තේ නන්ද හිමි**
(மாண்புமிகு (வண.)உடவத்தே நந்த தேரர்)
(The Hon. (Ven.) Udawatte Nanda Thero)
රැකියාවකටත් බලපානවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
රැකියා සම්බන්ධයෙන් ගරු කථානායකතුමනි, රජයක් හැටියට ප්‍රතිපත්තිමය තීන්දුවක් අර ගෙන කටයුතු කරන්නට ඕනෑ. විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමේදී ප්‍රතිශතයක් තිබෙනවා. ඒ ප්‍රතිශතය අර ජාතික මට්ටමේ කුසලතාවක් දක්වන දරුවන්ට වෙන් කර තිබෙන ප්‍රමාණයක්. ඒ අවස්ථාවලදී දහම් පාසල් සහතිකය පිළිගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තීරණයක් ගන්න පුළුවන්.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව. ගරු රවි කරුණානායක මහතායි යෝජනාව ඉදිරිපත් කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, විනාඩි පහළොවක් වැඩියෙන් කාලය ගන්නට අපට පුළුවන්කමක් නැද්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා යෝජනාවක් කරනවා. නියමිත වෙලාවට වඩා විනාඩි පහළොවක් විතර වැඩියෙන් ගත්තාට කමක් නැද්ද කියා අහනවා. ඒ ගැන ඔබතුමා එකඟද? කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන යෝජනාව සඳහායි, ඒ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විනාඩි පහළොවක් වැඩියෙන් දෙනවාය කියන්නේ, එම කාලයෙන් භාගයක් ආණ්ඩු පක්ෂයටයි අයිති වන්නේ ගරු කථානායකතුමනි. එහෙමද ඉල්ලන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මිනිත්තු 20ක් ගත්තොත් හොඳයි. මොකද ජේවීපී මන්ත්‍රීතුමෙක් කතා කරන්න සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විනාඩි දහය, දහය ගන්න. හොඳයි. එකඟයි.

# රටේ ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුවේ කාර්ය භාරය
## நாட்டின் பொருளாதாரம் பாதுகாக்கப்படுவதில் மத்திய வங்கியின் பாத்திரம்
## ROLE OF THE CENTRAL BANK IN PROTECTING THE ECONOMY OF THE COUNTRY

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you, Hon. Speaker. Sir, I rise on the Floor of the House to move an Adjournment Motion in order to discuss a very important matter that has arisen in the country today. It is in relevance to the economy of this country.

Sir, I move the following Adjournment Motion.

"The country's financial situation has been moving from bad to worse. The present Public Debt has increased 100 per cent as at what it was on 01st January, 2004.

Furthermore, from the very recent past, the Central Bank has been moving away from its non political role to being a mouthpiece of the Government.

Now there is a very severe international financial meltdown in the world as well.

Therefore, how and what would be the role of the Sri Lanka Central Bank in this background (Domestically & Internationally), especially as to how the economy will be protected and insulated. Viz.

<u>Domestically</u>

1. As to how Sakvithi Investments Limited, a Central Bank registered company went bust?
2. How much taxes were paid and reserved collected and protected by Central Bank?
3. How is the Central Bank going to ensure such situations won't arise again?

<u>Internationally</u>

1. Does the Central Bank and the Government accept that there is an international financial crisis?
2. How much of our foreign reserves were held as at 01st August 2008 and where were they invested?
3. Is it correct that the Government of Sri Lanka through Central Bank has invested money in Lehman Brothers in USA?
4. How are you going to protect the currency internationally?"

Hon. Speaker, the relevance in bringing in this Motion today is that there is a huge financial meltdown in the world and as a result Sri Lanka, one of the 212 countries in the world, is not insulated to face all the problems that are there, domestically and internationally.

Hon. Speaker, first I would start with the domestic one because it is relevant with the practical things that have taken place in this country. I wish to know whether the Central Bank of Sri Lanka, the esteemed institution which is mandated to look after the financial activities of this country, has done the basic things required of the institution because they are entrusted to look into the deposits and the well-being of the depositors when they are taken over by financial institutions. Has due care been taken in this regard?

The second one is, against the financial meltdown in the world whether the Sri Lankan Rupee is made to be stable as against the Dollar; whether domestically, action has been taken with regard to that. The third one is, whether the foreign reserves that are held by the Central Bank of Sri Lanka overseas have been invested prudently because if not it can have ramifications at a time when the dollar or foreign currency is of absolute essence to protect our currency.

So, Hon. Speaker, today the inflation is around 30 per cent. I am talking from the domestic point of view. When the Budget was presented by the Finance Minister last November, he stated that the projected revenue would be roughly around Rs. 760 billion but as at 30th August, 2008, we can see, on a proportional basis only 46 per cent of the total revenue has been earned. So roughly on that pro rata basis, the maximum that the Government could earn would be between Rs. 600 - 650 billion and if so, there is going to be a Rs.110 billion deficit. Furthermore, with the stock exchange today dropping to almost 2000 points which is roughly about a 1500 percentage drop over the last couple of weeks, Hon. Speaker, I want to know whether the Central bank is in full control of the economy at this particular moment. The reason being - අපේම ආසනය වන කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ ආසනයේ සක්විති ආයෝජන කොම්පැනිය කියා කොම්පැනියක් ලියාපදිංචි කරලා තිබුණා. දැන් පුදුමයි, මෙතෙක් මේ කෝට්ටේ තිබුණු එක රවි කරුණානායක නමට ගැවුණේ නැති එක. ගරු කථානායකතුමනි, අපේ ලක් එකට අද ලොකුවට තිබෙනවා ජනාධිපතිතුමාගේ ඡායාරූපයක්. ඊට පස්සේ මර්වින් සිල්වාගේ ඡායාරූපයක් තිබෙනවා. මෙතැනදී මම "නම්" කියන්න කැමැති නැහැ. නමුත් ඇමතිවරුන් හතර දෙනකුගේ ඡායාරූප තිබෙන නිසා රවි කරුණානායක ඒකට දමන්න බැරි වුණු නිසා තමයි සක්විතිගෙන් මම බේරුණේ. ඉතින් දෙවියන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඒක එහෙම වුණාට.

දැන් මොනවාද වෙලා තිබෙන්නේ? අහිංසක තැන්පත්කරුවන් 7,800ක් ඉන්නවාලු. ඒ කොම්පැනියේ රුපියල් මිලියන 1,800ක් ආයෝජනය කර තිබෙනවා. පොලිසියේ අය සාමාන්‍ය රැකවරණය දෙන්න ඉන්න අයයි. ඒ අයගෙනුත් 29 දෙනකු මහන්සියෙන් හම්බ කරලා තිබෙන සල්ලි එතනට දාලා තිබෙනවා. ඒ වාගේම ඩීඅයිජීලා දෙදෙනකුගේ සල්ලි එතැන තිබෙනවාය කියා අපට වාර්තා වෙලා තිබෙනවා. මෙවැනි දේවල් වනවාය කියලා අප පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි උදේ පාන්දරට සමහර වෙලාවට ඔබතුමා තරහ ගස්සමිනුත් ප්‍රශ්න අහන්නේ රට වෙනුවෙනුයි. නමුත් අද පෙනෙනවා ඒ ප්‍රශ්න අහන එකේ වටිනාකම මොකක්ද කියලා. මෙවැනි අවස්ථාවක මම කියන්න කැමැතියි, මෙන්න මේ කාරණය. එදා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ මමත්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත්, ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් සිටින අවස්ථාවේදී අප ඇහුවා මෙවැනි ආයතන කොහොමද යම් විධියකින් රැකවරණයක් දෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ඇති කරන්නේ කියලා. මම ඒක ඒ verbatim report වලින්ම කියවන්නම්. නමුත් ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේකට පදනම මොකක්ද? මෙවැනි තැන්, මෙවැනි ආයෝජන කොම්පැනි බිහි වෙන්නේ යම් ප්‍රශ්නයක් නිසායි. රටේ උද්ධමනය සියයට 30ක් තියා ගෙන හිඳිමින් යම් විධියකින් Treasury Billවලට පොලිය සියයට 19ක් දෙන අවස්ථාවේදී අපේ රටේ බැංකුවල සාමාන්‍ය ඉතිරි කිරීම්වලට දෙන පොලී ප්‍රමාණය තවම සියයට හයයි. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ, ඔබතුමාත් අපත් ඇමතිවරුන් වශයෙන් කටයුතු කරන කාලයේ රටේ උද්ධමනය තිබුණේ සියයට හතරයි. රටේ ඉතිරි කිරීම්වලට සියයට හතක පොලියක් අප දුන්නා. ඒ කාලයේ Treasury Bill වලට සියයට හයක පොලියක් දුන්නා. ඒ දෙන නිසා කිසි ආර්ථික අර්බුදයක් ඇති වුණේ නැහැ. නමුත් අද මෙතරම් උද්ධමනකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙන අවස්ථාවක ඉතිරි කිරීම්වලට තවමත් සියයට හයක පොලියක් ගෙවන අවස්ථාවකදී මොකක්ද සිද්ධ වන්නේ? ජනතාව අනිවාර්යයෙන්ම බලා ගෙන ඉන්නවා. ජනතාවගේ - ඒ කියන්නේ negative return එකක්. - ඉතිරි කිරීම්වලට වැඩිය වියදම් කරන්න වන විධියේ මාර්ගයක් ඇති කරනවා. ඉතින් එවැනි දේවල් නිසා තමයි සක්විති රණසිංහ වගේ පුද්ගලයන් - ඒ වගේ හොරු ටික - එකතු වෙලා අන්තිමට අහිංසක දුප්පත් ජනතාවගේ සල්ලි පාවිච්චි කරන්නේ. අද කොහෙද ඉන්නේ මේ අය?

ඉතින් මේ වාතාවරණය සාමාන්‍ය company ඇති කරලා තිබෙන දෙයක් නොවෙයි. රජයක මූල්‍ය පරිපාලනයේ දුර්වලතාවක් තිබෙන නිසා තමයි, - monetary policies have been very lackadaisically used. - එතැන ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි මෙවැනි දේවල් ඇති වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් කියනවා, සුදු සහ කළු මුදල් ව්‍යාපාරයක් - black money and the white money - තිබෙනවාය කියා. ඒකෙදී සියයට තිස්පහක්, සියයට හතළිහක් මුදල් තිබෙන්නේ කළු මුදල් ව්‍යාපාරය තුළයි. ඒක මේ ලංකාවේ විතරක් නොවෙයි එංගලන්තයේ වුණත් සියයට තිස්පහක් තිබෙනවා. ඉතින් ඒක නරක දෙයක් නොවෙයි. නමුත් ඒ සම්බන්ධයෙන් හරියාකාරව පරිපාලනයක් ගෙන යන්න අවශ්‍යයි. මේ රටේ මුදල්වලින් සියයට තිහක්, සියයට හතළිහක් අතර ප්‍රමාණයක් ඒ තුළ තිබෙනවා. ඉතින් එහෙම තිබෙන අවස්ථාවේදී අප පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව තුළින් මේ ගැන කරුණු අහලා තිබෙනවා. ඒ නිසා අප අහනවා මොනවාද මේ සම්බන්ධයෙන් කර තිබෙන්නේ කියා.

මා මේ අවස්ථාවේදී නැවතත් ගරු කථානායකතුමාගේ පිහිට පතනවා. මගේ කාල වේලාව ඉතිරි කර ගන්න ඕනෑ නිසා මා මේ Annex 2 **හැන්සාඩ්** ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

මෙහි සඳහන් වනවා, commercial banks' average weighted deposit rate කියා. එය 2000 වර්ෂයේ සියයට 9.89යි; 2003 වර්ෂයේ සියයට 5.27යි; 2004 වර්ෂයේ සියයට 5.31යි; 2005 වර්ෂයේ සියයට 6.2යි; 2007 වර්ෂයේ සියයට 10.31යි. නමුත් බැංකුවලින් කීයක් ගෙවනවා ද? ජාතික ඉතිරි කිරීමේ බැංකුව සියයට 6.7යි. ලංකා බැංකුව සියයට 5.3යි. මහජන බැංකුව සියයට 5.8යි. අපි මීට පෙර අහලා තිබුණා, රජයේ බැංකුවක් අහිංසක දුප්පත් ජනතාවගේ ඉතිරි කිරීම්වලට මෙතරම් ප්‍රමාණයක් ගෙවනවා නම් ඇයි උද්ධමනය සියයට 30ක් තිබෙන අවස්ථාවක

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

[ගරු රවි කරුණානායක මහතා]

මේ වගේ දෙයක් කරන්නේ කියලා? ඒ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර මහතා අපට කිව්වේ මොකක්ද? එය verbatim report එකේ තිබෙන නිසායි මා කියන්නේ. ඔහු කිව්වේ කිසිම භයක් නැතිව සියයට 5.7ක් ගන්න පුළුවන්ය කියායි. යම් විධියකින් ඊට වඩා වැඩි පොලී ප්‍රමාණයක් ලබා ගන්න අවශ්‍ය වන විට භයක් ඇතිව වෙනත් තැනකට යන්න ඕනෑය කියා කිව්වා. ඒකයි කිව්වේ. නමුත් එය හේතු සහගත උත්තරයක්ද?

මේ අවස්ථාව වන විට මේ රටේ උද්ධමනය කොපමණ ද කියන එක මා වාර්තා කරන්න කැමැතියි. 2008 ජනවාරි මාසයේ සියයට 16.4ක්ව තිබුණු අගය සියයට 28 දක්වා වැඩි වී තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ බව සඳහන් ලේඛනය ඔබතුමාගේ අවසරය මත මා **සභාගත*** කරනවා.

2005 ජූනි මාසයේ 01 වැනි දා එවකට Monetary Board එකේ හිටපු රොද්‍රිගු මහතාට මා කිව්වා, "investment companies තුළ ආයෝජනය කරන සාමාන්‍ය ජනතාවට මහ බැංකුවේ රැකවරණයක් දෙන්න යම් විධියක විධිවිධානයන් පාවිච්චි කර තිබෙනවාදැයි කරුණාකර අපට කියන්න" කියා. එතුමා කියා තිබෙන්නේ මොකක්ද? "මේ අවස්ථාවේදී එවැන්නක් සිදු කර නැහැ. නමුත් අපි ඉදිරියට කටයුතු කරනවා" කියන පොරොන්දුව අපට දුන්නා. නැවත ඒ අය 2006 ජූලි මාසයේ 19 වැනි දා ආවා. අප නැවත ඇහුවා Mrs. Jayamahaගෙන්. ඊට පස්සේ මා අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගෙන් - Governorගෙන් - බොහොම ඕනෑකමින් මෙහෙම ඇහුවා. මා quote කරනවා, from page 27 of the verbatim report of the COPE dated 19th July, 2006.

> "Hon. Minister, when you were the Chairman of the COPE you have been saying that there are a lot of companies who are borrowing money on the pretext of having this company."

I was referring to an investment company. In the report I ask further, I quote:

> "Is it more deteriorated? For flimsy reasons they were collecting money. I think we brought it to your attention......"

We brought to his attention that there is a general perception that there are companies operating on the basis of investment companies which have not been registered at the Central Bank. ඊට පස්සේ අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා අපට දුන් උත්තරය, "ඔව්, මේක බොහොම හරි. මාස දෙක තුනක් යන්න ඉස්සෙල්ලා අප මේ සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට වාර්තා කරන්නම්" කියායි. මේ කියන්නේ 2006 ජූලි මාසයේයි. මේවාට සම්පූර්ණයෙන් රැකවරණයක් දෙන්න පුළුවන් විධියට අප වැඩ කටයුතු කරනවාය කිව්වා.

ඉන් පසුව අප මේ සම්බන්ධයෙන් නැවත ප්‍රශ්න කළේ 2006 දෙසැම්බර් මාසයේදීයි. ඒ අවස්ථාවේදීත් අපි අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගෙන් ඇහුවා, "මේ සම්බන්ධයෙන් වැඩ කටයුතු කර තියෙනවාද" කියා. "නැහැ" කිව්වා. නැහැයි කිව්වාට පස්සේ දැන් සක්විති රණසිංහ වගේ පුද්ගලයන් අහිංසක ජනතාවගේ රුපියල් මිලියන 1,500ක පමණ මුදලක් සම්පූර්ණයෙන්ම ව්‍යාංගයෙන් අරගෙන තිබෙනවා. අන්තිමට අද වෙලා තිබෙන්නේ මුදල් ආයෝජනය කළ අය අසරණ තත්ත්වයට පත් වීමයි. ඒ ප්‍රශ්නය ඇති වුණාට පස්සේ අජිත් නිවාඩ් කබ්රාල් වගේ පුද්ගලයන් මොනවාද දෙන උත්තර? මා මේ උපුටා ගන්නේ 2008 ඔක්තෝබර් 03 වැනි දා "ලංකාදීප" පත්තරයෙන්. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "වැඩි පොලියක් ලබාගැනීමේ කෑදරකමට එවැනි ස්ථානවල මුදල් ආයෝජනය කර තිබෙන පුද්ගලයින්ගෙන් වැඩි පිරිසක් කූට උපක්‍රම, ත්‍රස්තවාදී ක්‍රියා හෝ නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මුදල් උපයාගත් පුද්ගලයන් බව පරීක්ෂණවලදී තහවුරු වී තිබෙන බවද මහ බැංකු අධිපතිවරයා කීය."

2006 ජූනි මාසයේ ඉඳන් අපි කියනවා "මේ වගේ හොරු ඉන්නවා. එවැනි හොරු සිටින අවස්ථාවක ජනතාව ආරක්ෂා කිරීම මහ බැංකුවේ යුතුකමක්" කියා. ඔහු කිව්වා මාස දෙකකින් අවශ්‍ය කටයුතු කරනවාය කියා. එහෙත් ඒ මුදල් වංචාව සිදු වුණාට පසුව දෙන උත්තර බලන්න.

මේ දවස්වල ශ්‍රේෂ්ඨාධිකරණයෙන් බොහොම සෘජු තීන්දු දී ගෙන යනවා. වැදගත් ස්ථානයකට නායකත්වයක් දෙන මේ වගේ නිලතල දරන අය දැන ගන්න අවශ්‍යයි මෙවැනි දේ කීමෙන් අන්තිමට සිදු වන්නේ කුමක්ද කියා. බැරි වෙලාවත් එයින් එක් කෙනෙක් උසාවිය ඉදිරියට ගියොත් මොන වගේ උත්තරයක්ද ලබා ගන්න පුළුවන් වන්නේ?

ගරු කථානායකතුමනි ඔබතුමා දන්නවා ඇති, සමහර අය ගෙවල් විකුණලා ඒ මුදල් තැන්පත් කර තිබෙනවා. සමහර අය තම දරුවන්ට ඉදිරියේදී හොඳින් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් වන විධියට මාසයකට සියයට පහක්, හයක් පොලිය ලැබෙනවාය කියන පොරොන්දුව මත මුදල් තැන්පත් කර තිබෙනවා. සමහර අය operationවලට ගෙවන්න තිබුණු සල්ලි තැන්පත් කර තිබෙනවා. අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? ආණ්ඩුව අද මේ සම්බන්ධයෙන් මොනවාද කරන්න තිබෙන්නේ? ආණ්ඩුවේ වග කීමක් තිබෙනවා නේද?

මේවා ගැන කථා නොකළා නොවෙයි. මේවා ගැන කථා කරලා තිබෙනවා. 2008 ජූලි මාසයේ 30 වැනි දා ශාන් වික්‍රමසිංහ මැතිතුමාත්, හඩ්සන් සමරසිංහ මැතිතුමාත් මේ ගැන අසා තිබුණා. ඒ රේඩියෝ වැඩ සටහන අහන නිසායි මා එහෙම කිව්වේ. ඒ ගොල්ලෝ මේ ගැන අහලා තිබුණා. "මෙවැනි අය මාසයකට සියයට හයේ, හතේ පොලියක් දෙනවා, ජනතාවට එහෙම දෙන්නේ කොහොමද? ඒ ගොල්ල කුඩුකාරයෝද, හොරුද?" කියා අහලා තිබෙනවා. ඒ අහලා තිබුණේ ජූලි මාසයේ 30 වැනි දායි. මේවා නොතකා සිටීම නිසා අන්තිමේදී අහිංසක අය සම්පූර්ණයෙන් නැත්තටම නැති වෙලා තිබෙනවා. අද මිනිස්සු මේ සම්බන්ධයෙන් කතා කරන්නේ නැහැ. ඇමතිවරු 110ක් ඉන්නවා, අද මේ ගැන කතා කරනවාද? බිත්තියේ එල්ලා තිබුණු එක marketing tool එකක් වශයෙන් පාවිච්චි කළා. ඒ අය එහෙම බිත්තියේ එල්ලා තියලා, මෙන්න අපි ඡන්දවලට සල්ලි දුන්නාය කියන පදනමින් තමයි අද ඒ අහිංසකයන්ගේ සල්ලි අරගෙන තිබෙන්නේ.

අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා එදා එහෙම කිව්වාට පසුව දැන් මෙහෙම කියනවා.

Sir, I quote from "The Bottom Line" online edition of Wednesday, 08th October, 2008. It states:

> "Finance Act to revamp to get tougher on fraudsters"

After the horse has bolted, they are trying to bring in regulations for rectification. This is the normal principle followed in this country whether it is with regard to a VAT fraud or whatever.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි. 2008 ඔක්තෝබර් 04 වැනි දා "දිවයින" පුවත් පතේ මේ විධියට පළ වෙලා තිබෙනවා:

> "පසු ගිය වසර දෙකක කාලය තුළ ලියාපදිංචි බැංකු සහ මූල්‍ය ආයතන පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට රුපියල් කෝටි 450ක් වැය කළා."

අවුරුදු දෙකකට දවස් 730ක් තිබෙන නිසා මේ රුපියල් කෝටි 450, දවස් 730න් බෙදුවාම එක දවසකට මිලියන 6ක් වියදම් වෙනවා. ඒ කියන්නේ මෙන්න මේ වගේ හොරු ඉන්නවාය කියා ජනතාව දැනුවත් කරන්න දවසකට ලක්ෂ 60ක් වියදම් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, දවසකට ලක්ෂ 60ක් වියදම්

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

කරලා මේ වාගේ දෙයක් කරන්න අවශ්‍යතාවක් තිබෙනවාද? ඒත් එහෙම කරලා තිබෙනවා. මොකටද මේ දැනුවත් කර තිබෙන්නේ? මේ වියදම් කර තිබෙන්නේ කාටද? මේවා දීලා තිබෙන්නේ තමන්ගේ දේශපාලන පත්තරවලටද? නැත්නම් ජනතාව මේවා නොදන්නේ ඇයි? මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කිරීම නිසා තිබෙන හොඳ සිතිවිල්ලත් සම්පූර්ණයෙන් නැතුව යනවා නේද කථානායකතුමනි. අපි අහන්නේ රජය මේ සම්බන්ධයෙන් මොනවාද කරන්නේ කියායි.

සැප්තැම්බර් මාසයේ 28 වැනි දා තවත් පුවත් පතක මේ විධියට පළ වී තිබුණා. "හොර මූල්‍ය ආයතනවල දැන්වීම් පළ කිරීම මාධ්‍ය ආයතනවලට තහනම්." මහ බැංකුව එවැනි නියෝගයක් කර තිබෙනවා. Banking Supervision Section එකේ Mr. Attanayake නමැති පුද්ගලයෙක් කියා තිබෙනවා, "අපි Monetary Board එක දැනුවත් කර තිබෙනවා"ය කියා. Monetary Board එක මේ විධියට කියා තිබෙනවා, "Please note that there are companies that are duping people and ensure that we take action on this". ඒත් ඒ සම්බන්ධයෙන් කිසිම කතාවක් කරලා නැහැ. අපි මහ බැංකුවෙන් අහන්නේ දැන් මොනවාද මේ අයට කරන්නේ කියලායි. ආණ්ඩුවේ වැඩ කරන කෙනෙකු අතින් රුපියලක්, දෙකක් එහෙ මෙහෙ වුණාම, ඒ අය රිමාන්ඩ් භාරයට අරගෙන කොතරම් හිරිහැර කරනවාද? මේ පුද්ගලයා රටින් පිටට ගිහින් තිබෙන්නේ ඇමතිවරයකුගේ උදවු ඇතිවය කියා මට ආරංචියි. එහෙම නම් ගිහින් තිබෙන්නේ කොහේටද? මහ බැංකුව නොදන්නවාද? Investment companiesවලින් tax ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. කීයක් ගෙවා තිබෙනවාද? ඒ වාගේම ඒ investment companiesවල ආයෝජනවලින් යම් කිසි ප්‍රතිශතයක් සුරැකුම් පත්වල තියා ගන්න අවශ්‍යයි. කොතරම් ප්‍රමාණයක් තිබෙනවාද? එහෙම කරලා නැත්නම් එහෙම කරලා නැත්තේ ඇයි කියන ප්‍රශ්නය මතු වෙනවා නේද? ආණ්ඩුවේ ඇමතිවරුන් 110කින් දැන් මෙතැන ඉන්නේ එක් කෙනායි. දැන් මේ වාගේ අවස්ථාවක මට උත්තර දෙන්න රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා ඉන්නවාද? කවුද මේකට උත්තර දෙන්නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)

මම ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

කනගාටුයි. එතුමාගේ seat එකේ level එක පහළ නිසා මා එතුමා දුටුවේ නැහැ. මා ඒ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරනවා. එතුමා ඉන්නේ වෙනත් ආසනයක කියායි මා හිතුවේ. එතුමා ඉස්සරහ ආසනයක ඉන්න ඕනෑ පුද්ගලයෙක් නේ. ගරු ඇමතිතුමනි, මාධ්‍ය ප්‍රචාර සඳහා දවසකට රුපියල් ලක්ෂ 60ක් වියදම් කරනවාය කියා තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**

(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)

(The Hon. Ranjith Siyambalapitiya)

මගේ කතාවේදී මා එය පැහැදිලි කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා දැන් මේ අය සම්බන්ධයෙන් මොනවාද කරන්නේ? ප්‍රමුඛ බැංකුවේ මෙවැනි ප්‍රශ්නයක් ඇති වුණා. කිසිම සෙතක් වුණේ නැහැ. සාමාන්‍ය බැංකුවක් ඇරියා. නමුත් ඒකෙන් තැන්පත්කරුවන් සියයට 10කට වඩා සෙතක් ලැබිලා නැහැ. නොම්මර ප්‍රමාණය ලැබිලා තිබෙනවාය, නමුත් මූල්‍ය ප්‍රමාණය ලැබිලා නැහැයි කියන එක අද ප්‍රසිද්ධ රහසක් වෙලා තිබෙනවා. Sakvithi Investments Limited සම්බන්ධයෙන් මා නම්, ගම් පාවිච්චි කරලා කතා කරන්න කැමැති නැහැ. මොකද, පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධයෙන් කතා කරන්න ඒ අයට අවස්ථාවක් නැති නිසා. නමුත් "සක්විති රණසිංහ" කියන හොරා ගැන කතා කරන්න අවශ්‍යතාව තිබෙනවා. ඒ නම විතරයි තිබෙන්නේ. ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියා අපි අහනවා. නමුත් අභ්‍යන්තර ප්‍රශ්නයක් -

**ගරු ලලිත් දිසානායක මහතා**

(மாண்புமிகு லலித் திஸாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

පොඩි පැහැදිලි කිරීමක් තිබෙනවා. පිරමිඩ ක්‍රමය තහනම් කරන්න මහ බැංකුවෙන් කටයුතු කරලා ඒ සම්බන්ධයෙන් දැන් නඩු පවරා තිබෙන බව ඔබතුමාත් දන්නවා. ඊයේ, පෙරේදාත් කුරුණෑගල ප්‍රදේශයේ කිහිප දෙනකු අත් අඩංගුවට ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් යම් කිසි ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවාය කියන එක ඔබතුමා දන්නවාද?

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

නැහැ. මා දන්නේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**

(மாண்புமிகு லலித் திஸாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

අර pyramid system එක ගැන කුරුණෑගල, ගොකරැල්ල ප්‍රදේශයේ සමහර අයට විරුද්ධව නඩු පවරා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

මන්ත්‍රීතුමනි, pyramid system එක උඩ තමයි අජිත් නිවාඩ් කබ්රාල් ඉන්නේ. Pyramid system එක පටන් ගත්තේ එතුමායි. එතුමා මහ බැංකුවට ගියාට පසුව ඒක නැවැත්වූවා. අපි නොදන්නවා නොවෙයි. ඊට පසුව ඒ සම්බන්ධයෙන් එක් කෙනෙක්වත් ඉදිරිපත් වී තිබෙනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**

(மாண்புமிகு லலித் திஸாநாயக்க)

(The Hon. Lalith Dissanayake)

ඔබතුමා කිව්වා නේ, රජය හෝ මහ බැංකුව කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැයි කියා.

**ගරු රවි කරුණානායක මහතා**

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

මා කථා කරන්නේ පිරමිඩ සම්බන්ධයෙන් නොවෙයි. මතක තබා ගන්න. ඒ දෙක පටලවා ගන්න එපා. බැංකු ක්ෂේත්‍රය අනුව කිව්වොත් -

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මහ බැංකුව කිසිම පියවරක් අරගෙන නැහැයි කියා ඔබතුමා කිව්වා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මන්ත්‍රීතුමනි, කරුණාකර පස්සේ උත්තර දෙන්න. මා කියා තිබෙන්නේ, මේ ආයෝජන කොම්පැනි සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙන නැහැ කියලායි. ඒ සම්බන්ධයෙන් පියවර ගෙන තිබෙනවාද කියා කියන්න. නැහැ නේ. පිරමිඩ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස්. බැංකු ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් වෙනස්. Finance Ministry එක යටතේ එහෙම කොටස් කරලා තිබෙනවා. මේ මහ බැංකුවේ සියලුම departments වෙන වෙනමයි තිබෙන්නේ. මූල්‍ය අංශය ගැන දන්නවා නම් එහෙම කථා කරන්නේ නැහැ. පිරමිඩ ක්‍රමය මේ රටේ නීත්‍යනුකූල දෙයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඒ අය උසාවියට ගෙන යන්න අවශ්‍ය නැහැ; කෙළින්ම හිර ගෙදරට ගෙන යන්න අවශ්‍යයි. කරුණාකර ඒක දැන ගන්න.

Then, I get on to the international scene, Hon. Speaker. I moved away from the domestic sector because Sakvithi Investment Limited has created a huge uproar and impacted on the hearts and minds of many people today. Some of them have even gone insane owing to the fact that amidst a bad economic crisis their situation has become worse.

Hon. Speaker, I would like to take this even further. Why has this situation been created? This Government has decided, owing to the fact that they do not want conditional loans and they are financially taking the system on, to go for international borrowing on syndicated loans, on commercial loans. Now I table* a printed copy of a news item that appeared in "The Bottom Line" online edition on the 08th of October, 2008 under the headline "Lanka foregoes $ 468.4 m from WB".

ගරු කථානායකතුමනි, ඒ කියන්නේ ලෝක බැංකුවේ සාමාන්‍යයෙන් සියයට දශම 5, සියයට දශම 25 පොලියට ණය ගන්න එක අහෝසි කරලා, ඒක අමතක කරලා, US Dollars 468 million එපැයි කියා අපි යනවා, HSBC එකට; අපි යනවා, Standard Chartered Bank එකට. එතැන සියයට 10, සියයට 11 පොලියට ණය ගන්නවා. ඉතින් මේක හෙණ ගහන අපරාධයක් නොවෙයිද? අපට කියන්න, මේ වාගේ දේවල් කරන්නේ ඇයි කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ වෙන්න පුළුවන්; 1994 සිට 2000 දක්වා පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩු කාලයේ වෙන්න පුළුවන්; ඒ ලබා ගෙන තිබෙන මුදල් ප්‍රමාණය පාවිච්චි කරලා නැත්තේ ඇයි?

Then, I also table* a copy of the news item that appeared in "The Bottom Line" online edition of 8th October, 2008 which shows that a US Dollars 300 million syndicated loan is being looked at by the Government of Sri Lanka.

What is the requirement? You look at the HSBC loan. We pointed out in this House the inimical effects of taking such US Dollar loans. One thing we said was that - you are going for dollar borrowing - when your internal resources and the internal financial controls are weak, please do not expose ourselves to the foreign world because the vicissitudes that take place in the currency-adjusting factors can make or break a country. You do not need to feel shy about Sri Lanka when banking institutions in many countries like the United States, Pakistan - technically, Pakistan has gone default at the moment - and Iceland have gone bankrupt. Lehman Brothers Bank in the USA has gone bankrupt. US Dollars 700 billion has been approved by the Congress and the Senate in order to stimulate the US economy. The Central Bank of Hong Kong has reduced their interest rates. Likewise, Australia, for the first time, has reduced one and a half per cent over the last three days and in the United Kingdom, the Bank of England has stepped in to support inter-bank borrowing because the situation is so volatile.

Hon. Speaker, amidst this, does the Governor of the Central Bank, in his naivety, have the audacity to say that this country is not having an economic problem? We would like to say that after all one person's judgment can affect 20 million people's future. That is what is happening. We would like to know as a responsible Opposition what necessary steps have been taken to insulate the economy domestically and internationally. The reason why I referred to the HSBC loan was to point out that today we are paying a fixed rate of 8.25 per cent on a dollar borrowing. It was based on the Federal Reserve Rate plus 3 per cent and fixed at that. Today the Federal Reserve Rate has dropped from 5 per cent to 1.5 per cent. Yet, we are paying at 8.5 per cent.

Then, look at the Norochcholai Coal Power Plant Project. The Hon. Minister of Finance in reply to a question raised in Parliament stated that there are two Trans Loans which have been taken. One is, US Dollars 300 million at 2.5 per cent and the next one is US Dollars 155 million at 8 per cent plus 0.3 per cent per year. That works to 10.4 per cent. US Dollars 50 million has been taken from the ICICI Bank and US Dollars 270 million has been taken from the Standard Chartered Bank.

Today, the London Inter Bank Offered Rate has reduced from 5.83 to 4.85 per cent. The premium rate has gone up now that no bank will lend to Sri Lanka at anything less than 11 per cent. When you look at the Central Bank and its financial syndicated loans, are we not

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

heading into a death trap? Today, the amortization factor is so high that last year's total revenue was Rs 770 billion. The amortization factor was Rs. 685 billion. That is, interest plus capital factor. Then, how is the Government going to ensure that protection is given to the country and to the citizens? This is where the tiger has been caught by the tail. Now, at this particular moment we are wondering as to how we can go forward?

Another action that has been taken by the Central Bank is the Futures Trading market. Three months ago the price of a barrel of petrol was US Dollars 146. At that particular point, the rates changed and today the rate has dropped to US Dollars 88 per barrel. But, unfortunately our rates cannot be reduced for the simple reason that this Government has decided to go for Futures Trading. They have gone for Futures Trading with the Standard Chartered Bank and the City Bank and they have committed this country till February - March 2009 at the rate of US Dollars 138. Has it been done through a tender? Has it been done through a Cabinet decision? If not, who is held responsible for this? US Dollars 138 as opposed to US Dollars 88 today! Who is paying the difference? It is the consumer who is paying that and that is why the Hon. Minister Fowzie is unable to reduce the oil prices.

Furthermore, the agreement according to the Futures Trading is that, when the rates go up to US Dollars 138, there is a cap; that if the prices go beyond a certain point, the maximum profit that the Petroleum Corporation can make is Rs. 1.5 billion. But, when it comes down from US Dollars 138 to US Dollars 88, there is no cap to take advantage of that particular benefit. So, as a result what has happened is that, today the price of a barrel of petrol is US Dollars 88 but we will be paying US Dollars 138 per barrel till next February or March. I am made to understand that only 50 per cent of the purchasing has been hedged and when it comes down, you have got to buy not only the quantity but twice the quantity that has been mentioned, so that you make a double impact. To whom are we giving this money? The Standard Chartered Bank.

මේකේ අන්තිමට අද වෙලා තිබෙන්නේ මොකක්ද? ලෝක වෙළෙඳ පොළේ plug එක ගලවනවාය කිව්ව කට්ටියට අද ගිහිල්ලා ලෝක වෙළෙඳ පොළේ plug එක අතින් නොවෙයි, ඇඟිලිවලින් නොවෙයි, මුළු ඇඟෙන්ම බදා ගන්න සිදු වෙලා තිබෙනවා. මේක තමයි වෙලා තිබෙන්නේ. කෝ ඒ අය? මට තවම මතකයි, එදා ලෝක බැංකුවෙන් සියයට භාගයට ණය ගන්න විට ජනතා විමුක්ති පෙරමුණේ කට්ටිය කෑ ගැහුවා. එදා ඒක අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයක්ය කිව්ව කට්ටිය අද සියයට 10ට ඇමරිකාවෙන් ණය ගන්න විට මොනවාද කථා කරන්නේ? මේක තමයි අද තත්ත්වය. රටේ ආර්ථිකය ගැන කිසිම අවබෝධයක් නැතිව, දැනුමක් නැතිව යම් අය කෑ ගැහුවා. අද ඒ අය ඒ පක්ෂයේවත් නැති කට්ටියක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් රටට ඒ හෙණය ඇද ගෙන යන්න වෙලා තිබෙනවා. සියයට භාගයට ණය ගන්න හදන විට බෝඩ් ලෑලි අල්ලා ගෙන හිටියා. මේ රටින් ඒ කට්ටිය පැන්නුවා. අද ගිහිල්ලා සියයට 12ට 13ට ණය දෙන කට්ටිය බදා ගෙන මේ රටට ගෙන්වා ගන්න හදනවා. කෝ ජාතිකත්වය? ඇයි, රටින් අඩු පොලියට ගන්නේ නැත්තේ? ගරු කථානායකතුමනි, මේක තමයි අපි කාරුණිකව කියන්නේ. විපක්ෂයේ හිටියත් අපි රට වෙනුවෙන් කථා කරනවා. මේ අවස්ථාවේදී අපට කියන්න පුළුවන් එකම දේ තමයි කරුණාකර අපි ජාත්‍යන්තර වශයෙන් - Domestically and internationally we must ensure that our currency - the value of the rupee - is protected. Please ensure that we have a solid stand. We should go forward on that basis to have a better tomorrow. Remember the world is in turmoil. Financial melt-downs are taking place all over the world. Today, even the FTSE has almost lost about 300 points. The Colombo Stock Exchange, with yesterday's verdict on the Waters Edge land issue, will have an financial impact. Wherever there are corrupt deeds , they need to be corrected. That is what the Supreme Court says. We, the United National Party, will ensure at this moment and will go on record as well, that every single corrupt deal will be corrected and brought before the people.

So, we tell all investors that this is an open situation. The Supreme Court has given a very clear mandate. Every single corrupt deal will be revealed in order to protect tomorrow. I mean, the general situation is, governments come and governments go. This Government has been ruining the country for 15 years and it is high time that they go. So, when they quit we have to inherit the country; you and I will have to inherit this. When we inherit, we must ensure - [*Interruption.*] You are laughing, Hon. Speaker. We must ensure that when we take over the country, we should have less of a burden, not more of a burden because the general fact is, the UNP is like a janitorial service; we come and we correct the situation and then again somebody else comes and messes it up.

On that score, all we want to ensure is that there should be a solid ground on which the economy can stand firm and sound at a time when there are financial melt-downs all over the world. Ensure that we have a proper answer in order to protect our countrymen and our economy.

Thank you.

***සභා මේසය මත තබන ලද ලේඛනය :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :*
*Statement tabled :*

## KEY ECONOMIC INDICATORS (contd.)

| | 1990 | 2000 | 2003 | 2004 | 2005 | 2006 | 2007(a) |
|---|---|---|---|---|---|---|---|
| Current account balance (per cent of GDP) (g) | -4.7 | -6.4 | -0.4 | -3.1 | -2.7 | -5.3 | -4.2 |
| Total external assets (months of same year imports) (j) | 3.7 | 3.5 | 5.8 | 5.2 | 5.7 | 4.7 | 5.3 |
| Official external assets (months of same year imports) (j) | 1.9 | 1.7 | 4.2 | 3.3 | 3.7 | 3.3 | 3.7 |
| Overall debt service ratio | | | | | | | |
| As á percentage of export of goods and services | 17.8 | 14.7 | 11.6 | 11.6 | 7.9 | 12.7 | 13.0 |
| As a percentage of current receipt | 15.3 | 12.2 | 9.4 | 9.4 | 6.3 | 9.8 | 9.9 |
| Total external debt and liabilities (per cent of GDP) (g) | 72.7 (k) | 61.0 | 62.4 | 61.8 | 53.3 | 50.3 | 51.8 |
| **EXCHANGE RATES** | | | | | | | |
| Annual average | | | | | | | |
| Rs/US$ | 40.06 | 75.78 | 96.52 | 101.19 | 100.50 | 103.96 | 110.62 |
| Rs/SDR | 54.42 | 99.90 | 135.23 | 149.88 | 148.45 | 153.00 | 169.37 |
| NEER(2006 = 100) (24- currency basket) | - | - | 113.75 | 104.32 | 104.06 | 100.00 | 89.23 |
| REER(2006 = 100) (24- currency basket) (l) | - | - | 92.82 | 90.60 | 97.66 | 100.00 | 100.17 |
| End - year | | | | | | | |
| Rs/US$ | 42.58 | 80.06 | 96.74 | 104.61 | 102.12 | 107.71 | 108.72 |
| Rs/SDR | 57.25 | 104.31 | 143.75 | 162.45 | 145.95 | 162.03 | 171.57 |
| **GOVERNMENT FINANCE (per cent of GDP) (g)** | | | | | | | |
| Revenue | 21.1 | 16.8 | 15.2 | 14.9 | 15.5 | 16.3 | 15.8 |
| o/w Tax Revenue | 19.0 | 14.5 | 12.7 | 13.5 | 13.7 | 14.6 | 14.2 |
| Expenditure and net lending | 31.0 | 26.7 | 22.9 | 22.8 | 23.8 | 24.3 | 23.5 |
| Current expenditure | 22.3 | 20.2 | 18.4 | 18.6 | 18.1 | 18.6 | 17.4 |
| Capital expenditure and net lending | 8.7 | 6.5 | 4.6 | 4.2 | 5.8 | 5.6 | 6.1 |
| Current account deficit(-)/surplus(+) | -1.2 | -3.4 | -3.2 | -3.7 | -2.6 | -2.4 | -1.6 |
| Primary deficit(-)/surplus(+) | -3.5 | -4.2 | -0.9 | -2.2 | -3.5 | -2.9 | -2.6 |
| Overall deficit(-)/surplus(+) | -9.9 | -9.9 | -7.7 | -7.9 | -8.4 | -8.0 | -7.7 |
| Deficit financing | 9.9 | 9.9 | 7.7 | 7.9 | 8.4 | 8.0 | 7.7 |
| Foreign | 5.7 | 0.4 | 2.8 | 2.2 | 3.3 | 2.5 | 3.7 |
| Domestic | 4.2 | 9.4 | 4.4 | 5.6 | 5.1 | 5.5 | 4.0 (m) |
| Privatisation proceeds | - | ... | 0.6 | 0.1 | - | - | - |
| Government debt | 96.6 | 96.9 | 102.3 | 102.3 | 90.6 | 88.7 | 85.8 |
| Foreign | 55.0 | 43.1 | 46.3 | 47.6 | 39.0 | 38.4 | 37.9 |
| Domestic | 41.6 | 53.8 | 56.0 | 54.7 | 51.6 | 50.3 | 47.9 |
| **MONETARY AGGREGATES (point-to-point percentage change )** | | | | | | | |
| Reserve money | 17.9 | 4.7 | 11.9 | 20.9 | 15.8 | 21.2 | 10.2 |
| Narrow money ($M_1$) (n) | 12.8 | 9.1 | 16.0 | 16.6 | 22.4 | 12.6 | 2.7 |
| Broad money ($M_{2b}$) (n) | 20.1 | 12.9 | 15.3 | 19.6 | 19.1 | 17.8 | 16.6 |
| Net foreign assets of the banking system | 115.7 | -31.9 | 51.0 | 1.9 | 20.3 | -15.0 | 33.2 |
| Net domestic assets of the banking system | 13.4 | 26.9 | 7.6 | 25.0 | 18.7 | 25.9 | 13.8 |
| Domestic credit from the banking system to | | | | | | | |
| Government (net) (o) | 0.7 | 56.8 | -11.0 | 25.1 | 11.9 | 43.1 | 4.7 |
| Public corporations | 12.8 | 193.2 | 15.9 | 13.8 | -59.5 | 89.3 | 55.8 |
| Private sector | 24.3 | 11.8 | 16.9 | 22.1 | 21.5 | 24.0 | 19.3 |
| Money multiplier for $M_{2b}$ | 2.87 | 4.60 | 5.08 | 5.02 | 5.16 | 5.02 | 5.31 |
| Velocity of $M_{2b}$ (g) | 3.55 | 2.79 | 2.74 | 2.68 | 2.61 | 2.65 | 2.73 |
| **INTEREST RATES (per cent per annum at end year)** | | | | | | | |
| Repurchase rate (overnight) | - | 17.00 | 7.00 | 7.50 | 8.75 | 10.00 | 10.50 |
| Reverse repurchase rate (overnight) | - | 20.00 | 8.50 | 9.00 | 10.25 | 11.50 | 12.00 |
| Treasury bill rate | | | | | | | |
| 91 days | 17.41 | 17.77 | 7.35 | 7.25 | 10.10 | 12.76 | 21.30 |
| 364 days | 18.36 | 18.22 | 7.24 | 7.65 | 10.37 | 12.96 | 19.96 |
| Deposit rates | | | | | | | |
| Commercial banks' Average Weighted Deposit Rate (AWDR) | 12.90 | 9.89 | 5.27 | 5.31 | 6.20 | 7.60 | 10.31 |
| Commercial banks' 12 month fixed deposit (max.) | 21.00 | 15.00 | 7.75 | 9.75 | 11.50 | 14.00 | 20.00 |
| NSB savings | 16.20 | 8.40 | 5.00 | 5.00 | 5.00 | 5.00 | 5.00 |
| NSB 12 month fixed deposit | 18.50 | 15.00 | 7.00 | 8.00 | 9.00 | 11.00 | 15.00 |
| Lending rates | | | | | | | |
| Commercial banks' Average Weighted Prime Lending Rate (AWPR) | 18.50 | 21.46 | 9.26 | 10.23 | 12.24 | 15.19 | 17.95 |
| Bills purchased & discounted | 14.50-30.00 | 11.00-25.00 | 7.00 - 19.00 | 7.20 - 20.70 | 7.00 - 31.00 | 7.10-20.50 | 7.10-25.50 |
| **CAPITAL MARKET** | | | | | | | |
| All Share Price Index (1985 = 100) | 384.0 | 447.6 | 1,062.1 | 1,506.9 | 1,922.2 | 2,722.4 | 2,541.0 |
| Sensitive Price Index (1985 = 100)/Milanka Price Index 1998 Dec =1,000) | 680.0 | 698.5 | 1,897.8 | 2,073.7 | 2,451.1 | 3,711.8 | 3,291.9 |
| Value of shares traded ( Rs. million) | 1,563 | 10,624 | 73,629 | 59,052 | 114,599 | 105,154 | 104,985 |
| Net purchases by non nationals (Rs.million) | 391 | -3,364 | 209 | 1,109 | 6,145 | 5,377 | 11,254 |
| Market capitalisation (Rs.billion) | 37.0 | 88.8 | 262.8 | 382.1 | 584.0 | 834.8 | 820.7 |

(j) Including ACU receipts.
(k) Excluding external liabilities of commercial banks.
(l) CCPI (N) is used for REER computation.
(m) Payments to be made (Rs. 17,400 million) are also included in domestic financing.
(n) Includes assests/ liabilities of National Development Bank which, merged with NDB Bank Ltd. with effect from August 2005.
(o) Restructuring bonds worth Rs.19,392.6 million, which were issued by the government to the two state banks, have been converted to Treasury bonds upon their maturity in October 2006. This amount, which previously appeared under other assets has been included in Net Credit to Government since October 2006.

*සභා මේසය මත තබන ලද ලියවිල්ල :
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம் :
Document tabled :*

## MOVEMENTS OF THE CCPI(2002=100), CCPI Core (2002=100)

| Year | Month | Index Number ( Base : 2002 = 100 ) | | Month to Month | | Year on Year (Pt. to Pt.) | | 12 Month Moving Average | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | CCPI | CCPI (Core.Ind) | CCPI | CCPI (Core.Ind) | CCPI | CCPI (Core.Ind) | CCPI | CCPI (Core.Ind) |
| 2003 | January | 105.8 | 106.0 | | | | | | |
| | February | 105.2 | 106.2 | -0.5% | 0.2% | | | | |
| | March | 104.2 | 106.4 | -1.0% | 0.2% | | | | |
| | April | 104.4 | 106.8 | 0.2% | 0.4% | | | | |
| | May | 105.4 | 107.2 | 1.0% | 0.4% | | | | |
| | June | 105.7 | 107.5 | 0.3% | 0.3% | | | | |
| | July | 105.1 | 108.1 | -0.6% | 0.6% | | | | |
| | August | 104.9 | 108.2 | -0.1% | 0.1% | | | | |
| | September | 106.1 | 111.3 | 1.1% | 2.9% | | | | |
| | October | 106.2 | 111.1 | 0.1% | -0.2% | | | | |
| | November | 107.6 | 111.7 | 1.4% | 0.5% | | | | |
| | December | 108.9 | 111.9 | 1.2% | 0.2% | | | 5.8% | 8.5% |
| 2004 | January | 110.9 | 115.5 | 1.8% | 3.2% | 4.8% | 9.0% | | |
| | February | 111.0 | 116.2 | 0.1% | 0.6% | 5.5% | 9.4% | | |
| | March | 110.2 | 115.9 | -0.7% | -0.3% | 5.7% | 8.9% | | |
| | April | 111.6 | 116.1 | 1.3% | 0.2% | 6.9% | 8.7% | | |
| | May | 112.8 | 116.5 | 1.0% | 0.3% | 7.0% | 8.7% | | |
| | June | 113.8 | 116.7 | 0.9% | 0.2% | 7.7% | 8.6% | | |
| | July | 115.4 | 118.7 | 1.5% | 1.7% | 9.9% | 9.8% | | |
| | August | 116.4 | 119.4 | 0.8% | 0.6% | 10.9% | 10.4% | | |
| | September | 118.3 | 119.6 | 1.6% | 0.2% | 11.4% | 7.5% | | |
| | October | 119.0 | 120.6 | 0.6% | 0.8% | 12.1% | 8.6% | | |
| | November | 121.5 | 123.0 | 2.1% | 2.0% | 12.9% | 10.1% | | |
| | December | 123.0 | 123.0 | 1.3% | 0.0% | 13.0% | 9.9% | 9.0% | 9.1% |
| 2005 | January | 124.4 | 125.7 | 1.1% | 2.2% | 12.2% | 8.8% | 9.6% | 9.1% |
| | February | 124.4 | 125.8 | 0.0% | 0.1% | 12.1% | 8.3% | 10.2% | 9.0% |
| | March | 124.9 | 128.3 | 0.4% | 2.0% | 13.3% | 10.7% | 10.8% | 9.2% |
| | April | 126.5 | 129.1 | 1.3% | 0.6% | 13.3% | 11.2% | 11.3% | 9.4% |
| | May | 127.2 | 129.6 | 0.6% | 0.4% | 12.8% | 11.2% | 11.8% | 9.6% |
| | June | 127.9 | 129.6 | 0.5% | 0.0% | 12.4% | 11.1% | 12.2% | 9.8% |
| | July | 128.5 | 131.0 | 0.5% | 1.1% | 11.3% | 10.4% | 12.3% | 9.8% |
| | August | 128.9 | 132.2 | 0.3% | 0.9% | 10.7% | 10.7% | 12.3% | 9.9% |
| | September | 129.2 | 132.6 | 0.2% | 0.3% | 9.2% | 10.9% | 12.1% | 10.2% |
| | October | 130.3 | 134.5 | 0.9% | 1.4% | 9.5% | 11.5% | 11.9% | 10.4% |
| | November | 131.5 | 134.5 | 0.9% | 0.0% | 8.2% | 9.3% | 11.5% | 10.3% |
| | December | 132.2 | 134.3 | 0.5% | -0.1% | 7.4% | 9.2% | 11.0% | 10.3% |
| 2006 | January | 133.5 | 136.5 | 1.0% | 1.6% | 7.3% | 8.6% | 10.6% | 10.2% |
| | February | 134.7 | 137.0 | 0.9% | 0.4% | 8.3% | 8.9% | 10.3% | 10.3% |
| | March | 134.7 | 139.3 | 0.0% | 1.7% | 7.9% | 8.6% | 9.8% | 10.1% |
| | April | 136.7 | 139.8 | 1.5% | 0.4% | 8.1% | 8.3% | 9.4% | 9.9% |
| | May | 139.0 | 140.2 | 1.6% | 0.3% | 9.2% | 8.2% | 9.1% | 9.6% |
| | June | 141.4 | 141.7 | 1.8% | 1.1% | 10.6% | 9.3% | 9.0% | 9.5% |
| | July | 141.3 | 142.5 | -0.1% | 0.6% | 9.9% | 8.8% | 8.9% | 9.3% |
| | August | 141.8 | 143.1 | 0.4% | 0.4% | 10.0% | 8.2% | 8.8% | 9.1% |
| | September | 143.5 | 143.8 | 1.2% | 0.5% | 11.1% | 8.4% | 9.0% | 8.9% |
| | October | 145.4 | 145.4 | 1.3% | 1.1% | 11.5% | [illegible] | 9.2% | 8.7% |
| | November | 147.8 | 145.8 | 1.7% | 0.3% | 12.4% | 8.4% | 9.5% | 8.6% |
| | December | 150.0 | 145.8 | 1.4% | 0.0% | 13.5% | 8.6% | 10.0% | 8.5% |
| 2007 | January | 151.8 | 148.5 | 1.3% | 1.9% | 13.7% | 8.8% | 10.6% | 8.5% |
| | February | 155.2 | 149.2 | 2.2% | 0.5% | 15.2% | 8.9% | 11.1% | 8.6% |
| | March | 155.0 | 149.9 | -0.1% | 0.5% | 15.1% | 7.6% | 11.7% | 8.5% |
| | April | 156.3 | 151.2 | 0.8% | 0.9% | 14.3% | 8.2% | 12.3% | 8.5% |
| | May | 157.3 | 151.3 | 0.6% | 0.1% | 13.2% | 7.9% | 12.6% | 8.4% |
| | June | 160.6 | 153.0 | 2.1% | 1.2% | 13.5% | 8.0% | 12.8% | 8.3% |
| | July | 163.1 | 153.1 | 1.6% | 0.0% | 15.4% | 7.4% | 13.3% | 8.2% |
| | August | 165.2 | 153.5 | 1.3% | 0.3% | 16.5% | 7.3% | 13.8% | 8.1% |
| | September | 166.7 | 153.5 | 0.9% | 0.0% | 16.1% | 6.7% | 14.2% | 8.0% |
| | October | 171.8 | 155.2 | 3.0% | 1.1% | 18.2% | 6.7% | 14.8% | 7.9% |
| | November | 176.4 | 155.5 | 2.7% | 0.2% | 19.3% | 6.7% | 15.4% | 7.7% |
| | December | 178.1 | 157.6 | 1.0% | 1.4% | 18.8% | 8.1% | 15.8% | 7.7% |
| 2008 | January | 183.5 | 158.8 | 3.0% | 0.8% | 20.8% | 6.9% | 16.4% | 7.5% |
| | February | 188.6 | 161.8 | 2.8% | 1.9% | 21.6% | 8.4% | 17.0% | 7.5% |
| | March | 191.9 | 163.8 | 1.7% | 1.2% | 23.8% | 9.3% | 17.7% | 7.6% |
| | April | 195.4 | 165.3 | 1.8% | 0.9% | 25.0% | 9.3% | 18.7% | 7.7% |
| | May | 198.5 | 165.8 | 1.6% | 0.3% | 26.2% | 9.6% | 19.8% | 7.9% |
| | June | 205.9 | 174.7 | 3.7% | 5.4% | 28.2% | 14.1% | 21.0% | 8.4% |
| | July | 206.4 | 179.5 | 0.2% | 2.8% | 26.6% | 17.2% | 21.9% | 9.3% |
| | August | 206.3 | 180.2 | 0.0% | 0.4% | 24.9% | 17.4% | 22.6% | 10.1% |
| | September | 207.2 | 182.2 | 0.4% | 1.1% | 24.3% | 18.7% | 23.2% | 11.1% |

Note: CCPI Core (2002=100) - Excluding Food & Energy

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, 2006.07.19 වන දා හා 2006.12.01 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව COPE එකට ආව වෙලාවේ -එදා මමත් එහි සාමාජිකයෙක්, අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමාත් සාමාජිකයෙක්- මහ බැංකුවේ අධිපතිතුමා මේ විධියට පැහැදිලි පොරොන්දුවක් දුන්නා.

"මුදල් මණ්ඩලයේ නිසි අනුමැතියක් නොලබා නීති විරෝධී ආකාරයෙන් ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම්වලට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බව පෙන්වා දෙනු ලැබිණ. මූල්‍ය සමාගම්වල -ලියා පදිංචි නැති- නීති විරෝධී ක්‍රියාකාරිත්වය පෙන්වා දෙමින් නිතර නිතර පුවත් පත්වල දැන්වීම් පළ කිරීම රටේ ආර්ථිකයට දැඩි ලෙස අහිතකර අයුරින් බලපෑ හැකි ඉතාම අයහපත් පුරුද්දකි. මෙම තත්ත්වය නිවැරදි කිරීමට -මාස දෙකක කාලයක් තුළ- පියවර ගැනීමට මහ බැංකුවේ අධිපතිවරයා පොරොන්දු විය."

ඒ 2006 ජූලි මාසයේදී. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපි නිතර පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළේ කාටවත් මඩ ගහන්න නොවෙයි. මහ බැංකුවේ අධිපතිතුමා 2006.07.19 වන දා පොරොන්දුවක් දුන්නා මාස දෙකක් ඇතුළත ලියා පදිංචි නැති මූල්‍ය සමාගම් ගැන පරීක්ෂණයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරලා නීතිමය කටයුතු කරනවාය කියලා. එතුමා ඒක කළේ නැහැ. එතකොට පැහැදිලිව එහි වගකීම තිබෙන්නේ මහ බැංකුවේ අධිපතිතුමාටයි; මුදල් අමාත්‍යාංශයටයි. එදා ආණ්ඩුව කිව්වේ අපි ආණ්ඩුවට මඩ ගහන්න හදනවාය කියලායි. ආණ්ඩුව නියම ස්වරූපයෙන් අපේ විවේචන පිළිගත්තේ නැහැ. එදා මහ බැංකුවේ අධිපතිතුමා ක්‍රියා කළා නම් මේක වෙන්නේ නැහැ. දැන් බලන්න මිලියන 1,800ක්. ගම්පොල ප්‍රදේශයේ අන්ධ පුද්ගලයෙක් - a blind man has deposited Rs. 5.3 million. මේක ජාතික අපරාධයක්. අපිට කාටවත් මඩ ගහන්න ඕනෑ නැහැ. අපි රජයට කියන්නේ මේකට මැදිහත් වෙලා මේ අයට සහනයක් ලබා දෙන්නය කියලායි. ජනතාවගේ පැත්තෙන් එච්චරයි අපි කියන්නේ. මොකද, මුදල් අමාත්‍යාංශය, ඒ වාගේම මහ බැංකුවේ අධිපතිතුමා තමන්ගේ වගකීම පැහැර හැර තිබෙනවා. මෙහෙම දෙයක් සිද්ධ වෙනවාය කියා අපි 2006 හත් වන මාසයේදී පෙන්වා දීලා තිබෙනවා. අවුරුදු දෙකකට කලින් අපි පෙන්වා දී තිබෙනවා. නමුත් ආණ්ඩුව මේක ගණන් ගත්තේ නැහැ. මහ බැංකුව කල්පනා කරන්න ඕනෑ කොහොමද මෙච්චර පොලියක් දෙන්නේ කියලා. මාසයකට සියයට 6යි. එතකොට ගරු කථානායකතුමනි, අවුරුද්දකට සියයට 72යි; 72 per cent per year. මෙහෙම පොලියක් ගෙවන්න බැරි බව ඔබතුමා වුණත් දන්නවා. මහ බැංකුව මැදිහත් වෙලා මේ වාගේ අහිංසක මිනිස්සු ආරක්ෂා කරන්නේ නැත්නම් මොකද වෙන්නේ? මහ බැංකුවේ අධිපතිතුමාට මේක විතරක් නොවෙයි පිරමිඩ් ගනු දෙනුව ගැන ගත්තත්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

"ගරු ලලිත් දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு எல்.ஜீ. வசந்த பியதிஸ்ஸ)
(The Hon. L.G. Wasantha Piyatissa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලලිත් දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லலித் திஸாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* THE HON. LALITH DISSANAYAKE *took the Chair.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජයෙන් ඉල්ලා සිටින්නේ මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා මේ අයට යම් කිසි සහනයක් ලබා දෙන්නය කියායි. පූර්වාදර්ශයක් තිබෙනවා. මොකද, අපි කවුරුත් දන්නවා, මීට කලින් සමහර මූල්‍ය සමාගම් බංකොලොත් වුණ අවස්ථාවලදී විශාල මුදලක් මහ බැංකුවෙන් දීලා තිබෙන බව. ඊට කලින් බංකොලොත් වූ මූල්‍ය සමාගම්වලට මිලියන 7,000ක් මහ බැංකුවෙන් ලබා දීලා තිබෙනවා. බංකොලොත් වූ මූල්‍ය සමාගම්වලට ලබා දුන් රුපියල් මිලියන 7,000ක් ආපසු අය කර ගැනීමටත් මහ බැංකුවේ අධිපතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා. එතුමා කියා තිබෙනවා, මාස දෙකක් ඇතුළත එම මිලියන 7,000 ලබා ගන්න කටයුතු කරනවා කියා. නමුත් එතුමා ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙන නැහැ. එතකොට එතුමා පිරමිඩ් මුදල් ගනු දෙනුව ගැන පොරොන්දු වෙලා තිබෙනවා. එතුමා පිරමිඩ් මුදල් ගනු දෙනුව ගැන කථා කෙරුවා 2006.07.19 වන දා. "රටේ විදේශ විනිමය කෙරෙහි අහිතකර අන්දමින් බලපා ඇති පිරමිඩ් මුදල් ගනු දෙනු ක්‍රම පිළිබඳව කටයුතු සොයා බැලීමට කමිටුවක් පත් කිරීමටත්, මාස දෙකක් ඇතුළත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඒ පිළිබඳව වාර්තා කිරීමටත් මහ බැංකුවේ අධිපතිතුමා එකඟ විය."

ඒක කරලාත් නැහැ. එතකොට කවුද මේකට වග කියන්න ඕනෑ? අද අපේ රටේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මේකයි. පාර්ලිමේන්තුවට තමයි මුදල් බලතල තිබෙන්නේ. නමුත් ජනාධිපතිතුමා මුදල් අමාත්‍යාංශය භාර අරගෙන තිබෙනවා. මම එතුමාට දොස් කියන්නේ නැහැ. නමුත් අපි සියලු දෙනාම එක්කාසු වෙලා මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. නමුත් ජනාධිපතිතුමා මුදල් ඇමතිකම භාර අරගෙන තිබෙනවා. එතකොට ජනාධිපතිතුමාට මුදල් ඇමති හැටියට එතුමාට නැති මුදල් බලයක් ලැබී තිබෙනවා. මේක පරස්පර විරෝධී තත්ත්වයක්. අපි දෙ ගොල්ලෝම එක්කාසු වෙලා මේ ගැන යම් කිසි තීරණයක් ගන්න ඕනෑ. මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ජනාධිපතිතුමාට මුදල් බලයක් නැහැ. ජනාධිපති අරමුදලේ මුදල් වියදම් කරන්න වුණත් එතුමා ජනාධිපතිතුමා අරමුදල් පනත යටතේ ක්‍රියා කරන්න ඕනෑ. ඒ මුදල් මුදා හරින්නත් ජනාධිපති අරමුදලේ අධ්‍යක්ෂවරුන්ගේ අනුමතිය තියෙන්න ඕනෑ. එතකොට මුදල් බලයක් එතුමාට නැහැ. නමුත් මුදල් ඇමති හැටියට එතුමාට මුදල් බලයක් ලැබී තිබෙනවා. ඒක තමයි අද අපේ රටේ තිබෙන ප්‍රශ්නය.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
( மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன - மின்வலு, சக்தி அமைச்சர்)
(The Hon. W. D. J. Senewiratne - Minister of Power and Energy)

වාර්ෂිකව ඉදිරිපත් කරන අය වැයට පාර්ලිමේන්තුවේ අනුමතිය ලබා ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවේදී අය වැය අනුමත වුණාට පස්සේ තමයි ඒ අය වැය අනුව රටේ මුදල් පරිපාලනය කෙරෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නම්. මිහින් එයාර් එකට රුපියල් මිලියන තුන්දහස් ගණනක් වියදම් කෙරුවා. ඒකට පාර්ලිමේන්තුවේ අනුමතිය ලැබුණාද? ඒක ඔබතුමා පෙන්වන්න. ඒකට පාර්ලිමේන්තුවේ අනුමතිය ලැබුණෙත් නැහැ. රවි කරුණානායක මැතිතුමා මිහින් එයාර් එක ගැන ප්‍රශ්න 25ක් 30ක් විතර ඇහුවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. ජනාධිපතිතුමාට මුදල් බලතල නැහැ. නමුත් එතුමා මුදල් ඇමතිකම භාර අරගෙන ඒ විධායක බලතල පාවිච්චි කරලා පාර්ලිමේන්තුවට කියන්නේ නැතිව එම මුදල් වියදම් කරනවා. ඒක මම හිතන විධියට අපි සියලු දෙනාටම තිබෙන ප්‍රශ්නයක්. අපේ බලතල දවසින් දවස අපි එක එක් කෙනාට දෙනවා. අපේ පාර්ලිමේන්තුවේ හුඟක් බලතල අධිකරණයට දීලා තිබෙනවා.

දැන් අධිකරණය තමයි පළමු වන ශ්‍රේණියට ළමයි ඇතුළත් කරන්නේ. මොකද, අධ්‍යාපන ඇමතිතුමාට පළමු වන ශ්‍රේණියට ළමයි ඇතුළත් කිරීම සඳහා නීතිය හදන්න බැරි වුණා. ඒක තමයි අපේ රටේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාත් යනවා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මොකක්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

තමුන්නාන්සේලාත් එහෙම කරනවා නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

උදාහරණයක් කියන්න. ඔබතුමාට ශක්තිය තිබෙනවා නම් උදාහරණයක් කියන්න. අපි එහෙම කළා නම් උදාහරණයක් කියන්න. ඔබතුමා මේක නිකම් විහිළුවක් කරන්න හදන්න එපා. මා මේ වැදගත් ප්‍රශ්නයක් ගැනයි කථා කළේ. දැන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා කිව්වා, ජනාධිපතිතුමා අය වැයෙන් අවසර ගන්නවාය කියලා. මා ඇහුවා, මිහින් එයාර් එකට පාර්ලිමේන්තුවෙන් අවසර ගත්තාද කියලා. එතුමාට උත්තරයක් දෙන්න බැරි වුණා. ඔබතුමා මේක විහිළුවක් කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ මේ මැදිහත් වීම ගැන මා කනගාටු වෙනවා. හැම එකටම දේශපාලනය ගාවන්න එපා. මා කිව්වේ-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, මා කිව්වේ ඒක නොවෙයි. මා කිව්වේ අධිකරණය සම්බන්ධයෙනුයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔව්, ඒක තමයි. මා ඔබතුමාට කියන්නම්. දැන් බලන්න. පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගන්න නීති හදන්න ඇමතිතුමාට බැරි වුණා. එතකොට දෙමව්පියන් උසාවියට ගියා. මොකද, ඒ දරුවන් පාසලට ඇතුළත් කර ගන්න ඕනෑ නිසා. අපි එතුමාට කිව්වා, පනතක් ගෙනෙන්න පාර්ලිමේන්තුවේ ඉන්න අපේ හතළිස් හතර දෙනාම ඒකට ඡන්දය දෙනවා කියලා. එතුමා පනතක් ගෙනාවේ නැහැ. Environmental laws අනුව ශබ්ද දූෂණය සම්බන්ධයෙන් අද මේ ආණ්ඩුව භික්ෂූන් වහන්සේලාව හිරේ යවනවා. 2005 දී පරිසර ඇමතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට පොරොන්දුවක් දුන්නා ශබ්ද දූෂණය සම්බන්ධයෙන් නීති හදලා අධිකරණයට ඉදිරිපත් කරනවාය කියලා. 2005 ඉඳලා දැන් 2008 අද වන තුරුත් එතුමා පොල් ගානවා. තවම අධිකරණයට නීති හදලා ඉදිරිපත් කරන්න බැරි වුණා. ඒ නිසා අග්‍ර විනිශ්චයකාරතුමාට සිද්ධ වුණා තීන්දුවක් දෙන්න.

ගුරුවරුන්ගේ ප්‍රශ්න ගැන නීති හැදීමේ හැකියාවක් ආණ්ඩුවට නැති නිසා අධිකරණයට යන්න සිද්ධ වුණා. මා හැම දාමත් කියන්නේ, අපේ පාර්ලිමේන්තුවේ බලතල අපි එක එක් කෙනාට පූජා කරනවාය කියලායි. ඒ ඇමතිවරුන්ගේ නොහැකියාව නිසා. ඇමතිවරුන් 100ක් විතර ඉන්නවා. එක් කෙනෙක්වත් වැඩක් කරන්නේ නැහැ. හැම එක් කෙනාම බෝලය පාස් කරනවා, "මේක මගේ නොවෙයි අරයාගේ" කියලා. ඉතින් ඇත්ත වශයෙන්ම මේක විහිළුවක් නොවෙයි.

මා කලින් කිව්වා වාගේ පාර්ලිමේන්තුවටයි මුදල් බලතල තිබෙන්නේ. ඒ බලතල අපිට පාවිච්චි කරන්නට අවස්ථාවක් නැහැ. ජනාධිපතිතුමා මුදල් ඇමතිකම භාර අරගෙන පස්ස දොරෙන් ඒ සියලු කටයුතු කරනවා. මිහින් එයාර් එක ඒකට හොඳම උදාහරණයක්. අවි ආයුධ ගන්න මේ පාර්ලිමේන්තුවෙන් අවසර ගත්තේ කවදාද? සමාගමක් තිබෙනවා අවි ආයුධ ගන්න හදපු. ඒකේ මුදල් Auditor-General ට audit කරන්නත් බැහැ.

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யூ. டீ. ஜே. செனெவிரத்ன)
(The Hon. W. D. J. Senewiratne)

ගරු මන්ත්‍රීතුමනි, අවි ආයුධ මිලදී ගන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කර තිබෙන සල්ලිවලින්. ඔබතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේවත් ආයුධ ගන්නය කියලා වෙනම වැය ශීර්ෂයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. පරිපූරක ඇස්තමේන්තුවක් මිසක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමාට මිහින් එයාර් එක පිළිබඳව උත්තරයක් දෙන්න බැරි වුණා නේ. [බාධා කිරීමක්] කාලීන ප්‍රශ්නය තිබෙන්නේ මිහින් එයාර් එක ගැන නේ. එක මන්ත්‍රීවරයෙක් දවසක් කිව්වා, බුද්ධගයාවට යන්න මිහින් එයාර් එක ආරම්භ කළායි කියලා. බුද්ධගයාවට මිහින් එයාර් එක ගියේ පහළොස් වතාවයි. පහළොස් වතාවක් යන්න රුපියල් මිලියන තුන්දහස් ගණනක් වියදම් කළා. එතැනත් ආගම විකුණන්න හදනවා. දැන් විකුණන්න දෙයක් නැහැ.

මා මීට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මා විශේෂයෙන්ම කියා සිටින්නේ මහ බැංකුවේ අධිපතිතුමා මේ පාර්ලිමේන්තුව නොමඟ යවා තිබෙන බවයි. COPE වාර්තාව එතුමා තුට්ටුවකටවත් ගණන් අර ගෙන නැහැ. අප ඉල්ලීමක් කරන්නේ මේ රුපියල් මිලියන 1800 වෙනුවෙන් රජය මැදිහත් වෙන්නය කියලායි. රජයේ වැරැද්ද. මේ මුදල් ටික ඒ අයට ලබා දෙන්න. මේ ආයතනවල මිනිස්සු මුදල් තැන්පත් කරන්නේ මිනිසුන්ට ජීවත් වෙන්න බැරි නිසායි. පොලිය වැඩියෙන්

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ලැබෙන තැන්වල මිනිස්සු මුදල් තැන්පත් කරනවා. ඉතින් මා මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව මැදිහත් වෙලා මේ තැන්පත්කරුවන්ට යම් කිසි සහනයක් ලබා දෙන්නය කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට ගරු වසන්ත පියතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහයි තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමනි. 3.40ට කථාව අවසන් කරන්න.

**ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு எல்.ஜீ. வசந்த பியதிஸ்ஸ)
(The Hon. L.G. Wasantha Piyatissa)

මට විනාඩි 10ක් ලබා දෙනවාය කියලා තිබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාගේ කථාව 3.40ට අවසන් කරන්න.

**ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு எல்.ஜீ. வசந்த பியதிஸ்ஸ)
(The Hon. L.G. Wasantha Piyatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] ඒ මැතිනියගේ පුරුෂයා වැඩ කරන්නේ Securities and Exchange Commission of Sri Lanka කියන ආයතනයේද කියලා කරුණාකරලා කියන්න පුළුවන්ද? මොකද, ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. World Bank Representativeගේ පුරුෂයා Securities and Exchange Commission of Sri Lanka ආයතනයේ වැඩ කරනවා නම්, ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඇමතිතුමා මේ පිළිබඳව අවංක පිළිතුරක් දෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

**ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு எல்.ஜீ. வசந்த பியதிஸ்ஸ)
(The Hon. L.G. Wasantha Piyatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කාලීන වැදගත්කමකින් යුක්ත යෝජනාවක් අද ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. නමුත් විනාඩි පහක පමණ කාලයක් තුළ ඉතා කෙටියෙන් කරුණු දක්වන්නට තමයි මට සිද්ධ වෙන්නේ.

කෙසේ වෙතත් අද ඉදිරිපත් කර තිබෙන යෝජනාව අනුව රටේ මූල්‍ය තත්ත්වය දිනෙන් දින ගරා වැටෙනවාය, එහෙම නැත්නම් ඉතා නරක අතට පත් වෙනවාය කියන එක කියන්න තමයි මේ කරුණු පෙළ ගැසෙමින් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ මූල්‍ය තත්ත්වය නරක අතට හැරෙනවාය කියන්නේ රටේ ආර්ථිකය කඩා වැටෙනවාය කියන එකයි. රටක පැවැත්ම සම්බන්ධයෙන් වන ප්‍රධානතම කොන්දේසිය ඉතා නරක, බරපතළ තත්ත්වයකට පත් වෙනවාය කියන එකයි. රටේ ආර්ථිකය කඩා වැටිලාය කියනවා නම්, කඩා වැටිලා නම්, එහෙම කඩා වැටෙන්නේ ඇයි කියලා අපි සොයන්න ඕනෑ; කල්පනා කරන්න ඕනෑ. රටේ මූල්‍ය තත්ත්වය කඩා වැටෙන්නේ ඇයි කියන එක අපි සොයන්න ඕනෑකම තිබෙනවා. රටේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ මොන හේතුන් නිසාද, ඒ හේතුන්වලට මොන විධියේ විසඳුම් ලබා දී තිබෙනවාද කියා අපි සොයා බලන්න ඕනෑකම තිබෙනවා. රටක ආර්ථිකය ශක්තිමත් කරන්න නම්, රටේ ආර්ථිකය නඟා සිටුවන්න නම් නිවැරදි මූල්‍ය ප්‍රතිපත්තියක් තියෙන්න ඕනෑය කියන එක අපි මූලික වශයෙන් විශ්වාස කරනවා. නිවැරදි මූල්‍ය ප්‍රතිපත්තියක් අපේ රටේ තිබෙනවා නම් ආර්ථිකය කඩා වැටෙන්න පුළුවන්ද කියලා අපි අහනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටක මූල්‍ය ප්‍රතිපත්තිය නිවැරදි විය යුතු වාගේම ඒ හා බැඳුණු තවත් කාරණයක් තිබෙනවා. රටේ මූල්‍ය විනය ශක්තිමත් වෙන්න ඕනෑකම තිබෙනවා. අද රටේ මූල්‍ය විනයක් තිබෙනවාද කියන මූලික ප්‍රශ්නය ගැන අපට මේ අවස්ථාවේ සාකච්ඡා කරන්න පුළුවන්කම තිබෙනවා. ඉතා නිවැරදි මූල්‍ය ප්‍රතිපත්තියක් වාගේම එය ක්‍රියාත්මක කිරීමේදී ඒ හා බැඳුණු මූල්‍ය විනයක් අප රට තුළ තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන කථා කරද්දී පක්ෂ, පාට භේදයකින් තොරව අපේ රටේ පොදු ජනතාව මොකක්ද කියන්නේ? ජනතාව කියන්නේ අල්ලස, නාස්තිය, දූෂණය, වංචාව, කොමිස් ගැහිල්ල ආදියෙන් අපේ රට පිරිහිලා කියන එකයි. ඒකයි ජනතාවගේ පොදු අදහස. ඒකේ යම් යම් ප්‍රමාණයන්ට යම් යම් පුද්ගලයන් වග කිව යුතුව තිබෙනවා. නමුත් එක පුද්ගලයකුට, එක ආයතනයකට, එක සංස්ථාවකට, එක දෙපාර්තමේන්තුවකට විවෙචන එල්ල කරලා බේරෙන්න පුළුවන්කමක් තිබෙනවාද? එහෙම බේරෙන්න පුළුවන්කමක් නැහැ. අපි මූලික වශයෙන් ප්‍රශ්න කරන්න ඕනෑ මේ රට ගොඩ ගැනීම සඳහා උර දෙන කම්කරුවන්ගේ ජීවිතය, ගොවි ජනතාවගේ ජීවිතය, අනෙකුත් සුළු ව්‍යාපාරිකයන්ගේ ජීවිතය, කර්මාන්තකරුවන්ගේ ජීවිතය, ඔවුන්ගේ සමාජ මට්ටම, සමාජ තත්ත්වය නඟා සිටුවන්න අපේ ආර්ථික ප්‍රතිපත්තිය සමත් වෙලා තිබෙනවාද, අපේ මූල්‍ය විනය ශක්තිමත් වෙලා තිබෙනවාද කියා. පසු ගිය කාලය දිහා බැලුවාට පස්සේ අපේ රටේ එහෙම මූල්‍ය විනයක් තිබුණාය කියා කිසි සේත්ම සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූල්‍ය විනය කඩ කිරීම නිසා රුපියල් කෝටි 15,000ක් රජයට, ජනතාවට අහිමි වෙලා තිබෙන බව කෝප් වාර්තාවෙන් හෙළි වුණා. එයට වග කියන්න ඕනෑ කවුද? ජනතාවද? නැහැ. රටේ පාලකයන් එයට වග කිව යුතුව තිබෙනවා. ඒ වාගේම පසු ගිය දවස්වල වැට් වංචාව ගැන සාකච්ඡා වුණා. එයින් රුපියල් කෝටි 39,000ක් රජයට අහිමි වෙලා තිබෙනවා. ඒ කියන්නේ ජනතාවට අහිමි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව වග කියන්න ඕනෑ කවුද? ඒ සඳහා ගත් ක්‍රියා මාර්ග මොනවාද? ඒ වාගේම දුප්පත් ගොවි පවුලකට, එහෙම නැත්නම් සුළු ව්‍යාපාරිකයකුට, සුළු කර්මාන්තකරුවකුට ණයක් ලබා ගන්නට ඉඩක් නොමැති තත්ත්වයක් තුළ -බොහෝ වෙලාවට ගත් ණය ගෙවා ගන්න නොහැකි තත්ත්වයක් තුළ- අද ඔවුන් පීඩාවට පත් වෙලා ඉන්නවා. එවැනි තත්ත්වයක් යටතේ පසු ගිය වසර හය තුළ මහා පරිමාණ කෝටිපති ව්‍යාපාරිකයන්ගෙන් අය විය යුතු මොන තරම් මුදල් ප්‍රමාණයක්, බොල් ණය ලෙස කපා දමා තිබෙනවාද කියා මම ගරු අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි. රුපියල් මිලියන දස දහස් ගණනක් එහෙම කපා හැර තිබෙනවා එහෙම තත්ත්වයක් තිබෙනවා. මිහින් එයාර් ගුවන් සේවයට අදාළව රුපියල් මිලියන 3,200ක් තිබෙනවා. එහෙම බැලුවාට පසුව පෙනෙනවා මේ ආකාරයට මහා පරිමාණ මුදල් ප්‍රමාණයක් රටට අහිමි වෙලා තිබෙන බව. මූල්‍ය විනය පිරිහිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් පවත්වා ගෙන යැමේදී එයට මූලික වන අය අතින් -මහ බැංකුව වන්න පුළුවන්, එහෙම නැත්නම් රජය වන්න පුළුවන්- ඒ විනය කඩ වනවා නම් අමාත්‍යාංශ ලේකම්තුමාගේ සිට ග්‍රාම නිලධාරි මහත්මයා දක්වා වන මූල්‍ය විනය ආරක්ෂා කරන්න කිසිවෙකුටත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මෙය ඉතා බරපතළ ලෙස සලකන්න ඕනෑකම තිබෙනවා.

අපේ රටේ ආදායම් සෙවීමේ ප්‍රධාන ක්‍රමවේදය මොකක්ද? නිෂ්පාදන ආර්ථිකයට අද මොකක්ද වෙලා තිබෙන්නේ? ණය ගන්නවා, බදු බර වැඩි කරනවා. දැන් අපේ රටේ මූලික ආදායම මෙය බවට පත් වෙලා නැද්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1948 දී අපේ රටේ සමස්ත ණය ප්‍රමාණය වශයෙන් තිබුණේ රුපියල් මිලියන 517යි. අද වන විට -2008 මුල් භාගය වන විට- මෙය රුපියල් මිලියන -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு எல்.ஜீ. வசந்த பியதிஸ்ஸ)
(The Hon. L.G. Wasantha Piyatissa)

මා අවසන් කරන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් මිලියන 27,71,700යි. අද වන විට සමස්ත ණය කන්දරාව රුපියල් මිලියන 30,13,400ක් වෙලා තිබෙනවා. මේ තරම් ණය ගනිමින් මේ රට මේ කොහේටද අර ගෙන යන්නේ? අද මේ වාගේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

සක්විති මහත්මයා ගැන කිව්වා. මහා මුදල් වංචාවක් වෙලා තිබෙනවාය කියනවා. හැබැයි, සක්විතිට විතරක් අපි සීමා වනවාද? එවැනි සක්විතිලා මේ ආණ්ඩුව තුළ කොයි තරම් ඉන්නවාද, එහෙම ඉන්න බැරිද? කල්පනා කර බලන්න. එහෙම ප්‍රශ්නයක් තිබෙන මේ රට තුළ මෙහෙම මුදල් වංචාවන් තිබුණත් ඒවාට ඉඩ කඩ සැපයෙන නීතිමය තත්ත්වයන් තිබෙනවා. මේ සියල්ලම වෙනස් කිරීමට අදාළව ඉතා කඩිනම් සහ තීරණාත්මක තීන්දු ගන්නේ නැත්නම් මේ කිසිදු සාකච්ඡාවකින් වැඩක් වන්නේ නැහැ.

අද මේ රටේ මූල්‍ය තත්ත්වය ඉතාම බරපතළ විධියට පිරිහිලාය, කඩා වැටිලාය කියා අපට දැනෙමින් තිබෙනවා. මා එක උදාහරණයක් කියන්නම්. අම්පාර දිස්ත්‍රික්කයේ මහ රෝහලේ ඉදි කිරීම් ගණනාවක් සිද්ධ කරමින් තිබුණා. ඒ සියල්ල අතර මඟ නවත්වා තිබෙනවා. රුපියල් මිලියන 50කට වඩා වැඩි ප්‍රමාණයක් ඒ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන්න තිබෙනවා. ඔවුන් අද ඒ ගැන පැමිණිලි කරනවා. මාස නවයක් තිස්සේ රජයෙන් ඒ මුදල් ඉල්ලනවා. අම්පාර මහ රෝහලේ ඉදි කිරීම් කටයුතුවලට අදාළ එක බිලක්වත් අද වන තුරු ගෙවා නැහැ. එවැනි තත්ත්වයන් තිබෙනවා. ණය අර ගෙන, ණය අර ගෙන වැඩ කරනවාට වඩා අපේ හැකියාවට අනුව, අපේ තත්ත්වයට අනුව ගම් මට්ටමේ සිට නිෂ්පාදන ආර්ථිකය දියුණු කරමින් හොරා කෑම, වංචාව, දූෂණය, අල්ලස නවත්වමින්, ආදර්ශයෙනුත් ඒ සියල්ල පෙන්වමින් ඉදිරියට යන ගමනක් තුළින් අපේ ආර්ථිකයේ මේ කඩා වැටීම නවත්වන්න ඕනෑ. මේ රටේ මූල්‍ය ප්‍රශ්නයක් තිබුණාට අපේ ඉහළ පැළැන්තියට, අපේ මැති ඇමතිවරුන්ට මූල්‍ය ප්‍රශ්නයක් නැහැ. දුප්පත් ජනතාවට තමයි මෙය බලපාන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு எல்.ஜீ. வசந்த பியதிஸ்ஸ)
(The Hon. L.G. Wasantha Piyatissa)

ඒ නිසා මෙය වෙනස් කිරීම සඳහා කඩිනමින් පියවර ගන්නා ලෙස අප ආණ්ඩුවට යෝජනා කර සිටිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ස්තුතියි. මී ළඟට ගරු රංජිත් සියඹලාපිටිය අමාත්‍යතුමා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Revenue and Finance and Deputy Minister of Finance and Planning)

අපේ දිස්ත්‍රික්කයෙන් අලුතින් පත් වුණ ලලිත් දිසානායක මන්ත්‍රීතුමා මූලාසනයේ සිටින අවස්ථාවක ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරපු සුවිශේෂී කරුණුවලට පිළිතුරු දෙන්න ලැබීම පිළිබඳව මා සතුටු වනවා. එදා එක්සත් ජාතික පක්ෂ රජයේ හිටපු කැබිනට් අමාත්‍යවරු දෙපළක් මේ ගරු සභාවේ දැන් සිටිනවා. ඔබතුමන්ලා එදා හිතුවාට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් විධියට හිතන්න අද පුරුදු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට අමතක නැතිව ඇති ප්‍රමුඛ බැංකුව කඩා වැටුණු වෙලාව. ප්‍රමුඛ බැංකුව කියන්නේ අවසර නොලත් මූල්‍ය ආයතනයක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බලපත්‍ර සහිත බැංකුවක්. ඒක කඩා ගෙන වැටුණා. ඒකේ 14,000ක් පමණ ගිණුම් හිමියන් හිටියා. ඒ 14,000න් වැඩි පිරිසක් රුපියල් ලක්ෂයට වඩා අඩුවෙන් තැන්පත් කළ පොඩි තැන්පත්කරුවන්. ඔවුන් මහ පාරට වැටුණා. නීත්‍යනුකූල බැංකුවක මුදල් තැන්පත් කරපු මිනිස්සු ඒ තත්ත්වයට වැටුණා. අද මේ අය කිඹුල් කඳුළු හෙළන්නේ නීත්‍යානුකූල බැංකුවක මුදල් තැන්පත් කර ඇති පිරිසක් ගැන නොවෙයි. එහෙම නොවන දෙදහසකටත් අඩු පිරිසක් පිළිබඳව. එදා නීත්‍යනුකූල බැංකුවක මුදල් තැන්පත් කරපු 14,000ක පිරිසක් මහ පාරට වැටුණු වෙලාවේ ඔබතුමන්ලා කැබිනට් ඇමතිවරු හැටියටයි හිටියේ. නමුත් මොකක්ද ලැබුණු පිළිතුර?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කවුද ඒකට අවසර දුන්නේ? චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු මන්ත්‍රීතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය අවසර දුන්නා තමයි. නමුත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව සමයේ තමයි ඒක කඩා වැටුණේ. අද තිබෙන මේ කැක්කුම එදා තිබුණාද? මොකක්ද ඒ මිනිසුන්ට ලැබුණු පිළිතුර? ලාභය සොයා ගෙන තැන්පත් කළා නම් පාඩුව විඳ ගන්නය කිව්වා. බලපත්‍ර සහිත බැංකුවක ගිණුම් හිමියන්ටයි එදා ඒ උත්තරය දුන්නේ. අද මේ සභාව දෙදරනකම් කතා කරනවා, බලපත්‍ර නැති, කිසිම වග කීමක් නැති ආයතනයක මුදල් තැන්පත් කරපු පිරිසකට -අසීමිත පොලියක් බලා ගෙන මුදල් තැන්පත් කරපු පිරිසකට- සහන ලබා දෙන්නය කියා. ඒ නිසා දැන් මේවා සම්පූර්ණයෙන් උඩු යටිකුරු වෙලායි තිබෙන්නේ. මේවා ඔබතුමන්ලාට අමතක වුණාට මේ රටේ ජනතාවට අමතක නැහැ; මාධ්‍යයට අමතක නැහැ. ඒ නිසා කරුණාකරලා කල්පනාවෙන් මේවා ගැන කතා කරන්න. මේ විධියට උඩු යටිකුරු වෙලා අදහස් දක්වන්න පටන් ගත්තාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවට තිබෙන ගෞරවයයි නැති වෙලා යන්නේ.

රාජ්‍ය ණය ගැන අපි හැම දාම කතා කරනවා. එතුමන්ලා කියනවා, ලෝක බැංකුවෙන් අඩු පොලියට ණය ගන්න තිබියදී අපි වැඩි පොලියට ගත්තාලු. ඔබතුමන්ලාට මා ගෞරවයෙන් මතක් කරනවා, මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නොවන බව. මේ "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහන නොවෙයි. මේ සම්පූර්ණයෙන් ඊට වෙනස් "මහින්ද චින්තන" වැඩ සටහනයි. මේකේ තිබෙනවා, පොහොර සහනාධාරය. මේකේ කියා නැහැ, කොළඹ දිස්ත්‍රික්කයේ කුඹුරු ගොඩ කරන්නය කියා. මේකේ කියා නැහැ, මහජන බැංකුව විකුණන්නය කියා. මේකේ කියා නැහැ, ජනතාවට රැකියා දෙන්නේ නැහැ කියා. මේකේ කියා නැහැ, උපාධිධාරියාට ගහලා පන්නන්නය කියා. මේකේ කියා නැහැ, සතොස අලෙවි කරන්නය කියා. මේක ජනතාව වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා ජනතාවට ඉදිරිපත් කරපු "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ සඳහා ඉදිරියට යන ආණ්ඩුවක්. ඒවා පිළිගන්නා, ඒවාට කොන්දේසි නොදමන කණ්ඩායම් එක්ක තමයි අපි මූල්‍ය කටයුතු කරන්නේ. ඒ නිසා කරුණාවෙන් මතක තියා ගන්න, මේක "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ. මේක "යළි පුබුදමු ශ්‍රී ලංකා" නොවෙයි. ඔබතුමන්ලාට ඒ කොන්දේසි යටතේ ණය දෙන්න සූදානම් වෙච්ච පිරිස් පිළිබඳව අපිත් එක්ක කතා කරන්න එපා. අපි ඊට වඩා වෙනස් ගමනකයි යන්නේ. අපේ නායකයාට මේ රටේ ජනතාව අවසරය දීලා තිබෙන්නේ ඒ ගමන යන්නයි; "යළි පුබුදමු ශ්‍රී ලංකා" පොත උස්සා ගෙන මේ රට අලෙවි කරන්න නොවෙයි; මේ රටේ රාජ්‍ය දේපළ විකුණන්න නොවෙයි. ඒ නිසා අපට ගැළපෙන ආකාරයෙන් අභියෝගයක්

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

අරගෙන මූල්‍ය වෙළෙඳ පොළට, ජාත්‍යන්තර වෙළෙඳ පොළට ගිහින් රටට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගත්තා. ඔබතුමන්ලා නොයෙක් විධියේ බාධාවන් කරද්දී අපි ඒ මුදල් ලබා ගත්තා. ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය පටන් අරගෙනම තිබෙන්නේ රාජ්‍ය ණය විශාල ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලාය කියායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක වේවා, ආයතනයක වේවා, නිවසක වේවා, පුද්ගලයකුගේ වේවා, ණය බලන්න අවශ්‍ය වන්නේ නිරපේක්ෂව නොවෙයි, සාපේක්ෂවයි. මම ඔබතුමාට සරල උදාහරණයක් කියන්නම්. රුපියල් 1,000ක ආදායමක් ලබන පුද්ගලයකු රුපියල් 100ක් ණයයි නම් ඔහු රුපියල් 200ක් ණය වෙන කොට අපට නිරපේක්ෂව කියන්න පුළුවන්, රුපියල් 100ක් ණය වෙලා සිටිය මිනිහා රුපියල් 200ක් ණය වෙලාය, සියයට සියයකින් ණය බර වැඩි වෙලාය කියා. හැබැයි රුපියල් 1,000ක්ව තිබුණු ඔහුගේ ආදායම රුපියල් 10,000 වෙලා නම් ඔහු රුපියල් 200ක් ණය ගන්න කොට දෙගුණයකින් ණය බර වැඩි වෙලාය, ඒ පුද්ගලයා ණය බරින් හිර වෙලා ඉන්නවාය කියා අපි කියන කතාව හරිද? නැහැ, ඔහු රුපියල් 100ක් ණය වෙලා ඉන්න කොට ඔහුගේ ආදායම රුපියල් 1,000යි. ඔහු රුපියල් 200ක් ණය වෙන කොට ආදායම රුපියල් 10,000යි. ඒ නිසා රටක හෝ පුද්ගලයකුගේ හෝ ආයතනයක හෝ ණය බර ගැන කතා කරන්න ඕනෑ සාපේක්ෂවයි. ඒ යුගයේ ආදායමට, ඒ යුගයේ වත්කම්වලට සමානව අපි කොච්චර ණය වෙලා තිබෙනවාද කියන එකයි බලන්න ඕනෑ. එහෙම නැතිව නිරපේක්ෂව කතා කරලා රටට මහා චිත්‍රයක් මවන්න පුළුවන්, ණය වෙලා තමයි ඔක්කොම කරන්නේ කියා. 2002 දී තමුන්නාන්සේලා බලයේ ඉන්න කොට මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 105.6ක් ණයයි; 2003 දී ඒ සංඛ්‍යාව සියයට 102.3යි; 2004 දී සියයට 102.3යි; 2005 දී සියයට 90.6යි; 2006 දී සියයට 88.7යි; 2007 දී සියයට 85.8යි. මම මේ තොරතුරු ඉදිරිපත් කරන්නේ මහ බැංකු වාර්තාවෙනුයි. මෙතුමන්ලාටත් අවශ්‍ය නම් කියවලා බලන්න ඊට අදාළ කොටස මම **සභාගත*** කරනවා.

මේ රටේ ජනතාව අනවශ්‍ය විධියට බය කරන්න ඕනෑ නැහැ. අප දවසින් දවස දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව මේ රටේ ණය ප්‍රමාණය පහළට අර ගෙන ඇවිත් තිබෙනවා. එහෙම නම් ණය කළමනාකරණය පිළිබඳ ගැටලුවක් මේ රටේ නැහැ. නමුත් ඉලක්කමක් හැටියට අරගෙන මහා චිත්‍රයක් මවන්න පුළුවන්, අපේ රටේ ණය විශාල වශයෙන් ඉහළ ගිහින් තිබෙනවාය කියා. ඒක ඉතා අසාධාරණ සඳහන් කිරීමක්ය කියන එක මා ඉතාමත් ඕනෑකමින් පෙන්වා දෙන්න කැමැතියි.

ඒ වාගේම ලෝක අර්බුදය ගැනත් එතුමා කතා කර තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුව ඒ හැම අවස්ථාවකදීම ඉතා වග කීමෙන් යුතුව කටයුතු කර තිබෙනවා. මේ රටේ ලෝක බැංකු නිත්‍ය නියෝජිතතුමියගේ ස්වාමි පුරුෂයා වැඩ කරන්නේ කොහේද කියා ඒ ගරු මන්ත්‍රීතුමා මගෙන් ඇසුවා. පවුල්වල ස්වාමි පුරුෂයන්, භාර්යාවන් වැඩ කරන තැන් ගැන දැනට හොයන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් එතුමා කී කාරණය වැදගත් නම් මා ඒ ගැන හොයා බලන්න ලෑස්තියි. ඒ අදාළ නියෝජිතයාගෙන් කෙරෙන කාර්ය භාරය ගැන විතරයි සොයා බලන්නේ. අපි ඒ තරම් ගැඹුරු ලෙස පවුල්වල අය වැඩ කරන තැන් හොයන්නේ නැහැ. නමුත් ඔබතුමා කියන කාරණාව වැදගත් නම් සොයා බලන්න සූදානම්. මන්ත්‍රීතුමා නැඟිට්ටේ ඇයි? [බාධා කිරීමක්] ඔබතුමාට ඉවසිල්ලක් නැහැ නේ. මට කථා කරන්න තව වෙලාව තිබෙනවා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න තව කොච්චර වෙලාව තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

සභාව කල් තබන්නේ 4.30ට. ආණ්ඩු පක්ෂයේ කාලය තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මා දන්නා සියලු තොරතුරු මෙහිදී මා හෙළි කරන්න සූදානම්. එතුමා අහන ප්‍රශ්නයක් තමයි, ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමාන ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ දේශීය මූල්‍ය ස්ථායිතාව සඳහා ගෙන ඇති පියවර කුමක්ද යන්න. විශේෂයෙන්ම අර්බුදයට ලක් වෙලා තිබෙන විදේශීය බැංකු එක්ක අපේ රටේ ගනුදෙනු බොහොම අල්පයි. ඒ නිසා අපට ඒ පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙයි කියා ශ්‍රී ලංකා මහ බැංකුව කල්පනා කරන්නේ නැහැ. ඒ වාගේම දේශීය ආර්ථිකයේ යම් අරමුදල් හිඟයක් ඇති වීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කර අරමුදල් සැපයීම සිදු කළා. මෙය ලංකාවේ පමණක් නොව ලෝකයෙත් වෙනවා. ඔබතුමන්ලා දන්නවා, ඇමෙරිකාව තමන්ගේ මූල්‍ය පද්ධතිය ආරක්ෂා කර ගන්න මේ වන විට ඩොලර් බිලියන 700ක් නිදහස් කරන්න කටයුතු කළ බව. ඒ වාගේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්බුදයට ලක් වී ඇති බැංකු සමඟ සබඳතාවක් ඇති ලංකාවේ ක්‍රියාත්මක වෙන විදේශීය බැංකු සමඟ සාකච්ඡා කර ඒවායේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට අවශ්‍ය උපදෙස් මේ වෙන කොට දීලා තිබෙනවා. තාවකාලිකව මෙසේ ඇති වන ආර්ථික උච්චාවචනයන්ගෙන් දේශීය ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා පොලී සහ විනිමය අනුපාතික ස්ථායිව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා තිබෙනවා. මේ තත්ත්වය විශාල පරිමාණයෙන් එළියට එන්න ඉස්සර වෙලාත් මෙවැනි තත්ත්වයන් උදා වෙන්න පුළුවන් කියන උපකල්පනය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව පියවර අරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බැංකු විසින් අපරීක්ෂාකාරී ලෙස ණය දීමෙන් ඇති විය හැකි අනිසි ප්‍රතිවිපාක පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැඩි අවධානයකින් සිටි නිසා 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ලෙස සෑම බැංකුවක්ම සිය සක්‍රිය ණය සහ අත්තිකාරම් වෙනුවෙන් සියයට 1ක පොදු වෙන් කිරීමක් අවශ්‍යයි කියා ශ්‍රී ලංකා මහ බැංකුව දැනුම් දුන්නා. මේ ප්‍රශ්නය උද්ගත වෙන්න ඉස්සරයි මේක කිව්වේ. ශ්‍රී ලංකා මහ බැංකුව පුරෝකථනයක් කළා, මෙහෙම තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්, අපි ආරක්ෂා විය යුතුයි කියා. එමෙන්ම වාණිජ බැංකුවලට ලබා ගත හැකි විදේශීය ණය ඔවුන්ගේ ප්‍රාග්ධනයේ අනුපාතයක් ලෙස සියයට 15ක සීමාවකට යටත් කළා. එමෙන්ම, බැංකුවල සුපරීක්ෂණ කටයුතු වඩා විධිමත් කිරීම සහ අවදානම් කළමනාකරණය පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඉහළ ශ්‍රේණිගත බැංකු සමඟ පවත්වා ගත් විදේශ වත්කම් මූලික වශයෙන් විදේශීය මහ බැංකුවල තැන්පතු වශයෙන් තබා ගැනීමට කටයුතු කළ නිසා ඒවායේ සියයට 100ක සුරක්ෂිතභාවයක් තහවුරු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. මෙම සිදු වීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව කල් තබා අධ්‍යයනය කළ නිසා දේශීය විදේශ විනිමය වෙළෙඳ පොළෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් පමණ මිලදී ගැනීම වරින් වර සිදු කළ අතර, එය අවශ්‍ය අරමුදල් හිඟ අවස්ථාවල භාවිත කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබී තිබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකා මහ බැංකුව හැටියට වග කීමෙන් මේ කටයුතුවලට මුහුණ දුන්නා කියන එක මට මේ ගරු සභාවට කියන්න පුළුවන්.

ඒ වාගේ ම එතුමා අහනවා, සක්විති ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ආයතනය කඩා වැටුණේ කෙසේද කියා. සක්විති ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වුණු ආයතනයක්ය කියායි එතුමා ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. මම ඉතා වග කීමෙන් කියනවා, සක්විති ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ආයතනය කිසි සේත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වෙලා නැති බව. මම දන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට මේ තත්ත්වය දැන ගෙන තියෙද්දීත් එතුමා එහෙම ප්‍රශ්නයක් ඇහුවේ ඇයි කියා.

මෙම ආයතනය ගැන 1988 මූල්‍ය පනතේ 11 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂණ ආරම්භ කර, ඒ පරීක්ෂණයේ උච්චතම අවස්ථාවට පැමිණි විට 2008.09.19 වන දා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරින් කණ්ඩායමක් මේ ආයතනයට ඇවිල්ලා ඔවුන්ගේ පොත්පත් පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු

* *පුස්තකාලයේ තබා ඇත.*
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

කළා. එතැන තමයි මම හිතන විධියට රටට මේ පණිවිඩය ගිය පළමු වන අවස්ථාව වන්නේ. එතැනින් පස්සේ තමයි තැන්පත්කරුවෝ මේ ආයතනයේ මුදල් ආපසු ගැනීම ආරම්භ කළේ. එතැනින් පසුව තමයි රටට මේ පණිවිඩය ගියේ, මෙහෙම නිල නොවන ආයතනයක් විසින් තමන්ගේ මුදල් අරගෙන තිබෙනවා කියන එක. අද සමහර විට කථා කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව පළමු වන වතාවට මෙවැනි ආයතනයක් පිළිබඳව කටයුතු කළාය කියන හැඟීම රටට දෙන්න වෙන්න ඇති මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නැහැ, ශ්‍රී ලංකා මහ බැංකුව දිගින් දිගටම මෙවැනි ආයතන ජනතාවට පෙන්වා දෙන්න, ඔවුන් නීතියේ රැහැනට හසු කරන්න කටයුතු කළා කියන එක මම වගකීමෙන් මේ ගරු සභාවේදී කියනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව, අවසර නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කරන්නේ යයි හැඟුණ පුද්ගලයන් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු 2001 වසරේදී ආරම්භ කරලා තිබෙනවා. මෙම ආයතනවල ආයෝජනය කිරීම අනතුරු දායක බව මහජනතාවට දිගින් දිගටම පැහැදිලි කරලා තිබෙනවා. 2003 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාවට අනතුරු අඟවමින් ලියා පදිංචි නොවූ සහ මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමට අවසර ලබා නොගත් ආයතන 27ක් ප්‍රසිද්ධ කර තිබෙනවා. 2003 ජනවාරි කියන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලය. එම පුවත් පත් දැන්වීමේ නම් සඳහන් ආයතන කීපයක් 2003 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුවට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගවලටත් ගිහින් තිබෙනවා. ඒ 2003 වර්ෂයේදී. මේ පිළිබඳව 2003 ජුනි මස අධිකරණයේදී ඇති කර ගන්නා ලද එකඟතාවක් මත 2003 ජූලි මාසයේදී පෙත්සම්කරුවන් විසින් සඳහන් කරන ලද නම්ද ඇතුළත්ව අවසර නොලත් මූල්‍ය ආයතන වශයෙන් ආයතන 31ක් නැවත වතාවක් මහ බැංකුව විසින් නම් කර තිබෙනවා. මේ එතුමන්ලාගේ ආණ්ඩු කාලයේයි. මේවාට මට පිළිතුරු නොදී ඉන්න පුළුවන්. මේකයි මහ බැංකුවේ ඉතිහාසය. රජය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේද නැත්නම් අපේ පක්ෂයේද කියන එක නොවෙයි ප්‍රශ්නය. මහ බැංකුව ස්වාධීන ආයතනයක් හැටියට අඛණ්ඩව මෙම වගකීම් ටික ඉදිරියට ගෙනැවිත් තිබෙනවා. අප අපේ දේශපාලනික වුවමනාකම් නිසා මොන විධියේ ප්‍රකාශ නිකුත් කරන්න හැදුවත්, මඩ ගහන්න උත්සාහ කළත් රටේ මූල්‍ය පද්ධතිය පිළිබඳ වග කියන ආයතනය හැටියට මහ බැංකුව විසින් අඛණ්ඩව මේ කටයුත්ත ඉදිරියට ගෙනැත් තිබෙනවා කියන එකයි මට කියන්න අවශ්‍ය වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී පැන නැඟුණ ප්‍රශ්නයක් තමයි, දැනට පවතින 1988 මුදල් පනත යාවත්කාලීන කිරීමට අවශ්‍යයි කියන එක. මා ඉතා සරල උදාහරණයක් කියන්නම්. මේ මුදල් පනතේ තිබෙන්නේ ඒ සැකයට භාජනය වන ආයතනයේ ගිණුම් පොත් පත් භාරයට ගෙන පරීක්ෂා කරන්න කියලායි. නමුත් අද බොහෝ ආයතනවල තිබෙන්නේ පරිගණකගත කළ ගිණුම්. මෙය ඉතා සරල උදාහරණයක්. එහෙම නැත්නම් බොහෝ ආයතන එදා තැන්පතු භාර ගත්තේ මුදලින් පමණයි. 1988 මුදල් පනතේ එහෙමයි සඳහන් වන්නේ. නමුත් අද වෙනත් බොහෝ උපක්‍රම එනම් අධ්‍යාපනය ලබා දෙන විධියට, ඒකේ කොටස්කාරයෝ නැත්නම් රැකියා ලාභීන් විධියට, තවත් සමහරු වෙනත් කෘෂිකාර්මික ආයෝජනයන් විධියට මුදල් ලබා ගන්නවා. ඉතින් මෙන්න මේවාට ගැළපෙන විධියට මුදල් පනත වෙනස් කළ යුතුයි. ඒ වාගේම පුළුල් පරාසයක අද මේවා පැතිරිලා තිබෙනවා. මහ බැංකුවේ, බැංකු නොවන මූල්‍ය ආයතනය පරීක්ෂා කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉන්නේ ඉතා සීමිත නිලධාරීන් පිරිසක්. ඒ නිසා ඒ ආයතනයත් පුළුල් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේකට අවශ්‍ය නීති පද්ධතිය අපි සංශෝධනය කරලා මේ වන කොට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවටත් මහ බැංකුව විසින් ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූල්‍ය පනතක් සංශෝධනය කරනවා කියා කියන්නේ - ඔබතුමා නීතිඥයකු හැටියට එය දන්නවා; මෙතුමන්ලාත් දන්නවා. - සරල කාරණයක් නොවෙයි. ඒ යුගයට ගැළපෙන පරිදි හිදැසක් ඇති නොවන විධියටයි මෙය කරන්නට අවශ්‍ය. සංශෝධනයක් තුළින් නැවතත් හිදැසක් ඇති වෙනවා නම් ඒ සංශෝධනයෙන් වැඩක් නැහැ. හිදැසක් ඇති නොවන විධියට මේ නීතිය හැම පාර්ශ්වයක් පිළිබඳව සලකා බලා කොහොමද ඉදිරිපත් කරන්නේ කියන කාරණයත් මේ වන කොට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා මහ බැංකුව මේකේ වගකීම නිසි පරිදිම ඉෂ්ට කළායි කියා මට කියන්න පුළුවන්. මේ කාරණාවේදී විශේෂයෙන්ම මහ බැංකුව පැත්තෙනුත් මුදල් අමාත්‍යාංශය පැත්තෙනුත් වැදගත් කාරණා හැටියට මා දකින්නේ ජනතාව දැනුවත් කිරීමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ තැන්පතුකරුවන් මෙසේ කරන්නට පෙලඹිලා තිබෙන්නේ ඇයි කියා පැහැදිලිවම කාරණා කීපයක් අපට දක්වන්න පුළුවන්. එකක්, අධික පොලියට ඇති උනන්දුව. දෙ වෙනි කාරණාව මේ තැන්පත් කිරීම් තුළින් ලබන ආදායම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැන ගැනීමට ඇති අකැමැත්ත; තවත් පැත්තකින් මේ මුදල් උපයා ගත්ත ආකාරය පිළිබඳව හෙළි කිරීමට අකැමැති වීම. සියලු දෙනාම මේ ගොඩට දාලා කථා කරනවා නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් බහුතරයකගේ ප්‍රශ්නය දිහා අපට මේ විධියට බලන්න පුළුවන්. හැම ගමකින්ම මේ ආයතනයට එන පුද්ගලයන් බැංකු කීයක් පහු කර ගෙනද මෙතැනට ආවේ කියන එක අපට ප්‍රශ්නයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද හැම ගමකම අඩු ගණනේ සමෘද්ධි බැංකුවක් හෝ තිබෙනවා. එහෙම නැත්නම් හැම තැපැල් කාර්යාලයකම ඉතිරි කිරීමේ තැන්පතුවක් භාර ගැනීමට සූදානමින් ඉන්නවා. හැබැයි ඒවායෙන් මේ වාගේ අසීමිත පොලියක් ලැබෙන්නේ නැහැ. ඒ ස්ථාන පසු කර ගෙනයි මෙතැනට ආවේ.

තමන්ගේ කාලයේදී බලපත්‍ර ලාභී බැංකුවක් කඩා වැටුණාම ඒ බැංකුව ගැන ඇස් නොඇරපු එක්සත් ජාතික පක්ෂය අද අපට යෝජනා කරනවා, මේ සඳහා වන්දි ගෙවන්න කියලා. මම අහනවා මේ වන්දිය ගෙවන්න වෙන්නේ මේ රටේ සාධාරණ විධියට ඉතුරු කරපු ජනතාවගේ බදු මුදලින්ද කියලා; සියයට 5 සිට සියයට 17 දක්වා වූ පොලියක් තමන්ගේ ඉතිරි කිරීම් - තැන්පත්- වෙනුවෙන් ගත්ත අයගෙන්ද කියලා. ජාතික ඉතිරි කිරීමේ බැංකුව ගැන බැලුවොත්, ඒ වාගේ මේ රටේ සාධාරණ විධියට මුදල් හොයපු අහිංසක ඉතිරි කිරීම් හිමියෝ දසලක්ෂ 10ක් ඉන්නවා. ඔවුන්ගෙන් මුදල් එකතු කර ගෙන තමයි මේ කියන ගෙවීම් කරන්න අපට පුළුවන් වෙන්නේ. මම මේ ගරු සභාවෙන් අහන්න කැමැතියි, ඒ වැඩේ සාධාරණයිද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මම වාගේම ගැමියෙක්. ඔබතුමාත් දන්නවා, අපේ ගම්වල, පොළවල්වල සීට්ටු තිබෙන බව. සීට්ටුකාරයෝ හිටපු ගමන් පැනලා යනවා. මිනිස්සු සීට්ටු දමනවා, අධික මුදල් අවශ්‍යතාව සඳහා. එතකොට රජය මේ සියල්ලන්ටම ගෙවන්න බැඳිලා ඉන්නවාද? දේශපාලන වශයෙන් මේක හොඳ හඬක් කියලා අපට කල්පනා කරන්න පුළුවන්. හැබැයි, මේකේ සාධාරණය මොකක්ද? රජය කියන්නේ වෙනම මුදල් හොයන ආයතනයක් නොවෙයි. රජයට මේ මුදල් ගෙවන්න වෙන්නේ මේ රටේ සමස්ත ජනතාවගෙන් ලබා ගන්නා බදු මුදලින්. සියයට 72ක අධික ලාභයක් අරමුණු කර ගෙන මුදල් තැන්පත් කරපු පිරිසකගේ අවශ්‍යතාව පිරිමහන්න අර සියලු දෙනාගේම මුදල් එකතු කරලා අපි ගෙවිය යුතුද කියන කාරණාව -අසරණ වුණු පිරිසකට තව තවත් බර පටවන්න නොවෙයි මා කථා කරන්නේ- සාධාරණද කියන ප්‍රශ්නයයි අපට තිබෙන්නේ. විපක්ෂය වාගේ පටු විධියට මේ ප්‍රශ්නය දිහා බලන්න ආණ්ඩුවේ අපට බැහැ; මුදල් අමාත්‍යාංශයට බැහැ; මහ බැංකුවට බැහැ. අපි ඒක වටහා ගත යුතුයි කියන කාරණාව මා ඔබතුමාට විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධානම කාරණාව මහජනතාව වඩ වඩා දැනුවත් කිරීමයි. 2007 අවුරුද්දේ ජූලි ඉඳලා 2008 අවුරුද්දේ සැප්තැම්බර් දක්වා පමණක් රුපියල්

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

මිලියන 14ක් මහ බැංකුව මේ සඳහා වියදම් කර තිබෙනවා. ඔබතුමා කියවපු පත්තරයේ මගේ ප්‍රකාශය වැරදිලා සටහන් වෙලා තිබෙන්න ඇති. මම ඉතා පැහැදිලිවයි ප්‍රකාශ කළේ. 2007 අවුරුද්දේ ජූලි සිට 2008 අවුරුද්දේ සැප්තැම්බර් දක්වා මහ බැංකුව රුපියල් මිලියන 14ක් -ලක්ෂ 140ක්- වියදම් කර තිබෙනවා, විවිධ ආකාරයෙන් පුවත් පත්වල දැන්වීම් දාන්න. මෙන්න මේ වගන්තිය තමයි ඔබතුමාට වෙනත් පුවත් පතකින් ලැබිලා තිබුණේ. මෙයට අමතරව නීත්‍යනුකූල බැංකු, නීත්‍යනුකූල මූල්‍ය ආයතන මම මේ කිව්ව කාල සීමාව තුළ රුපියල් 4,500ක් වියදම් කරලා "තමන් වෙතට, තමන්ගේ නීත්‍යනුකූල ආයතන වෙතට තමන්ට ගෙවන්න පුළුවන් පොලියට තැන්පතු ලබා දෙන්න" කියන ඉල්ලීම පුවත් පත් මාර්ගවලින් සහ වෙනත් මාර්ගවලින් මේ රටේ ජනතාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේවා නොදැන විශාල පොලියක් ලබා ගන්න ගියා කියන චෝදනාව සාධාරණ නැහැයි කියලායි මම කල්පනා කරන්නේ. එයට අමතරව මහ බැංකුව විසින් ජනතාව දැනුවත් කරන්න විශාල වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. විවිධ සම්මන්ත්‍රණ හරහා නිතර නිතර කතිකාවත් පවත්වලා මේ අනවසර මූල්‍ය ආයතන ගැන කියා දීමට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ආයෝජන තීරණ ගැනීමට පෙර ආයෝජනයකදී සලකා බැලිය යුතු කරුණු ඇතුළත්ව සකස් කරන ලද පත්‍රිකාවක් භාෂා තුනෙන්ම මුද්‍රණය කර ප්‍රාදේශීය සංවර්ධන බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ ලියාපදිංචි මුදල් සමාගම්වල ශාඛා කාර්යාල හරහා දිවයින පුරාම බෙදා හරින්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම වඩාත් විස්තරාත්මක තවත් පත්‍රිකාවක් -පිටපත් 4,00,000 පමණ- ග්‍රාම නිලධාරින් හරහා බෙදා හරින්නට කටයුතු කර තිබෙනවා, මේ තත්ත්වයන්වලට ගොදුරු වෙන්න එපාය කියන පණිවුඩය ජනතාවට ලබා දෙන්න. ඒ වාගේම නීත්‍යනුකූල නොවන මූල්‍ය ආයතනවල සේවකයන්ගෙන් බහුතරයක් අපොස (උසස් පෙළ) සමත් වුණ දරුවනුයි. මේ ආයතනවලට සම්බන්ධ වෙන්න එපාය කියා ඔවුන් දැනුවත් කරන්න මහ බැංකුවේ "සටහන" කියන ප්‍රකාශය නිතිපතා වැඩසටහනක් ගෙන ගිහින් තිබෙනවා. ඒ මේ රටේ පාසල් හැරලා සමාජ ගත වන්න සූදානම් වන ශිෂ්‍යයන් දැනුවත් කරන්නයි. ඒ වාගේම සුරක්ෂිත ආයෝජන හඳුනා ගැනීම සහ තෝරා ගැනීම පිළිබඳව විනාඩි 15ක විශේෂ රූපවාහිනී වැඩසටහනක් නිෂ්පාදනය කර මාසයකට වතාවක් විකාශය කර තිබෙනවා. ඒ වාගේම බැංකු අධ්‍යයන කේන්ද්‍රය පවත්වන ලද විශේෂ පුහුණු වැඩසටහනකදී අනවසර මුදල් ව්‍යාපාරවල නිරත වීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් මුදල් ව්‍යාපාර පවත්වා ගෙන යාමට අදාළ විධිවිධාන හා නීතිමය කරුණු පිළිබඳව මාධ්‍යකරුවන් දැනුවත් කරන්නත් කටයුතු කර තිබෙනවා. ඒ නිසා මහ බැංකුව මේ කාරණාව සම්බන්ධයෙන් තමන්ට ගත හැකි ක්‍රියා මාර්ග උපරිම විධියට අර ගෙන තිබෙන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

එතුමා ප්‍රශ්නයකින් අහලා තිබෙනවා, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳ පොළේ අර්බුදයක් පවතින බව ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය පිළිගන්නවාද කියලා. මේක ඉතින් අද ලෝකයම පිළිගන්නා කාරණාවක්. පොඩි ළමයෙක් වුණත් අද දන්නවා ලෝකයේ මූල්‍ය ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඉතින් එහෙම ප්‍රශ්නයක් අහන්න හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ.

එතුමා විදේශ සංචිත ගැන අහලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔක්තෝබර් මාසයේ මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක පිටපතක් **හැන්සාඩ්**ගත කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ විනිමය වත්කම් ප්‍රමාණය 2008.08.01 දිනට එක්සත් ජනපද ඩොලර් මිලියන 3.356කට සමාන අගයකින් තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ වත්කම්වලින් කොටසක් රාජ්‍ය සහ රාජ්‍ය ඇපකර සහිත ඉහළ ශ්‍රේණිගත ස්ථාවර ආදායම් සුරකුම්පත්වලත්, තවත් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙනත් මහ බැංකුවල පවත්වා ගෙන යන ගිණුම්වලත් තැන්පත් කර තිබෙනවා. තවද එක්තරා ප්‍රමාණයක් ඉහළ ශ්‍රේණිගත ජාත්‍යන්තර බැංකුවල 2008.08.01 දිනට තැන්පත් කර තිබුණා. ඒ ප්‍රමාණය අද වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙනත් මහ බැංකුවල පවත්වා ගෙන යනවා. එතුමා අසා තිබෙන ආකාරයේ කිසිම ප්‍රශ්නයක් අපේ විදේශ තැන්පත්වලට ඇති වෙලා නැහැයි කියන එක මම ඉතාමත් වුවමනාවෙන් මේ සභාවේදී කියන්න කැමැතියි.

*කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

එතුමා අහලා තිබෙනවා, ශ්‍රී ලංකා ආණ්ඩුව ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ඇමෙරිකාවේ ලේමන් බ්‍රදර්ස් ආයතනයේ මුදල් තැන්පත් කර තිබෙනවා ද කියලා. අපි මේ වන විට එවැනි තැන්පත් කිරීමක් කරලා නැහැ.

ශ්‍රී ලංකාවේ මුදල ජාත්‍යන්තරව ආරක්ෂා කර ගැනීම සඳහා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියලා එතුමා අහලා තිබෙනවා. ශ්‍රී ලංකා රුපියලේ ජාත්‍යන්තර අගය තීරණය වන්නේ දේශීය විදේශ විනිමය වෙළෙඳ පොළ ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් මත. වර්තමාන ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් විනිමය අනුපාතිකයෙහි ඉහළ විචල්‍යතාවක් ඇති වුවහොත් ශ්‍රී ලංකා මහ බැංකුව විචල්‍යතාව අවම කිරීම සඳහා වෙළෙඳ පොළට විදේශ විනිමය සපයලා මේ තත්ත්වය සමනය කරනවා. මේක මීට පෙරත් කරලා තිබෙනවා. ඒ නිසා මහ බැංකුව වග කීමෙන් කටයුතු කරනවා කියන එක අපට අලුත් දෙයක් නොවෙයි. හැබැයි මහ බැංකුව ඉදිරිපත් කරන තොරතුරු සමහර විට ඇතැම් අයට ගෝචර නොවන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂය හෝ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු කැමැති තොරතුරු නොවෙයි සමහර විට මහ බැංකුවෙන් ඉදිරිපත් වන්නේ. ඔවුන් මේ වෙලාවේ බලාපොරොත්තු වන්නේ මොකක්ද? අර ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වේ කඩා වැටිලාලු කියායි. මම අහනවා, කොහේද කඩා වැටිලා තිබෙන්නේ කියා? ඒ බලාපොරොත්තු වන දේ. ඒ ඔවුන්ගේ සිහිනය. හැබැයි ඒකට ගැළපෙන තොරතුරු මහ බැංකුව ඉදිරිපත් නොකරාවි. ඒ ගරු මන්ත්‍රීතුමා ඊට පස්සේ කියනවා, "මහ බැංකුව රජයේ හොරණෑවක් වෙලා"ය කියා. තමන්ට ගැළපෙන තොරතුරු ඉදිරිපත් නොකරන කොට ඒක හොරණෑවක්ය කියා යමෙකු කියන්න උත්සාහ කරනවා නම් ඒක තමයි දේශපාලනය කියන්නේ. මහ බැංකුව කියන්නේ ස්වාධීන ආයතනයකටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කඩා වැටුණාය කියන ආර්ථිකය සම්බන්ධව තොරතුරු කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. ඔබතුමාගේ අවසරය ඇතිව එය **හැන්සාඩ්** ගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මේ තොරතුරු රටක ආර්ථිකයේ ශක්තිය ගැන කථා කෙරෙන තොරතුරු. ඒවා ශ්‍රී ලංකා මහ බැංකුව විතරක් නොවෙයි ලෝකයේ ඕනෑම රටක භාවිත කෙරෙන දත්ත, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි මේවා එක්සත් ජාතික පක්ෂය, සමහර විට ජනතා විමුක්ති පෙරමුණ එහෙම නැත්නම් මේ රටේ රාජ්‍ය නායකයාව විවේචනය කරන්න බලා ගෙන ඉන්න කණ්ඩායම්වලට කැමැති තොරතුරු නොවන්න පුළුවන්. ඒ නිසා කෙනෙකු කියනවා නම් මේ මහ බැංකුව හොරණෑවක්ය කියා මම දැන් ප්‍රකාශ කරන්නම් මෙන්න මේ කාරණය. රටක ප්‍රධානම දේ වන ආර්ථික වර්ධනය ගැන අප කථා කරනවා. ශ්‍රී ලංකා ආර්ථිකය 2002 වසරේ සිට සියයට හයක සාමාන්‍ය වේගයකින් වර්ධනය වූ අතර එය 2005, 2006 සහ 2007 අනුගාමී වර්ෂවලදී එය සියයට හය ඉක්මවා ගිහින් තිබෙනවා. අප බලාපොරොත්තු වනවා, දැනට තිබෙන තත්ත්වයත් එක්ක 2008 වසර සඳහා සියයට හයක ආර්ථික වර්ධන වේගයක්. මුළු ලෝකයම ආර්ථික අවපාතයකින් පීඩා විඳින වෙලාවේ අපට සියයට හයකට වැඩිය ආර්ථික වර්ධන වේගයකින් යන්න පුළුවන් කියලා මහ බැංකුවයි මේ වාර්තා කරන්නේ. මේ මහ බැංකුව කියන්නේ මුදල් අමාත්‍යාංශයට නොවෙයි. මහ බැංකුව කියන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ

*කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

මතය නොවෙයි. මහ බැංකුව ස්වාධීන ආයතනයක්; මේ රටේ ඉන්න ඉහළම විද්වතුන් සම්බන්ධ වෙලා ස්වාධීනව තොරතුරු ඉදිරිපත් කරන ආයතනයක්. මේ රට පාලනය කරන්නේ එක්සත් ජාතික පක්ෂ රජයක් වෙන්න පුළුවන්; අපේ රජයක් වෙන්න පුළුවන්. නමුත් අප ඒක දකිනවා. මහ බැංකුව දීර්ඝ කාලීනව වග කීමෙන් කටයුතු කරපු ආයතනයක්. මේ ලේඛනයත් මම **සභාගත*** කරනවා. මම ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා, මේ ලේඛනයත් **හැන්සාඩ්** ගත කරන ලෙසට.

මම තවත් චෝදනාවක් දැක්කා. එනම් අපි මේ වර්ධනය ගැන කථා කරන්නේ සේවා අංශයෙන් විතරය කියා කිව්වා. නැහැ, අපි සියලු අංශවලින් විවිධ මට්ටම්වලින් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. 2007 වර්ෂයේදී සේවා අංශයෙන් සියයට 59.6ක වර්ධනයක් අපි ලබා ගත්තා. කාර්මික අංශයෙනුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 28.5ක වර්ධනයක් අප ලබා ගත්තා. මොන බාධකය තිබුණත් කෘෂිකාර්මික අංශයෙනුත් අපි සියයට 11.9ක වර්ධනයක් ලබා ගත්තා. මේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා. මම ඔබතුමාගේ අවසරය ඇතිව මේ ලේඛන **හැන්සාඩ්** ගත කිරීම සඳහා **සභාගත*** කරනවා. මේ වාර්තා ඉතාම මෑත, එනම් පසු ගිය ඔක්තෝබර් මාසයේ ලබා දුන් වාර්තා.

විදේශීය ආයෝජනයන් ලැබෙන්නේ නැහැයි කියලා අපට චෝදනා කෙරෙනවා. පෞද්ගලීකරණ ලැබීම් නොවන දළ සෘජු විදේශීය ආයෝජන ගලා ඒම 2006 වසර තුළ සියයට 76යි. 2007ත් එය සියයට 26ක් වෙලා තිබෙනවා. උතුරු නැඟෙනහිර පළාතේ අප දැනට කර ගෙන යන මානුෂික මෙහෙයුම, රට ඇතුළේ ත්‍රස්තවාදීන් විටින් විට ඇති කරන විවිධ හොල්මන් -මේ සියල්ල- මැද්දේ විදේශීය ආයෝජනත් මේ රටට ගලා ගෙන ඇවිල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විදේශ ගතව සිටින ශ්‍රී ලාංකිකයන් මේ රටට මුදල් එවන්න භයයි කියලා දැන් සමහරුන් කියන්න උත්සාහ කරනවා. නැහැ, එහි පැහැදිලි වර්ධනයක් තිබෙනවා. ගෙවුම් තුලනය යහපත් කිරීමට උපකාරී වෙමින් හා වෙළෙඳ හිඟයෙන් සියයට 70ක ප්‍රමාණයක් පියවමින් 2004 වසරේ සිට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සියයට පහළොවකින් වර්ධනය වී තිබෙනවා. එය දිගින් දිගටම හැම වර්ෂයකම සියයට පහළොවකින් ශක්තිමත් වෙලා තිබෙනවා. මම හිතන්නේ අප - මේ රටේ සමස්ත ජනතාවම- ඔවුන්ට ණය ගැතියි කියලායි. ලක්ෂ පහළොවකට වැඩි අපේ රටේ ශ්‍රමිකයන් විදේශයන්වලට ගිහිල්ලා අපේ වෙළෙඳ ශේෂයෙන් සියයට 70ක් ආවරණය කරලා දෙනවා. වර්ෂයෙන් වර්ෂය සියයට පහළොවකින් ඔවුන් මේ රටට හොයලා දෙන ආදායම වැඩි වෙමින් පවතිනවා. මේවා තමයි රටක ආර්ථික අභිවෘද්ධිය මනින විවිධ උපකරණ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව කාරණාවක් කිව්වා. අපේ අරමුණ ආරක්ෂාව සපයා ගැනීම විතරයි කියලා චෝදනා කරනවා මම දැක්කා. නැහැ, හොඳම උදාහරණය ගනිමු. 2008 අය වැයේ සියයට 19.3කින් ආරක්ෂක වියදම වැඩි වුණා. හැබැයි ඒකේ ප්‍රතිඵල අද අප දකිනවා. කථා නොකරපු නැඟෙනහිර අද ප්‍රජාතන්ත්‍රවාදී පළාත් සභාවක් පිහිටුවා ද්‍රවිඩ මහ ඇමතිවරයකු පාලනය කරනවා. ඊයේ පෙරේදා වන කොට එහෙන්, එල්ටීටීඊ සංවිධානයට මුලින් සම්බන්ධ වෙලා හිටපු ගරු විනායාගමූර්ති මුරලිදරන් මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ආවා. මේක දශක තුනකට පස්සේ, ජාතියේ ඇවිලෙන ගිනි දැල්වලට අතිගරු ජනාධිපතිතුමාගේ මෙහෙය වීමෙන් ලබා දුන්නු හොඳම දිය දහරයි කියලා මම කල්පනා කරනවා. මේ ජයග්‍රහණ ලැබුවේ මේවායින් තමයි.

ඊළඟට මම කියන්න හදන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008 වර්ෂයේ ආරක්ෂක වියදම සියයට 19.3කින් වැඩි වෙන කොට ආණ්ඩුවේ ප්‍රවාහන හා විදුලි සංදේශ වියදම සියයට 75කින් වැඩි වෙලා තිබෙනවා කියලායි. අපි යුද්ධ කරනවා විතරක් නොවෙයි. බලශක්ති සහ ජලය සඳහා වියදම සියයට 61.3කින් වැඩි වෙලා තිබෙනවා. සෞඛ්‍ය සඳහා වියදම සියයට 16.2කින් වැඩි වෙලා තිබෙනවා. ඔබතුමා සබරගමුව පළාත් සභාවේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයායි. 1994 අවුරුද්දේ අප බලයට එන කොට අර කරවනැල්ල රෝහලේ එක වෛද්‍යවරයායි සිටියේ. දැන් එය බොහෝ පහසුකම් තිබෙන ආරෝග්‍යශාලාවක් බවට පත් වෙලා තිබෙනවා. මේවා තමයි, ඒ වියදම්. අධ්‍යාපනය සඳහා වියදම සියයට 18.5කින් වැඩි වෙලා තිබෙනවා. අපි සලකන්නේ එක පැත්තක් ගැන විතරයි කියා යම් අයෙක් චෝදනා කරනවා නම්, මා හිතන හැටියට මේක -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වා, අධ්‍යාපනය සඳහා වියදම සියයට 16.5කින් වැඩි වෙලා තිබෙනවාය කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
සියයට 18.5කින් වැඩි වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උද්ධමනය සියයට 30කින් වැඩි වෙලා තිබෙනවා. මූලික අවශ්‍යතාවන් -

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඉන්න. උද්ධමනය ගැනත් මා කථා කරනවා. ඔබතුමාට ඉවසිල්ලක් නැහැ, මේවා අහන කොට. අපට තේරෙනවා, ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය. ඔබතුමන්ලාගේ පක්ෂයට, ඔබතුමන්ලාට තිබෙන සිහිනවලට දවසින් දවස ඇති වන බලවත් බාධාවන් එක්ක ඔබතුමන්ලාගේ ඉවසීම සීමා වෙනවා. ඊයේ ගරු විනායාගමූර්ති මුරලිදරන් මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවට එන කොට ජාතියම ගරු කළා මා දැක්කා. ඔබතුමා කිව්වා, කොටියෙක් ආවාය කියා. මා හිතන හැටියට ගරු මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඊට වඩා සංයමයකින් යුතුව කථා කරන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒ අවස්ථාවේ මා මේ ගරු සභාවේ සිටි නිසායි, මා වග කීමෙන් කියන්නේ. [බාධා කිරීමක්] ඒ ඔබතුමන්ලාට තිබෙන නොඉවසිල්ල. ඔබතුමන්ලාගේ සිහිනය දවසින් දවස බොඳ වෙනවා. අපට ඒකට කරන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඊළඟට ඔබතුමා බලයට ඇවිත් මේවා විසඳනවාය කියන කොට ගරු කථානායකතුමාත් හිනා වෙනවා මා දැක්කා. අපට ඒවාට කරන්න දෙයක් නැහැ. අපි සත්‍යයත් එක්කයි ඉන්නේ.

මේ ගරු සභාවට මා කියන්නේ අපි මේ රටේ ආරක්ෂක වියදම් සියයට 19.3කින් වැඩි කරලා මේ රටේ ආරක්ෂාව දවසින් දවස තර කරන කොට ප්‍රවාහනය සහ විදුලි සංදේශ සඳහා සියයට 75කින් වියදම වැඩි කරලා තිබෙනවා කියලායි. චෝදනාවක් කරන්න බැහැ, කාටවත්. මේ මහ බැංකුව ඉදිරිපත් කරන වාර්තා. මේ ලේඛනය **හැන්සාඩ්**ගත කරන්න ඔබතුමාගෙන් අවසර ඉල්ලමින් මා එය **සභාගත*** කරනවා. ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමන්ලාට කථා කරන්න පුළුවන්.

අය වැය හිඟය ගැන මා කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අය වැය හිඟය වසර 2001 සිට දිගින් දිගටම සියයට 29කින් පහළ බැහැලා තිබෙනවා. මේ එකක් ගැනවත් නෑසූ කනින්

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

** කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

එක පාර්ශ්වයක් දිහා බලා, ජනතාව සතුටු කරන්න වග කීමකින් තොරව කටයුතු කරනවාය කියා ප්‍රකාශ කරන්න උත්සාහ කරන විපක්ෂයට මා කියනවා මේ සටහන් ටික බලන්නය කියලා. මේවා ශ්‍රී ලංකා මහ බැංකුව ඔක්තෝබර් මාසයේ ඉතා ස්වාධීනව ඉදිරිපත් කරපු වාර්තා. මේවා අසත්‍ය නම් එතුමන්ලාට වග කීමක් තිබෙනවා, සත්‍ය ඒවා ඉදිරිපත් කරන්න. මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව පැවැත්වෙනවා, ලබන සතියේ. එහිදී මේවා පෙන්වා දෙන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ වගකීම ජනතාව අනවශ්‍ය බියකට පත් කිරීම නොවෙයි කියන එක කියන්නයි මා උත්සාහ කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් අප උද්ධමනය ගැන කථා කරනවා. මේකත් විපක්ෂයට හැම දාම සතුටු දායක කාරණාවක්. හැබැයි, මේ රටේ උද්ධමනය වැඩියෙන්ම වැඩි වුණේ අපේ යුගවල නොවෙයි. අද උද්ධමනය වැඩි වෙලා තිබෙන්නේ මොකද? අද තෙල් මිළ ඉහළ ගිහින් තිබෙනවා. අප යුද්ධයකුත් කරනවා. ලෝකයේත් බඩු මිල වැඩි වී තිබෙනවා. මේ හැම බාධාවකටම මැදි වෙච්ච අපේ රටේ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි උද්ධමනය වැඩි වෙලා තිබෙන්නේ. මා කියන්නම් දැන් ලෝකයේ තිබෙන තත්ත්වය. පාකිස්තානය වසර 30කට පසු ඉහළම උද්ධමනයට අද මුහුණ දී තිබෙනවා. සිංගප්පූරුව වසර 25කට පසු වැඩිම උද්ධමන වේගය මේ වර්ෂයේ සටහන් කර තිබෙනවා. කැමැත්තෙන් නොවෙයි. නමුත් මේ රටවල් ලෝකයත් එක්ක බැඳී තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ වසර 17කට පසු වැඩිම උද්ධමන වේගය සටහන් වී තිබෙනවා. යුරෝපා හවුල වසර 16කට පසු වැඩිම උද්ධමන වේගය සටහන් කර තිබෙනවා. [බාධා කිරීම්] ඔබතුමා බලන්න. ඔක්තෝබර් මාසයේ මහ බැංකුව ඉදිරිපත් කළ මාසික වාර්තාවකින් මම මේ කියන්නේ. [බාධා කිරීමක්] හරි. සියයට 3.5 හරි. වැඩි වීමේ වේගය ගැනයි මේ කථා කරන්නේ ගරු මන්ත්‍රීතුමනි. අප දැන ගෙනයි කථා කරන්නේ. ඉන්දියාවේ වසර 13කට පසු වැඩිම උද්ධමන වේගය, ජපානයේ වසර 10කට පසු ඉහළම උද්ධමන වේගය. ඕස්ට්‍රේලියාවේ -අපේ මිනිස්සු සැප සම්පත් හොයා ගෙන යන රටවල් මේ- අවුරුදු 9කට පසු වැඩිම උද්ධමන වේගය. ඉතින් මේක අපේ රටට විතරක් ඇති වෙච්ච දෙයක් විධියට මහා හඬක් නැඟුවාට හරි යන්නේ නැහැ. රජයක් හැටියට අප මේවාට පිළියම් යොදනවා. මම හිතන්නේ විපක්ෂයක් හැටියට අපට ඔවුන්ගේ සාධාරණ සොයා බැලීම් අවශ්‍යයි. මේක මේ රටට පමණක් උරුම වෙච්ච මහා අපලයක් ද? එහෙම නේ මේ කියන්න උත්සාහ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාගේත් අවධානය පිණිස රට රටවල උද්ධමන අගය සටහන් වන මේ ලේඛනය **හැන්සාඩ්** වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

ඒ වාගේම ඒක පුද්ගල ආදායම රටක ආර්ථික ශක්තිය මනින, ආර්ථික වර්ධනය මනින තවත් ඉතාමත් වැදගත් මිම්මක්. 2002 දී මේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 900යි. 2007 වර්ෂය වන විට ඩොලර් 1,617යි. අප මේ පැත්තත් බලන්න ඕනෑ. මේ රටේ උද්ධමනය වැඩි වෙන කොට බඩු මිල ඉහළ යන කොට ඒක පුද්ගල ආදායම ඩොලර් 900 සිට ඩොලර් 1,617ක් වෙලා තිබෙනවා.

ඒ වාගේම නාගරික හා ග්‍රාමීය දරිද්‍රතාව පසු ගිය වසර කිහිපය තුළ සැලකිය යුතු ලෙස අඩු වී තිබෙනවා. මේ බව සඳහන් වන්නේත් මහ බැංකුව ඔක්තෝබර් මාසයේ ඉදිරිපත් කළ වාර්තාවේයි. 1990/91 ශ්‍රී ලංකාවේ නාගරික සහ ග්‍රාමීය දරිද්‍රතාව සියයට 26.1යි. 1995/96 වන විට එය සියයට 28.8 යි. තවත් වැඩි වෙලා තිබෙනවා. 2002 වර්ෂයේ සියයට 22.7යි. අද මේ ආර්ථිකය කඩා වැටිලාය කියා විපක්ෂය මහ අඳෝනාවක් නඟනවා. 1990/91 දී සියයට 26.1ක් වුණු දරිද්‍රතා ප්‍රතිශතය 2006/07 දී සියයට 15.2යි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතින් අප ආපස්සට ගිහින්ද, ඉදිරියට ගිහින්ද? මේවා තමයි සාධාරණව රටේ ආර්ථික ප්‍රගමනය මනින දත්ත.

***කථාව අවසානයේ පළ කර ඇත.***
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

ඒ වාගේම තවත් වැදගත්ම කාරණාවක් තමයි, සේවා වියුක්තිය. 1994 අපි මේ රට භාර ගත්තා. 1995 වන විට මේ රටේ සේවා වියුක්තිය සියයට 12ට වැඩියි. 2008 වර්ෂයේ පළමු වන කාර්තුවේ මේ රටේ සේවා වියුක්තිය සියයට 5.2යි. මහ බැංකුවේ ඔක්තෝබර් මාසයේ වාර්තාවෙන් මේ කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක කාරණාවක් සඳහන් කරන්න මා ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා. දූරකථන භාවිතාවත් රටක දියුණුව මනින්න ගන්නා එක මිම්මක්. අද මේ රටේ සෑම පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් කෙනකුට ජංගම දූරකථනයක් හෝ තිබෙනවා. ඒ කියන්නේ සියයට පණහක් දූරකථන භාවිත කරනවා. මේකත් අද ලෝකයේ ආර්ථික දියුණුව මනින එක්තරා මිම්මක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටෙත් ලොකු ප්‍රශ්නයක් තිබුණා. අප මේ ආර්ථික වර්ධනය ගැන කථා කරද්දී නිදහස ලබා අවුරුදු 60ක් වෙන තුරුම අපේ ආර්ථික වර්ධනයේ සියයට 50කට වැඩි ප්‍රමාණයකට උරුම කිව්වේ බස්නාහිර පළාත බව කියන්න ඕනෑ. අරණායක, දැරණියගල වැනි අපේ ප්‍රදේශ ගත්තොත් ආර්ථික වර්ධනය කීයද කියා ඔබතුමා දන්නවා. නමුත් ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමන්ගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ විශාල වෙනසක් කරන්නට, මේ රටේ සම්පත් ග්‍රාමීය ප්‍රදේශවලට හරවන්නට කටයුතු කළා. මග නැඟුම තුළින් වන්නට පුළුවන්, ගම නැඟුම තුළින් වන්නට පුළුවන්, වෙනත් සංවර්ධන යෝජනා ක්‍රම තුළින් වන්නට පුළුවන් එතුමා ඒ කටයුතු කළා. අද අප එහි ප්‍රතිඵල ක්‍රම ක්‍රමයෙන් භුක්ති විඳිනවා. 2006 වර්ෂයේ සියයට 50.1ක ආර්ථික වර්ධන වේගයේ අයිතිය බස්නාහිර පළාතටයි තිබුණේ. නමුත් 2007 වර්ෂයේ සියයට 48.4යි බස්නාහිර පළාතට හිමි වුණේ. ඒ කියන්නේ සියයට 2කට වැඩි ප්‍රමාණයක් එක වර්ෂයක් තුළ මේ රටේ ග්‍රාමීය ප්‍රදේශවලට, නැඟෙනහිරට වෙන්නට පුළුවන්, තවත් පළාතකට වෙන්නට පුළුවන් ආර්ථික වේගය ගලා ගෙන යන්නට අපේ මේ ක්‍රමවේදය තුළ පුළුවන්කම ලැබී තිබෙනවා. පසු ගිය කාලයට වඩා මේ කාල සීමාව තුළ ඒ ආර්ථික වර්ධන වේගයට දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කය, ඒ දිළිඳු ප්‍රදේශ උරුමකම් කියන්නට මහින්ද චින්තන වැඩ පිළිවෙළත් එක්ක පහසුකම් ලැබුවේ කොහොමද කියා මෙහි තිබෙනවා. එම ලේඛනය ඔබතුමාගේ අවසරය පරිදි **හැන්සාඩ්**ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.


ආර්ථිකය කඩා වැටිලාය කියා විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමෙක් කිව්වා. එතුමාට අවශ්‍ය පිළිතුර මේ වාර්තාව තුළ තිබෙනවා. අපට හැබැයි අභියෝග තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, ලෝකයේම ආර්ථික බලවතාට අද සිද්ධ වෙලා තිබෙන කාරණාව. අපි ආර්ථික බලවතෙක් නොවෙයි. අපි හැම පීඩනයකටම ලක් වන කුඩා රටක්. මේක අපට ඉතාම තදින් බලපානවා, විදේශ වෙළඳාමට බොහෝ සෙයින් සම්බන්ධ වුණු රටක් හැටියට. තවත් පැත්තකින් අපි ත්‍රස්තවාදයත් එක්ක තීරණාත්මක සටනක යෙදිලා සිටින අවස්ථාවක්. තෙල් මිල ඉහළ ගිහින් තිබෙනවා, තවත් පැත්තකින්. නමුත් මේ සියලු අභියෝගත් එක්ක අපි ඉදිරියට පැහැදිලි ස්ථාවර ගමනක් යනවාය කියන්න මේක හොඳ අවස්ථාවක් කියලා මම හිතනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළත් එතුමාගේ ශක්තියත් එක්ක ඔබතුමන්ලාගේ සිහින තව දුරස්ථ වන්න පුළුවන්. නමුත් ඔබතුමන්ලා මේ ජාතියට ආදරයෙන් අවංකව නම් කථා කරන්නේ, අමාරුවේ වැටුණු ගිණුම් හිමියන් වෙනුවෙන් ආදරයෙන් නම් කථා කරන්නේ අවංකව මේ යන ගමනට ශක්තිය ලබා දීලා පිරිසිදු විවේචනත් එක්ක අපත් සමඟ මේ ගමන යමු කියා ආරාධනා කරමින්, මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***කථාව අවසානයේ පළ කර ඇත.***
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*


*සභා මේසය මත තබන ලද ලේඛනය :
சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :
Statement tabled :

මතය: විදේශ මුදල් සංචිත අවදානම් ලෙස පහත වැටී ඇත.
සත්‍ය තත්ත්වය: විදේශ ණය සහ ද්‍රවශීලතා තත්ත්වය යහපත් ලෙස වර්ධනය වී ඇත.


ජාත්‍යන්තර සංචිත ඉහළයාම (ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් නොමැතිව - එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3358




ජාත්‍යන්තර සංචිත (ආනයනය කළ මාස අනුව)




මහ බැංකු මැදිහත් වීම (එ.ජ.ඩොලර් දශ ලක්ෂ)




ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

***සභා මේසය මත තබන ලද ලේඛන :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்றுகள் :*
*Documents tabled :*

## ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව - 2007


### 6.9 සංඛ්‍යා සටහන — රාජ්‍ය ණය දර්ශක


| ශීර්ෂය | 2004 | 2005 | 2006 | 2007 තාවකාලික | 2008 (අ) ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|
| රාජ්‍ය ණය/ද.දේ.නි. | 102.3 | 90.6 | 88.7 | 85.8 | 82.3 |
| දේශීය ණය/ද.දේ.නි. | 54.7 | 51.6 | 50.3 | 47.9 | 44.6 |
| විදේශීය ණය/ද.දේ.නි. | 47.6 | 39.0 | 38.4 | 37.9 | 37.7 |
| මුළු විදේශීය ණය/අපනයන[ආ] | 134.8 | 120.6 | 127.5 | 129.5 | 134.8 |
| මුළු ණය සේවාකරණ ගෙවීම්/ද.දේ.නි | 14.4 | 14.1 | 15.1 | 14.0 | 14.4 |
| මුළු ණය සේවාකරණ ගෙවීම්/ රජයේ ආදායම[ඇ] | 96.5 | 90.8 | 93.0 | 88.6 | 80.2 |
| එයින් දේශීය ණය සේවාකරණ ගෙවීම්/රජයේ ආදායම[ඇ] | 81.4 | 83.3 | 79.8 | 73.5 | 62.2 |
| මුළු ණය සේවාකරණ ගෙවීම්/ රජයේ වියදම[ඈ] | 45.7 | 42.6 | 44.1 | 43.2 | 41.9 |
| එයින් දේශීය ණය සේවාකරණ ගෙවීම්/රජයේ වියදම[ඈ] | 38.6 | 39.1 | 37.9 | 35.8 | 32.5 |
| විදේශීය ණය සේවාකරණ ගෙවීම්/ අපනයන[ආ] | 6.4 | 3.6 | 7.1 | 8.2 | 3.2 |
| දේශීය ණය පොලී /ද.දේ.නි. | 5.1 | 4.6 | 4.6 | 4.5 | 4.3 |
| දේශීය ණය පොලී/ රජයේ වර්තන වියදම් | 27.2 | 25.5 | 24.4 | 25.9 | 25.2 |
| විදේශීය ණය පොලී/ අපනයන (ආ) | 1.9 | 0.9 | 1.9 | 2.0 | 2.6 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(අ) මුල් අයවැය ඇස්තමේන්තු මත පදනම් වී ඇත.
(ආ) භාණ්ඩ හා සේවා අපනයන
(ඇ) රජයේ ආදායම ආර්ථික වර්ගීකරණයට අනුව
(ඈ) ණය ආපසු ගෙවීම් ඇතුළත්ව රජයේ වියදම


# මතය: ශ්‍රී ලංකාවේ වර්ධනය අස්ථාවර හා තිරසාරකමින් තොරය.
# සත්‍ය තත්ත්වය: ශ්‍රී ලංකාව ශක්තිමත් හා තිරසාර වර්ධනයක් ලබමින් පවතී.




## ශ්‍රී ලංකාවේ ශක්තිමත් ආර්ථික වර්ධනය

- ශ්‍රී ලංකා ආර්ථිකය 2002 වසරේ සිට සියයට 6 ක සාමාන්‍ය වේගයකින් වර්ධනය වූ අතර එය 2005, 2006 සහ 2007 යන අනුගාමී වර්ෂ වල දී සියයට 6 ඉක්මවා යන ලදී.
- 2008 වසර සඳහා සියයට 6 ක පමණ ආර්ථික වර්ධනයක් පුරෝකථනය කෙරේ.
- ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කලාපයේ සමගාමී රටවල් හා B හා BB ස්වෛරීත්ව ණය වර්ගීකරණ ලබා ඇති රටවල් අභිබවා ගොස් ඇත.





ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

6


# මතය: වර්ධනයක් සිදුවී ඇත්තේ සේවා අංශයේ පමණි.

# සත්‍ය තත්ත්වය: ආර්ථිකයේ සියලුම අංශයන්හි තිරසාර වර්ධනයක් වාර්තා කරන ලදී.

## ද.දේ.නි. යේ ආංශික දායකත්වය (%)




## ද.දේ.නි. යේ ආංශික වර්ධනය (%)




## සුවිශේෂ ලක්ෂණ

### සේවා අංශය

- 2007 වසරේ ද.දේ.නි. යට 59.6% ක දායකත්වයක් ලබා දී ඇති අතර සියලු ප්‍රධාන උප අංශ වල දායකත්වයෙන් 7.1% කින් වර්ධනය විය.
- දළ වශයෙන් ශ්‍රම බලකායෙන් සියයට 42.1 කට රැකියා සපයයි.
- 2008 ප්‍රථම භාගය තුළදී සේවා අංශය 6.7% කින් වර්ධනය විය.

### කාර්මික අංශය

- 2007 දී ද.දේ.නි. යට 28.5% ක දායකත්වයක් ලබා දී ඇත.
- කාර්මික අංශයේ නිමැවුම සඳහා අපනයන හා දේශීය වෙළෙඳ පොළ අභිමුඛ කර්මාන්ත දායක විය.
- 2008 ප්‍රථම භාගය තුළදී කාර්මික අංශය 6.5% කින් වර්ධනය විය.


### කෘෂි කාර්මික අංශය

- 2007 වසරේ ද.දේ.නි.යට 11.9 % ක දායකත්වයක් ලබා දී ඇත.
- ප්‍රධාන නිෂ්පාදන වනුයේ සහල්, තේ, රබර් සහ පොල්ය.
- ධීවර සහ පශු සම්පත් අංශ ද මෙම වර්ධනයට දායක විය.
- 2008 පළමු කාර්තුව තුළ දී කෘෂිකාර්මික අංශය 6.6% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## මතය: ත්‍රස්තවාදී උවදුර නිසා සෘජු විදේශීය ආයෝජන අඩුවී ඇත.
## සත්‍ය තත්ත්වය: සෘජු විදේශීය ආයෝජන අඛණ්ඩව ඉහළ යමින් පවතී.

### ශුද්ධ සෘජු විදේශීය ආයෝජන ලැබීම්, එ.ජ.ඩො. දශ ලක්ෂ




### ආංශිය වශයෙන් පෞද්ගලික සෘජු ආයෝජන - 2007




### සෘජු විදේශීය ආයෝජන ස්ථාවර ලෙස ඉහල යමින් පවතී

- පෞද්ගලීකරණ ලැබීම් නොවන දළ සෘජු විදේශීය ආයෝජන ගලා ඒම 2006 වසර තුළ 76% කින් ඉහළ ගිය අතර 2007 වසර තුළ එය 26% කින් වර්ධනය විය.
- සෘජු විදේශීය ආයෝජනයන් ශ්‍රී ලංකාවට ආකර්ෂණය වීමට පහත කරුණු හේතු වී ඇත.
  - භූගෝලීය තත්ත්වය
  - ඉන්දියානු වෙළෙඳපොළ තුළට සෘජුවම පිවිසීම
  - උසස් තත්ත්වයේ ශ්‍රම බලකාය
  - විවෘත වෙළෙඳපොළ ආර්ථිකය
  - විවිධ නිදහස් වෙළෙඳපොළ ගිවිසුම්


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

TOWARDS PROSPERITY

## මතය: සමස්ත අයවැය හිඟය ආර්ථික වර්ධනය සීමාකරයි.

## සත්‍ය තත්ත්වය: රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතී.

**සමස්ත අයවැය හිඟය පහළයමින් පවතී (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)**




Source: Central Bank of Sri Lanka and IMF

1

**මූලික විශේෂතා**


- වසර 2001 සිට අයවැය හිඟය සියයට 29 කින් පමණ පහළ බැස ඇත.
- රාජ්‍ය ආදායම් හා වියදම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වඩා පුළුල් උපාය මාර්ගවලින් මෙහෙය වූ වඩා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය
- මෙම ධනාත්මක ප්‍රවණතාවය ඉදිරියේ දී නොකඩවා බලාපොරොත්තු විය හැක.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


**මතය: විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයෝ සිය රටට මුදල් එවීමට කැමැත්තක් නොදක්වති.**

**සත්‍ය තත්ත්වය: විදේශ ප්‍රේෂණ සැලකිය යුතු මට්ටමකින්ද ශීඝ්‍රයෙන්ද වර්ධනය වෙමින් පවතී.**


**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (එ.ජ. ඩොලර් බිලියන)**




**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කලාප අතර බෙදී යාම (2006)**




**ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස පවා ප්‍රේෂණ වැඩි වෙමින් පවතී.**




- ගෙවුම් තුලනය යහපත් කිරීමට උපකාර වෙමින් හා වෙළඳ හිඟයෙන් 70% ක ප්‍රමාණයක් පියවමින් 2004 වසරේ සිට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 15% පමණ ශක්තිමත් වේගයකින් වර්ධනය වී තිබේ.

- 2007 වසර තුළදී විදේශගත සේවා නියුක්තිකයන්ගේ 15.8% කින් පමණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,502 ක් දක්වා සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇති අතර, 2008 වසරේදී ද හිතකර වේගයකින් අඛණ්ඩව ඉහළ යමින් පවතී.


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**මතය: මහජනයාට ආර්ථික වර්ධනය දැනෙන්නේ නැත.**

**සත්‍ය තත්ත්වය: එවැනි ප්‍රකාශයක් හමුවේ වුවද සමාජ සහ ආර්ථික දර්ශක අඛණ්ඩව වැඩිදියුණු වෙමින් පවතී. ඒවායින් සමහරක්,**

මෑත වර්ෂ තුළ දී සැලකිය යුතු ලෙස සන්නිවේදන සේවා ඉහළ ගොස් ඇත. 2008 ජූනි මාසය වන විට ජංගම දුරකථන ඇතුළු දුරකථන ඝනත්වය 60 ක් වූ අතර මෙයින් පිළිබිඹු වනුයේ සෑම පුද්ගලයින් දෙදෙනෙකුගෙන් එක්අයෙකුට දුරකථනයක් පවතින බවයි.

**දුරකථන ඝනත්වය (පුද්ගලයින් සියයටකට ඇති දුරකථන සංඛ්‍යාව)**





ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA
TOWARDS PROSPERITY


මතය: වැඩිවන ජීවන වියදම, ආර්ථික වර්ධනය හා ස්ථායීභාවය වළකාලනු ඇත.

සත්‍ය තත්ත්වය: ජීවන වියදම ඉහළ මට්ටමක පැවතිය ද ඉහළ රැකියා නියුක්තිය හා ඉහළ යන ඒකපුද්ගල ද.දේ.නිෂ්පාදිතය, ආර්ථිකයේ ශක්තිමත් වර්ධන ගාමකත්වය පිළිබිඹු කරයි.

## ඒකපුද්ගල ද.දේ.නි. (එ.ජ.ඩොලර්)





## ජාත්‍යන්තර මිල ගණන් 2002 - 2007




## සුවිශේෂී ලක්ෂණ

- පසුගිය වසර 4 තුළ ඒක පුද්ගල ද.දේ.නි. (එ.ජ.ඩොලර්) සියයට 50 කට වඩා වර්ධනය වී ඇත.
- ශක්තිමත් ආර්ථික වර්ධනය තුළින් ශක්තිමත් රැකියා උත්පාදනයක් ඇතිවී තිබේ.
  - ලෝක තෙල් මිල හා භාණ්ඩ මිල ගණන් පෙර නොවූ විරූ ලෙස ඉහළ යමින් පවතී.
  - කෘෂිකර්මය, ධීවර කර්මාන්තය හා සත්ව පාලනය සඳහා ඇති අවධානය වැඩි වී ඇත.

## අඩුවන විරැකියා අනුපාතය (%)




ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මතය: මහජනයාට ආර්ථික වර්ධනය දැනෙන්නේ නැත.

සත්‍ය තත්ත්වය: එවැනි ප්‍රකාශයක් හමුවේ වුවද සමාජ සහ ආර්ථික දර්ශක අඛණ්ඩව වැඩිදියුණු වෙමින් පවතී. ඒවායින් සමහරක්,

• නාගරික සහ ග්‍රාමීය දරිද්‍රතාව පසුගිය වසර කිහිපය තුළ සැලකිය යුතු ලෙස අඩුවී ඇත.

ජනගහන දරිද්‍රතා දර්ශකය (ප්‍රතිශතය)


| | 1990/91 | 1995/96 | 2002 | 2006/07 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 26.1 | 28.8 | 22.7 | 15.2 |
| අංශයන් | | | | |
| නාගරික | 16.3 | 14.0 | 7.9 | 6.7 |
| ග්‍රාමීය | 29.5 | 30.9 | 24.7 | 15.7 |
| වතු | 20.5 | 38.4 | 30.0 | 32.0 |

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මතය: මහජනයාට ආර්ථික වර්ධනය දැනෙන්නේ නැත.

සත්‍ය තත්ත්වය: එවැනි ප්‍රකාශයක් හමුවේ වුවද සමාජ සහ ආර්ථික දර්ශක අඛණ්ඩව වැඩිදියුණු වෙමින් පවතී. ඒවායින් සමහරක්,

- සේවා වියුක්ති අනුපාතය ඉතිහාසගත අඩුම මට්ටමදක්වා පහත වැටුණි.




ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

*සභා මේසය මත තබන ලද ලේඛනය :
சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :
Statement tabled :

මතය: 2008 අයවැයෙන් ආරක්ෂක වියදම 20% ප්‍රමාණයකින් වැඩි කර ඇත.

සත්‍ය තත්ත්වය: එය සත්‍යයකි. ඒ සමගම ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන වියදම ද සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි කර තිබේ.

- ආයෝජනය ඉහළ නැංවීමට නම් ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සහතික කළ යුතුව ඇත. එබැවින් 2008 දී ආරක්ෂාව සඳහා වෙන් කිරීම 19.3% කින් ඉහළ ගොස් ඇත.
- ඒ සමගම සංවර්ධන ක්‍රියාවලිය පවත්වා ගැනීම සඳහා ආර්ථිකමය යටිතල පහසුකම් සඳහා ඊටත් වඩා වැඩි වෙන් කිරීමක් සිදුකර තිබේ. අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි සමාජීය යටිතල පහසුකම් වෙනුවෙන්ද වැඩි මුදල් ප්‍රමාණයක් වෙන්වී ඇත.

| Item | 2007 to 2008 % Change |
|---|---|
| Defence | 19.3 |
| Transport & Communication | 75.0 |
| Water Supply & Energy | 61.3 |
| Health | 16.2 |
| Education | 18.5 |

Source: Ministry of Finance and Planning

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


*සභා මේසය මත තබන ලද ලියවිලි :
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :
Statement tabled :


## මතය : ශ්‍රී ලංකාවේ වර්තමාන ඉහළ උද්ධමනය දේශීය මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් උද්ගතවී ඇත.

355 -M

## සත්‍ය තත්ත්වය: ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ආහාර මිල ගණන් ඉහළ යාම ඍජුවම ශ්‍රී ලංකාවෙහි කුඩා විවෘත ආර්ථිකයට බලපා ඇත.

**දේශීය මිල ගණන් මත ජාත්‍යන්තර මිල ගණන්වල සැඩිනම් බලපෑමක් ඇත.**





**ලොව වටා වර්තමාන උද්ධමනය**

- බොහෝ රටවල දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුවද ඉතා ඉහළ උද්ධමන අගයන් වාර්තා වේ.
  - පකිස්ථානය - වසර 30 කට පසු ඉහළම අගය
  - සිංගප්පූරුව - වසර 25 කට පසු ඉහළම අගය
  - එක්සත් ජනපදය - වසර 17 කට පසු ඉහළම අගය
  - යුරෝපා හවුලේ වසර 16 කට පසු ඉහළම අගය
  - ඉන්දියාවේ වසර 13 කට පසු ඉහළම අගය
  - ජපානයේ වසර 10 කට පසු ඉහළම අගය
  - ඕස්ට්‍රේලියාවේ වසර 9 කට පසු ඉහළම අගය

- සියලු දෙනාගේම අපේක්ෂාවන් ඉක්මවායමින් ජාත්‍යන්තර පාරිභෝගික භාණ්ඩ සහ බනිජ තෙල් මිල ගණන් ශීඝ්‍ර ලෙස ඉහළ නැග ඇත. බොහෝ රටවල උද්ධමනය දෙගුණ වී ඇති අතර, මෙය ශ්‍රී ලංකාවට පමණක් විශේෂිත වූ සිදුවීමක් නොවේ.
- 2006 අවසානයේ සිට පවත්වාගෙන යනු ලබන සහනාධාර නොදීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් ජාත්‍යන්තර මිල කම්පනයන්ගෙන් දේශීය උද්ධමනය මත සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.
- පාරිභෝගික මිල දර්ශකයෙහි සියයට 47 ක් ආහාරපාන මගින් පිළිබිඹු වීමත්, ශුද්ධ ආහාර ආනයනිකයකු වීමත් හේතුවෙන් ආහාර සඳහා සාපේක්ෂව අඩු අගයක් ඇති වඩා විශාල දේශීය ආර්ථිකයක් ඇති හෝ මෙම කරුණු දෙකම බලපැවැත්වෙන රටකට වඩා ආහාර කම්පනයන් ශ්‍රී ලංකාවට තදින් බලපානු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

27


මතය: කේන්ද්‍රීය නගර සහ අන් ප්‍රදේශ අතර දැඩි විෂමතාවක් පවතී.

සත්‍ය තත්ත්වය: ප්‍රාදේශීය ආදායම් මට්ටම් ඉහළ යමින් පවතින අතර විෂමතාවන් අඩු වෙමින් පවතී.

ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට දී ඇති ඉහළ ප්‍රමුඛතාත් සමග මෙම ප්‍රදේශවල ඇති ආර්ථික ක්‍රියාකාරකම්වල යලි පණගැන්වීමක් සිදුවී ඇත. පසුගිය වසරේ ද.දේ.නි. දත්ත අනුව මෙම පළාත් වල ආදායම් මට්ටම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරේ.

පළාත් අනුව ද.දේ.නි.ය (%)



පළාත් අනුව ඒකපුද්ගල ආදායම (රු.'000)



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.20ට, 2008 ඔක්තෝබර් 10 වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.20 மணிக்கு பாராளுமன்றம், 2008 ஒக்ரோபர் 10, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 4.20 p.m. until 9.30 a.m. on Friday, 10th October, 2008.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---


| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 9.30 a.m. to 4.20 p.m. on 09.10.2008** |
| **Final set of manuscripts Received from Parliament** | **:** | **4.45 p.m. on 20.10.2008** |
| **Printed copies dispatched** | **:** | **26.10.2008 Morning** |

**දායක මුදල්: පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු.2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 5, කිරුළපන, මායා මාවත. අංක 132 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30දා ට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.**

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 132, மாயா அவெனியு, கிருளப்பனை, கொழும்பு 5** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscription : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATION BUREAU, No. 132, Maya Avenue, Kirulapone, Colombo 5. The fee should reach him on or before November 30 each year . Late application for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.